# අග්ගඤ්ඤ සූත්‍රය

## (ලෝකෝත්පත්ති වංශ කථාව)

**සම්පාදක:**

**පූජ්‍ය නිකපිටියේ ගුණරතන හිමි.**

**ධර්ම දානය පිණිසයි!**

ශ්‍රී බු ව 2562 වූ දුරුතු මස පුර දෙළොස්වක නම් තිථිය ලත් සඳුද

ව්‍ය: ව: 2019-01-06

# පෙරවදන

**"පුඤ්ඤං චෙ පුරිසො කයිරා - කයිරාථෙතං පුනප්පුනං"**

**පිං කරන තැනැත්තා නැවත නැවත පිං කරයි**

පූජ්‍ය නිකපිටියේ ගුණරතන ස්වාමින් වහන්සේ ධර්ම දේශනා කිරීමෙහිද දහම් පොත් ලිවීමෙහි ද යන ධර්ම දානමය කුසල කර්මයන්හි නිතර නිතර යෙදෙයි. මෙවරද දායකයන්ගේ ඇරයුම පරිදි අග්ගඤ්ඤ සූත්‍ර දේශනාව දහම් පොතක් වශයෙන් ඉදිරිපත් කරයි. මෙම සූත්‍ර දේශනාව දීඝනිකායේ තුන්වැනි පොතෙහි සඳහන් සූත්‍රයකි. ලෝකෙය් හටගැන්මත් එහි ව්‍යාප්තියත් පැහැදිලි කරමින් බුදුරජාණන් බුදුරජාණන් වහන්සේ වාශිෂ්ඨයන්ට දේශනා කළ සේක. බ්‍රාහ්මණයෝ බ්‍රහ්මයාගේ මුවින් උපන්නේ යයි යන අදහස බිඳලමින් ඔවුන් ද සාමාන්‍ය ජනයා තුළින් ම ව්‍යාප්ත වූ කොටසක් බව දේශනා කළ සේක. මෙම දේශනාව පෙළෙහි වැඩි දීඝී නොවූවත් පූජ්‍ය ගුණරතන ස්වාමින් වහන්සේ අටුවා ටීකා විස්තර ඈඳ ගනිමින් ඉදිරිපත් කර ඇති ආකාරය ප්‍රශංසනීය ය. මෙය කියවන්නාට අටුවා ටීකා නො පෙරලා බොහෝ විස්තර පහසුවෙන් දැන ගත හැක.

පූජ්‍ය ගුණරතන ස්වාමින් වහන්සේට තව තවත් මෙවැනි දහම් පොත් ලිවීමට ශක්තිය බලය ලැබේවායි ආශිංසනය කරමි. මෙම ධර්ම දානමය කුසලය නිවන පිණිස ම උපනිඃශ්‍රය වේවා. මෙම දහම් පොත පරිශීලනය කරන සැමදෙනාටද නිවන් අවබෝධ වේවා. පූජ්‍ය ගුණරතන ස්වාමින් වහන්සේ හැදූ වැඩූ දෙමාපියන්ට ද මේ කුසලය නිවන පිණිස උපනිඃශ්‍රය වේවා. දායක පක්ෂයට ද මෙම ධර්ම දානමය කුසලය නිවන් පිණිස ම හේතු-වේවා.

මේ වගට සසුන් ලැදි
පූජ්‍ය මීගොඩ සංඝසෝභන ස්ථවිර,
නා උයන ආරණ්‍ය සේනාසනය,
පන්සියගම, මැල්සිරිපුර.

# හැඳින්වීම

**කම්මා විපාකා වත්තන්ති - විපාකො කම්මසම්භවො,**
**තස්මා පුනබ්භවො හොති - එවං ලොකො පවත්තතී'ති.**

කයින් වචනයෙන් සිතින් සිදු කරගනු ලබන කුසලාකුසල කර්මයන් විපාක පිණිස පවතී. එම විපාකයන් ගෙන් නැවත කර්ම හට ගනී. ඒ හේතුවෙන් නැවත ඉපදීම සිදු වේ. මෙසේ සත්ව ලෝකය නො සිඳී පවතී.

කර්මය යනු චේතනාවට නමකි. අසූ නවයක් වූ සියලු චිත්තයන්හි ම යම් අරමුණක් ගෙන සිතක් උපදී. එසේ ගනු ලබන අරමුණ චේතනාව නම් වේ. සත්ව සන්තානයෙහි හටගන්නා වූ සිත්හි ජවන කෘත්‍යය සිද්ධ කරමින් ද, විපාක උපදවමින් ද සියලු කුසලාකුසල සිත්හි යෙදෙන චේතනා චෛතසිකය "**කර්මය**" නම් වේ.

ඒකාසූවක් (81) වූ ලෞකික සිත් අතරින් අකුසල සිත් දෙළොස ය, කාමාවචර කුසල සිත් අට ය, රූපාවචර කුසල සිත් පස ය, අරූපාවචර කුසල සිත් සතර ය යන විසි නවයක් වූ සිත් කර්ම සිත් නම් වේ. මෙම කර්ම මහත් බවට සම්පූර්ණ බවට පැමිණි කල්හි "**කර්මපථ**" නම් වේ. කර්මයන්ගෙන් උපදවන විපාක "**ප්‍රතිසන්ධි විපාක**" හා "**ප්‍රවෘත්ති විපාක**" යැයි දෙ වැදෑරුම් වේ. කාම රූප අරූප භවයන්ගෙන් යම් තැනක ප්‍රතිසන්ධිය ලබා දෙයි ද එය "**ප්‍රතිසන්ධි විපාක**" නම් වේ. සුගති දුගතීන්හි උපනුපන් තැන්හි දී සැප දුක් විපාක ලබා දෙයි ද එය "**ප්‍රවෘත්ති විපාක**" නම් වේ. ඒ අතරින් කර්මපථ බවට පැමිණියා වූ කර්මයන්ගෙන් ප්‍රතිසන්ධි විපාක හා ප්‍රවෘත්ති විපාක යන දෙකම ලබා දෙති. කර්මපථ බවට නොපැමිණියා වූ අසම්පූර්ණ කර්මයන්ගෙන් ප්‍රවෘත්ති විපාක පමණක් ලබා දෙයි.

යම් අරමුණක් ගෙන සිතක් උපදනා කල්හි ඒ සිතින් කරනු ලබන යම් ක්‍රියාවක් වෙයි ද, ඒ ක්‍රියාව කිරීමට උපකාර වන ලෙසට අනෙකුත් චෛතසික ධර්මයන් ද උපදවා ගෙන ම මේ චේතනා චෛතසිකය ඒ සිත සමගම උපදී. එසේ ම සත්වයන් උපනුපන් තැන්හි දී කළල රූපය, චක්ෂු සෝත ඝාණ ජිව්හා කාය ප්‍රසාද රූපයන් ද,

හෘදවස්තු රූපය භාව රූපය ජීවිතේන්ද්‍රිය රූපය යන මේ සියල්ලක් ම චේතනා නම් වූ කර්ම ශක්තියෙන් ම උපදවති.

මෙලෙස කර්ම ශක්තිය විසින් නාම රූප ධර්ම උපදවමින් සැම කල්හි පරම්පරා වශයෙන් සත්වයන් ගේ පැවැත්ම කර්ම නියාම ධර්ම නියාම චිත්ත නියාම යන නියාම ධර්මතා අනුව සිදු වෙති. යම් කල්පයක ආරම්භය පටන් කුසලාකුසල ධර්ම හේතුවෙන් සත්වයන් ගේ පිරිහීම හා දියුණුව සිදුවන ආකාරය ද, සත්වයන් ගේ පැවතුම් අනුව ක්‍ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර යන කුල වංශයන් හට ගන්නා ආකාරය ද, සම්මා සම්බුද්ධ ශාසනයක් ලොව පහළ වූ විටක සත් තිස් බෝධිපාක්‍ෂික ධර්ම භාවනා වඩා සසර දුකින් නිදහස් වීමේ ප්‍රතිපදාව ද පෙන්වා දෙමින් විශේෂයෙන් නිවනට පමුණුවන කුසල ධර්ම සිදු කිරීම තුළින් නිවනට පැමිණ දුක් අවසන් කරන බව ද පෙන්වා දෙමින් ධර්මය ම ශ්‍රේෂ්ඨ බව මෙම අග්ගඤ්ඤ සූත්‍රයෙන් පැහැදිලි වන්නේ ය.

මෙම අගනා ධර්ම ග්‍රන්ථය සැකසීමට මූල කාරණය වූයේ නා උයන ආරණ්‍යයෙහි සේවය කරන පින්වත් රන්ජිත් ලියනගම මහත්මා විසින් ව්‍යා: වර්ෂ 2019-01-06 දින නා උයන ආරණ්‍යයෙහි මහා සංඝ රත්නය වෙත පිරිනමන දන පින්කමට සමගාමීව ධර්ම දානයක් ද කරනු පිණිස කළ ආරාධනාව ය. මේ සඳහා දායකත්වයෙන් උපකාර කළ පූජාපිටිය දෙලපිහිල්ලේ පදිංචි විශ්‍රාම ලත් විදුහල්පති ඒ: ඒ: දෙලපිහිල්ල මහතා, හෝමාගම අතුරුගිරිය පාරේ පදිංචි සහන් සන්දීප මහතා සහ ගෝමස් මනම්පේරි මහත්මිය, කිරිවත්තුඩුවේ පදිංචි ශාන්ත ඇරැණියගල මහතා, පූජාපිටිය වටගලතැන්න පදිංචි ටී: එම්: චන්ද්‍රරත්න බණ්ඩාර මහතා යන පින්වත් පිරිස ද, නාබැට සෝභනසීලා සිල් මැණියන් වහන්සේ ද, ඩී. බී නිමල් ජයවර්ධන මහතා මියගිය තම මව්පිය ඥාතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිස ද දායකත්වයෙන් උපකාර වූහ. ඒ සැමට ත්‍රිලක්‍ෂණ චතුරාර්‍ය සත්‍යාවබෝධයෙන් සුව සේ නිවන් සුව ලබන්නට හේතු වේවා! එසේ ම බුරුම රට චිත්තල පබ්බත පා අවුක් ටෝ යා භාවනා මධ්‍යස්ථානාධිපති අග්ග මහා කර්මස්ථානාචාර්‍ය අති පූජනීය ඌ ආචිණ්ණ මහා ස්වාමීන් වහන්සේට ද, ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාවේ වත්මන් ප්‍රධාන අනුශාසක අති පූජනීය පහල විටියල ජනානන්දාභිධාන මහා ස්වාමීන් වහන්සේට ද, නා උයන

ආරණ්‍ය සේනාසනයෙයි ප්‍රධානාචාර්‍ය අති පූජනීය මීගොඩ සංඝසෝභන මහා ස්වාමින් වහන්සේට ද, එසේ ම නා උයන ආරණ්‍යයෙහි ප්‍රධාන කර්මස්ථානාචාර්‍ය අති පූජනීය අඟුල්ගමුවේ අරියනන්ද මහා ස්වාමින් වහන්සේට ද, මෙම අගනා ග්‍රන්ථයෙහි සෝදුපත් බලා නිවැරදි කොට දුන් නා උයන ආරණ්‍ය වාසී විනයාචාර්‍ය පූජ්‍ය නාවලපිටියේ නාරද ස්වාමින් වහන්සේට ද, නා උයන ආරණ්‍ය වාසී වූ ද, යෝගාශ්‍රම සංස්ථා වාසී වූ ද, ලංකා වාසී වූ ද, ලෝකවාසී වූ ද සියලු මහා සංඝ රත්නයට ද, සම්බුදු සසුන සීල සමාධි ප්‍රඥා ආදී සසුන් පිළිවෙත් ගුණයන්ගෙන් බබුළුවමින් සුව සේ පාරමී ගුණ බෝධිපාක්ෂික ධර්ම සපුරා ප්‍රාර්ථනීය බෝධියෙන් නිවන් සුව ලබන්නට හේතු වාසනා වේත්වා! මව්පිය ඤාති මිත්‍රාදීන්ට ද, දායක කාරකාදී පින්වත් සැමට ද, ශාසනාරක්ෂක ලෝක පාලක ආත්මාරක්ෂක දිව්‍යරාජ මණ්ඩලයට ද, අනෙකුත් සදේවක ලෝකවාසී සත්වයන්ට ද සුව සේ නිවන් සුව ලබන්නට හේතු වාසනා වේත්වා! මෙම ග්‍රන්ථය මනාව මුද්‍රණය කර දුන් යක්කල දිමුතු මුද්‍රණාලයෙහි අධිපති තුමා ප්‍රධාන කාර්‍ය මණ්ඩලයෙහි සැමට ද සියලු සම්‍යක් ප්‍රාර්ථනා ජය ගෙන සුවසේ ම නිවන් සුව ලබන්නට හේතු වාසනා වේත්වා!

මෙයට මෙතැති,
නිකපිටියේ ගුණරතන හිමි,
නා උයන ආරණ්‍යය.
පන්සිය ගම, මැල්සිරිපුර.

# පටුන


පෙරවදන ....................................................................................3

හැඳින්වීම.................................................................................... 4

❄ සූත්‍ර නිදානය....................................................................................11

❄ ප්‍රථම ධර්ම සංගායනාව....................................................................................12

☸ ආනන්ද තෙරුන් රහත් වීම ....................................................................................19

☸ විනය සංගායනා කිරීම.................................................................................... 20

☸ ධර්මය සංගායනා කිරීම ....................................................................................21

☸ ධර්ම විනය බෙදා දැක්වීම ....................................................................................23

❄ අග්ගඤ්ඤ සූත්‍ර සංගායනාව .................................................................................... 27

☸ නිසි බුද්ධෝපස්ථායෙකු නොවීම ....................................................................................28

☸ නිත්‍ය උපස්ථායෙකු පත් කර ගැනීම.................................................................................... 29

☸ ප්‍රතික්ෂේප සතර ....................................................................................30

☸ ආයාචනා සතර ....................................................................................31

☸ විශාඛාවගේ උත්පත්තිය ....................................................................................38

☸ විශාඛාව සෝවාන් ආර්‍යය ශ්‍රාවිකාවක් වීම ....................................................................................39

☸ සාකේත නුවර ඉදි වීම.................................................................................... 40

☸ විශාඛාවගේ විවාහය ....................................................................................41

☸ මිගාර සිටු කුලය ආර්‍යය ශ්‍රාවකයින් වීම ....................................................................................53

☸ පූර්වාරාම මහා විහාරය ඉදි කිරීම....................................................................................57

☸ පූර්වාරාම විහාර පූජාව....................................................................................59

❄ වාසෙට්ඨ භාරද්වාජ දෙනම ....................................................................................65

❄ චතුවර්ණ ශුද්ධිය.................................................................................... 70

☸ ආයුෂ් කල්පය....................................................................................75

☸ අන්තර් කල්පය ....................................................................................75

රෝග අන්තර් කල්පය ....................................................................................76

- දුර්භික්ෂ අන්තර් කල්පය ....76
- සත්ථ අන්තර් කල්පය ....76
- අසංඛෙය්‍ය ....79
- අසංඛ්‍ය කල්පය ....80
- සංවට්ට තුන ....81
- සංවට්ට සීමා තුන ....81
- ක්ෂේත්‍ර තුන ....82
- කල්ප විනාශය වන ආකාරය ....83
- ත්‍රිවිධ මහා කෝලාහල ....83
- කල්ප කෝලාහලය ....83
- බුද්ධ කෝලාහලය ....84
- චක්‍රවර්ති කෝලාහලය ....84
- මහා කල්පය ....87
- රස පොළව පහළ වීම ....88
- චන්ද්‍ර, සූර්‍ය, නැකත් තරු පහළ වීම ....91
- රෑ, දහවල, දින, පක්ෂ, මාස පහළ වීම .... 92
- ඍතු සකස් වීම .... 94
- සංවත්සර සකස් වීම .... 96
- චක්‍රාවාට පර්වතය ....97
- මහාමේරු පර්වතය ....97
- සප්ත කූට පර්වත ....98
- සතර මහ දිවයින ....101
- පූර්ව විදේහය ....101
- ජම්බුද්වීපය ....102
- හිමාල පර්වතය ....103
- අපරගෝයානය .... 113

- උතුරු කුරු දිවයින ....................................................... 113
- ❄ භූමි පප්පටක (හතු) පහළ වීම ....................................................... 118
- ❄ බදාලතා වැල් පහළ වීම ....................................................... 118
- ❄ දහයියා නිවුඩු නැති හැල් පහළ වීම ....................................................... 119
- ❄ ස්ත්‍රී-පුරුෂ ලිංග පහළ වීම ....................................................... 120
- ❄ මෛථුන සේවනය ....................................................... 121
- ❄ හැල් සහල් බෙදීම ....................................................... 123
- ❄ මහා සම්මත රජ ....................................................... 125
- ❄ බ්‍රාහ්මණ මණ්ඩලය පහළ වීම ....................................................... 127
- ❄ වෛශ්‍ය මණ්ඩලය පහළ වීම ....................................................... 128
- ❄ ශුද්‍ර මණ්ඩලය පහළ වීම ....................................................... 129
- ❄ දුශ්චරිත ආදි කථා ....................................................... 130
- ❄ බෝධිපාක්ෂික ධර්ම භාවනාව ....................................................... 134
  - ☸ සති සම්බොජ්ඣංගය ....................................................... 136
  - ☸ ධම්මවිචය සම්බොජ්ඣංගය ....................................................... 137
  - ☸ විරිය සම්බොජ්ඣංගය ....................................................... 137
  - ☸ ප්‍රීති සම්බොජ්ඣංගය ....................................................... 138
  - ☸ පස්සද්ධි සම්බොජ්ඣංගය ....................................................... 139
  - ☸ සමාධි සම්බොජ්ඣංගය ....................................................... 139
  - ☸ උපෙක්ඛා සම්බොජ්ඣං ....................................................... 140

# අග්ගඤ්ඤ සූත්‍රය

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

## ❄ සූත්‍ර නිදානය

භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ සැවැත් නුවර **මිගාර මාතා** නම් වූ **විශාඛා** මහ උපාසිකාව විසින් සාදවා පූජා කරන ලද **මිගාරමාතුප්‍රාසාදය** නම් වූ පූර්වාරාමයෙහි වැඩසිටි දිනක මෙම අග්ගඤ්ඤ සූත්‍රය **වාසෙට්ඨ, භාරද්වාජ** යන සාමණේරයන් වහන්සේලා දෙනම අරභයා දේශනා කොට වදාළ සේක. ඒ පිළිබඳ අර්ථ විවරණය මෙසේ ය.

**"එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ."**

**"මා විසින් මෙසේ අසන ලදී. එක් සමයක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර මිගාරමාතු ප්‍රාසාදය නම් වූ පූර්වාරාමයෙහි වැඩ වසන සේක."**

බුද්ධුපස්ථායක වූ ආනන්ද තෙරුන් වහන්සේ විසින් ප්‍රථම සංගායනා කාලයෙහි ධර්ම සංගායනා කරන්නා වූ ආයුෂ්මත් මහා කාශ්‍යප මහරහතන් වහන්සේ විසින් විමසූ කල්හි පන්සියයක් මහරහතන් වහන්සේලා හමුවෙහි මෙම සූත්‍රය සංගායනාවට භාජනය කළේ ය. මෙය දීඝ නිකායේ පාථික වර්ගයෙහි එන සිවුවන සූත්‍ර දේශනාවයි.

භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ වනාහි සියලු ධර්මයන් තමන් වහන්සේ විසින් ම අවබෝධ කළ සේක. ආචාර්යයවරයෙකු නොමැත්තේ ය. ලෝක නාථ වූ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවෙහි පටන් සුභද්‍ර පරිබ්‍රාජක තුමා හික්මවීම දක්වා වූ පන්සාලිස් වස තුළ කළ

යුතු සියලු බුද්ධ කෘත්‍යයන් සම්පූර්ණ කොට කුසිනාරා නුවර උපවර්තන නම් මල්ල රජ දරුවන්ගේ සල් වනයෙහි යමක ශාල වෘක්ෂයන් අතර පනවන ලද උතුම් බුද්ධාසනයෙහි නැවත නො නැගිටිනා සෙයියාවෙන් වැඩ හිඳ වෙසක් පුර පසලොස්වක පොහෝය දින අලුයම් වෙලෙහි අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පා වදාළ සේක.

# ❄ ප්‍රථම ධර්ම සංගායනාව

තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණය නිමිත්තෙන් රැස් වූ සත් ලක්ෂයක් භික්ෂු සංඝයා වහන්සේ අතර සංඝ ස්ථවිර වූ මහා කාශ්‍යප මහරහතන් වහන්සේ තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණයෙන් සත් වන දින පාවා නුවර සිට කුසිනාරාව වෙත වඩිමින් සිට මඳක් විවේක ගැනීම පිණිස මාර්ගයෙන් ඉවත්ව එක් වෘක්ෂ මූලයක වැඩසිටි සේක. එකල්හි පාවා නුවර වැසි එක් උපාසකයෙක් බුද්ධ ශරීරයට ගෞරව දක්වා දෙවියන් විසින් ආකාශයෙහි සිට බුදු සිරුරට පූජා කරන ලද පාත්‍රයක් පමණ වූ දිව්‍යමය මදරා මලක් රැගෙන පාවා නුවර වෙත යමින් සිට මහා කාශ්‍යප මහරහතන් වහන්සේ වෙත පැමිණ වැඳ සිටියේ ය. එවිට තෙරුන් වහන්සේ ඒ උපාසක තුමාගෙන් "**කොහි සිට එන්නේ ද**" යැයි අසා සිටියේ ය. ඔහු කුසිනාරාවෙහි සිට ආවෙමි යැයි කීවේ ය. "**අපගේ ශාස්තෲන් වහන්සේ දන්නෙහි ද**" යැයි තෙරුන් වහන්සේ විචාළේ ය. තථාගතයන් වහන්සේ පිරිනිවී සත් දවසක් වන බව කීවේ ය. එය අසා රහතන් වහන්සේලා ද, අනාගාමී ආර්‍යයන් වහන්සේලා ද ධර්ම සංවේග උපදවා ගත්හ. කාම රාග ව්‍යාපාද ප්‍රහීණ නොවුණු බැවින් සෝවාන්, සකෘදාගාමී ආර්‍යයන් වහන්සේලා ද, කල්‍යාණ පෘථග්ජන භික්ෂූන් වහන්සේලා ද අඬා වැලපෙන්නට වූහ.

ඒ අවස්ථාවේ සුභද්‍ර නම් මහලු පැවිද්දෙක් ඒ පිරිසෙහි සිටියේ ය. එම භික්ෂුව පූර්වයෙහි ආතුමා නුවර කරණවෑමියෙකු ව සිට වයස්ගත ව පැවිදි වූවෙකි. මහලු වයසේ සිටි බැවින් දරුවන් ලවා තම ගෙවත්තෙහි ම කුටියක් සාදවාගෙන එහි සිටිමින් තම දරුවන්ගේ කෙස් රැවුල් කපමින් ජීවිකාව කළේ ය. එක් චාරිකා සමයක තථාගතයන් වහන්සේ එක්දහස් දෙසිය පනසක් පමණ වූ මහත් භික්ෂු පිරිසක්

පිරිවරාගෙන කුසිනාරා නුවර සිට ආතුමා නුවරට වැඩි සේක. එකල්හි එම භික්ෂුව තථාගතයන් වහන්සේ විශාල සඟ පිරිසක් සමග වඩින්නේ ය යැයි අසා සාමණේර භාවයෙන් සිටි තම දරුවන් දෙදෙනා අමතා **"දරුවනි, නුඹලා ගොස් හිස කෙස් කැපීමට උවමනා උපකරණ රැගෙන ගෙයක් පාසා ඇවිද මිනිසුන්ගේ කෙස් රැවුල් කපා ලුණු තෙල් හා අනුභව කළ යුතු දේ රැස් කරවු. භාග්‍යවතුන් වහන්සේ ප්‍රධාන සංඝයාට බෙහෙත් කැඳ දනයක් දෙන්නෙමු"** යැයි කීවේ ය. ඒ සාමණේර පැවිද්දෝ ද එසේ කළහ. භාග්‍යවතුන් වහන්සේ වැඩි කල්හි මිනිසුන්ගේ ද අත් උදව් ඇතිව එලෙස එක්රැස් කරන ලද දෙයින් භොජ්ජ යාගුවක් (ඝන කැඳක්) සැදවූහ. ගිතෙල්, මී පැණි, මත්ස්‍ය, මාංශ, මල් එල රස ආදිය ද, යම් කෑ යුතු දෙයක් වේ ද ඒ සියල්ල එහි දැම්මවී ය. තව ද හකුරු යොද කරන ලද **"මධුගෝළක"** නම් කැවිලි ද පිළියෙල කරවූයේ ය. මෙයට **"අතිරස කැවුම්"** යැයි ද, **"මධුසීසක"** යැයි ද කියනු ලැබේ. මේ සියල්ල දන්නා භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සමග නගරයට පිඬු පිණිස වැඩි සේක. මිනිස්සු **"භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සමග නගරයට පිඬු පිණිස වඩියි, ඔබ කවුරුන් හට කැඳ පිළිගන්වන්නෙහි ද"** යැයි එම භික්ෂුවට කීහ. එවිට ඒ භික්ෂුව කලබල වී භාග්‍යවතුන් වහන්සේ ඉදිරියට ගොස්, **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, කැඳ පිළිගන්නා සේක්වා"** යැයි ආරාධනා කළේ ය. භාග්‍යවතුන් වහන්සේ **"මහණ, නුඹ කෙසේ කැඳ සැකසුවේ ද"** යැයි අසා ගර්හා කොට අකප්පිය සමාදනය ද, **"පූර්වයෙහි භාවිතා කළ කරණවෑම් බඩු පාවිච්චි නොකළ යුතුය"** යැයි ද මෙසේ ඒ භික්ෂුව නිමිති කොට දුෂ්කට සිකපද දෙකක් පනවා දැහැමි කථාවක් කොට භික්ෂූන් අමතා මෙසේ වදළ සේක. **"මහණෙනි, අනේක කල්ප කෝටි ගණනක් භෝජනය සොයන්නවුන් සමගම මේ දීර්ඝ සංසාරයේ කල් ගත කරන ලදී. මෙය වනාහි නුඹලාට අකැප ය. මේ අධර්මයෙන් උපයා ගත් භෝජනය පරිභෝග කළවුන් අනේක වූ ආත්මභාව සිය දහස් ගණනක් අපායෙහි ම උපදින්නෙහි ය. ඉවත් වන්න, මෙය පිළි නො ගන්න"** යැයි වදරා පිඬු පිණිස වැඩි සේක. එක් භික්ෂුවකුදු එය පිළි නො ගත්හ. සුභද්‍ර භික්ෂුව නො සතුටු ව **"මොහු සියල්ල දනිමි යි ඇවිදියි. ඉදින් නො ගනු කැමැත්තෙහි නම් එය කිය යුතු නොවන්නේ ද, මා වෙහෙසීමෙන් කරන ලද සියල්ල මොහු විසින් නසන ලද්දේ ය. මොහු මා කෙරෙහි හිතවත් බවක් නැත්තේ ය"** යැයි තථාගතයන් වහන්සේ සමග වෛරී

ව සිට තථාගතයන් වහන්සේ ජීවමාන ව සිටියදී කිසිවක් කියන්නට නොහැකි ව සිට පිරිනිවියේ යැයි අසා සතුටු ව අඬා වැලපෙන භික්ෂූන් අමතා මෙසේ කීවේ ය.

**"ඇවැත්නි, ශෝක නොකරවු. නො වැලපෙව්. අපි ඒ මහා ශ්‍රමණයාගෙන් සම්පූර්ණයෙන් මිදුණෝ වෙමු. ඒ මහා ශ්‍රමණයා මෙය නුඹලාට කැපය, මෙය නුඹලාට අකැප ය යනාදී ලෙස සිකපද පනවමින් අපි පීඩාවට පත් කරනු ලැබුවෝ වෙමු. දැන් අපි ඒ ගැහැට වලින් නිදහස් වූවෝ වෙමු. එබැවින් දැන් අපි යමක් කැමැත්තෙමු නම් එය කරන්නෙමු. යමක් අකැමැත්තෙමු නම් එය නො කරන්නෙමු"** යැයි මේ වචනය කීවේ ය.

මේ වචනය මහා කාශ්‍යප මහ රහතන් වහන්සේට හදවතට වැදුණු පහරක් මෙන් ද, හිසට පහත් වූ වියලි හෙනයක් මෙන් ද හැඟී ගියේය. මහත් වූ ධර්ම සංවේගයක් හට ගත්තේ ය. තෙරුන් වහන්සේ සිතන සේක් **"සත් දිනකට පෙර භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑ නමුත් අද ද ඒ බුදු සිරුර රන් පැහැයම ය. භාග්‍යවතුන් වහන්සේ විසින් දුකසේ ගොඩනැගූ සසුනෙහි පාපී කසටක්, කටුවක් හට ගත්තේ ය. මෙවන් පාපී පුද්ගලයන්ට වැඩෙන්නට ඉඩ ලැබුණ හොත් තවත් සහායකයන් ලැබ ශාසනය පසු බස්සවන්නට හැකි වන්නේ ය. ඉදින් වනාහි මම මේ මහල්ලා ව මෙහි දී ම රෙදි කඩක් අන්දවා අළු විසුරුවා බැහැර කරන්නෙම් නම්, මිනිස්සු ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ දේහය තිබිය දී ම ශ්‍රාවකයෝ විවාද ඇති කර ගනිති යැයි අපට දෙස් පවරන්නාහුය"** යැයි සිතා නැවත ද මෙසේ සිහිපත් කළේ ය.

භාග්‍යවතුන් වහන්සේ විසින් එකට එකතු නොකළ මල් රාශියක් මෙන් ධර්මය දේශනා කරන ලදී. එහි යම් සේ වාතය වැදීමෙන් සමහර මල් විසිරී යයි. එපරිද්දෙන් මෙබඳු පව්ටු පුද්ගලයන් නිසා කල් ගතවන විට විනයෙහි සිකපද එක දෙක බැගින් විනාශ වී යන්නේ ය. සූත්‍රයන්හි එකක් දෙකක් ප්‍රශ්න වාරයන් නැසී යන්නේ ය. අභිධර්මයෙහි එක දෙක වෙනස් වෙනස් වාරයන් නැසී යන්නේ ය. මෙසේ පිළිවෙලින් මුල නැසුණු කල්හි අපි පිසාචයන් හා සම වූවෝ වෙමු. එබැවින් ධර්මයත් විනයත් සංගායනා කරන්නෙමි. මෙසේ ඇති කල්හි ශක්තිමත් නූලකින් ගැට ගසන ලද මල් මාලාවක් මෙන් ධර්ම - විනය දෙක ස්ථිරව

පිහිටන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ මේ සඳහා ම මට පෙර ගමන් කළ සේක. අවවාද තුනකින් උපසම්පදාව දුන් සේක. කයින් සිවුරු මාරු කළ සේක. මේ සියල්ලට වඩා අසාධාරණ වූ නවානුපූර්ව විහාර සමාපත්තීන්ගෙන් සම තැන තැබූ සේක. මෙසේ තමන් වහන්සේ හා සම තැන්හි තැබීමෙන් අනුග්‍රහ කරන ලද මට ධර්ම - විනය සංගායනාව හැර අන් කිනම් මගකින් ණය නැති බවක් වන්නේ ද, සක්විති රජ කෙනෙකු තමන්ගේ සන්නාහයත් ඓශ්වර්යයත් දීමෙන් ස්වකීය කුල වංශය පිහිට වූ පුතුට මෙන් භාග්‍යවතුන් වහන්සේ **"මෙතෙම මාගේ සද්ධර්ම වංශය පිහිටුවන්නෙක් වන්නේ ය"** යැයි දැන මේ අසාධාරණ අනුග්‍රහයෙන් මට අනුග්‍රහ කළ සේක යැයි සිතුවේ ය. එසේම **"මා වැනි භික්ෂූන් වහන්සේලා සිටියදී මේ පාපියෙකුට සසුනෙහි දියුණු වන්නට ඉඩක් නො තැබිය යුතු ය. යම්තාක් අධර්මය අවිනය නො බැබළේ ද ඒ තාක් ධර්මයත් විනයත් පසු බසින්නේ නැත. යම් විටෙක අධර්මය අවිනය බැබළේ ද එවිට ධර්මයත් විනයත් පසු බසින්නේ ය. එබැවින් අධර්මවාදීන් අවිනයවාදීන් බලවත් වීමට පෙර ධර්මවාදීන් විනයවාදීන් දුබල වීමට පෙර ධර්ම - විනය දෙක සංගායනා කරන්නේ නම් මැනවි"** යැයි සිතා ඒ මොහොතේ කිසිවක් නොකියා කුසිනාරාව වෙත වැඩම කොට බුදු සිරුර තැන්පත් කරන ලද විසි රියන් උස සඳුන් දර සෑය වටා ප්‍රදක්ෂිණා කොට අධිෂ්ඨාන බලයෙන් බුදු සිරිපා තම නළලෙහි තබා වන්දනා කළේ ය. ඉන් පසු දේවානුභාවයෙන් ඒ චිතකය ගිනි ඇවිල ආදහනය වූයේ ය.

පරිනිර්වාණයෙන් පසු බුදු සිරුර සත් දිනක් ඒ ආසනයෙහි ම පැවතුණේ ය. ඒ කාලය සදේවක ලෝකවාසීන් විසින් වැඳුම් පිදුම් කළහ. සත් වන දින ආදහනය සිදු විය. ඉන් පසු සත් දිනක් ධාතු පූජා කාලය වූහ. ඉන් පසු සර්වඥ ධාතු බෙදා දීමට සත් දිනක් ගත විය. මේ අවස්ථාවට සත් ලක්ෂයකට අධික භික්ෂු සංඝයා වහන්සේ රැස්ව සිටියහ. ඒ සර්වඥ ධාතු බෙදා දීමේ කටයුතු නිමා වූ පසුව මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ මෙවැනි භික්ෂු සන්නිපාතයක් නැවත දුර්ලභ යැයි සිතා භික්ෂු සංඝයා අමතා **ඇවැත්නි, මම එක් සමයක පන්සියයක් පමණ වූ මහත් භික්ෂු පිරිසක් සමග පාවා නුවරින් නික්ම කුසිනාරාව බලා එන අතර තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණය අසා භික්ෂූන් හඬා වැලපෙන කල්හි එක් පාපී භික්ෂුවක් "ඇවැත්නි නො හඬන්න**

**නො වැළපෙන්න.... යමක් අකැමැත්තෙමු නම් එය නො කරන්නෙමු"** යැයි මෙසේ කීවේ ය.

පරිනිර්වාණයට පත් තථාගතයන් වහන්සේගේ බුද්ධ ශරීරය ආදහනය වීමටත් පෙර මේ නිර්ලජ්ජී පාප භික්ෂූන් ගේ නැඟී සිටීම විය. ධර්මය ශාස්තෘන් වහන්සේ සමගම නැතිව ගියේ යැයි ද, ධර්මය ශාස්තෘවරයෙකු නැති එකක් ය යැයි ද සිතන පාපී භික්ෂූහු අලජ්ජී පක්ෂය ලැබ, කොටස්වලට බෙදී නොබෝ කලකින් ම සද්ධර්මය අතුරුදහන් කරන්නාහු ය යන මේ කාරණයක් වේ ද, මෙය විද්‍යමාන වන්නේ ය. යම්තාක් ධර්මය විනය පවත්නේ ද, ඒ තාක් බුද්ධ වචනය නො ඉක්මවා සිටින ශාස්තෘවරයෙකු ඇති එකක් වන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ විසින් ම "**යො වො, ආනන්‍ද, මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො, සො වො මමච්චයෙන සත්‍ථා"** යනුවෙන් "**ආනන්දය, මා විසින් යම් ධර්මයක් දේශනා කරන ලද්දේ ද, යම් විනයක් පනවන ලද්දේ ද, ඒ ධර්ම - විනය දෙක මාගේ පරිනිර්වාණයෙන් පසු නුඹලාට ශාස්තෘ වන්නේ ය**" යැයි මේ කාරණය වදරන ලද්දේ ම ය. එබැවින් යම් සේ මෙම ශාසනය බොහෝ කල් පැවැත්මට සුදුසු වූවක් කොට ධර්මයත් විනයත් සංගායනා කරන්නෙමු" යැයි දන්වා සිටියහ.

භික්ෂූන් වහන්සේලා "**ස්වාමීනි, එසේ නම් ස්ථවිරයන් වහන්සේ ම ඒ සඳහා භික්ෂූන් වහන්සේලා තෝරා ගන්නා සේක්වා**" යි කීහ. තෙරුන් වහන්සේ සියලු නවාංග ශාස්තෘ ශාසන සංඛ්‍යාත පර්යාප්ති ධර, නොයෙක් සිය, දහස් ගණන් පෘථග්ජන, සෝතාපන්න, සකෘදගාමී, අනාගාමී, ශුෂ්ක විදර්ශක ක්ෂීණාශ්‍රව භික්ෂූන් හැර පියා ත්‍රිපිටක බුද්ධ වචනය හා සියලු පර්යාප්ති ප්‍රභේදයන්හි පර ප්‍රාප්ත සිවුපිළිසිඹියා පත් මහත් ආනුභාව ඇති, භාග්‍යවතුන් වහන්සේ විසින් ම අග්‍ර ස්ථානයෙහි තබන ලද ත්‍රිවිද්‍යා ආදී ප්‍රභේද ඇති ක්ෂීණාශ්‍රව භික්ෂූන් වහන්සේලා ම හාරසිය නව අනූ නමක් (499) තෝරා ගත්හ. කුමක් සඳහා එක නමක් අඩු කළ සේක් ද යත්? ආනන්ද තෙරුන් වහන්සේට ඉඩ සලසනු සඳහා ය. ඒ වන විට ආනන්ද තෙරණුවෝ රහත් ව නො සිටි බැවිනි. මේ ආනන්ද තෙරුන් වහන්සේ, භාග්‍යවතුන් වහන්සේ පසුපස යමින් අග්‍ර උපස්ථානය කරමින් බොහෝ ධර්ම - විනය කාරණා උගත්තේ ය. එබැවින් තෙරුන් වහන්සේ නොමැතිව ධර්ම සංගායනාව නොකළ

හැකිය. ඉන් පසු අන් භික්ෂූන් වහන්සේලාගේ ඉල්ලීමෙන් ආනන්ද තෙරුන් වහන්සේ ද තෝරා ගත්හ. ඉන් පසු ස්ථවිර භික්ෂූන් වහන්සේලාට **"අපි ධර්‍ම, විනය සංගායනාව කොතැන්හි දී කරන්නෙමු ද"** යැයි මේ සිත විය. එවිට එම භික්ෂූන් වහන්සේලාට මේ අදහස වූහ.

**"රජගහ නුවර භික්ෂාව ලැබීමට පහසු ය. බොහෝ සෙනසුන් ද ඇත. අජාසත් රජතුමා ගේ දැහැමි ආරක්ෂාව ද ලැබිය හැක. එබැවින් අපි රජගහ නුවර වස් වසමින් ධර්‍මයත් විනයත් සංගායනා කරන්නෙමු, අපගේ මේ කටයුත්ත බොහෝ කල් පවත්නකි. කිසියම් විරුද්ධ පුද්ගලයෙකු සඟ මැදට පැමිණ අර්බුද ඇති කිරීමට ඉඩ ඇත. එබැවින් අන් භික්ෂූහු රජගහ නුවර වස් නො විසිය යුතුය. ධර්‍ම සංග්‍රාහක තෙරුන් වහන්සේලා පමණක් රජගහ නුවර වස් සමාදන් විය යුතුය"** යැයි අදහස වී ඤත්ති දුතිය කර්‍මයෙන් එලෙස සම්මත කර ගත්හ.

ඉන් පසු වස් එළඹෙන සමය ලංවන බැවින් මහා කාශ්‍යප තෙරුන් වහන්සේ, සංගායනාවට සම්මත කරගත් රහතන් වහන්සේලාගෙන් අඩක් ගෙන රජගහ නුවර බලා එක් මඟකින් වැඩි සේක. අනුරුද්ධ තෙරුන් වහන්සේ ද, රහතන් වහන්සේලාගෙන් අඩක් ගෙන රජගහ නුවර බලා එක් මඟකින් වැඩි සේක. ආනන්ද තෙරුන් වහන්සේ ද, රජගහ නුවර වඩිනු කැමති ව, භාග්‍යවතුන් වහන්සේගේ පාත්‍රය හා චීවර ගෙන මහත් වූ භික්ෂු පිරිසක් පිරිවරා සැවැත් නුවර බලා චාරිකාවෙහි වැඩි සේක. ජේතවනාරාමයට වැඩ භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි ගඳකිළියෙහි දොර විවර කොට ඇඳ පුටු බැහැරට ගෙන ගසා දමා ගඳකිළිය හැමද මැලවුණු මල් ආදී කසල බැහැර කොට ඇඳ පුටු ඇතුළට ගෙන ගොස් සුදුසු තැන්හි තබා භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි කල්හි මෙන් කළ යුතු සියලු වතාවත් සිදුකළ සේක. ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ පරිනිර්වාණයෙහි පටන් සිටීම් හිඳීම් බහුලව සිටි බැවින් සෙම් පිත් ආදී දෙස් කිපුණු ශරීරයෙන් සිටි බැවින් දෙවන දින කිරි විරේකයක් පානය කොට විහාරයෙහි ම වැඩසිටි සේක. පසු දින සුභ මානවකයාගේ ආරාධනාවෙන් ඔහුගේ නිවසට වැඩ ඔහු විසින් විචාරන ලද පැන විසඳමින් දීඝ නිකායෙහි ඇතුළත් **"සුභ සූත්‍රය"** වදාළ සේක. අනතුරුව දෙව්රම් වෙහෙරෙහි

කැඩුණු බිඳුණු තැන් පිළිසකර කරවා වස් එළඹෙන සමය ලං වන බැවින් උපකාරක එක් භික්ෂුවක් සමග රජගහ නුවරට වැඩි සේක.

එසමයෙහි වනාහි රජගහ නුවර මහා විහාර අටළොසක් (18) වූහ. ඒවා අතර **තල් වනය, වේළුවනය, සීත වනය, මද්දකුච්ඡි මිගදය, ජීවක අම්බ වනය, මෝර නිවාපය, ලට්ඨි වනය** යන මේවා රජගහ නුවර සමීපයෙහි විය. එසේම **චෝර ප්‍රපාතය**, ඉසිගිලි පර්වතය පාමුල වූ **කාලසිලාව**, වේභාර පර්වතය පාමුල වූ **සප්තපර්ණී ගුහාව**, සීත වන සොහොන් බිම සමීපයෙහි වූ **සප්තසොණ්ඩික පබ්බභාරය, ගෝතම කන්දරය, තින්දුක ගුහාව, තපෝද කන්දරය, ඉන්ද සාල ගුහාව, පිප්ඵලි ගුහාව**, ගිජ්ජකූට පර්වතයෙහි වූ **සූකර කත ලෙන** යන මේවා රජගහ නුවර වටා පිහිටි ඒවා ය. භාග්‍යවතුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු භික්ෂූන් වහන්සේලා මේ විහාර සියල්ල අතහැර දමා ගිය බැවින් මකුළු දැල් බැඳී කොළ රොඩු වලින් ගැවසී පාලු විය. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ ද, අනුරුද්ධ තෙරුන් වහන්සේ ද සපිරිවරින් රජගහ නුවරට වැඩ අපවිත්‍ර වී පාලුවට ගොස් ඇති සෙනසුන් දැක "**භාග්‍යවතුන් වහන්සේගේ වචනයට ගරු කිරීම පිණිස ද, තීර්ථක උපවාදයෙන් මිදෙනු පිණිස ද පළමු මාසය අපවිත්‍ර සේනාසන පිරිසිදු කර කැඩුණු බිඳුණු තැන් පිළිසකර කරන්නෙමු**" යැයි මෙසේ සිතූහ.

තීර්ථකයෝ "**ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ශ්‍රාවකයෝ ශාස්තෘන් වහන්සේ සිටි කල්හි පමණක් විහාරයන් පිළිදැගුම් කළහ. පිරිනිවි කල්හි ඒ වතාවත් අත හැරියාහු වෙති**" යැයි මෙසේ කියන්නාහු ය. භාග්‍යවතුන් වහන්සේ විසින් විහාරයන්හි කැඩුණු බිඳුණු තැන් පිළිසකර කිරීම වර්ණනා කරන ලදී. ඇවැත්නි, එබැවින් අපි වස්කාලයෙහි පළමු මස විහාර පිළිසකර කරමු, මැද මාසයෙහි රැස්ව ධර්ම - විනය සංගායනා කරන්නෙමු යැයි කතිකා කරගෙන දෙවන දින රජ මාලිගයට වැඩ අජාසත්ත රජතුමා සම්මුඛ වී විහාර පිළිසකර කිරීමට අත් උදව් අවශ්‍ය බව කීහ. රජතුමා මිනිසුන් දුන්නේ ය. තෙරුන් වහන්සේලා විහාර පිළිසකර කරවා රජතුමාට ඒ බව දන්වා නැවත ද "**මහ රජ, ධර්ම සංගායනාවක් කරනු කැමැත්තෙමු**" යැයි කීහ. රජතුමා එය අසා "**ස්වාමීනි, විශ්වාස ඇත්තෝ ව කරනු මැනවි. ස්වාමින් වහන්සේලාට ධර්මචක්‍රය වේවා. මා හට ආඥා බලය වේවා. ඒ සඳහා මා විසින් කුමක් කළ යුතු ද**" යැයි අසා සිටියේ ය. "**මහ රජ, ධර්මය - විනය**

**සංගායනා කරන්නා වූ භික්ෂූන් වහන්සේලාට වැඩ හිඳීමට තැනක් කරවා ගත යුතුය"** යැයි කීහ. "**එය කොතැන්හි කළ යුතු ද"** යැයි රජතුමා ඇසුවේ ය. "**වේභාර පර්වතය පාමුල වූ සප්තපර්ණී ගුහා ද්වාරයෙහි සුදුසු ය"** යැයි තෙරුන් වහන්සේලා කීහ.

එකල්හි රජතුමා, විශ්ව කර්ම දිව්‍ය පුත්‍රයා විසින් මවන ලද්දක් හා සමාන ව, මැනවින් බෙදන ලද බිත්ති ඇති, කණු ඇති, පියගැටපෙළ ඇති, නන් වැදෑරුම් මල් කම් ලිය කම්වලින් විසිතුරු කරන ලද මහා මණ්ඩපයක් කරවා, නොයෙක් මල් දම් එල්ලන ලද මනහර වියනක් කරවා, නොයෙක් රත්නයන්ගෙන් විසිතුරු වූ මැණික් ඔබ්බවන ලද මාලා කර්මයන්ගෙන් විසිතුරු වූ බිමක් එහි කරවා, බ්‍රහ්ම විමානයක් සේ සරසා, පන්සියයක් භික්ෂූන් වහන්සේලාට වැඩ හිඳීමට අනගි වූ පස තුරුණු පණවා, මණ්ඩපය මැද නැගෙනහිරට මුහුණ ලා සම්මා සම්බුදු රජාණන් වහන්සේට වැඩ හිඳීමට සුදුසු බුද්ධාසනයක් ද පනවා, එහි දකුණුපස උතුරු දෙසට මුහුණ ලා ථේරාසනයක් ද, ඇත් දළවලින් ලියවන ලද විසිතුරු විජිනිපතක් තබා "**ස්වාමීනි, මගේ කටයුතු නිමවන ලදී"** යැයි තෙරුන් වහන්සේලාට දන්වා සිටියේ ය.

## ☸ ආනන්ද තෙරුන් රහත් වීම

මේ වන විටත් ආනන්ද තෙරුන් වහන්සේ ශෛක්‍ෂව සිටි බැවින් රහතන් වහන්සේලා ආනන්ද තෙරුන් වෙත පැමිණ "**ආනන්දය, හෙට අපගේ රැස්වීම වන්නේ ය. නුඹ තවම ශෛක්‍ෂයෙකි, රැස්වීමට යෑමට නුසුදුස්සෙකි. එබැවින් අප්‍රමාදී විය යුතුය"** යැයි කීහ. ආනන්ද තෙරණුවෝ ද "**හෙට රැස්වීම වන්නේ ය. මා විසින් ශෛක්‍ෂව රැස්වීමට යෑම නොවටීය"** යැයි සිතා රාත්‍රියෙහි බොහෝ වේලාවක් "**කායගතා සති"** කමටහනින් යුතුව සක්මනෙහි යෙදී උත්සාහ කළ නමුත් විශේෂාධිගමයක් නොවූ බැවින්, මඳක් විවේක ගෙන නැවත උත්සාහයෙහි යෙදෙන්නෙමි යැයි සිතා, අලුයම් වෙලෙහි සක්මනින් බැස පා සෝදා විහාරයට පිවිස, විඩා හරින්නෙමි යැයි ඇඳෙහි වැඩ හිඳ කොට්ටය වෙත හිස එළ වූ සේක. දෙපා පොළොවෙන් මිදුණාහ. හිස කොට්ටයට නො පැමිණියේ ය. මේ අතර රහත් වූ සේක. මෙසේ හිඳීම,

සිටීම, සක්මන් කිරීම සැතපීම යන සිව් ඉරියව්වෙන් තොරව රහත් වූහ. **එබැවින් මේ බුදු සසුනෙහි සිව් ඉරියව්වෙන් තොරව යම් භික්ෂූන් වහන්සේ නමක් රහත් වූයේ නම් ඒ ආනන්ද තෙරුන් වහන්සේ ය** යැයි කිව යුතු වන්නේ ය.

පසු දින ස්ථවිර භික්ෂූන් වහන්සේලා බත් කිස කොට පාත්‍ර චීවර තැන්පත් කොට තබා ධර්ම මණ්ඩපයෙහි රැස්ව තමන් වහන්සේලාට නියමිත ආසනයන්හි වැඩ හුන් සේක. ආනන්ද තෙරුන් වහන්සේ ගේ ආසනය පමණක් හිස් විය. ආනන්ද තෙරුන් වහන්සේ තමන් රහත් ව වැඩි බව හඟවනු පිණිස භික්ෂූන් වහන්සේලා සමග නො වැඩියේ ය. භික්ෂූන් වහන්සේලා "**මේ ආසනය කවරෙකු සඳහා ද**" යැයි විචාළහ. "**මෙය ආනන්ද තෙරුන් වහන්සේ සඳහා**" යැයි කීහ. ආනන්ද තෙරුන් වහන්සේ ඒ මොහොතේ සිටි ආවාසයෙන් පොළොව කිමිද මණ්ඩපයෙන් මතු ව තමන් වහන්සේට නියමිත ආසනයෙහි වැඩසිටි සේක. මේ හේතුවෙන් ආනන්ද තෙරුන් වහන්සේ රහත් ව වැඩි බව සියලු භික්ෂූන් වහන්සේලා ම පිළිගත්හ.

## ☸ විනය සංගායනා කිරීම

මෙසේ ධර්ම සංග්‍රාහක මහා රහතන් වහන්සේලා ධර්ම මණ්ඩපයෙහි රැස් වූ කල්හි සංඝ ස්ථවිර වූ මහා කාශ්‍යප තෙරුන් වහන්සේ "**ඇවැත්නි, ධර්මය විනය දෙකෙන් කවරක් පළමු ව සංගායනා කරන්නෙමු ද**" යැයි භික්ෂු සංඝයා ඇමතූ සේක. භික්ෂූන් වහන්සේලා "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, විනය නම් බුද්ධ ශාසනයාගේ ආයුෂයයි. විනය පිහිටි කල්හි ශාසනය සිටියේ වෙයි. එබැවින් පළමු ව විනය සංගායනා කරමු**" යැයි කීහ. "**කවුරුන් ප්‍රධාන කොට ගෙන විනය සංගායනා කළ යුතු ද**" යැයි කාශ්‍යප තෙරුන් වහන්සේ ඇසුවේ ය. "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, මේ උපාලි තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ විසින් ම විනයධරයන් අතර අග්‍ර ස්ථානයෙහි තබා වදාළ සේක. එබැවින් උපාලි තෙරුන් වහන්සේ ප්‍රධාන කොට ගෙන සංගායනා කරමු**" යැයි භික්ෂූන් වහන්සේලා කීහ. ඉන් පසු කාශ්‍යප තෙරුන් වහන්සේ විනය විචාරීමට "**සුණාතු මෙ, ආවුසො, සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ආයස්මන්තං උපාලිං විනයං**

**පුච්ඡෙයයං"** යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන ථේරාසනයෙහි වැඩසිටි සේක. උපාලි තෙරුන් වහන්සේ විනය විසඳීමට **"සුණාතු මෙ, භන්තෙ, සඞෙඝා. යදි සඞඝසස පත්තකලලං, අහං ආයසමතා මහාකසසපෙන විනයං පුට්ඨො විසසජ්ජෙයයං"** යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන අසුනින් නැඟිට සිවුර ගැට වටු ගන්වා ගෙන, වැඩිහිටි ස්ථවිර භික්ෂූන් වැඳ, විජිනිපත ගෙන ධර්මාසනයෙහි වැඩ හුන් සේක. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ උපාලි තෙරුන් වහන්සේගෙන් මෙසේ විනය විචාල සේක.

**"ඇවැත්නි, උපාලිය, භාග්‍යවතුන් වහන්සේ පළමු පාරාජිකාව කොතැනක දී පනවා වදාළ සේක් ද"** යැයි ඇසීය. උපාලි තෙරුන් වහන්සේ **"ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, විශාලා මහනුවර දී පනවා වදාළ සේක"** යැයි විසඳුවේ ය. **"කවුරුන් අරබයා පනවා වදාළ සේක් ද"** යැයි ඇසීය. **"කලන්දක පුත්‍ර සුදින්න තෙරුන් අරබයා පනවා වදාළ සේක"** යැයි විසඳුවේ ය. **"කුමන වස්තුවෙහි පනවා වදාළ සේක් ද"** යැයි ඇසීය. **"මෛථුන ධර්ම ප්‍රතිසේවනයෙහි පනවා වදාළ සේක"** යැයි විසඳුවේ ය. ඉන් පසු සියලු දෙනා වහන්සේ ම එකතුව පළමු පාරාජිකා සිකපදය නිදාන සහිතව සන සජ්ඣායනා කළහ. මෙලෙස සෙසු ශික්ෂා පදයන් ද, භික්ෂු භික්ෂුණී උභතෝ විභංගය ද, දෙවිසි ඛන්ධකයන් ද, සොළොස් පරිවාරයන් ද සහිත සියලු විනය පිටකය සංගායනා කොට උපාලි තෙරුන් වහන්සේ විජිනිපත තබා ධර්මාසනයෙන් බැස වැඩිහිටි තෙරුන් වහන්සේලා වැඳ තමාට පැමිණි අසුනෙහි වැඩ හුන් සේක.

## ☸ ධර්මය සංගායනා කිරීම

විනය සංගායනාවෙන් අනතුරුව ධර්මය සංගායනා කරනු කැමති මහා කාශ්‍යප තෙරුන් වහන්සේ, භික්ෂු සංඝයා වහන්සේ අමතා **"ධර්මය සංගායනා කරන්නා වූ අප විසින් කවුරුන් ප්‍රධාන කොට ගෙන කළ යුතු ද"** යැයි අසා සිටියේ ය. භික්ෂූන් වහන්සේලා **"ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, මේ ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි බොහෝ ධර්මයන් ඉගෙන ගත්තෙකි. භාග්‍යවතුන් වහන්සේ විසින් කරුණු පසකින් අග්‍ර ස්ථානයෙහි තබන ලද්දෙහි ය.**

**එබැවින් මේ ආනන්ද තෙරුන් වහන්සේ ප්‍රධාන කොට ගෙන සංගායනා කරමු**" යැයි කීහ. ඉන් පසු කාශ්‍යප තෙරුන් වහන්සේ ධර්‍මය විචාරීමට "**සුණාතු මෙ, ආවුසො, සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ආයස්මන්තං ආනන්දං ධම්මං පුච්ඡෙය්‍යං**" යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන ථේරාසනයෙහි වැඩසිටි සේක. ආනන්ද තෙරුන් වහන්සේ ධර්‍මය විසඳීමට "**සුණාතු මෙ, භන්තෙ, සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ආයස්මතා මහාකස්සපෙන ධම්මං පුට්ඨො විස්සජ්ජෙය්‍යං**" යනුවෙන් තමන් වහන්සේ ම සම්මත කරගෙන අසුනින් නැඟිට සිවුර ගැටවටු ගන්වා ගෙන වැඩිහිටි ස්ථවිර භික්ෂූන් වහන්සේලා වැඳ විජිනිපත ගෙන ධර්‍මාසනයෙහි වැඩහුන් සේක. මහා කාශ්‍යප තෙරුන් වහන්සේ ආනන්ද තෙරුන් වහන්සේගෙන් මෙසේ ධර්‍මය විචාල සේක.

"**ඇවැත්නි, ආනන්දය, භාග්‍යවතුන් වහන්සේ බ්‍රහ්ම ජාල සූත්‍රය කොතැනක දී දේශනා කොට වදාළ සේක් ද**" යැයි ඇසීය. ආනන්ද තෙරුන් වහන්සේ, "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, රජගහ නුවරටත් නාලන්ද නුවරටත් අතර අම්බලට්ඨිකා රජ උයනෙහි වූ රාජාගාරයෙහිදී දේශනා කොට වදාළ සේක**" යැයි විසඳුවේ ය. "**කවුරුන් අරබයා දේශනා කොට වදාළ සේක් ද**" යැයි ඇසීය. "**ස්ථවිරයන් වහන්ස, සුප්පිය පරිබ්‍රාජකයා ද බ්‍රහ්මදත්ත මානවකයා ද අරබයා දේශනා කොට වදාළ සේක**" යැයි විසඳුවෙහි ය. මෙසේ බ්‍රහ්ම ජාල සූත්‍රයෙහි නිදානය ද විචාළහ. පුද්ගලයා ද විචාළහ. ඉන් පසු "**ඇවැත්නි, ආනන්දය, භාග්‍යවතුන් වහන්සේ සාමඤ්ඤ ඵල සූත්‍රය කොතැනක දී දේශනා කොට වදාළ සේක් ද**" යැයි ඇසීය. ආනන්ද තෙරුන් වහන්සේ, "**ස්වාමීනි, ස්ථවිරයන් වහන්ස, රජගහ නුවර ජීවක අඹ වනයෙහි දී දේශනා කොට වදාළ සේක**" යැයි විසඳුවෙහි ය. "**කවුරුන් අරභයා දේශනා කොට වදාළ සේක් ද**" යැයි ඇසීය. "**වෛදේහිපුත්‍ර අජාසත්ත රජතුමා අරබයා දේශනා කොට වදාළ සේක**" යැයි විසඳුවෙහි ය. මෙසේ සාමඤ්ඤ ඵල සූත්‍රයෙහි නිදානය ද විචාළහ. පුද්ගලයා ද විචාළහ. මේ ක්‍රමයෙන් සියලු සූත්‍ර පිටකය ද, සියලු අභිධර්‍ම පිටකය ද සංගායනා කළහ. මෙසේ සංගායනා කරන ලද්දේ වූ ධර්‍ම - විනය විවිධාකාරයෙන් බෙදා දැක්වූහ.

# ☸ ධර්ම විනය බෙද දැක්වීම

**මේ සියලු බුද්ධ වචනය රස වශයෙන් එක් වැදෑරුම් වේ. ධර්මය - විනය වශයෙන් දෙ වැදෑරුම් වේ. වචන වශයෙන් තෙවැදෑරුම් වේ. පිටක වශයෙන් ද තෙවැදෑරුම් වේ. නිකාය වශයෙන් පස් වැදෑරුම් වේ. අංග වශයෙන් නව වැදෑරුම් වේ. ධර්මස්කන්ධ වශයෙන් සුවාසූ දහසක් (84,000) වේ.**

### බුද්ධ වචනය රස වශයෙන් එක් වැදෑරුම් වන්නේ කෙසේ ද?

භාග්‍යවතුන් වහන්සේ අනුත්තර සම්මා සම්බෝධියට පැමිණ දම්සක් සූත්‍රය පැවැත්වීමේ පටන් පිරිනිවන් මඤ්චකය දක්වා වදළ සියලු බුද්ධ වචනය, මහා සමුද්‍රයෙහි කොතැනින් ජල බිඳක් ගත්තේ ද එකම ලුණු රසය වන්නා සේ, දහම් පදයක් පාසා ම සත්වයන් නිවනට පමුණුවන ගුණයෙන් යුක්ත බැවින් නිවන් රසයෙන් යුක්ත ය.

### ධර්ම විනය වශයෙන් දෙ වැදෑරුම් වන්නේ කෙසේ ද?

කාය - වාක් සංවරය පිණිස පනවා වදළ සියලු බුද්ධ වචනය **"විනය"** නම් වේ. සිතෙහි පවත්නා කෙලෙසුන්ගේ තදංග විෂ්කම්භන සමුච්ඡේද වශයෙන් ප්‍රහාණය පිණිස දේශනා කොට වදළ අවශේෂ බුද්ධ වචනය **"ධර්ම"** නම් වේ.

### වචන වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේ ද?

බුදු බවට පැමිණ පටිච්ච සමුප්පාද හේතුඵල ධර්මය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මනසිකාර කිරීමෙන් ඇති වූ පහන් සංවේගය වචන බවට පෙරලී ප්‍රථමයෙන් ම බුදු මුවින් පිටවුණු :-

"අනෙක ජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං,
ගහකාරකං ගවෙසන්තො - දුක්ඛා ජාති පුනප්පුනං"

"ගහකාරක දිට්ඨොසි - පුන ගෙහං න කාහසි,
සබ්බා තෙ ඵාසුකා භග්ගා - ගහකූටං විසඞ්ඛතං,
විසඞ්ඛාරගතං චිත්තං - තණ්හානං ඛයමජ්ඣගා"ති.

යන මේ ගාථා දෙක ප්‍රථම බුද්ධ වචනයයි.

පරිනිර්වාණ මඤ්චකයෙහි සැතපී අවසාන වශයෙන් වදළ **"හන්දදානි, භික්ඛවෙ, ආමන්තයාමි වො, වයධම්මා සඞ්ඛාරා, අප්පමාදෙන සම්පාදෙථ"** යන මෙය අන්තිම බුද්ධ වචනයයි. මේ අතරතුර පන්සාළිස් වසක් මුළුල්ලෙහි වදළ සියල්ල මධ්‍යම බුද්ධ වචනයයි.

### පිටක වශයෙන් තෙවැදෑරුම් වන්නේ කෙසේ ද?

ප්‍රථම සංගායනාවේ දී සංගායනාවට නැගුණා වූ ද, නො නැගුණා වූ ද සියල්ල එක් කොට **"උභය ප්‍රාතිමෝක්ෂය, උභය විභංගය, දෙවිසි කඳුවත්, සෝළස පරිවාර"** යන මේ සියල්ල **"විනය පිටකය"** නම් වේ. **"දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අංගුත්තර නිකාය, ඛුද්දක නිකාය"** යන මේ සියල්ල **"සූත්‍ර පිටකය"** නම් වේ. **"ධම්මසංගණී, විභංග, ධාතු කථා, පුග්ගල පඤ්ඤත්ති, කථා වත්ථු, යමක, පට්ඨාන"** යන ප්‍රකරණ සත **"අභිධර්ම පිටකය"** නම් වේ.

### නිකාය වශයෙන් පස් වැදෑරුම් වන්නේ කෙසේ ද?

බ්‍රහ්ම ජාල සූත්‍රයෙහි පටන් දීඝී වූ සූත්‍ර තිස්හතරක් ඇති වර්ග තුනකින් යුත් සංග්‍රහය **"දීඝනිකාය"** නම් වේ. මූලපරියාය සූත්‍රයෙහි පටන් මධ්‍යම ප්‍රමාණයෙන් යුත් සූත්‍ර එකසිය දෙපණසකින් යුක්ත වූ වර්ග පසළොසකින් යුත් සංග්‍රහය **"මජ්ඣිම නිකාය"** නම් වේ. ඔඝතරණ සූත්‍රයෙහි පටන් සත් දහස් සත් සිය දෙසැටක් (7762) සූත්‍ර ඇති සංයුත්ත පනස් හයකින් යුත් සංග්‍රහය **"සංයුත්ත නිකාය"** නම් වේ. චිත්ත පරියාදය සූත්‍රයෙහි පටන් සූත්‍ර නවදහස් පන්සිය සත් පනසකින් (9557) යුත් වර්ග එකසිය සත් සැත්තෑවක් ඇති නිපාත එකොළොසකින් යුත්

සංග්‍රහය **"අංගුත්තර නිකාය"** නම් වේ. එසේම මේ නිකාය සතරට ඇතුළත් නොවූ **"ඛුද්දක පාඨ, ධම්මපද, උදාන, ඉතිවුත්තක, සුත්තනිපාත, විමානවත්ථු පෙතවත්ථු, ථෙරගාථා, ථෙරිගාථා, පටිසම්භිදා, අපදාන, ජාතක, නිද්දේස, බුද්ධවංස, චරියා පිටක"** යන කුඩා ග්‍රන්ථ පසළොස ද, **"විනය පිටකය හා අභිධර්ම පිටකය"** යන දෙක ද ඇතුළත් ව මේ සියල්ල **"ඛුද්දක නිකාය"** නම් වේ. මෙසේ නිකාය වශයෙන් පස් වැදෑරුම් වේ.

**අංග වශයෙන් නව වැදෑරුම් වන්නේ කෙසේ ද?,**

**"සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල" යන මේ නවයයි. මෙය "නවාංග ශාස්තෘ ශාසනය"** නම් වේ.

- **"උභතෝ විභංගය, නිද්දේස, ඛන්ධක, පරිවාර" යන මේවා ද, සුත්ත නිපාතයෙහි ඇතුළත් "මංගල සූත්‍රය, රතන සූත්‍රය, නාලක සූත්‍රය, තුවටක සූත්‍රය"** ආදී සූත්‍ර නාමයෙන් දක්වෙන සියලු බුද්ධ වචනය **"සුත්ත"** නම් වේ.
- සියලු ගාථා සහිත සූත්‍ර **"ගෙය්‍ය"** නම් වේ. සංයුත්ත නිකායෙහි සගාථ වර්ගය ද, අන් සියලු සගාථ සූත්‍රයන් ද මෙහි ඇතුළත් වේ.
- සියලු අභිධර්ම පිටකය ද, සියලු නිර්ගාථක සූත්‍රයන් ද, අන් අංග අටෙහි සංග්‍රහ නොවූ සියලු බුද්ධ වචනය ද **"වෙය්‍යාකරණ"** නම් වේ.
- **"ධම්මපද, ථෙර ගාථා, ථෙරි ගාථා"** යන මේවා ද, සුත්ත නිපාතයෙහි සූත්‍ර සංඛ්‍යාවට නො ගැනෙන ගාථා වශයෙන් ඇති සියල්ල ද **"ගාථා"** නම් වේ.
- සොම්නස් සහගත සිතින් උපන් ගාථාවන්ගෙන් ප්‍රතිසංයුක්ත අසූදෙකක් සූත්‍ර **"උදාන"** නම් වේ.
- **"වුත්තඤ්හෙතං භගවතා"** ආදී ලෙස නැවත දේශනා කරන ලද එක සිය දෙළොසක් සූත්‍ර **"ඉතිවුත්තක"** නම් වේ.

- ❖ අපණ්ණක ජාතකය ආදී කරුණක් ඇති කල්හි ම දේශනා කරන ලද පන්සිය පණසක් පමණ පූර්ව බෝධිසත්ව චර්‍යාවන් "**ජාතක**" නම් වේ.

- ❖ "**චත්තාරොමෙ, භික්ඛවෙ, අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දෙ**" යනාදී ලෙස පැවති සියලු ම ආශ්චර්‍ය අද්භූත ධර්මයන්ගෙන් ප්‍රතිසංයුක්ත සූත්‍ර දේශනා "**අබ්භූතධම්ම**" නම් වේ.

- ❖ "**චූළවෙදල්ල සූත්‍රය, මහාවෙදල්ල සූත්‍රය, සම්මා දිට්ඨි සූත්‍රය, සක්කපඤ්හ සූත්‍රය, සංඛාර භාජනීය සූත්‍රය, මහා පුණ්ණම සූත්‍රය**" ආදී සංවාද ස්වරූපයෙන් නුවණත් සතුටත් ලබමින් විචාරන ලදුව වදාළ සියලු සූත්‍ර "**වෙදල්ල**" නම් වේ.

**ධර්මස්කන්ධ වශයෙන් සුවාසූ දහසක් (84,000) වන්නේ කෙසේ ද?,**

ධර්ම සංගායනාවේ දී ආනන්ද තෙරුන් වහන්සේ විසින් මෙසේ වදරණ ලද්දේ ය.

"**ද්වාසීති බුද්ධතො ගණ්හිං - ද්වෙ සහස්සානි භික්ඛුතො,**
**චතුරාසීති සහස්සානි - යෙ මෙ ධම්මා පවත්තිනො**"

"**මම, භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙඅසූදහසක් උගතිමි. සැරියුත් මුගලන් ආදී මහරහතන් වහන්සේලා සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙදහසක් උගතිමි. මෙසේ මාගේ සිතෙහි ධරන්නා වූ ධර්මය ප්‍රමාණ වශයෙන් සුවාසූ දහසකි**" යැයි වදළේ ය.

එහි එක් අනු සන්ධියක් ඇති සූත්‍රයක් එක ධර්මස්කන්ධයකි. අනු සන්ධි බොහෝ ඇති සූත්‍රයන්හි ඒ අනු සන්ධි ගණනින් ධර්මස්කන්ධ ගණන් ගත යුතුය. දෙවියන් විසින් "**කති ඡින්දෙ කති ජහෙ**" යනාදී ලෙස ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ දී ඒ ප්‍රශ්න ගාථාවක් එක ධර්මස්කන්ධයකි. එයට භාග්‍යවතුන් වහන්සේ "**පඤ්ච ඡින්දෙ පඤ්ච ජහෙ**" යනාදී ලෙස වදාළ පිළිතුරු ගාථාව එක ධර්මස්කන්ධයකි. අභිධර්මයෙහි එක දුක මාතිකා, තික මාතිකාවන් බෙදීම ද, එක චිත්තවාර බෙදීම ද, එක ධර්මස්කන්ධ

වේ. විනයෙහි වස්තු ඇත, මාතෘකා ඇත, පද භාජනීය ඇත, අන්තරාපත්ති ඇත, ආපත්ති ඇත, අනාපත්ති ඇත, තික පරිච්ඡේද ඇත. එහි එක කොට්ඨාශ එක එක ධර්මස්කන්ධ වේ. මෙසේ සියල්ල එකතුව ධර්මස්කන්ධ වශයෙන් සුවාසූදහසකි (84,000).

## ❄ අග්ගඤ්ඤ සූත්‍ර සංගායනාව

පඤ්චසතික සංගායනාවේ දී මූලාසනයෙහි වැඩසිටි මහා කාශ්‍යප මහරහතන් වහන්සේ අසන සේක් **"ආනන්දය, තථාගතයන් වහන්සේ මෙම අග්ගඤ්ඤ සූත්‍රය කොතැනකදි දේශනා කළ සේක් ද?"** ධර්මාසනයෙහි වැඩ සිටියා වූ ආනන්ද මහරහතන් වහන්සේ එය විසඳන සේක් **"ස්වාමීනි කාශ්‍යප ස්ථවිරයන් වහන්ස, සැවැත් නුවර මිගාරමාතු ප්‍රාසාදය නම් වූ පූර්වාරාමයෙහි දී දේශනා කොට වදාළ සේක"** යැයි කීවේ ය. මහා කාශ්‍යප රහතන් වහන්සේ **"ආනන්දය, කවුරුන් අරභයා වදාළ සේක් ද"** යැයි ඇසූවේ ය. ආනන්ද තෙරුන් වහන්සේ **"ස්වාමීනි කාශ්‍යප ස්ථවිරන් වහන්ස, වාසෙට්ඨ භාරද්වාජ යන බුදු සසුනෙහි අලුත පැවිදි වූ නවක සාමණේරයන් වහන්සේලා දෙනම අරභයා වදාළ සේක"** යැයි කීවේ ය. මහා කාශ්‍යප මහරහතන් වහන්සේ **"කුමන කරුණක් හේතුකොටගෙන වදාළ සේක් ද"** යැයි ඇසුවේ ය. ආනන්ද තෙරුන් වහන්සේ **"ස්වාමීනි ස්ථවිරයන් වහන්ස, එම සාමණේරයන් වහන්සේලා දෙනම භාග්‍යවතුන් වහන්සේගෙන් ධර්ම කථාවක් ඇසීමේ කැමැත්තෙන් පැමිණි විට දේශනා කොට වදාළ සේක"** යැයි කීවේ ය.

බුද්ධ උපස්ථායක වූ ධර්ම භාණ්ඩාගාරික ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී ඉගෙන ගන්නා ලද මේ සූත්‍රය සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගත වූ තැන දී මහා කාරුණික වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ ගේ අධිෂ්ඨානය පරිදි මේ උතුම් සද්ධර්මය වේනෙය්‍ය ජනයාගේ ප්‍රයෝජනය පිණිස බොහෝ කලක් පැවැත්මට භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී ඉගෙන ගත් බව දක්වීමට මෙසේ ඉදිරිපත් කළේ ය. එහි පිළිවෙළ කථාව මෙසේ ය.

## ☸ නිසි බුද්ධෝපස්ථායෙකු නොවීම

ප්‍රථම බෝධිය වූ විසි වර්ෂය තුළ තථාගතයන් වහන්සේට නිත්‍ය උපස්ථායකයෙකු නොවී ය. ඒ කාලපරිච්ඡේදයෙහි දී **"නාගසමාල, නාගිත, උපවාන, සුනක්ඛත්ත, චුන්ද සාමණේර, සාගත, රාධ, මේඝිය" යන තෙරුන් වහන්සේලා ද ඇතැම් විටෙක "ආනන්ද තෙරනුවෝ"** ද උපස්ථාන කළහ.

එක් දිනක් භාග්‍යවතුන් වහන්සේ, නාගසමාල තෙරුන් වහන්සේ උපස්ථායක කොට දීඝී මාර්ගයට පිළිපන්නේ දෙමන් සන්දියකට පැමිණ, එයින් එක් මගකින් වැඩි සේක. එවිට නාගසමාල තෙරුන් වහන්සේ **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, අපි මේ මගින් වඩිමු"** යැයි කීවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ **"නැත මහණ, මා විසින් මේ මාර්ගයෙන් යා යුතුය"** යැයි වදාළ සේක. මෙසේ භාග්‍යවතුන් වහන්සේ තුන් වතාවක් වදාළ නමුත් නාගසමාල තෙරණුවෝ **"එසේ නම් භාග්‍යවතුන් වහන්ස, පාත්‍ර චීවර ගත මැනව"** යැයි කියා භාග්‍යවතුන් වහන්සේ ගේ පාත්‍ර චීවර බිම තබා ගියේය. පසුව භාග්‍යවතුන් වහන්සේ තම පාත්‍ර චීවර ගෙන එකලාව වැඩි සේක. අන් මගින් ගිය නාගසමාල තෙරුන් වනයෙහි දී සොරුන්ට හසු වූහ. පාත්‍ර චීවර ද පැහැර ගත්හ, හිස ද පැලූහ. ඉන් පසු තෙරණුවෝ **"මට භාග්‍යවතුන් වහන්සේ හැර අන් පිහිටක් නැත"** යැයි සිතා භාග්‍යවතුන් වහන්සේ සොයා ආයේ ය. භාග්‍යවතුන් වහන්සේ මේ කිම්ද යැයි ඇසූ සේක. තෙරණුවෝ සිදු වූ සියල්ල කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ **"මහණ, ඔය කරුණ දැනගෙනම ඒ මගින් යෑම වැළකුවෙමි"** යැයි වදාළ සේක.

එසේම තවත් දිනක භාග්‍යවතුන් වහන්සේ මේඝිය තෙරුන් වහන්සේ උපස්ථායකයෙකු වශයෙන් කැඳවාගෙන පාචීනවංශ මුව වනයෙහි ජන්තු නම් ගමට වැඩි සේක. එහි පිඬුසිඟා ගිය මේඝිය තෙරුන් වහන්සේ අලංකාර වූ අඹ වනයක් දැක භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ මෙසේ කීවේ ය. **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ ගේ පාත්‍ර චීවර බාර ගන්නා සේක්වා. මම මේ වනයට ගොස් මහණ දම් පුරමි"** යැයි කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ

තුන් වතාවක් ම වැළකූ නමුත් ගියේ ය. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ ම තම පාත්‍ර චීවර රැගෙන එකලාව ම වැඩි සේක. තෙරණුවෝ ඒ අඹ වනයට ගොස් භාවනාවට පටන් ගත්තේ ය. එහෙත් සුළු වේලාවකින් ම අකුසල විතර්කයන්ගෙන් පීඩිත ව මට භාග්‍යවතුන් වහන්සේ හැර අන් පිහිටක් නැතැයි සිතා භාග්‍යවතුන් වහන්සේ සොයා ආයේ ය. භාග්‍යවතුන් වහන්සේ "**මේඝිය, මම ඔය කරුණ දැනගෙනම ඒ ගමන වැළකුයෙමි**" යැයි වදාළ සේක.

## ☸ නිත්‍ය උපස්ථායෙකු පත් කර ගැනීම

පසු කළෙක බුද්ධත්වයෙන් විසිවන වර්ෂයෙහි දී සැවැත්නුවර ජේතවනාරාමයට වැඩියා වූ භාග්‍යවතුන් වහන්සේ, අග්‍ර ශ්‍රාවක, අසූ මහා ශ්‍රාවක මහරහතන් වහන්සේලා ප්‍රධාන විශාල භික්ෂූන් වහන්සේලා පිරිසක් පිරිවරා උතුම් බුද්ධාසනයෙහි වැඩ හිඳිමින්, මෙසේ වදාළ සේක. "**මහණෙනි, මම දැන් වයෝවෘධයෙමි. මට උපස්ථානයට පැමිණෙන ඇතැම් භික්ෂූන් වහන්සේලා මේ මගින් යමු යැයි කී විට, නැත භාග්‍යවතුන් වහන්ස, මේ මගින් යමු යැයි කියා මගේ පාත්‍ර - චීවර බිම දමා යති. එබැවින් මා හට නිත්‍ය උපස්ථායකයෙකු සම්මත කෙරේවා**" යැයි භික්ෂු සංඝයාට පැවරූ සේක. එවිට මහා සංඝයා හට මහත් සංවේගයක් ඇතිවූහ.

එවේලෙහි සැරියුත් මහරහතන් වහන්සේ නැගිට චීවරය ගැට වටු කොට පොරවා ගෙන භාග්‍යවතුන් වහන්සේට අභිවාදනය කොට "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ ම ප්‍රාර්ථනා කරගෙන ඒකාසංඛ්‍යා කල්ප ලක්ෂයක් පෙරුම් දම් පිරුවෙමි. මා වැනි වූ මහත් ප්‍රඥාවන්තයෙකු උපස්ථානයට සුදුසු නොවන්නෙහි ද? මම භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරමි**" යැයි කීවේ ය.

භාග්‍යවතුන් වහන්සේ එය අසා "**කම් නැත සාරිපුත්‍රය, නුඹ යම් දිශාවක වාසය කරන්නේ ද, ඒ දිශාව නොසිස් ය. එබැවින් ඔබගෙන් උවටැන් කරවා ගැනීමක් අවශ්‍ය නැත**" යැයි ප්‍රතික්ෂේප කළහ. මෙසේ මුගලන් මහරහතන් වහන්සේ, මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ආදී

මහරහතන් වහන්සෙලා ද, වෙන වෙනම උපස්ථානය ඉල්ලා සිටියහ. භාග්‍යවතුන් වහන්සේ ඒ සියලු දෙනා වහන්සේගේ ම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ සේක. එසේ වුව ද ආනන්ද තෙරුන් වහන්සේ නිහඬව ම සිටියේ ය. එවිට අන් භික්ෂූන් වහන්සේලා ආනන්ද තෙරුන් වහන්සේ අමතා **"ආනන්දය, ඔබ භාග්‍යවතුන් වහන්සේ වෙතින් උපස්ථායක තනතුර ඉල්ලා ගනු ව"** යැයි කීහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ **"ඇවැත්නි, ඉල්ලා ගත් තනතුරු කෙබඳු වේ ද? කිම, භාග්‍යවතුන් වහන්සේ මා නොදක්නා සේක් ද, භාග්‍යවතුන් වහන්සේ කැමති වන සේක් නම් ආනන්දය, මට උපස්ථාන කරන්න"** යැයි වදරණ සේක යැයි කීවේය. එවිට භාග්‍යවතුන් වහන්සේ **"මහණෙනි, ආනන්ද අනුන් විසින් උත්සාහ කළ යුත්තෙකු නොවේ. තමන් ම ඒ බව දැන මට උපස්ථාන කරන්නේ ය"** යැයි වදාළහ. එවිට භික්ෂූන් වහන්සේලා **"ආනන්දය, නැගී සිටින්න දස බලධාරීන් වහන්සේ ගේ උපස්ථානය ඉල්ලන්න"** යැයි කිහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ නැඟිට චීවරය ගැටවටු ගන්වා පොරවා ගෙන භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ ඇඳිළි බැඳ ප්‍රතික්ෂේප කිරීම් සතරක් ඉල්ලා සිටියේ ය.

## ☸ ප්‍රතික්ෂේප සතර

1. භාග්‍යවතුන් වහන්සේට ලැබෙන චීවර මට නො දෙන සේක්වා.
2. භාග්‍යවතුන් වහන්සේට ලැබෙන පිණ්ඩපාතය මට නො දෙන සේක්වා.
3. භාග්‍යවතුන් වහන්සේ සමග එක ගඳකිළියෙහි විසිමට මට අවසර නො දෙන සේක්වා.
4. භාග්‍යවතුන් පිළිගත් ආරාධනාවලට මා කැඳවා ගෙන නො යන සේක්වා.

**"භාග්‍යවතුන් වහන්සේ මේ ප්‍රතික්ෂේප සතර පිළිගන්නා සේක් නම් මම උපස්ථාන කරමි"** යැයි කීවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ, **"ආනන්දය, නුඹ කවර ආදීනවයක් දැක මේ ප්‍රතික්ෂේප සතර ඉල්ලන්නෙහි ද"** යැයි අසා වදාළහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ,

**"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඇතැම් කෙනෙක් ආනන්ද තෙරුන් ලාභ අපේක්ෂාවෙන් භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරන්නේය යැයි මේ වචනය කියන්නේ ය. එබැවින් මේ ප්‍රතික්ෂේප සතර ඉල්ලමි"** යැයි කීවේ ය. නැවත මේ ආයාචනා සතර ද ඉල්ලා සිටියේ ය.

## ☸ ආයාචනා සතර

1. මා විසින් බාර ගත් දන ආරාධනාවලට භාග්‍යවතුන් වහන්සේ වඩින සේක්වා.
2. භාග්‍යවතුන් වහන්සේ දැකීමට පිටතින් පැමිණෙන පැවිදි ගිහි ආගන්තුකයන් පමා නොවී භාග්‍යවතුන් වහන්සේ වෙත යොමු කරවීමට මට අවසරය දෙන සේක්වා.
3. ධර්මය - විනය පිළිබඳව සැකයක් උපන් විගස ඒ මොහොතෙහි දී ම එය විසඳ ගැනීමට භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණීමට මට අවසරය දෙන සේක්වා.
4. භාග්‍යවතුන් වහන්සේ මා නැති තැනක දී දේශනා කරන ධර්මයන් නැවත මා හට දේශනා කරන සේක්වා.

**"භාග්‍යවතුන් වහන්සේ මේ ආයාචන සතර පිළිගන්නා සේක් නම් මම උපස්ථාන කරමි"** යැයි කීවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ **"ආනන්දය, නුඹ කුමන ආනිසංසයක් දැක මේ ආයාචන සතර ඉල්ලන්නෙහි ද"** යැයි අසා වදාළහ. එවිට ආනන්ද තෙරුන් වහන්සේ, **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, සැදැහැ ඇති සත්පුරුෂයෝ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි අවකාශ නොලැබ මා හමුවට පැමිණ, ස්වාමීනි! ආනන්ද ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සමග හෙට මාගේ ගෙයි දනට වඩින සේක්වා"** යැයි ආරාධනා කොට යයි. භාග්‍යවතුන් වහන්සේට එයට අවකාශ නැති විට ඒ සත්පුරුෂයන් භාග්‍යවතුන් වහන්සේ හමුවට පමුණුවාලීමටත් සැක දුරුකර ගැනීමටත් අවකාශ ලබති. එසේ නො ලැබුණු කල්හි **"කුමකට නම් මේ ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ ගේ උපස්ථායක වූයෙහි ද, අපට මෙපමණකුදු අනුග්‍රහයක් නැත"** යැයි දෙස් නගන්නේ ය.

තව ද භාග්‍යවතුන් වහන්සේ නැති විටෙක ඇතැම් සත්පුරුෂයෝ මා හමුවට පැමිණ **"ඇවැත්නි, මේ සූත්‍රය, මේ ජාතකය, මේ ගාථාව භාග්‍යවතුන් වහන්සේ කොතැනක දී දේශනා කළ සේක් ද"** යැයි මගෙන් ඇසුව හොත් එය කිව යුතු වන්නේ ය. නොහැකි වුව හොත් **"මේ ආනන්ද තෙරුන් වහන්සේ කුමකට නම් භාග්‍යවතුන් වහන්සේගේ සෙවණැල්ල මෙන් පාත්‍ර - චීවර ගෙන යමින් පසුපස ඇවිද්දෙහි ද? මෙපමණවත් දෙයක් නො දන්නෙහි ද?"** යැයි මා හට දෙස් නගන්නේ ය. එබැවින් මේ ආනිශංස දැක මා නැති තැන දෙසූ ධර්‍මයන් නැවත මා හට දේශනා කරන ලෙස ඉල්ලමි යැයි කීවේ ය. භාග්‍යවතුන් වහන්සේ එම ඉල්ලීම් අට පිළිගෙන උපස්ථායක තනතුර දුන් සේක. එතැන් පටන් ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ නිත්‍ය උපස්ථායක වූයේ ය.

මේ ආනන්ද තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට උපස්ථායක වීමට කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි පුරන ලද පාරමිතා ගුණ ඇති මහෝත්තමයෙකි. මේ වරය ලත් දින පටන් ඇල් පැන් - උණු පැන් - දැහැටි සපයමින්, පිට පිරිමදිමින්, පාද පිරිමදිමින්, ගඳකිළි පිරිවෙන අමදිමින්, මේ වේලාවෙහි භාග්‍යවතුන් වහන්සේට මේ දෙය ලැබෙන්නට වටී ය, මේ වේලාවෙහි මේ දෙය කරන්නට වටී ය යැයි දවස මුළුල්ලෙහි ම බුද්ධෝපස්ථානයෙහි යෙදී සිටියේ ය. එසේම රාත්‍රී කාලයෙහි දඬු වැට පහනක් ගෙන නව වාරයක් භාග්‍යවතුන් වහන්සේ සැතපුණු ගඳකිළිය වටා ඇවිදින්නේ ය. මෙසේ කරන්නේ භාග්‍යවතුන් වහන්සේ මා ඇමතූ විටෙක මා නිදි බරව සිටියේ නම්, එවිට ප්‍රති උත්තර දීමට නොහැකි වන්නේ ය යැයි ඒ පහන අතින් නුමුදා ම රෑ පහන් කරන්නේ ය. මෙසේ මහත් ගුණ ඇති ආනන්ද තෙරුන් වහන්සේ මේ බුදු සසුනෙහි **"බහුශ්‍රැත භික්ෂූන් අතර අග්‍ර වූහ. සතිමන්ත භික්ෂූන් අතර අග්‍ර වූහ. ගතිමන්ත භික්ෂූන් අතර අග්‍ර වූහ. ධෘතිමන්ත භික්ෂූන් අතර අග්‍ර වූහ. බුද්ධ උපස්ථායක භික්ෂූන් අතර අග්‍ර වූහ"**. මෙසේ අග්‍ර තානාන්තර පසකින් පිදුම් ලැබූහ.

ඒ මේ ආනන්ද තෙරුන් වහන්සේට එක් වරකට බණවර හැටක් (ගාථා පසළොස් දහසක්) ධාරණය වන්නේ ය. එය දීඝ නිකාය තරම් වූ ප්‍රමාණයකි. වසර විසි පහක් ම භාග්‍යවතුන් වහන්සේ පසුපස යමින්

බොහෝ ධර්මයන් ඉගෙන ගත්තේ ය. ඒ නිසාම පඤ්චසතික සංගායනාවෙහි දී ආනන්ද තෙරණුවෝ :-

**"ද්වාසීති බුද්ධතො ගණ්හිං - ද්වෙ සහස්සානි භික්ඛුතො,**
**චතුරාසීති සහස්සානි - යෙ මෙ ධම්මා පවත්තිනො"**

යනුවෙන් **"මම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙයාසූ දහසක් (82,000) උගතිමි. සැරියුත් මුගලන් ආදී මහරහතන් වහන්සේලා සමීපයෙහි දී ධර්මස්කන්ධ දෙදහසක් උගතිමි. මෙසේ මාගේ සිතෙහි ධරන්නා වූ ධර්මය ප්‍රමාණ වශයෙන් සුවාසූ දහසකි (84,000)"** යැයි වදළේ ය. මෙසේ ත්‍රිපිටක බුද්ධ වචනයෙන් බොහෝ දෑ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී ඉගෙන ගන්නා ලද මේ ආනන්ද තෙරුන් වහන්සේ එම ධර්ම සංගීතියෙහි දී **"අග්ගඤ්ඤ සූත්‍රය"** නමින් මෙසේ සංගායනාවට නැගූහ. එහි අර්ථ විවරණය මෙසේ ය.

**"එවං මෙ සුතං"** මා විසින් මෙසේ අසන ලදී. මෙය වනාහි මා විසින් අවබෝධ නොකරන ලද්දකි. ප්‍රත්‍යක්ෂ නොකරන ලද්දකි. යනුවෙන් තමන් වහන්සේ අත්හැර, මෙය මා විසින් භාග්‍යවතුන් වහන්සේ වෙතින් ම උගත්තෙමි යැයි අවධාරණය කොට දක්වන්නේය.

**"එවං"** යනුවෙන් තථාගතයන් වහන්සේ විසින් මාගේ ශාසනයෙහි බහුශ්‍රැත භික්ෂූන් අතර ද, යහපත් පැවතුම් ඇති භික්ෂූන් අතර ද, මනා සිහිය ඇති භික්ෂූන් අතර ද, ධාරණ ශක්තිය ඇති භික්ෂූන් අතර ද, උපස්ථායක භික්ෂූන් අතර ද මේ ආනන්ද තෙරුන් වහන්සේ අග්‍ර යැයි වදළ බුද්ධ වචනයට අනුරූප වූ තමන්ගේ ධාරණ ශක්තිය දක්වමින් **"මා විසින් මෙසේ අසන ලදී. එය ද අර්ථ වශයෙන් ද ව්‍යඤ්ජන වශයෙන් ද නො අඩු ය. නො වැඩි ය. මෙය මෙසේ ම මිස අන් අයුරකින් නො දත යුතුය"** යැයි සත්වයන් ගේ ඇසීමේ කැමැත්ත උපදවයි.

**"මෙ"** යනු මා විසින් යනුයි. භාග්‍යවතුන් වහන්සේ යම් සේ දේශනා කළ සේක ද, එසේම මා විසින් අඩු වැඩි නොකර වෙනස් නොකර මා විසින් ම භාග්‍යවතුන් වහන්සේ වෙතින් උගත්තෙමි

යනුවෙන් දක්වමින් භාග්‍යවතුන් වහන්සේ මේ ධර්මය දේශනා කළ ධර්ම ශාස්තෲවරයාණන් වහන්සේ වශයෙන් දක්වා තමන් ශ්‍රාවකයෙකු කොට දක්වයි.

"සුතං" යනු අසන ලදී යනු යි. ඒ ඇසීම වනාහි අනිකෙකු භාග්‍යවතුන් වහන්සේගෙන් අසා දැනගෙන මට කීවා නොවේ. භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී මගේ කණින් ම අවධානය යොමු කොට මනා ධර්ම ගෞරවයෙන් ම අසා දැන ගත්තෙමි යැයි දක්වයි.

එසේම මේ ආනන්ද තෙරුන් වහන්සේ වනාහි මිහිරි හඬින් ධර්මදේශනා කරන්නා වූ බහුශ්‍රැත වූ විචිත්‍ර ධර්ම කථිකයෙකි. මේ ආනන්ද තෙරුන් වහන්සේ මෙසේ වාක් චාතුර්යයෙන් යුක්තව මහේශාක්‍ය මහරහතන් වහන්සේලා ඉදිරියෙහි මේ උතුම් බුද්ධ වචනය සංගායනා කරන කල්හි එය දැකීමට ශ්‍රවණය කිරීමට අප්‍රමාණ දෙවියෝ ද බ්‍රහ්මයෝ ද රැස් වූහ. ඔවුන් අතරින් ඇතැම් දෙවියන්ට මෙබඳු සැකයක් උපන්හ.

**"තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ද ශාක්‍ය වංශිකයෙකි. මේ ආනන්ද තෙරුන් වහන්සේ ද ශාක්‍ය වංශිකයෙකි. භාග්‍යවතුන් වහන්සේ ගේ සුළු පියා වූ අමිතෝධන ශාක්‍ය රජතුමාගේ පුත්‍රයා ය. රූපයෙන් ද ස්වරයෙන් ද ශෝභමානය. භාග්‍යවතුන් වහන්සේගේ දයාදය ද ලබති. භාග්‍යවතුන් වහන්සේ ම මේ ආනන්ද තෙරුන් වහන්සේ කරුණු පසකින් අග්‍ර තැන්හි තැබූහ. ඓශ්වර්ය ධර්ම සතරකින් යුක්ත වූවෙකු ද වෙති. සැමට ප්‍රියමනාප වූයේ වේ. දැන් භාග්‍යවතුන් වහන්සේ ගේ ධර්ම දයාදය ලැබ බුදු වූයේ ය"** යැයි සිතූහ. එබැවින් ආනන්ද තෙරුන් වහන්සේ දෙවියන් තුළ වූ ඒ සිත තම සිතින් දැන එසේ වූ අද්භූත වූ ගුණ සම්භාවනාව නො ඉවසන සුළු වූයේ දෙවියන්ට ඇති වූ ඒ රැවටුණු අදහස් දුරු කරමින් ශාස්තෲන් වහන්සේට ඉමහත් ගෞරවය දක්වා තමන්ගේ ශ්‍රාවක බව **"එවං මෙ සුතං"** යනුවෙන් ප්‍රතිඥා කළේ ය.

තවද "එවං මෙ සුතං" යනුවෙන් **"මා විසින් මේ ධර්මය චතු වෛශාරද්‍ය විශාරද වූ, දසබල ධාරී වූ, උත්තම ස්ථානයෙහි පිහිටියා වූ, සිංහනාද සමාන නාද ඇත්තා වූ, සියලු සත්වයන්ට උත්තම වූ, ධර්මේශ්වර වූ, ධර්මරාජ වූ, ධර්මාධිපති වූ, ධර්මද්වීප වූ, ධර්මසරණ වූ, සද්ධර්ම**

**වර චක්‍රවර්ති වූ, සම්මා සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ ගේ සම්මුඛයෙන් පිළිගන්නා ලද්දේ වෙමි. මෙහි අර්ථයෙහි හෝ ධර්මයෙහි හෝ පදයෙහි හෝ ව්‍යඤ්ජනයෙහි හෝ සැකයක් හෝ විමතියක් හෝ නොකළ යුතුය**" යැයි සියලු දෙව් මිනිසුන් ගේ මේ ධර්මයෙහි අශ්‍රද්ධාව නසන සේක. ශ්‍රද්ධාව උපදවන සේක.

"**එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ**" එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විශාඛා මහ උපාසිකාව විසින් සාදවා පූජා කරන ලද පූර්වාරාමයෙහි වැඩසිටි සේක.

මෙහි "**එකං සමයං**" යන මෙහි සංවත්සර, ඍතු, මාස පක්ෂ දින පූර්වාහ්නය, මධ්‍යාහ්නය, අපරාහ්නය ප්‍රථම යාමය, මධ්‍ය යාමය, පශ්චිම යාමය වශයෙන් කාලය දැක්වීම "**සමය**" නම් වේ. මෙහි සමය බොහෝ වේ. පූරිත පාරමිතා ගුණ ඇති මහ බෝසතාණන් වහන්සේ දසදහසක් ලෝකධාතු වැසි දිව්‍ය බ්‍රහ්මයන් ගේ ආරාධනයෙන් පඤ්ච මහා විලෝකනයන් බලා සුදුසු මවු කුසෙහි පිළිසිඳ ගැනීම "**ගර්භාවක්‍රාන්ති සමය**" නම් වේ. උයනක දී මවු කුසෙන් බිහි වීම "**ජාති සමය**" නම් වේ. එතැන් පටන් සතර පෙර නිමිති දැකීම දක්වා ගිහි ව විසීම "**සංවේග සමය**" නම් වේ. පුතෙකු උපන් දම පැවිදි රුවක් දැක මහාභිනිෂ්ක්‍රමණය කිරීම "**අභිනිෂ්ක්‍රමණ සමය**" නම් වේ. අඩුම තරමින් සත් දිනක් හෝ දුෂ්කර ක්‍රියා කිරීම "**දුෂ්කර ක්‍රියා සමය**" නම් වේ. බෝධි මූලයට වැඩ අපරාජිත පර්‍ය්‍යංකයෙහි වැඩ හිඳිමින් මාර පරාජය කිරීම "**මාරවිජය සමය**" නම් වේ. ඒ එකම පර්‍ය්‍යංකයෙහි වැඩ හිඳිමින් තුන් යම් රාත්‍රියෙහි පුර්වේනිවාස ඥානය, දිව්‍යශ්‍රෝත ඥානය, ආශ්‍රවක්ෂය ඥානය ලැබීමත් සමගම සර්වඥතාඥාන ඥාන ප්‍රතිලාභයෙන් අභිසම්බෝධියට පැමිණීම "**අභිසම්බෝධි සමය**" නම් වේ. සත් සති ගත කිරීම ද, නිරෝධ සමාපත්ති, ඵල සමාපත්ති, ධ්‍යාන සමාපත්ති සුව විඳීම "**දිට්ඨධම්ම සුඛවිහරණ සමය**" නම් වේ. බ්‍රහ්මාරාධනාවෙන් දම්සක් සූත්‍රය දෙසීමෙහි පටන් ධර්මදේශනා කිරීම "**ධර්මදේශනා සමය**" නම් වේ. සූවිසි කෝටි ලක්ෂ වාරයක් නවානුපූර්ව විහාර සමාපත්ති සුව විඳ එයින් නැඟී සිට අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පරිනිර්වාණයට පැමිණීම "**පරිනිර්වාණ සමය**" නම් වේ.

ඒ සමයන් අතර මෙහි **"එකං සමයං"** යනු එක් ධර්ම දේශනා සමයක දී යනුයි. ඒ දේශනා සමය ද, **"ඤාණ කෘත්‍ය, කරුණා කෘත්‍ය"** සමයන් අතර **"කරුණා කෘත්‍ය"** සමයකි. **"ආත්ම හිත ප්‍රතිපත්ති සමය, පරහිත ප්‍රතිපත්ති සමය"** යන ප්‍රතිපත්ති සමයන් අතර **"පරහිත ප්‍රතිපත්ති"** සමයකි. රැස් වූ විට කළ යුතු වූ **"ධර්මකථා සමය, දේශනා ප්‍රතිපත්ති සමය"** යන සමයන් අතර **"ධර්මකථා" සමයකි.** මේ සියල්ල අතරින් මෙය **"දේශනා සමයකි".**

**"භගවා"** යනු ගුණයෙන් විශිෂ්ට වූ සත්වයන්ට උත්තම වූ ලෞකික ලෝකෝත්තර සැප නිපදවන්නා වූ දන සීලා දී පාරමී භාවයට පැමිණි කුසල් ඇති බැවින් ද, දස ක්ලේශ, අකුශල මූල, දුෂ්චරිත ආදී අනේක විධ වූ ක්ලේශයන් බිඳ හළ බැවින් ද, ඓශ්චර්ය්‍ය භාග්‍යා දී කීර්ති ප්‍රශංසාවට ගෞරවයට ලක්වන ගුණයෙන් යුක්ත වන බැවින් ද, අවබෝධ කළ යුතු වූ සියලු ධර්ම කුසල ත්‍රිකා දී ලෙස බෙදූ දැක් වූ බැවින් ද **"භගවා"** නම් වන සේක.

තවද මෙහි **"එවං මෙ සුතං"** යන වචනයෙන් ඇසූ පරිදි ඉගෙන ගත් පරිදි ධර්මය දේශනා කරන්නා වූ දේශකයෝ භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම ශරීරය පමණක් ම දේශනා කරති. එබැවින් **"මේ ධර්මය වනාහි ශාස්තෘවරයෙකු නොමැති එකක් නොවේ. මේ නුඹලාගේ ශාස්තෘවරයාය"** යැයි භාග්‍යවතුන් වහන්සේ නො දැකීමෙන් රූපකයෙහි පිරිනිවීම දක්වයි. එමගින් **"මේ ආර්ය්‍ය ධර්මය දේශනා කරන ලද්දූ වූ දසබල ධාරී වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ ද, වජ්‍ර සමාන කයක් ඇත්තේ නමුදු පරිනිර්වාණයට පත් වූ සේක් නම්, එබඳු ශක්තියක් නැති අන්‍යයන් විසින් දුබල ජීවිත කෙරෙහි කුමන කරුණක් හේතුකොටගෙන ජිවිතාශාව ඉපදවිය යුත්තේ ද"** යැයි ජීවිත මදෙන් මත් වූ ජනතාව සංවේගයට පත් කරයි. ඔවුනට සද්ධර්මයෙහි උත්සාහ උපදවයි. මෙසේ **"එවං"** යන්නෙන් දේශනා සම්පත්තිය ද **"මෙ සුතං"** යන්නෙන් ශ්‍රාවක සම්පත්තිය ද **"එකං සමයං"** යන්නෙන් කාල සම්පත්තිය ද **"භගවා"** යන්නෙන් දේශක සම්පත්තිය ද දක්වයි.

**"සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ"** සැවැත් නුවර සමීපයෙහි වූ විශාඛා මහ උපාසිකාව විසින් සාදවා ආරාමයක්

කොට පූජා කරන ලද පූර්වාරාමයෙහි වැඩසිටි සේක යන මෙහි "**සාවත්ථියං** " යනු මෙනම් නම් ඇති නගරයයි.

ස්වස්ථ ඍෂිවරයා හට වාස භූමිය වූ බැවින් මේ භූමිය "**සාවස්ථි**" නම් විය. මිනිසුන්ට අවශ්‍ය උප භෝග පරිභෝග භාණ්ඩ මෙහි ගබඩා කොට ඇති බැවින් "**සියල්ල ඇත්තේ ය**" යනාර්ථයෙන් සාවත්ථි නම් විය.

මෙසේ සියල්ල පරිපූර්ණ වූ මේ සැවැත් පුරයෙහි එන්න, කන්න, බොන්න ආදී වූ දසවිධ ශබ්දයන්ගෙන් වෙන් නොවූ ආහාර පානාදියෙන් පරිපූර්ණ වූ කොසොල් රට වැසියන්ගේ මේ අග නගරය වනාහි රම්‍ය වූ ද, දර්ශනීය වූ ද, මනෝ රමණීය වූ පුණ්‍ය භූමියක් වූයේ ය. අභිවෘධියෙන් යුක්ත වූ විපුල බවට පත් සාරවත් වූ සමෘධිමත් වූ දෙවියන්ගේ ආලකමන්දව වැනි වූ මේ සැවැත්නුවර උතුම් ය. බුද්ධ කාලයෙහි පසේනදි කොසොල් මහ රජතුමාගේ වාස භූමිය වූයේ ද මෙහි ය. පිහිටීම් වශයෙන් අචිරවතී නදී තීරයෙහි විය. මේ නදිය වක්‍රාකාරව ගලා යන බැවින් නගරයෙහි උතුරු දකුණු දෙදිසාවෙන් ම නදිය විය. බුදුරජාණන් වහන්සේගෙන් ම ධර්මය ශ්‍රවණය කොට මඟ ඵල ලැබුවෝ පන්කෝටියක් වූහ. අනාථපිණ්ඩික සිටුතුමා විශාකා මහෝපාසිකාව වැනියවුන් නිසා මේ නුවර බැබළීමට ගියේය.

"**විහරති**" යනු දිව්‍ය බ්‍රහ්ම ආර්‍ය විහරණයන්ගෙන් යම් විහරණයකින් වාසය කරයි යනුයි. එනම් ගමන් කිරීම සිටීම සැතපීම යන සිව් ඉරියව් පවත්වමින් වාසය කිරීමයි. භාග්‍යවතුන් වහන්සේ බුද්ධත්වයෙන් තුන් වන වර්ෂයෙහි දී මේ සැවැත් නුවරට වැඩි පළමු වතාවෙහි දී ම නව මසක් වැඩසිටි සේක. ඉන් පසු ද හතර වන වස් කාලයෙහි ද, විසි එක් වන වස්කාලයෙහි පටන් සතළිස් හතර වන වස්කාලය අවසන් වීම දක්වා වූ විසිපස් වසරක කාලයක් මේ සැවැත් නුවරම වැඩසිටි සේක.

"**මිගාරමාතුපාසාදෙ**" මිගාරමාතු ප්‍රාසාදයෙහි ය. එහි අනු පිලිවෙල කථාව මෙසේ ය.

## ☸ විශාඛාවගේ උත්පත්තිය

බුදු රජාණන් වහන්සේ ලොව පහළ වූ කාලයෙහි දඹදිව "**අංග, මගධ, කාශි, කොසල, වජ්ජි, මල්ල, චේති, වත්ස, කුරු, පඤ්චාල, මජ්ජ, සූරසේන, අස්සක, අවන්ති, ගාන්ධාර, කාම්බෝජ**" යනුවෙන් මහා ජනපද සොළසක් වූහ. ඒ ජනපදයන් අතර අංග, මගධ නම් ජනපද දෙක බිම්බිසාර මහ රජතුමාට අයත් විය. අංග රටේ අංගුත්තරාප ජනපදයෙහි ඉතා දියුණුවට පත් සශ්‍රීක වූ "**භද්දිය**" නම් නගරයක් විය. ඒ භද්දිය නුවර මහත් පුණ්‍ය සෘද්ධි ඇති "**ජෝතිය, ජටිල, මෙණ්ඩක, පුණ්ණක, කාකවලිය**" යැයි මහ ධන සිටුවරු පස් දෙනෙකු වූහ. එම සිටුවරු "**අමිතභෝගී**"[1] සිටුවරු නම් වූහ. මේ ධන සිටුවරුන් අතර මෙණ්ඩක සිටුතුමා එනුවර ප්‍රධාන සිටුවරයා වූයේ ය.

ඒ මෙණ්ඩක සිටුතුමාට මෙබඳු සෘද්ධියානුභාවයක් වූයේ ය. හිස සෝද නහා කොටු ගෙය හමදවා නිවස ප්‍රධාන දොරටුව සමීපයෙහි හිඳියි. අහසින් සුවඳ හැල් වී ධාරා ඇවිත් ඔහුගේ කොටු ගෙය පුරවයි.

එම සිටුතුමාගේ භාර්‍යාව චන්ද්‍රපදුමා දේවිය ය. එතුමියට මෙබඳු සෘද්ධියානුභාවයක් විය. සහල් නැළි සතරක බතක් හා එකම ව්‍යඤ්ජන ඇතිළියක් ළඟ හිඳ ගෙන දැසිදස් කම්කරුවන්ට ඒ ආහාර බෙදයි. ඇය එම ආසනයෙන් නො නැඟිටින්නේ ද ඒ තාක් ඒ ආහාර බඳුන් හිස් නොවේ.

එම දෙපලට ධනඤ්ජය නම් එකම පුත්‍රයෙකු වූයේ ය. එතුමාට මෙබඳු සෘද්ධියානුභාවයක් විය. කහවණු දහසකින් යුත් පසුම්බියක් ගෙන දැසිදස් කම්කරුවන්ට වැටුප් ගෙවයි. එතුමාගේ අතෙහි ඇති තාක් එම පසුම්බිය හිස් නොවේ.

එම ධනඤ්ජය සිටුතුමාගේ භාර්‍යාව සුමනා දේවිය ය. එතුමියට මෙබඳු සෘද්ධියානුභාවයක් විය. ද්‍රෝණ සතරකින් යුත් වී කූඩයක් ගෙන දැසිදස් කම්කරුවන්ට සය මසක වැටුප් වශයෙන් ඒ වී බෙදයි. ඇය එතැනින් නැඟී නොසිටිනා තාක් ඒ වී කූඩය හිස් නොවේ.

එම නිවසෙහි වැඩ කරන පුණ්ණ නම් දසයාට මෙබඳු සෘද්ධියානුභාවයක් විය. කුඹුරට ගොස් එක් නගුලක් බැඳ සී සාන විට එක් පසක සී විටි සතක් බැගින් සෑවෙයි.

මේ මෙණ්ඩක සිටුතුමාගේ පුත්‍ර වූ ධනඤ්ජය සිටුතුමාගේ දියණිය වූවා විශාකාව ය. මේ විශාඛාව මෙයින් කල්ප ලක්‍ෂයකට පෙර සාර[2] කල්පයෙහි පියුම තුරා භාග්‍යවතුන් වහන්සේගේ ලොව පහළ වූ කාලයෙහි හංසවතී නුවර උසස් කුල ගෙයක ඉපිද වැඩි විය පැමිණ සපිරිවරින් ගොස් බණ අසන්නී ය. එක් දිනක් භාග්‍යවතුන් වහන්සේ ධර්‍ම දේශනාව කෙළවර එක් උපාසිකාවක් තම බුදු සසුනෙහි දයිකාවන් අතර අග්‍ර තනතුරෙහි තබා වදාළ සේක. එය දැක මෙතුමිය ද බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට මහා දන් දී අනාගත බුදු සසුනක එම තනතුර ලැබීමට ප්‍රාර්ථනා කරන ලද්දේ ය.

ඉන් පසු කල්ප ලක්‍ෂයක් දෙව් මිනිස් සැප විඳිමින් ඇවිත් කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ගේ කාලයෙහි කාශි රට කිකී රජතුමාගේ නිවසෙහි උපන්නා ය. එම කසී රජතුමාට "සමණී, සමණගුත්තා, භික්ෂුණී, භික්ඛුදයිකා, ධම්මා, සුධම්මා, සංඝ දසී" යැයි දියණිවරු සත් දෙනාගෙන් සැමට ම බාල සංඝ දසී නමින් උපන්නී මේ විශාඛාව ය. එම කාශ්‍යප බුදු සසුනෙහි දී ද මේ සියලු දෙනාම අවුරුදු විසි දහසක් මුළුල්ලෙහි දනාදී මහත් පින්කම් කොට එයින් ච්‍යුතව බුද්ධාන්තරයක් දෙව් මිනිස් සැප විඳ අපගේ භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ කාලයෙහි "**ඛේමා, උප්පලවණ්ණා, පටාචාරා, ප්‍රජාපතී ගෝතමිය, ධම්ම දින්නා, මහා මායා දේවිය, විශාඛාව**" වශයෙන් මනුලොව උපන්හ. විශාඛාව අංග රට භද්දිය නුවර මෙණ්ඩක සිටුපුත් ධනඤ්ජය සිටුවරයාට දියණිය ව උපන්නා ය.

## ☸ විශාඛාව සෝවාන් ආර්‍ය්‍ය ශ්‍රාවිකාවක් වීම

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් දසවන මස මහත් භික්‍ෂු පිරිසක් පිරිවරා චාරිකා කරන සේක් මේ භද්දිය නුවරට වැඩි සේක. මෙණ්ඩක සිටුතුමා එය අසා තම පුත්‍ර වූ ධනඤ්ජය

සිටුතුමාගේ දියණිය (මිණි බිරිය) වූ සත් හැවිරිදි විශාකාව කැඳවා දියණිය! නුඹට ද මඟුලකි. අපට ද මඟුලකි. නුඹගේ පිරිවර ළඳුරියන් පන්සියය සමගින් රිය පන්සියයක නැඟී දැස්සන් පන්සියයක් පිරිවරන ලදුව භාග්‍යවතුන් වහන්සේට පෙර ගමන් කරව යැයි කීවේ ය. විශාකාව තම සීයාගේ කථාව අසා ඉමහත් සතුටින් තම පිරිවර දැරියන් සමග රිය පන්සියයක නැඟී ගොස් කාරණාකාරණයන් දැනීමෙහි දක්‍ෂ වූ බැවින් රියෙන් බැස පා ගමනින් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ එකත්පසෙක සිටියා ය. භාග්‍යවතුන් වහන්සේ විශාඛාවට චරිත වශයෙන් බලා දහම් දෙසූ සේක. ඇය ඒ ධර්‍ම දේශනාව අසා සෝවාන් ඵලයෙහි පිහිටියා ය. මෙසේ ධර්‍ම චක්ෂුසය ලැබූ විශාඛාව පසු ද දනය පිණිස භාග්‍යවතුන් වහන්සේට ආරාධනා කොට නික්ම ගොස් පසු ද තම නිවසෙහි ප්‍රණීත ලෙස කෑ යුතු බිදිය යුතු දෙය මනාව සකසා බුදු පාමොක් මහ සඟන වළඳවා මෙලෙස අඩ මසක් මහා දන් දුන්නා ය.

## ☸ සාකේත නුවර ඉදි වීම

පසේනදි කොසොල් මහ රජතුමා හා බිම්බිසාර මහ රජතුමා දෙමස්සිනෝ වූහ. පසේනදි කෝසල රජතුමා "**මගේ රාජ්‍යයෙහි අපමණ සම්පත් ඇති කුලයක් නම් නැත. බිම්බිසාර රජතුමාගේ රාජ්‍යයෙහි එසේ වූ අමිතභෝගී මහ ධන සිටුවරු පස් දෙනෙකු ඇත්තාහ. එබැවින් ඒ එක සිටුවරයෙකු කොසොල් රටට ලබා දෙන්න**" යැයි බිම්බිසාර මහ රජතුමාට දැන්වී ය. ඒ කුලයන් සොළවාලීමට මට නොහැකිය යැයි බිම්බිසාර මහ රජතුමා කීවේ ය. මම ඒ එක කුලයක් රැගෙන මිසක් නොයන්නෙමි යැයි කොසොල් රජතුමා කීවේ ය. බිම්බිසාර මහ රජතුමා එම කාරණය ඇමති මඬුල්ල හා කථා කළේ ය. ඇමති මඬුල්ල "**මහ රජ ඒ කුලයක් සොළවාලීම මහ පොළව සෙළවීමක් බඳුය**" යැයි කියා එයට අකමැති ව සිටු පුත්‍රයෙකු යවන ලෙස කීහ. එබැවින් මෙණ්ඩක මහ සිටුතුමාගේ පුත්‍ර වූ ධනඤ්ජය සිටුතුමා කොසොල් රටට ලබා දීමට සම්මත කරගත්හ. බිම්බිසාර මහ රජතුමා ධනඤ්ජය සිටුතුමා මහත් හරසරින් කොසොල් මහ රජතුමාට භාර කළේ ය. කොසොල් මහ රජතුමා ද මහත් සත්කාරයෙන් සිටුතුමා ප්‍රධාන වූ පිරිස කැඳවාගෙන යන අතර ඉතා සවස් වූ බැවින් අතරමඟ සපිරිවරින් නවාතැන් ගත්හ. ධනඤ්ජය සිටුතුමා මේ කාගේ රටක් ද

යැයි කොසොල් රජතුමාගෙන් ඇසී ය. මෙය මගේ රාජ්‍යය යැයි රජතුමා කීවේ ය. සැවත් නුවරට තව කොතෙක් දුර ද යැයි සිටුතුමා ඇසුවේ ය. තව සත් යොදුනක් ඇති බව රජතුමා කීවේ ය. එවිට සිටුතුමා මහ රජතුමාගෙන් අවසර ගෙන එහි ම වාසස්ථාන සකස් කර ගත්තේ ය. පසුව එම භූමිය සැවැත් නුවර සේ වූ මහත් දියුණුවට ගිය නගරයක් විය. එහි සවස නවාතැන් ගත් බැවින් "සාකේත නුවර" නම් විය.

## ☸ විශාඛාවගේ විවාහය

මේ කාලයෙහි සැවැත් නුවර වැසි මිගාර නම් ධන සිටුවරයෙකු විය. එතුමාගේ පුත්‍ර වූ පූර්ණ වර්ධන කුමාරයාට එම සිටුතුමා සුදුසු තැනකින් විවාහයක් කරගන්නා ලෙස කීයේ ය. එතුමා විවාහ දිවියට අකමැති විය. මව්පියන් නැවත නැවත බල කරන බැවින් "කේස කල්‍යාණය, මාංශ කල්‍යාණය, දන්ත කල්‍යාණය, ඡවි කල්‍යාණය, වයස් කල්‍යාණය" යන පඤ්ච කල්‍යාණයෙන් යුත් ස්ත්‍රියක් හැර අන් කෙනෙකු විවාහ කරගන්නේ නැතැයි දන්වා සිටියේ ය. මිගාර සිටුතුමා බ්‍රාහ්මණයන් එකසිය අට දෙනෙකුන් තම නිවසට කැඳවා කිරිබත් අනුභව කරවා පඤ්ච කල්‍යාණයෙන් යුත් ස්ත්‍රීන් ලොව ඇත්තේ ද යැයි ඇසුවේ ය. එසේ ය මහ සිටාණෙනි ඇත යැයි ඔවුහු කීහ.

එවිට එම බ්‍රාහ්මණයන්ගෙන් අට දෙනෙකුන් වෙන් කරවා කහවනු ලක්‍ෂයක් වටිනා රනින් කළ මාලයක් අතට දී ඔවුන් එබඳු ස්ත්‍රියක් සෙවීමට යැවුවේ ය. ඔවුහු කොසොල් රට බොහෝ තැන්වල ඇවිද එබඳු ස්ත්‍රියක් සොයා ගත නොහැකි ව ආපසු එන ගමනෙහි දී නැකත් සැණකෙළියක් දවසක සාකේත නුවරට පැමිණ ගං ඉවුරක ශාලාවක සිටියහ. එදින සොළොස් හැවිරිදි පමණ වූ විශාකාව තම පිරිවර කාන්තාවන් සමග දිය නාන්නට එම ගං ඉවුර වෙත පැමිණියහ. ඒ මොහොතේ මහත් වැස්සක් වසින්නට විය. විශාකාව ගේ පිරිවර ස්ත්‍රීහු එම වැස්සෙන් නො තෙමෙනු පිණිස එම ශාලාව වෙත වේගයෙන් දුව ආහ. විශාකාව වනාහි ස්ත්‍රී ලීලාව නො ඉක්මවා ඇත් ගමනින් සෙමින් තෙමෙමින් පැමිණියා ය. එම බ්‍රාහ්මණයෝ විශාකාව

එසේ එනු දැක මහා පිනැති දැරියක් එන්නී ය යැයි කියා බලා සිට ඇයගේ සිරුරෙහි පිහිටි "**කේශ කල්‍යාණය, මාංශ කල්‍යාණය, ඡවි කල්‍යාණය, වයස් කල්‍යාණය**" යන ලක්ෂණ සතර දැක "**දන්ත කල්‍යාණය**" දකිනු කැමති ව විශාකාව සමග කථාවක් ඇති කර ගැනීමට සිතා "**අපේ මේ දුව බොහොම අලසය, මැයගේ හිමියා කාඩි හොදි ටිකක් වත් ලබයි නම් එය මහ පුදුමයකි. ඒකාන්තයෙන් ඔහු හිඟන්නෙකු බවට පත් වන්නේ ය. මෙබඳු අලස ස්ත්‍රීන් ඉන්න නිවස කෙසේ නම් වැඩිදියුණු වන්නේ ද**" යැයි කීහ.

එය ඇසූ විශාකාව "**පියවරුනි! එසේ නො කියනු මැනවි. මම මේ සියලු ස්ත්‍රීන්ට වඩා බලගතු වෙමි. පියවරුනි! මම කරුණු දෙකක් නිසා නො දිවුවෙමි. එයින් පළමුවැන්න නම් මේ ලෝකයෙහි සතර දෙනෙකු දුවන කල්හි අශෝභන වෙති.**

1. **ඔටුනු පැළඳි රජතුමා සර්වාභරණයන්ගෙන් සැරසී දුවන කල්හි නො හොබී.**
2. **රජුගේ මඟුල් ඇතු හස්තාභරණයන්ගෙන් සැරසී දුවන කල්හි නො හොබී.**
3. **පැවිද්ද පාත්‍ර චීවර ධරව දුවන කල්හි නො හොබී.**
4. **ස්ත්‍රිය දුවන කල්හි නො හොබී.**

**අනෙක් කරුණ නම් ස්ත්‍රිය වනාහි වෙළඳ භාණ්ඩයක් වැනි ය. අප දුවන කල්හි පය පැකිළ හෝ හැඳි වස්ත්‍රය පැකිළී වැටී අතක් හෝ පයක් බිඳී ගියේ වේ ද, ඒ හේතුවෙන් යම් ආබාධයක් හෝ ශරීර විකෘතියක් වේ ද ඒ හේතු කොට පළුදු වූ භාණ්ඩයක වටිනාකම අඩු වන්නා සේ එම ස්ත්‍රියගේ ද වටිනාකම අඩු වන්නේ ය. එබඳු වූ ස්ත්‍රිය බාර ගන්නට කෙනෙකු කැමති නොවන්නේ ය. එයින් වන්නේ අපගෙන් මව්පිය සහෝදරාදීන්ට උපකාරයක් පිහිටක් නොවී ඔවුනට අප පෝෂණය කරමින් දිවිය පුරා කරදර විඳීමට ය. මේ කරුණු හොඳින් දන්නා බැවින් මම නො දිවුවෙමි**" යැයි කීවා ය.

රිදී සීනුවක නාදයක් බඳු වූ විශාඛාව ගේ ඒ මධුර කථාවෙන් ද, දන්ත කල්‍යාණය දැකීමෙන් ද අතිශයින් පැහැදුණු ඒ බ්‍රාහ්මණවරු

ගෙනෙන ලද රන් මාලය විශාකාව ගේ කරෙහි පැළඳූහ. එවිට විශාඛාව **"පියවරුනි! නුඹලා කිනම් රටකින් කිනම් කුලයකින් පැමිණියෙහු ද"** යැයි ඇසුවා ය. **"අපි වනාහි සැවැත් නුවර මිගාර සිටු කුලයෙන් පැමිණියෙමු"** යැයි එම බ්‍රාහ්මණවරු කීහ. විශාඛාව **"හිමියා කවරෙකු වන්නේ ද"** යැයි ඇසුවා ය. **"පූර්ණ වර්ධන කුමාරයෝ ය"** යැයි ඔවුහු කීහ.

විශාඛාව මේ කියන කුලය අපට ගැලපෙන සුදුසු කුලයක් ය යැයි දැන රන් මාලය පැළැන්දීම ඉවසා තම පියාණන් වෙත නිවසට යෑම පිණිස රථයක් එවන ලෙස පණිවිඩ යැවුවා ය. රන් මාලා කර ලූ ද පටන් උසස් මහත් කුලවල කාන්තාවෝ පා ගමනින් ගමන් නොකර රියෙන් ම ගමන් කරති. ධනඤ්ජය සිටුතුමා විශාකාව ප්‍රධාන පරිවාර ස්ත්‍රීන් පිණිස රථ පන්සියයක් යැවුවේ ය. විශාඛාව පරිවාර ස්ත්‍රීන් සමග එම රියවලින් තම නිවෙස්නට ගියා ය. එම බ්‍රාහ්මණයෝ ද පිටුපසින් ගියහ.

ධනඤ්ජය සිටුතුමා එම බ්‍රාහ්මණවරු දැක **"නුඹලා කිනම් රටකින් කිනම් කුලයකින් පැමිණියෙහු ද"** යැයි ඇසුවේ ය. **"අපි වනාහි සැවැත් නුවර මිගාර සිටු කුලයෙන් පැමිණියෙමු"** යැයි එම බ්‍රාහ්මණවරු කීහ. **"සිටු පුත්‍රයා කවරෙකු වන්නේ ද"** යැයි ඇසුවේ ය. **"පූර්ණ වර්ධන කුමාරයෝ ය"** යැයි ඔවුහු කීහ. පොහොසත් කම කොපමණ ද යැයි ඇසුවේ ය. **"කහවණු සතළිස් කෝටියකි"** යැයි කීහ. එවිට සිටුතුමා **"නුඹලාගේ සිටුතුමාගේ පොහොසත් කම මාගේ පොහොසත්කමෙන් තුට්ටුවක් තරම් වත් නොවන්නේ ය. අලගු (ඔට්ටු) තබන්නට වත් එය මඳ ය. කම් නැත මාගේ දියණියන්ට ආරක්ෂාව පමණක් ලැබෙන්නේ නම් එය ප්‍රමාණවත් ය. අනෙකකින් මට වැඩක් නැත"** යැයි කියා ඔවුන්ගේ අදහස පිළිගෙන දින කිහිපයක් ඔවුන් නවත්වාගෙන ආදර සැලකිලි දක්වා පිටත් කොට හැරියේ ය.

ඒ බ්‍රාහ්මණයෝ ද ඉතා සතුටින් සැවැත් නුවරට ගොස් අප බලාපොරොත්තු වූ පරිදි උසස් කුල කාන්තාවක් ලැබුවේ ය යැයි මිගාර සිටුතුමාට කීහ. කාගේ දුවක් ද යැයි ඇසූ විට ධනඤ්ජය සිටුතුමාගේ දියණිය යැයි කීහ. මහා කුලයකින් කාන්තාවක් ලැබීම පිළිබඳව අතිශය සතුටට පත් මිගාර සිටුතුමා කල් නො යවා ම ඇය මෙහි පමුණුව ගත

යුතුය යැයි කියා කොසොල් රජතුමාට ද එම කාරණය දන්වා සිටියේ ය. රජතුමා ද සතුටු ව මේ මහා කුලය මා විසින් බිම්බිසාර මහ රජතුමාගෙන් ලබාගෙන සාකේත නුවර පදිංචි කර වූ කුලය යි. එබැවින් එම කුලයට මම ද සංග්‍රහ කළ යුතුය යැයි සිතා **"මහ සිටාණෙනි! දූරිය කැඳවාගෙන එන දින මඟුල් පෙරහැරට මම ද එන්නෙමි, තවත් ඒ සඳහා උවමනා යමක් වෙතොත් දන්වන්න"** යැයි කීයේ ය.

මිගාර සිටුතුමා නොබෝ දිනකින් ම සුභ මොහොතින් කොසොල් රජතුමා ප්‍රධාන රාජ්‍ය වාසී බොහෝ පිරිවර ජනයා සමග පිටත්ව ගොස් සාකේත නුවරට අඩ යොදුනක් තිබිය දී නතර ව මහ රජතුමා ප්‍රධාන පිරිස ආ බව ධනඤ්ජය සිටුතුමාට දන්වා යැවී ය. ධනඤ්ජය සිටුතුමා ඒ සියල්ලන් වෙත යැවිය යුතු තෑගි භෝග යවා විශාඛාව කැඳවා **"දුව! ඔබගේ මාමණ්ඩිය වූ මිගාර සිටුතුමා කොසොල් මහ රජතුමා ද කැටුව සැවැත් නුවරින් පිටත්ව අවුත් මෙයට අඩ යොදුනකින් එපිට නො දුරු තැනක නැවතී සිටිති. ඔවුහු මෙහි ආ විට ඔබගේ මාමණ්ඩියට ද, කොසොල් රජතුමාට ද, යුව රජතුමාට ද නැවතීමට තැනක් පිළියෙල විය යුතු ය"** යැයි කීයේ ය. කල්ප ලක්ෂයක් පිරූ පාරමී ඇති මහත් ප්‍රඥාවක් ඇති විශාඛාව රජ යුවරජ සිටු ආදීන්ට ද, ඇත් අස් ආදීන්ට ද, ඇත්ගොව් අස්ගොව් ආදීන්ට ද, අන් සියලු පිරිවර ජනයාට ද මෙසේ සංග්‍රහ කළ යුතු ය යැයි දාසි දස් කම්කරු ජනයාට විධාන කොට යෙදෙව්වා ය.

ධනඤ්ජය සිටුතුමා එදින ම කඹුරන් පන්සියයක් ගෙන්වා මහා ලතා පසාධනය තනන්නට ඔවුන්ට රන්නික[1] දහසක් ද, රිදී, මුතු, මැණික්, පබලු, වීදුරු ආදී අවශ්‍ය සියල්ල නිදහස් කොට දුන්නේ ය. මෙසේ ටික දිනක් ගෙවී ගිය පසු කොසොල් මහ රජතුමා ධනඤ්ජය සිටුතුමා හට **"මහ සිටුතුමණි! අප මෙහි පැමිණ බොහෝ දිනක් ගත වූහ. පිරිස ද විශාලය. සත්කාර කිරීම ද අපහසු ය. එබැවින් දූරිය කැඳවාගෙන යන දිනයක් නියම කරන්න"** යැයි හසුනක් යැවූහ. එය බලා ධනඤ්ජය සිටුතුමා කොසොල් මහ රජතුමා හට **"මහ රජතුමනි! දැන් වැසි කාලය පැමිණියේ ය. මේ සිව් මස ගමන් යෑම අපහසු ය. නුඹ වහන්සේගේ බලකායට යමක් ලැබීමට වටී ද? ඒ සියල්ල මට භාර**

---

[1] නිකයක් යනු කළං විස්සකි.

**ය. එබැවින් දේවයන් වහන්සේ මා විසින් දූරිය එවන තෙක් රැඳී සිටින සේක්වා" යැයි දන්වා යැවී ය.**

**එතැන් පටන් සාකේත නුවර එකම නැකත් උත්සවයක් මෙන් විය. මෙලෙස තෙමසක් ඉක්ම ගියේ ය. ඒ තාක් මහා ලතා පසාධනයෙහි කටයුතු ද නිමාවට පත් නොවී ය. කොසොල් රජතුමා ප්‍රධාන පිරිසට සංග්‍රහ කරන්නෝ ඇවිත් නොමැති අන් දෙයක් නම් නැත. බලකායට බත් පිසීමට දර හිඟ බව කීහ. එවිට ධනඤ්ජය සිටුතුමා "දරුවනි! ඇත්හල්, අස්හල්, ගවහල් කඩා ඒ දූව වලින් බත් පිසවු" යැයි කීහ. ඒවා ද අඩ මසකට පමණක් සෑහුණේ ය. සේවකයෝ නැවත ද දර හිඟ බව කීහ. එවිට ධනඤ්ජය සිටුතුමා "දරුවනි! මෙකල්හි දර සෙවීම දුෂ්කර ය. රෙදි ගබඩා විවෘත කොට රළු වස්ත්‍ර ගෙන තෙල් සැළියෙහි ඔබා වැටි කොට ඒවායෙන් ආහාර පිසව්" යැයි අන කළේ** ය. ඒවා ද අඩ මසකට සෑහුණේ ය. මෙලෙස සිව් මස ගෙවී ගියේ ය.

මහා ලතා පසාධනය ද සාද නිම විය. එම පලඳනාවෙහි කපු නූලෙනි කළ මැස්මක් නැත. සියලු මැසුම් රිදී නූලෙන් කර ඇත. එය කයෙහි පැලඳි විට පාදයන්හි පිටි පතුළ දක්වා මුළු සිරුර ම වැසී යන්නේ ය. එහි ඒ තැන මුදු සවි කොට ගැට රනින් කරන ලද්දේ ය. පුඩු රිදියෙන් කරන ලද්දේ ය. එයින් හිස මුදුනෙහි එකකි. කන් දෙක මත දෙකකි. බෙල්ලෙහි දෙ පසෙහි දෙකකි. දෙ වුරෙහි දෙකකි. වැල මිටි දෙකෙහි දෙකකි. උකුල දෙ පසෙහි දෙකකි. පලඳනාව මුදුනෙහි මොනර රූපයක් කරන ලද්දේ ය. එහි දකුණු පස රනින් කරන ලද පියාපත් පන්සියයකි. වම් පස ද පියාපත් පන්සියයකි. තුඩ පබලුවෙන් කරන ලද්දේ ය. ඉඳුනිල් මිණිවලින් දෙනෙත් කරන ලද්දේ ය. බෙල්ල හා පිල් කලඹ ද ඉඳුනිල් මැණික්වලින් නිමවන ලද්දේ ය. පිල් දඬු හා කෙණ්ඩා රනින් කරන ලද්දේ ය. විශාඛාවගේ හිස මුඳුනෙහි පැලඳි මේ ආභරණයෙහි වූ මොනර රූපය කඳු මුඳුනක පිල් විදහා නටන මොනරෙකුට වඩා වෙනසක් නැත. පත් නළ දහසෙහි නාදය දිව්‍ය සංගීත නාදයක් සේ ද, තූර්‍ය්‍ය නාදයක් සේ ද පවත්නේ ය. එය දුර සිට බලන්නන්ට පෙනෙන්නේ පණ ඇති මොනරෙකු සේ ය. මේ පසාදනය වටිනාකමින් කහවණු නව කෝටියකි. එය තැනීමට කම්කරුවන්ට දුන් කුලියම කහවනු නව ලක්‍ෂයකි. පෙර කාශ්‍යප දසබලධාරින්

වහන්සේගේ ශාසනයෙහි දී මෙතුම්ය දහසක් භික්ෂු සංඝයාට සිවුරු පිණිස වස්ත්‍ර ද, ඉදි කටු හා නූල් ද, ඒ සිවුරුවලට පෙවීමට පඬු ද පූජා කළ පිනෙන් මේ පළඳනාව ලැබුවා ය.

ධනඤ්ජය සිටුතුමා විශාකාව පිණිස මංගල ඇඳුම් සැකසීමේ කටයුතු නිමවා කොසොල් රජතුමාට හා මිගාර සිටුතුමාට සිය නිවසට පැමිණෙන ලෙස දන්වා යවා රජතුමා ප්‍රධාන වූ පිරිස පැමිණි කල්හි ආගන්තුක සත්කාර දක්වා පිළිගෙන ඒ සියල්ලන්ට ම විශාඛාවගේ විධානය පරිදි සත්කාර කළහ. ඉන් පසු ධනඤ්ජය සිටුතුමා කුල සිරිත් නො ඉක්මවා සුබ මොහොතින් දියණිය පාවා දී දයාද වශයෙන් කහවණු පිර වූ ගැල් පන්සියයක, රන් බඳුන් පිර වූ ගැල් පන්සියයක, රිදී බඳුන් පිර වූ ගැල් පන්සියයක, පටසළු කසී සළු පිර වූ ගැල් පන්සියයක, ගිතෙල් බඳුන් පිර වූ ගැල් පන්සියයක, හැල සහල් පිර වූ ගැල් පන්සියයක, නගුල් හී වැල් ආදි කෘෂි උපකරණ පිර වූ ගැල් පන්සියයක යැයි සියල්ල පන්සියය බැගින් දුන්නේ ය. තව ද විශාඛාවට අත් උදව්වට මෙහෙකාර ස්ත්‍රීන් එක්දහස් පන්සියයක් යැවී ය. තුන් ගව්වක් දිග රියන් එකසිය සතළිසක් ප්‍රදේශයෙහි ඇඟින් ඇඟ ගැටෙන ප්‍රමාණයේ පිර වූ කිරි දෙනුන් ද දුන්නේ ය. එහෙත් ගාල් පැන ගොනුන් ද දෙනුන් ද සැට දහස බැගින් නික්මුණහ. පෙර කාශ්‍යප බුදු සසුනෙහි ළදරු භික්ෂූන්ට මේ කිරි ඉතා හොඳ ය, ගුණ ය යැයි කියා පෙරත්ත කරමින් කිරි වැළඳ වූ පිනෙන් මෙසේ විය.

ධනඤ්ජය සිටුතුමා "**හෙට දින දුවණිය යවන්නෙමි**" යැයි සිතා එදින රාත්‍රියෙහි විශාඛාව සමීපයෙහි හිඳුවා "**දරුව! ස්වාමි කුලයෙහි වසන්නිය විසින් මේ හැසිරීම් ඉගෙනීම වටී ය**" යැයි අවවාද දසයක් දුන්නේ ය. ඒවා මෙසේ ය.

1. මයිලණුවන්ගේ ගෙයි වසන්නිය විසින් ඇතුළත ගිනි පිටතට නො ගෙනිය යුතු ය.
2. පිටත ගිනි ඇතුළට නො පිවිසවිය යුතු ය.
3. දෙන්නාට ම දිය යුතු ය.
4. නො දෙන්නාට නො දිය යුතු ය.

5. දෙන්නාට ද, නො දෙන්නාට ද දිය යුතු ය.
6. සුව සේ හිඳිය යුතු ය.
7. සුව සේ වැළඳිය යුතු ය.
8. සුව සේ හෙවිය යුතු ය.
9. ගිනි පිදිය යුතු ය.
10. ඇතුළත දෙවියන් නැමැදිය යුතු ය.

ධනඤ්ජය සිටුතුමා විශාඛාවට මෙසේ අවවාද දෙන විට සමීප කාමරයෙහි සිටි මිගාර සිටුතුමා ඒ සියල්ල අසා සිටියේ ය.

ධනඤ්ජය සිටුතුමා පසු දින සියලු සෙනග රැස් කරවා රජ සෙනග මැද කෙළඹියන් අට දෙනෙකු භාර කරුවන් වශයෙන් තෝරා **"ඉදින් මගේ දුව ගිය තැන දෙසක් හට ගනී ද, නුඹලා විසින් එය නිවැරදි කළ යුතුය"** යැයි කියා විනිශ්චය කටයුතු ඔවුනට භාර කොට නව කෙළක් වටිනා මහා ලතා පසාධනයෙන් විශාඛාව සරසවා නහන සුනු (සබන්) ආදිය පිණිස කහවණු පනස්හතර කෝටියක් (54,00,000,00) ධනය දී සපිරිවරින් පිටත් කොට හැරියේ ය. විශාඛාව සපිරිවරින් සැවැත් නුවර දෙරටුව දක්වා වැසුණු යානයකින් ගොස් නුවර දෙරටුව සිට තමා දකිනු කැමති සියල්ලන්ට දැක ගැනීම පිණිස විවෘත රියක නැගී සිටගෙන මිගාර සිටු නිවස දක්වා ගියා ය. සැවැත් නුවර වාසීහු මහා සැප සම්පත්තියෙන් පිරුණු විශාඛාව දැක "විශාඛාව කියන්නේ මෙතුමියට ද, රූපයත් සැපතත් මෙතුමියට ම හොබීය" යැයි කීහ.

මෙලෙස විශාඛාව මහත් සැපතින් මිගාර සිටුතුමාගේ නිවසට පැමිණියා ය. පැමිණි දිනයෙහි ද සැවැත් නුවර වාසීහු **"ධනඤ්ජය සිටුතුමා තම නුවරට පැමිණි අපට මහත් සත්කාර කළේ ය"** යැයි විශාඛාවට පඬුරු යැවූහ. විශාඛාව එලෙස එවූ එවූ පඬුරු ඒ නුවරෙහි ම ඒ ඒ කුළයන්හි ප්‍රයෝජනවත් කටයුතුවල යුදෙව්වා ය. එදින ම රාත්‍රියෙහි විශාඛාවගේ එක් ආජානෙය්‍ය අස් වෙළඹකට දරු උපතක් සිදු විය. විශාඛාව තම දසීන් ලවා දඬු පහන් ගන්වා ගෙන එහි ගොස්

ඒ වෙළඹ උණු දියෙන් නහවා තෙල් ගල්වා තමන් වසන තැනට ගියා ය.

මිගාර සිටුතුමා ද තම පුත්‍රයාගේ අවාහ මංගල උත්සවය සත් දිනක් ම සිදු කළේ නමුත් ඒ අසල ජේතවනාරාමයෙහි වැඩ සිටින සම්මා සම්බුදු රජාණන් වහන්සේ හෝ අනෙකුත් ආර්‍ය්‍ය මහෝත්තමයන් වහන්සේලා සිහි නො කළේ ය. සත් වැනි දින දන් පිළියෙල කර සිය නිවසෙහි නග්න ශ්‍රමණයන් වඩා හිඳුවා විශාඛාව වෙත **"මගේ දුව රහතන් වහන්සේලා වඳින්න පැමිණෙන්න"** යැයි පණිවුඩයක් යැවුවේ ය. ආර්‍ය්‍ය ශ්‍රාවිකාවක් වූ විශාඛාව රහත් ය යන වචනය අසා සතුටු ව නිගණ්ඨයින් සිටින තැනට ගොස් ඔවුන් දැක **"මෙබන්දෝ නම් රහතන් වහන්සේලා වෙත් ද, විළිබිය නැත්තවුන්ගේ සමීපයට කුමක් හෙයින් මාමණ්ඩිය මා කැඳෙව්වේ ද?"** යැයි චී චී යැයි නින්දා කොට තම වාසස්ථානයට නික්ම ගියා ය. නග්න ශ්‍රමණයෝ ඇය දැක සිටාණන් අමතා **"කිමෙක් ද ගෘහපතිය, නුඹ අනෙකියක නො ලැබුවෙහි ද? ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවිකාවක් වූ මහා කාලකණ්ණියක මේ නිවසට පිවිසියෙහු ද? වහා ඇය මේ නිවසින් බැහැර කරව"** යැයි ගැරහූහ.

සිටුතුමා **"මොවුන්ගේ වචනයෙන් මට මෙතුමිය නිවසින් බැහැර කිරීමට නොහැකිය, මැය මහා කුලයක දියණියකි"** යැයි සිතා **"ආචාර්‍ය්‍යවරුනි! කුඩා දරුවෝ දැන හෝ නො දැන වරද කරති. නුඹ වහන්සේලා නිශ්ශබ්ද වුව මැනවි"** යැයි කියා නග්නයින් පිටත් කොට යවා මහා පලඟක හිඳ ගෙන රන් හැන්දක් ගෙන විශාඛාව බලා සිටියදී රන් තලියක දිය නුමුසු මී පායාසය අනුභව කරමින් සිටියේ ය. එවේලෙහි පිඬු සිඟා යන එක් තෙර නමක් එම නිවස ඉදිරියට වැඩියේ ය. මිගාර සිටුවරයා තෙරුන් දැක ද, නොදක්නා මෙන් මුව යටිකුරු කොට කිරිබත අනුභව කළේ ය. එවිට විශාඛාව මගේ මාමණ්ඩිය තෙරුන් වහන්සේ දැක ද නො දැක්කා සේ හිඳ කිරිබත් කයි යැයි නො ඉවසිලිමත්ව තෙරුන් වහන්සේ දිසාවට හැරී **"ස්වාමින් වහන්ස! අන් තැනක් බලා වඩින්න, මගේ මාමණ්ඩිය පුරාණයක් කති"** යැයි කීවා ය. එය ඇසූ සිටුවරයා දණ්ඩෙන් පහර ලත් නයෙකු සේ කිපී අත තිබූ කිරිබත් තලිය පසෙක දමා **"පෙණෙයි ද මැය, නිගණ්ඨයන් කියද්දීත් ගෙයින් පිට නො කෙළෙමි, මේ මංගල අවස්ථාවෙහි ම මා අසූචි කන්නෙකු කරන්නී ය. මැය මෙහි නවත්වා ගැනීම නුසුදුසු ය. වහාම**

**මේ ගෙයින් පිටකරවු"** යැයි කීයේ ය. එහි සිටි දස කම්කරු ආදී සියල්ලෝ ම විශාඛාවගේ පිරිවර ජනයා වූහ. එබැවින් විශාඛාවට එරෙහිව වචන මාත්‍රයක් කීමට තරම් සමතෙකු එහි නොවූයේ ය.

එකල්හි විශාඛාව මාමණ්ඩියගේ කථාව අසා **"පියාණෙනි! මෙපමණ වචනයකින් අපි නො යමු. මම නුඹ වහන්සේ විසින් දිය තොටින් කුම්භ දසියක මෙන් නො ගෙනෙන ලද්දෙමි. ජීවත් වන මව්පියන්ගේ දූවරු නම් මෙපමණකින් නො නික්මෙති. මේ කරුණ නිසාම මගේ පියා මෙහි එන දිනයෙහි කෙළෙඹියන් අට දෙනෙකුන් කැඳවා ඉදින් මගේ දුව නිසා යම් දෙසක් උපදී ද, එය නිවැරදි කරවු යැයි පවසා ඔවුන්ගේ අතෙහි තැබී ය. එබැවින් ඔවුන් කැඳවා මගේ දෙස් නිදෙස් බව පිරිසිදු කරවුව මැනව"** යැයි කීවා ය.

මිගාර සිටුතුමා **"මැය යහපතක් කියන්නී ය"** යැයි එම බ්‍රාහ්මණයින් අට දෙනා ගෙන්වා **"බ්‍රාහ්මණවරුනි! මේ දූරිය මෙහි ඇවිත් සත් වැනි දිනයෙහි නො පිරිපුන් වූම මඟුල් ගෙයෙහි හුන්නා වූ මා අසූචි කන්නෙක් ය"** යැයි කීවා ය. **"දියණියනි! එය සැබෑ ද?"** යැයි ඔවුහු විශාඛාවගෙන් ඇසූහ. එවිට විශාඛාව **"පියවරුනි! මගේ මාමණ්ඩිය අසූචි කෑමට කැමැත්තේ ය යැයි අදහස් කොට මම එසේ නො කීවෙමි. එක් පිඬු සිඟා යන තෙරුන් වහන්සේ නමක් ගෙදෙරට වැඩිය කල්හි මෙතෙමේ උන් වහන්සේ ගැන සැලකිල්ලක් නො දක්වා දිය නුමුසු පායාසය අනුභව කළේ ය. මේ හේතුවෙන් මම ස්වාමින් වහන්ස! අන් තැනක් බලා වඩින්න, මගේ මාමණ්ඩිය මේ දිවියෙහි පින් නොකරයි, පැරණි පින කයි"** යන්න පමණක් කීවෙමි යැයි පැවසුවා ය. එවිට එම බ්‍රාහ්මණවරු **"ආර්‍යයියෙනි! මෙහි දෙසක් නැත, අපගේ දියණිය සුදුසු කරුණක් කියයි. ඔබතුමා කුමක් සඳහා කිපුණේ ද?"** යැයි කීහ.

එවිට මිගාර සිටුතුමා **"ආර්‍යයවරුනි! ඒ කාරණය නිදෙස් බව පිළිගනිමි. එහෙත් මේ දූරිය මෙහි ආ දිනයෙහි ම රාත්‍රියෙහි මාගේ පුතු කෙරෙහි හැඟීමක් නැතිව තමන් කැමති තැනක ගියා ය"** යැයි කීයේ ය. "එය සැබෑ ද?" යැයි බ්‍රාහ්මණවරු ඇසූහ. එවිට විශාඛාව **"පියවරුනි! මම කැමති තැනකට නො ගියෙමි, මේ නිවසෙහි ආජානෙය්‍ය අශ්ව**

වෙළඹ වැදූ කල්හි හැඟීමකුදු නොකොට හිඳීම නුසුදුසු ය යැයි සිතා දඬු පහන් ගෙන්වාගෙන දාසසන් පිරිවරා ගෙන එහි ගොස් ඒ වෙළඹට ප්‍රසව පරිහාර කරවීමි" යැයි කීවා ය.

එවිට එම බ්‍රාහ්මණවරු මිගාර සිටුතුමාට "ගෘහපතිය! අපගේ දියණිය නුඹගේ නිවසෙහි දසීන් විසිනුදු නොකළ යුතු වැඩක් කරන ලද්දේ ය. එසේ ඇති කල්හි නුඹ කුමන දෙසක් දක්නෙහි ද?" යැයි ඇසූහ. මිගාර සිටුතුමා "එහි ද නිදෙස් බව පිළිගනිමි" යැයි කියා නැවත ද "බ්‍රාහ්මණවරුනි! මැයගේ පියා මෙහි එන දිනයෙහි අවවාද දෙමින් ඇතුළත ගිනි පිටත නො ගෙනිය යුතුය යැයි කීවේ ය. කිමෙක් ද, අප විසින් දෙ පසින් අසල්වැසි ගෙවලට ගිනි නොදී සිටිය හැකි ද?" මෙසේ කීවේ ය.

"දියණිය! එය සැබෑ ද?" යැයි බ්‍රාහ්මණවරු ඇසූහ. එවිට විශාඛාව "පියවරුනි! මාගේ පියා මේ ගිනි අරභයා කථා නො කළේ ය. ගේ ඇතුළත නැදි ආදී මාගමුන්ගේ යම් රහස් කථාවක් හට ගනී ද, එය එහි දාසසන්ට නොකිය යුතු ය. මෙබඳු කථා වැඩුණු කල්හි ඒවා කලහ පිණිස පවතියි. පියවරුනි! මාගේ පියා මේ සඳහා ඇතුළත ගිනි පිටත නො ගෙනිය යුතුය" යනුවෙන් කියන ලද්දේ ය යැයි කීවා ය.

එය ද එසේ වේවා! "මැයගේ පියා පිටතින් ගිනි ඇතුළට නො පිවිසිය යුතුය" යැයි කීවේ ය. "ඇතුළත ගිනි නිවුන කල්හි පිටතින් ගිනි නො ගෙනීමට අපට හැකි ද?" යැයි සිටුතුමා කීවේ ය. "දියණිය! එය සැබෑ ද?" යැයි බ්‍රාහ්මණවරු ඇසූහ. එවිට විශාඛාව "පියවරුනි! මාගේ පියා එම ගිනි සඳහා මෙසේ නො කීවේ ය. යම් දෙසක් දාසිදස් කම්කරුවන් විසින් කියන ලද්දේ වෙයි ද? එය ඇතුළත ජනයාට නොකිය යුතු ය. මෙබඳු කථා වැඩුණු කල්හි කලහ ඒවා කලහ පිණිස පවතියි. පියවරුනි! මාගේ පියා මේ සඳහා පිටතින් ගිනි ඇතුළට නො පිවිසිය යුතුය" යනුවෙන් කියන ලද්දේ ය යැයි කීවා ය.

එය ද එසේ වේවා! "තව ද, මැයගේ පියා දෙන්නාට ම දිය යුතුය යැයි කීවේ ය. එය කුමක් ද?" යැයි සිටුතුමා ඇසුවේ ය. "දියණිය! එය සැබෑ ද?" යැයි බ්‍රාහ්මණවරු ඇසූහ. එවිට විශාඛාව "පියවරුනි! යම් කෙනෙකු ණයක් හෝ වෑ පොරවා දී ආයුධයක් හෝ ඉල්ලා ගෙන

ගොස් නැවත ගෙනවිත් දේ ද? ඔවුන්ට ම දිය යුතුය යැයි මාගේ පියා විසින් මේ සඳහා දෙන්නහුට ම දිය යුතුය" යනුවෙන් කියන ලද්දේ ය යැයි කීවා ය.

එය ද එසේ වේවා! "තව ද, මැයගේ පියා නො දෙන්නාට නොදිය යුතුය යැයි කීවේ ය. එය කුමක් ද?" යැයි සිටුතුමා ඇසුවේ ය. "දියණිය! එය සැබෑ ද?" යැයි බ්‍රාහ්මණවරු ඇසූහ. එවිට විශාඛාව "පියවරුනි! යම් කෙනෙකු ණයක් හෝ වෑ පොරවා දී ආයුධයක් හෝ ඉල්ලා ගෙන ගොස් නැවත ගෙනවිත් නො දේ ද? ඔවුන්ට නැවත නො දිය යුතුය යැයි මාගේ පියා විසින් මේ සඳහා නො දෙන්නහුට නො දිය යුතුය" යනුවෙන් කියන ලද්දේ ය යැයි කීවා ය.

එය ද එසේ වේවා! "තව ද, මැයගේ පියා දෙන්නාට ද නො දෙන්නහුට ද දිය යුතුය යැයි කීවේ ය. එය කුමක් ද?" යැයි සිටුතුමා ඇසුවේ ය. "දියණිය! එය සැබෑ ද?" යැයි බ්‍රාහ්මණවරු ඇසූහ. එවිට විශාඛාව "පියවරුනි! දිළිඳු නෑ මිතුරන් පැමිණි කල්හි ණයක් හෝ වෑ පොරවා දී ආයුධයක් හෝ ඉල්ලා ගෙන ගොස් නැවත ගෙනවිත් දෙන්නේ හෝ නො දෙන්නේ වේ ද? ඒ කෙසේ වෙතත් ඔවුන්ට දිය යුතුය යැයි මාගේ පියා විසින් මේ සඳහා දෙන්නාට ද නො දෙන්නහුට ද දිය යුතුය" යනුවෙන් කියන ලද්දේ ය යැයි කීවා ය.

එය ද එසේ වේවා! "තව ද, මැයගේ පියා සුව සේ හිඳිය යුතුය යැයි කීවේ ය. එය කුමක් ද?" යැයි සිටුතුමා ඇසුවේ ය. "දියණිය! එය සැබෑ ද?" යැයි බ්‍රාහ්මණවරු ඇසූහ. එවිට විශාඛාව "පියවරුනි! නැඳි මයිලනුවන් දැක නැඟිටිය යුතු තැන්හි ඉඳගෙන හිඳීම නොකොට නැඟිටිය යුතුය යැයි මාගේ පියා විසින් මේ සඳහා සුව සේ හිඳිය යුතුය" යනුවෙන් කියන ලද්දේ ය යැයි කීවා ය.

එය ද එසේ වේවා! "තව ද, මැයගේ පියා සුව සේ වැළඳිය යුතුය යැයි කීවේ ය. එය කුමක් ද?" යැයි සිටුතුමා ඇසුවේ ය. "දියණිය! එය සැබෑ ද?" යැයි බ්‍රාහ්මණවරු ඇසූහ. එවිට විශාඛාව "පියවරුනි! නැඳි මයිලනුවන් හා ස්වාමියා වැළඳීමට පෙර නො වළඳ මුලින් ම ඔවුන් වළඳවා සියල්ලන් විසින් ලද නො ලද දේ දැන පසුව තමන්

වැළඳිය යුතුය යැයි මාගේ පියා විසින් මේ සඳහා සුව සේ වැළඳිය යුතුය" යනුවෙන් කියන ලද්දේ ය යැයි කීවා ය.

එය ද එසේ වේවා! "තව ද, මැයගේ පියා සුව සේ හෙවිය යුතුය යැයි කීවේ ය. එය කුමක් ද?" යැයි සිටුතුමා ඇසුවේ ය. "දියණිය! එය සැබෑ ද?" යැයි බ්‍රාහ්මණවරු ඇසූහ. එවිට විශාඛාව "පියවරුනි! නැඳි මයිලනුවන් ස්වාමියාට පෙර සයනයට නැඟ නො නිදිය යුතුය. ඔවුන්ට කළ යුතු වත් පිළිවෙත් කොට සියල්ලන්ට ම පසුව නිදිය යුතුය යැයි මාගේ පියා විසින් මේ සඳහා සුව සේ හෙවිය යුතුය" යනුවෙන් කියන ලද්දේ ය යැයි කීවා ය.

එය ද එසේ වේවා! තව ද, මැයගේ පියා විසින් "ගිනි පිදිය යුතුය" යැයි කීවේ ය. එය කුමක් ද? යැයි සිටුතුමා ඇසුවේ ය. "දියණිය! එය සැබෑ ද?" යැයි බ්‍රාහ්මණවරු ඇසූහ. එවිට විශාඛාව "පියවරුනි! නැඳි මයිලනුවන් ස්වාමියා ගිනි කඳන් මෙන් ද, නා රජුන් මෙන් ද දැකීමට වටී ය යැයි මාගේ පියා විසින් මේ සඳහා ගිනි පිදිය යුතුය යැයි කියන ලද්දේ ය" යනුවෙන් කියන ලද්දේ ය යැයි කීවා ය.

එය ද එසේ වේවා! තව ද, මැයගේ පියා විසින් "ඇතුළත දෙවියන් නැමැදිය යුතුය" යැයි කීවේ ය. එය කුමක් ද? යැයි සිටුතුමා ඇසුවේ ය. "දියණිය! එය සැබෑ ද?" යැයි බ්‍රාහ්මණවරු ඇසූහ. එවිට විශාඛාව "පියවරුනි! ආවේණික ගෙයෙහි වාසය කරන කාලයෙහි පටන් අපගේ ගෙදොරට පැමිණුණු පැවිද්දෙකු දැක ගේ තුළ යම් කෑ යුත්තක් බිදිය යුත්තක් ඇත්තේ ද? එයින් පැවිද්දන්ට දන් දී කෑම වටී ය යැයි මාගේ පියා විසින් මේ සඳහා ඇතුළත දෙවියන් නැමැදිය යුතුය" යනුවෙන් කියන ලද්දේ ය යැයි කීවා ය.

ඉක්බිති එම බ්‍රාහ්මණවරු මිගාර සිටුතුමා අමතා "මහ සිටාණෙනි! නුඹ වනාහි පැවිද්දන් දැක නො දෙනු කැමැත්තෙකු බව හැඟෙයි" යැයි කීහ. එවිට සිටුවරයා එයට පිළිතුරක් නැතිව බිම බලාගෙන හුන්නේ ය. එකල්හි එම බ්‍රාහ්මණවරු "කිමෙක් ද? සිටාණෙනි! අපගේ දියණියගේ අන් දෙසකුත් ඇත්තේ ද" යැයි ඇසූහ. හෙතෙම "ආර්‍ය්‍යයෙනි නැත" යැයි කීවේ ය. "එසේ නම් කුමක් හෙයින් නිදෙස් වූ මැය පිට මං කළෙහි ද" යැයි බ්‍රාහ්මණවරු ඇසූහ.

එකෙනෙහි විශාඛාව **"පළමු ව මගේ මාමණ්ඩියගේ වචනයෙන් එක ක්‍ෂණයෙන් පිටව යෑම නුසුදුසු බැවින් මම නො ගියෙමි. මා මෙහි පැමිණෙන දිනයෙහි මගේ දෙස් නිදෙස් පිරිසිඳු කිරීම සඳහා මගේ පියා නුඹලාගේ අතෙහි තබා දුන්නේ ය. දැන් මගේ යෑම මම ම දැන ගනිමි"** යැයි පවසා **"ගමනට දැසි දසුන් යානාදිය සූදානම් කරවු"** යැයි අණ කරන ලද්දේ ය.

ඉක්බිති මිගාර සිටුතුමා එම බ්‍රාහ්මණයින්ගේ අත ගෙන විශාඛාව අමතා **"දියණිය මා විසින් නො දැන කියන ලද්දට සමා වන්න"** යැයි කීවේ ය. එවිට විශාඛාව **"පියාණෙනි! ක්‍ෂමා කරමි. ඔබගේ ක්‍ෂමා කළ යුත්තට ක්‍ෂමා කරමි. මම වනාහි බුදු සසුනෙහි නො සැලෙන පැහැදීම් ඇති කුලයක දියණියක් වෙමි. අපි භික්‍ෂු සංඝයාගෙන් තොරව නො පවතිමු. ඉදින් මගේ කැමැත්තෙන් භික්‍ෂු සංඝයා පිළිදැගුම් කිරීමට ලබන්නෙම් නම් වසමි"** යැයි කීවා ය. එවිට මිගාර සිටුතුමා **"දරුව! නුඹ කැමති පරිද්දෙන් නුඹේ ශ්‍රමණයන් වහන්සේලා පිළිදැගුම් කරව"** යැයි කීවේ ය.

## ☸ මිගාර සිටු කුලය ආර්‍යය ශ්‍රාවකයින් වීම

ඉක්බිති විශාඛාව භාග්‍යවතුන් වහන්සේට ආරාධනා කොට දෙවැනි දිනයෙහි නිවස පුරවමින් බුද්ධ ප්‍රමුඛ මහා සංඝයා වඩා හිඳෙව්වා ය. නග්න පිරිස ද ශාස්තෘන් වහන්සේ මිගාර සිටුවරයාගේ ගෙට වැඩි බව දැන එහි ගොස් ගෙය පිරිවරා සිටියහ. විශාඛාව දක්ෂිණෝදකය දී සියලු සත්කාර පිළියෙල කොට මිගාර සිටුතුමා හට **"මගේ මාමණ්ඩිය පැමිණ භාග්‍යවතුන් වහන්සේ වළඳවත්වා"** යැයි හසුනක් යැවුවා ය. **සිටුතුමා නිගණ්ඨයින්ගේ වචනය අසා "මගේ දුව සම්බුදුන් වහන්සේ වළඳවාවා"** යැයි විශාඛාවට පැවසී ය. විශාඛාව නොයෙක් අග්‍ර රසයෙන් යුත් භෝජනයෙන් බුද්ධ ප්‍රමුඛ මහ සඟරුවන වළඳවා බත් කිස නිම වූ කල්හි මිගාර සිටුතුමාට **"මගේ මාමණ්ඩිය පැමිණ භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම කථාව අසත්වා"** යැයි යළි හසුනක් යැවුවා ය. එවිට සිටුතුමා **"දැන් නො ගියේ නම් එය බලවත් අයුක්තියකි"** යැයි සිතා ධර්ම කථාව ඇසීමේ කැමැත්තෙන් යන විට

**නග්න ශ්‍රමණයෝ "ගෘහපතිය! එසේ නම් ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ධර්මය අසන්නේ නම් තිරයකින් පිටුපස හිඳ අසව"** යැයි කියා ඔවුහු කලින් ම ගොස් තිරයකින් වට කරන ලද්දහු ය. මිගාර සිටුතුමා ගොස් භාග්‍යවතුන් වහන්සේ නො පෙනෙන ලෙස තිරයෙන් පිටුපස හුන්නේ ය. එවිට තථාගතයන් වහන්සේ **"මහ සිටාණෙනි! නුඹ තිරයෙන් පිටත හෝ හිඳුව, බිත්තියෙන් පිටත හෝ පර්වතයෙන් පිටත හෝ සක්වළින් පිටත හෝ හිඳුව. මම වනාහි සම්මා සම්බුද්ධ නම් වෙමි. මගේ හඬ නුඹට අස්වන්නට හැක්කෙමි"** යැයි රන්වන් ඵල ඇති අඹ ගසක් කඳින් ගෙන සොලවන්නාක් මෙන් ධර්ම දේශනා කළ සේක. දේශනාව අවසානයෙහි සිටුතුමා සෝවාන් ඵලයෙහි පිහිටා තිරය ඔසවා ශාස්තෘන් වහන්සේ වෙත ගොස් දැතින් ශ්‍රී පාදයන් පිරිමදිමින් මුවෙන් පා සිඹිමින් **"ස්වාමීනි මම මිගාර වෙමි"** යැයි තෙවරක් තමන්ගේ නම කියා භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී පාද මූලයෙහි වැටී වැඳ භාග්‍යවතුන් වහන්සේ අමතා **"ස්වාමීනි! මෙතෙක් කල් මම කොතැනට දෙන ලද දානය මහත් ඵල ඇත්තේද යැයි නො දැන සිටියෙමි. මේ දියණිය නිසා අද එය දැන ගතිමි. සියලු අපා භයින් නිදහස් වීමි. මේ දියණිය මෙහි පැමිණියේ මට වැඩ පිණිස ම ය"** යැයි පවසා ශාස්තෘන් වහන්සේ සමීපයෙහි දී ම විශාඛාවට **"දරුව, නුඹ අද පටන් මගේ මව"** යැයි කියා විශාඛාව තමන්ගේ මව් තනතුරෙහි තැබුවේ ය. එතැන් පටන් විශාඛාව **"මිගාර මාතා"** නම් වූවා ය. එම හේතුවෙන් ම විශාඛාවට උපන් පළමු පුත්‍රයාට **"මිගාර"** යැයි නම් තැබුවේ ය.

විශාඛාව පසුදින සඳහා ද භාග්‍යවතුන් වහන්සේට දානය පිණිස ආරාධනා කළා ය. එදින ශාස්තෘන් වහන්සේ කළ දේශනයෙන් විශාඛාවගේ නැන්දනිය සෝවාන් වූවා ය. එතැන් පටන් මිගාර සිටු නිවස බුදු සසුනට විවෘත වූ දෙර ඇත්තේ විය. මිගාර සිටුතුමා **"මේ දියණිය මට බොහෝ උපකාර වූවා ය, එබැවින් ඇය කෙරෙහි මා තුළ ඇති ප්‍රසාදය දැක්විය යුතු ය, මේ මේල පසාධනය ද බර වැඩි ය, නිතර කයෙහි පැළඳීමට ද බැරි ය, එබැවින් නිතර කයෙහි පැලඳීමට සුදුසු ආභරණයක් කර දිය යුතු ය"** යැයි සිතා කහවණු ලක්ෂයක් වියදම් කොට **"ඝනමට්ට"** නම් ආභරණයක් කරවා, බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නය සිය නිවසට වැඩමවා මහා දානයක් දී සුවඳ මුසු පැන් සොළොස් කලයකින් විශාඛාව නහවා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි දී ඒ ආභරණය

පළඳවා භාග්‍යවතුන් වහන්සේගේ පා වැන්දේ ය. ශාස්තෘන් වහන්සේ අනුමෙවෙනි බණ වදරා විහාරයට වැඩි සේක.

විශාඛාව ද දනාදී පින්කම් කරමින් ශාස්තෘන් වහන්සේ වෙතින් අට වරයක් ලැබ අහස් තලයෙහි චන්ද්‍ර මණ්ඩලය මෙන් සැම තැන්හි ප්‍රසිද්ධ වූවා ය. ඇයට පුත්‍රයෝ දස දෙනෙකුන් ද, දූවරු දස දෙනෙකුන් ද වූහ. එම දරුවන් විසි දෙනාට ද පුත්‍රයෝ දස දෙනෙකුන් හා දූවරු දස දෙනෙකුන් වශයෙන් දරුවෝ වූහ. ඔවුන් සැම දෙනාට ම ද පුත්‍රයෝ දස දෙනෙකුන් හා දූවරු දස දෙනෙකුන් වශයෙන් දරුවෝ වූහ. මෙසේ විශාඛාවගේ දූ පුතුන්, මුනුබුරු මී මුනුබුරු පරපුර අටදහස් සාරසිය විස්සකි. මේ සියල්ලෝ ම නිරෝගිමත් ව අවුරුදු එකසිය විස්සක් ජීවත් වූහ. මේ විශාඛාව අවුරුදු එකසිය විස්සක් ජීවත් වූ නමුත් පැසුණු හිස කෙස් ගසක් නැතිව සොළොස් හැවිරිදි තරුණියක මෙන් වූවා ය.

පසු කලෙක සැවැත් නුවර නැකත් උත්සවයක් පවත්නා විටෙක ඇතුල් නුවර ගුණධර්ම වශයෙන් ගත යුතු දෙයක් නො දක විශාඛාව මහා ලතා පසාධනය ද පැළඳ, තම දසීන් පිරිවරා ගෙන ශාස්තෘන් වහන්සේගෙන් ධර්ම කථාවක් ඇසීම පිණිස ජේතවනාරාමයට ගොස් **"භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සමීපයට උඩඟු වෙසින් යෑම නුසුදුසුය"** යැයි සිතා එම පසාධනය කයෙන් මුදා එය එක් දසියකට දී ශාස්තෘන් වහන්සේ වෙත එළඹ වැඳ එකත්පසෙක හුන්නා ය. මේ පසාධනය දැරීමට ඇතුන් පස් දෙනෙකුන්ගේ කාය බල ඇති ස්ත්‍රියකට හැර අනෙකියකට නොහැකි ය. එම දසිය ද විශාඛාවගේ පිනට ම උපන් එවැනි ම කාය බලයක් ඇති තැනැත්තියකි. ශාස්තෘන් වහන්සේ විශාකාව දැහැමි කථාවෙන් කරුණු දක්වමින්, එහි සමාදන් කරවමින්, තියුණු කරවමින්, සතුටු කරවමින් ධර්ම දේශනා කළ සේක. ඇය ඉතා සතුටින් ධර්ම ශ්‍රවණය කොට භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට පිටත්ව ගියා ය. මහා ලතා පසාධනය තබා ගත් දසිය ද ගඳකිළි පිරිවෙන ඉදිරියෙහි එය තබා ගෙන සිට විශාඛාව සමග ආපසු යන විට පසාධනය අමතක ව ගියා ය.

සැම දිනක ම ධර්ම ශ්‍රවණය කොට පිරිස නැගිට ගිය පසු ආනන්ද තෙරුන් වහන්සේ භික්ෂු භික්ෂුණී උපාසකෝපාසිකාවන්ට

අමතක ව ගොස් ඇති යමක් ඇත්තේ දැයි සොයා බලන්නේ ය. එදින ද එලෙස සොයා බලන විට විශාඛාවගේ මේල පළඳනාව තිබෙනු දැක එය භාග්‍යවතුන් වහන්සේට දැන්වූයේ ය. භාග්‍යවතුන් වහන්සේ "එසේ නම් ආනන්දය එය සුරක්ෂිත කොට තබන්න" යැයි වදාළ සේක. ආනන්ද තෙරණුවෝ එසේ කළේ ය.

විශාඛාවගේ දාසිය මඟ දුරක් ගොස් එය සිහි වී ආපසු හැරුණා ය. එවිට විශාඛාව එය කොතැනක තබන ලද ද යැයි අසා ගඳකිළි පිරිවෙන ඉදිරිපස යැයි කී කල්හි "**දාස්ස! එසේ නම් ගොස් එය රැගෙන එව, යම් ලෙසකින් ආනන්ද තෙරුන් වහන්සේ එය කොතැනක හෝ ආරක්ෂාව පිණිස අරන් තබන ලද්දේ නම් මා විසින් එය තෙරුන් වහන්සේට පූජා කරන ලද්දේ ය. එසේ වුවහොත් නොගෙන එන්න**" යැයි දන්වා දාසිය යැවුවා ය. දාසිය ආරාමයට ගිය විට ආනන්ද තෙරණුවෝ "**එය ගඳකිළි පිරිවෙනෙහි තරප්පුවේ පසෙක තබා ඇත රැගෙන යන්න**" යැයි වදාළේ ය. එම දාසිය විශාඛාවගේ අදහස ආනන්ද තෙරණුවන්ට කියා එය එහි ම තබා විශාඛාව වෙත ගොස් ආයුෂ්‍යයන් වහන්සේ එය අරන් තබා ඇති බව කීවා ය. එවිට විශාඛාව "**දුව ආයුෂ්‍යයන් වහන්සේ විසින් ආරක්ෂා කොට තබන ලද ඒ පසාධනය නැවත මගේ කයෙහි පැලඳීම නුසුදුසු ය. එය ආරාමයෙහි තැබූ කල්හි ආයුෂ්‍යයන් වහන්සේලාට ද හිරිහැරයකි. එහෙයින් එය විකුණා දඬුවමක් කරන්නෙමි**" යැයි කියා නැවත දාසිය යවා එය ගෙන්වා ගත්තා ය.

විශාඛාව කඹුරන් (රන් කරුවන්) තම නිවසට ගෙන්වාගෙන එහි මිල විමසුවා ය. ඔවුහු එය කහවණු නව කෝටියක් වටිනා බව ද, කම්කරු මිල ම කහවණු ලක්‍ෂයක් යැයි ද කීහ. එවිට විශාඛාව ඒ ඇඳුම කරත්තයක තබා "**මෙය ගෙන ගොස් විකුණා මුදල් ගෙන එව**" යැයි කියා ඔවුන්ට බාර කොට යැවුවා ය. ඔවුහු එය ගෙන නුවර පුරා ඇවිද්දේ නමුත් එය මිලට ගන්නෙකු නුවර නොවී ය. එය යමෙකු මිල දී ගත්තේ නමුත් පැලඳීමට සුදුසු පින් ඇති ස්ත්‍රීහු ලොව දුර්ලභ ය. මේ මේල පලඳනාව පැලඳීමට මේ අන්තර් කල්පයෙහි මිහිකත තුළ පින් ඇතිව සිටියේ "**විශාඛාව, බන්දුල මල්ලිකාව හා බරණැස් සිටු දියණිය**" යන තිදෙනා පමණකි.

## ☸ පූර්වාරාම මහා විහාරය ඉදි කිරීම

ඉන් පසු විශාඛාව ම එය මිල දී ගෙන ඒ කහවණු නවකෝටි එක් ලක්‍ෂයක මහා ධනස්කන්ධය ගැලක තබා ගෙන ජේතවනාරාමයට රැගෙන ගොස් පසෙක තබා ශාස්තෘන් වහන්සේ වෙත ගොස් වැඳ භාග්‍යවතුන් වහන්සේ අමතා **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මාගේ දාසිය විසින් අමතක කොට ගිය මේල පළඳනාව ආනන්ද තෙරුන් වහන්සේ විසින් ආරක්‍ෂා කොට තබන ලද්දේ ය. ආයුෂ්මතුන් වහන්සේ විසින් ආරක්‍ෂා කොට තැබූ එය දැන් මගේ කයෙහි පැලඳීමට නුසුදුසු ය. එබැවින් එය විකුණා භික්‍ෂු සංඝයා හට අවශ්‍ය කැප භාණ්ඩයක් ගෙනවිත් පූජා කිරීමට සිතා විකිණීමට යැවූ නමුත් එය මිළට ගන්නෙකු නුවර නොවී ය. එබැවින් එය මම ම මිල දී ගෙන එම ධනය ආරාමයට රැගෙන ආවෙමි, ස්වාමීනි මෙය ශාස්තෘන් වහන්සේට පූජා කරමි"** යැයි කීවා ය. ශාස්තෘන් වහන්සේ **"විශාඛාවෙනි! රන් රුවන් නම් පැවිද්දන්ට නොවටනේය"** යැයි වදාරා එය ප්‍රතික්‍ෂේප කළ සේක. එවිට විශාඛාව **"එයින් භාග්‍යවතුන් වහන්සේට හෝ සංඝයාට අවශ්‍ය දෙයක් රැගෙන ආ හැකි ය. භාග්‍යවතුන් වහන්සේ ඒ සඳහා කළ යුත්තක් වදාරණ සේක්වා"** යැයි දන්වා සිටියා ය. භාග්‍යවතුන් වහන්සේ **"විශාඛාවෙනි! එසේ නම් මේ නුවර නැගෙනහිර දොර සංඝයා උදෙසා සුදුසු විහාරයක් කරවීම වටී ය"** යැයි වදාළ සේක. විශාඛාව **"එසේය ස්වාමීනි"** යැයි එය ගෞරවයෙන් පිළිගෙන එම කහවණු නවකෝටිය දී ඉඩමක් ගෙන තවත් කහවණු නවකෝටියක් වියදම් කොට ආරාමයක් ගොඩනැගීමට පටන් ගත්තා ය.

භාග්‍යවතුන් වහන්සේ මේ කාලයෙහි එක් දිනක සුපුරුදු ලෙස අලුයම් වෙලෙහි මහා කරුණා සමවතින් නැගී පිහිට විය යුතු සත්වයන් කවුරුන්ද යැයි ලොව බලා වදාරණ සේක් දෙව් ලොවින් ච්‍යුතව භද්දිය නුවර සිටු කුලයෙහි උපන් භද්දිය සිටු පුත්‍රයාගේ මග ඵල නිවන්සුව ලැබීමට ඇති හේතු සම්පත් දැක එදින අනාථපිණ්ඩික සිටුතුමාගේ නිවසෙහි දන් වළඳා උතුරු දිසාව බලා වැඩි සේක.

භාග්‍යවතුන් වහන්සේ යම් දිනක විශාඛාවගේ නිවසෙහි දන් වැළඳූ සේක් නම්, එදින දකුණු දෙරින් නික්ම ගොස් ජේතවනාරාමයෙහි

වැඩ වාසය කරන සේක. යම් දිනක ජේතවනාරාමයෙහි දන් වැළඳූ සේක් නම් එදින නැගෙනහිර දෙරින් නික්ම ගොස් පූර්වාරාමයෙහි වැඩ වාසය කරන සේක. යම් දිනයක උතුරු දෙස බලා වඩින සේක් නම් එය දක්නා මනුෂ්‍යයෝ භාග්‍යවතුන් වහන්සේ චාරිකාවෙහි වඩිනා බව දනිති. එදින භාග්‍යවතුන් වහන්සේ ජේතවනාරාමයෙහි දන් වළඳ උතුරු දෙසට වැඩි සේක යැයි ඇසූ විශාඛාව වේගයෙන් ගොස් භාග්‍යවතුන් වහන්සේට වන්දනා කොට **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මම මෙතෙක් වියදම් කොට භාග්‍යවතුන් වහන්සේ උදෙසා විහාරයක් කරවමි, එබැවින් චාරිකාවෙහි නො වැඩ නවතිනු මැනව"** යැයි කීවා ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ **"විශාඛාවෙනි! මේ ගමන නතර කළ හැකි ගමනක් නොව, යා යුතු ම ගමනකි"** යැයි වදාළ සේක. එවිට විශාඛාව **"යම්කිසි හේතු සම්පත් ඇති සත්වයෙකු දැක වඩින ගමනක් විය යුතුය"** යැයි සිතා **"එසේ නම් ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මා විසින් මෙහි කළ නොකළ දෙය සොයා බැලීමට භික්ෂු නමක් නවත්වා වැඩිය මැනව"** යැයි කීවා ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ **"විශාඛාවෙනි! එසේ නම් ඒ සඳහා නුඹ කැමති භික්ෂුවක ගේ පාත්‍රය ගත මැනව"** යැයි වදාළ සේක.

විශාඛාව මෙබඳු කටයුතුවල දී ආනන්ද ස්වාමීන් වහන්සේට ම ප්‍රිය කරන නමුත් මෙම විහාර කර්මාන්තයෙහි ඉක්මනින් නිම වීම අපේක්ෂා කොට ඍද්ධි විෂයෙහි අග තැන්පත් මුගලන් මහ රහතන් වහන්සේගේ පාත්‍රය ගත්තා ය. එවිට මුගලන් මහ රහතන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ මුහුණ බැලුවේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ මුගලන් මහ රහතන් වහන්සේ අමතා **"මහා මොග්ගල්ලානය! නුඹ සපිරිවරින් මෙහි නවතිනු මැනව"** යැයි වදාළ සේක. මුගලන් මහ රහතන් වහන්සේ තම පිරිවර පන්සිය නමක් පමණ භික්ෂූන් සමග නතර වූහ. විහාර කර්මාන්තය කරන කම්කරුවෝ මුගලන් මහ රහතන් වහන්සේගේ ආනුභාවයෙන් යොදුන් පනස - සැට පමණ දුර ගොස් ගල් වැලි හා විශාල ගස් ආදිය කරත්තවල පටවා ගෙන ඉතා පහසුවෙන් එද ම පැමිණෙති. ඒවා කරත්තවලට පැටවීමාදී කටයුතු ඉතා පහසුවෙන් සිදු වෙති. අපමණ බර පැට වූ නමුත් කරත්තවල අලවංගු ආදිය නො නැමෙති නො කැඩෙති. මෙසේ ඉතා පහසුවෙන් කෙටි කලකින් ම යට

මහලෙහි කාමර පන්සියයක් ද, උඩුමහලෙහි කාමර පන්සියයක් ද වශයෙන් යුක්ත වූ එම විහාර කර්මාන්තය මුගලන් මහ රහතන් වහන්සේගේ ආනුභාවයෙන් නව මසකින් නිමාවට පත් කළ හැකි විය. භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා පිරිවරා ගෙන මාස නවයක් පුරා මහා මණ්ඩල චාරිකාවක් වැඩ නිමවා සැවැත් පුරයට ආපසු වැඩි සේක.

## ☸ පූර්වාරාම විහාර පූජාව

භාග්‍යවතුන් වහන්සේ චාරිකාව නිමවා සැවැත් නුවර ජේතවන මහා විහාරයට වැඩම කරන බව අසා විශාඛාව භාග්‍යවතුන් වහන්සේ ඉදිරියට ගොස් ආරාධනා කොට තමන් සෑදූ ආරාමයට වැඩම කරවා ගෙන ඇවිත් **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මේ සාර මාසය මහ සඟරුවන සමග මෙහි ම වැඩ හිඳිනු මැනව, වෙන තැනකට නො වැඩීම මැනවි, මම සාර මාසයක් විහාර පූජාව කරන්නෙමි."** යැයි කියා ආරාධනා කොට බුද්ධ ප්‍රමුඛ මහා සංඝයා තම ආරාමයෙහි වඩා හිඳුවා විහාර පූජාව පටන් ගත්තා ය. එතැන් පටන් විශාඛාව තම ආරාමයෙහි දී බුද්ධ ප්‍රමුඛ සංඝරත්නයට මහ දන් දෙයි, පුද සත්කාර කරයි. මෙලෙස පුද පෙරහර දක්වමින් සාර මාසයක් ගත කොට අවසන් දිනයෙහි සියලු දෙනා වහන්සේට ම සිවුරු පිණිස වටිනා සළු පිළිගැන්වූවා ය. ඉතා කුඩා භික්ෂුවකට පූජා කළ සළුව කහවණු දහසක් අගනේ විය. එසේම සියලු දෙනා වහන්සේලාට ම පාත්‍ර පුරා බෙහෙත් පිළිගැන්වූවා ය. මෙලෙස විශාඛාවට දනය පිණිස කහවණු නවකෝටියක් වැය විය. මෙසේ ඉඩම මිලයට ගැනීමට නවකෝටියක් ද, ආරාමය ගොඩනැගීමට නවකෝටියක් ද, ආරාම පූජාවට නවකෝටියක් ද වශයෙන් විශාඛාව බුදු සසුනට කහවණු විසිහත් කෝටියක් (27,00,000,00) ධනය පූජා කරන ලද්දේ ය. මෙසේ මේ අන්තර් කල්පයෙහි මෙබඳු මහත් පූජාවක් කළ ස්ත්‍රියක් විශාඛාව හැර අන් තැනැත්තියක් මේ පෘථිවි තලයෙහි නැත.

විශාඛාව විහාර පූජාව අවසාන දිනයෙහි තම දරු මුනුබුරන් කැටි ව ගොස් **"මා පෙර පැතූ සියල්ල මුදුන් පැමිණියේ ය"** යැයි

අතිශයින් සතුටට පැමිණ ප්‍රාසාදය වටේ යමින් මිහිරි හඬ නගා මෙලෙස උදන් අනන්නට වූවා ය.

**කදාහං පාසාදං රම්මං - සුධාමත්තිකලෙපනං,**
**විහාරදානං දස්සාමි - සඞ්කප්පො මයහ පූරිතො.**

කෛලාශ කූට පර්වතය මෙන් සුදෙන් බබලන මැටි සුනු ආදියෙන් පිරියම් කොට මිනිස් ලොවට වෛජයන්ත ප්‍රාසාදයක් හා සමාන වූ ප්‍රාසාදයක් කරවා කවර කලෙක දන් දෙමි ද යැයි සිතා ප්‍රාර්ථනා කරගෙන ආවා වූ එම ප්‍රාර්ථනයත් සමෘද්ධ විය.

**කදාහං මඤ්චපීඨඤ්ච - භිසිබිම්බොහනානි ච,**
**සෙනාසනභණ්ඩං දස්සාමි - සඞ්කප්පො මයහ පූරිතො.**

ඇඳ පුටු කොට්ට මෙට්ට ආදී වූ සේනාසන භාණ්ඩයන්ගෙන් පිරිපුන් ප්‍රාසාදයක් කරවා කවර කලෙක දන් දෙමි ද, යැයි සිතා පාර්ථනා කරගෙන ආවා වූ එම ප්‍රාර්ථනයත් සමෘද්ධ විය.

**කදාහං සලාකභත්තං - සුචිං මංසූපසෙචනං,**
**භොජනදානං දස්සාමි - සඞ්කප්පො මයහ පූරිතො.**

අති පවිත්‍ර රස මසවුළෙන් යුක්තව ආහාර පාන සපයා කවර කලෙක භික්ෂු සංඝයාට දන් දෙමි ද, යැයි සිතා ප්‍රාර්ථනා කරගෙන ආවා වූ එම ප්‍රාර්ථනයත් සමෘද්ධ විය.

**කදාහං කාසිකං වත්‍ථං - ඛොමකප්පාසිකානි ච,**
**චීවරදානං දස්සාමි - සඞ්කප්පො මයහ පූරිතො.**

ක්ෝම කෝසෙයාා කපු ආදී වූ පිළී කප්පවා සිවුරු කරවා කවර කලෙක චීවර පූජා කරන්නෙම් ද, යැයි සිතා ප්‍රාර්ථනා කරගෙන ආවා වූ එම ප්‍රාර්ථනයත් සමෘද්ධ විය.

**කදහං සප්පිනවනීතං - මධුතෙලඤ්ච ඵාණිතං,**
**භෙසජ්ජදානං දස්සාමි - සබ්බකපොා මයහ පූරිතො'ති"**

ගිතෙල් වෙඬරු තලතෙල් මී පැණි හකුරු ආදී බෙහෙත් සකසා කවර කලෙක ඖෂධ දන් දෙම් ද, යනුවෙන් ප්‍රාර්ථනා කරගෙන ආවා වූ එම ප්‍රාර්ථනයත් සමෘද්ධ විය.

භික්ෂූන් වහන්සේලා විශාඛාව මෙලෙස කියමින් විහාරය වටා සපිරිවරින් ඇවිදීම දැක භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! අපි මෙතෙක් කලක් විශාඛාව ගී කියන බවක් අසා නැත. අද විශාඛාව තම දරු මුනුබුරන් කැටුව ගී කියමින් විහාරය වටා ඇවිදින්නී ය. කිමෙක් ද ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! ඇයගේ ශරීරයෙහි පිත කිපී ද, නැතහොත් උමතු වී ද"** යනුවෙන් අසා සිටියහ.

එවිට භාග්‍යවතුන් වහන්සේ **"මහණෙනි! මාගේ දියණිය ගීත ගායනා නොකරයි. ඇයගේ අදහස දූන් සම්පූර්ණ ය. එබැවින් තමාගේ ප්‍රාර්ථනා සියල්ල සම්පූර්ණ ය යැයි සතුටට පත්ව උදන් අනමින් හැසිරෙයි"** යැයි වදාළ සේක. එවිට භික්ෂූන් වහන්සේලා **"ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! විශාඛාව කවද නම් එබඳු පැතුමක් කරන ලද්දේ ද?"** යැයි අසා සිටියහ. එවිට භාග්‍යවතුන් වහන්සේ විශාඛාවගේ අතීත ප්‍රාර්ථනාව මෙසේ වදාළ සේක.

මහණෙනි! මේ මහා භද්‍ර කල්පයෙන් මහා කල්ප ලක්ෂයකට පෙර අවුරුදු ලක්ෂයක් මනුලොව ආයුෂය ඇති කල්හි පියුම තුරා (පදුමුත්තර) නම් ලෝක නායක වූ සර්වඥ සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළ වූයේ ය. ඒ භාග්‍යවතුන් වහන්සේ ගමන් වඩිනා විට අනූ රියන් පමණ පෙති ඇති, තිස් රියන් පමණ කෙසුරු ඇති, කළ නවයක් පමණ රේණු ඇති, දෙළොස් රියන් පමණ වූ හෙළ පියුම් රත් පියුම් පිපෙමින් එක් පියවරකින් වත් අත් නො හැරී චක්‍ර ලක්ෂණයන්ගෙන් යුත් ශ්‍රී පාද යුග්මය පිළිගන්නා බැවින් ඒ බුදුරජාණන් වහන්සේ **"පියුම තුරා"** නම් වූහ. ඒ භාග්‍යවතුන් වහන්සේ උපන් නගරය හංසවතී නුවර ය. පියාණෝ ආනන්ද නම් රජතුමා ය. මෑණියෝ සුජාතා නම් බිසව ය. ඒ බුදුරජාණන් වහන්සේට සැම කල්හි රහත් භික්ෂූහු

ලක්ෂයක් පිරිවර වූහ. "**දේවලය, සුජාතය**" යන තෙරුන් වහන්සේලා අග්‍රශ්‍රාවකයෝ වූහ. සුමන තෙරණුවෝ උපස්ථායක විය. "**අමිතා අසමා**" යනුවෙන් අග්‍ර ශ්‍රාවිකාවෝ දෙදෙනෙක් වූහ. බෝධි වෘක්ෂය "**සලල**" නම් විය. "**විතින්නය, තිස්සය**" යනුවෙන් අග්‍ර උපස්ථායකයෝ දෙදෙනෙක් වූහ. "**හත්‍ථාය විචිත්තාය**" යනුවෙන් අග්‍ර උපස්ථායිකාවෝ දෙදෙනෙක් වූහ. රන් ඇගෑවක් (පහන් ගසක්) බඳු ව, දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් යුත් (පදුමුත්තර) බුදුරජාණන් වහන්සේ අට පනස් රියන් ශරීරය ඇති වූහ. පියුම තුරා භාග්‍යවතුන් වහන්සේට අග්‍ර උපස්ථායිකාව වූ උපාසිකාවක් භාග්‍යවතුන් වහන්සේ වෙතින් අට වරයක් ඉල්ලා මවු තනතුරෙහි සිට උදය සවස විහාරයට යමින් බුද්ධ ප්‍රමුඛ මහා සංඝයාට නිතර උපස්ථාන කරයි. එතුමිය සමග සැමද යෙහෙළියක ද යයි. එතුමිය එම උපස්ථායිකාව භාග්‍යවතුන් වහන්සේ සමග ඉතා විශ්වාසවන්තව බව හා ප්‍රිය මනාප බව දැක "**බුදුරජාණන් වහන්සේලාට ප්‍රිය මනාප වීමට කුමක් කළ යුතු ද**" යැයි සිතා බුදුරජාණන් වහන්සේ වෙත එළඹ වැඳ "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මෙම උපාසිකාව මේ බුදු සසුනෙහි කවුරු නම් වේ ද**" යැයි ඇසුවා ය. භාග්‍යවතුන් වහන්සේ "**පින්වතිය, එතුමිය මාගේ සසුනෙහි අග්‍ර උපස්ථායිකාව වන්නී ය**" යැයි වදාළ සේක. එවිට එතුමිය "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! අග්‍ර උපස්ථායිකාවක වන්නට කුමක් කළ යුතු ද**" යැයි ඇසුවා ය. පින්වතිය, "**ඒ සඳහා කල්ප ලක්ෂයක් දනාදී පාරමී පිරිය යුතුය**" යැයි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! දැනුත් එසේ කළ හැකි ද?**" යැයි අසා හැකි බව වදාළ කල්හි බුද්ධ ප්‍රමුඛ ලක්ෂයක් භික්ෂූන් වහන්සේලා තම නිවසට වැඩමවා සත් දිනක් මුළුල්ලෙහි මහා දන් දී සත් වන දින සිවුරු පිණ්ස පිළි පූජා කොට බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී පාමුල වැටී වැඳ, "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මම සත් දිනක් මුළුල්ලෙහි බුද්ධ ප්‍රමුඛ ලක්ෂයක් මහසඟරුවණට සිත් සේ දන් දී සිවුරු පිණ්ස පිළි පූජා කිරීමේ මහඟු කුසල බලයෙන් දෙව් මිනිස් සක්විති සම්පත්තියක් නො පතමි. භාග්‍යවතුන් වහන්සේ හා සමාන බුදුරජාණන් වහන්සේ නමක ගේ ශාසනයක අට වරයක් ලබා මව් තනතුරෙහි සිට සිවු පසයෙන් උපස්ථාන කරන්නියන් අතර ප්‍රධාන වන්නට ලැබේවා**" යැයි කියා සිටියා ය. භාග්‍යවතුන් වහන්සේ "**මැයගේ මේ ප්‍රාර්ථනාව සමෘද්ධ වේ ද**" යැයි අනාගතංස ඥාණයෙන් බලා සමෘද්ධ වන බව දැක, "**මෙයින් කල්ප ලක්ෂයකින් මතු මහා භද්‍ර කල්පයෙහි ලොව පහළ වන ගෞතම සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ ශාසනයෙහි දී විශාඛා**

**නම් උපාසිකාවක වී ඒ බුදුරජාණන් වහන්සේ හමුවෙහි අට වරයක් ලැබ මවු තනතුරෙහි පිහිටා බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට උපස්ථාන කරන උපාසිකාවන් අතර අග්‍ර වන්නී ය**" යැයි වදාළ සේක.

එතුමියට කල්ප ලක්ෂයකින් ලැබෙන එම සම්පත්තිය අද ලැබෙන්නක් සේ වැටහී මහත් පින්කම් සිදු කොට ආයු කෙළවර දෙව්ලොව උපන්නා ය. මෙලෙස දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳිමින් ඇවිත් කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ කාලයෙහි බරණැස් නුවර කිකී නම් කාශි රජතුමාගේ දියණියන් සත් දෙනාගෙන් බාල දියණිය වූ "**සංඝ දාසිය**" නමින් ඉපිද වැඩි විය පැමිණ බොහෝ කලක් දානාදී පින්කම් කොට ඒ කාශ්‍යප දස බලධාරීන් වහන්සේ හමුවෙහි දී ද අනාගත "**බුදුරජාණන් වහන්සේ නමක ගේ ශාසනයක අට වරයක් ලබා මව් තනතුරෙහි සිට සිවුපසයෙන් උපස්ථාන කරන්නියන් අතර ප්‍රධාන වන්නට ලැබේවා**" යැයි ප්‍රාර්ථනා කරන ලද්දේ ය. එතැන් සිට ද දිව්‍ය මනුෂ්‍ය සැප විඳිමින් පාරමී පුරමින් පැමිණ මෙකල්හි ධනඤ්ජය සිටුතුමා හට දියණිය ව උපන්නා ය. දැන් ඇය මාගේ සසුනෙහි මහත් සේ පින් කරයි. "**මහණෙනි! මෙසේ මාගේ සසුනෙහි අග තනතුරු ලැබීමට පතා කල්ප ලක්ෂයක් පිරූ පාරමී ගුණ පිරූ මාගේ දියණිය ගායනා නොකරයි. තම ප්‍රාර්ථනාවන් මුදුන් පත්ව ඇති බව දැක උදන් අනන්නී ය**" යැයි වදාරා එම කාරණය මුල්කොට ධර්මදේශනා කරන සේක් මෙම ගාථාව වදාළ සේක.

**යථාපි පුප්ඵරාසිම්හා - කයිරා මාලාගුණෙ බහූ,**
**එවං ජාතෙන මච්චෙන - කත්තබ්බං කුසලං බහුං.**

(ධම්මපදය පුෂ්ප වර්ගය)

**(දක්ෂ වූ මාලාකාරයෙක්) බොහෝ මල් එකතු කොට මල් දම් කරන්නේ යම් සේ ද, එපරිද්දෙන් ම උපන්නා වූ මිනිසා විසින් බොහෝ කුසල් කටයුතු ය. යන මේ ධම්මපද දේශනාව වදාළ සේක.**

පසු කලෙක "**එතදග්ගං, භික්ඛවෙ, මම සාවිකානං දායිකානං යදිදං විසාඛා මිගාරමාතා**" යනුවෙන් "**මහණෙනි! යම් මිගාරමාතා විශාඛාව නම් උපාසිකාවක් ඇත් ද, දීමෙහි ඇලුනා වූ මාගේ ශ්‍රාවිකා**

**උපාසිකාවන් අතර එතුමිය අග්‍ර වේය"** යැයි විශාඛා මහ උපාසිකාව අග තනතුරෙහි තබා වදාළ සේක.

මෙසේ විශාඛාව විසින් කහවණු විසිහත් කෝටියක ධනයන් වැය කොට සාදවා බුදු සසුනට පූජා කරන ලද පූර්වාරාමය නම් වූ මිගාරමාතු ප්‍රාසාදයෙහි භාග්‍යවතුන් වහන්සේ සය අවුරුද්දක් විශාඛාවට අනුග්‍රහ දැක්වීම පිණිස වැඩසිටි සේක.

මෙහි දී ආරාමය දැක්වීමෙන් යම් ගොදුරු ගමක් ඇසුරු කොට සතර ඉරියව් පවත්වමින් පහසු විහරණයෙන් වාසය කිරීමට යෝග්‍ය වාසස්ථානය දැක්වීම වේ. මෙහි සැවැත් නුවර දැක්වීමෙන් ගොදුරු ගම දක්වයි. ආරාමය දැක්වීමෙන් පැවිද්දට යෝග්‍ය නිවාස ස්ථානය දක්වයි. තවද සැවැත් නුවර දැක්වීමෙන් භාග්‍යවතුන් වහන්සේගේ ගිහි ජනයාට අනුග්‍රහ කිරීම ද, ආරාමය දැක්වීමෙන් පැවිද්දන්ට අනුග්‍රහ කිරීම ද දක්වයි. එසේම නගරය දැන්වීමෙන් සිවු පසය ලැබීමෙන් අත්ථකිලමතානුයෝගයෙන් දුරු වීම ද, ආරාමය දැක්වීමෙන් වස්තු කාම ප්‍රහාණයෙන් වෙන් වීමේ උපාය ද දක්වයි. එසේම නගරය දැක්වීමෙන් ධර්ම ශ්‍රවණය ද, ආරාමය දැක්වීමෙන් ඒ ධර්මයෙහි යෙදීම ද දක්වයි. තව ද ගොදුරු ගම දැක්වීමෙන් කරුණාවෙන් ජනයා වෙත එළඹීම ද, ආරාමය දැක්වීමෙන් ඒ ගෘහ වාසයෙහි ආදීනව දැක ඒවායෙන් නිදහස් වීම ද දක්වයි. තව ද ගොදුරු ගම දැක්වීමෙන් සත්වයන්ට හිතසුව ඇති කිරීමේ අදහස ද, ආරාමය දැක්වීමෙන් අනුන්ට හිතසුව ඇති කිරීමෙහි නො ගැලී සිටීම ද දක්වයි. තව ද ගොදුරු ගම දැක්වීමෙන් ධාර්මික සැපය අත නොහැරීම නිමිති කොට ඇති පහසු විහරණය ද, ආරාමය දැක්වීමෙන් උත්තරිමනුෂ්‍ය ධර්මයෙහි යෙදීම නිමතිකොට ඇති පහසු විහරණය ද දක්වයි. තව ද ගොදුරු ගම දැක්වීමෙන් මිනිසුන්ට බොහෝ උපකාර බව ද, ආරාමය දැක්වීමෙන් දෙවියන්ට බොහෝ උපකාර බව ද දක්වයි. තව ද ගොදුරු ගම දැක්වීමෙන් ලෝක ජනයා අතර ඉපද ඔවුන් අතරම වැඩුණු බව ද, ආරාමය දැක්වීමෙන් ලෝකය හා නො ඇලුණු බව ද දක්වයි. මෙතෙක්නි මේ සූත්‍ර දේශනාව පිළිබඳ වූ නිදන වර්ණනාව දක්වන ලද්දේ ය. මෙතැන් පටන් සූත්‍ර සාරය පිළිබඳ වූ අනු පිළිවෙල අර්ථ වර්ණනාව දැක්වෙන්නේ ය.

# ❄ වාසෙට්ඨ භාරද්වාජ දෙනම

එක් කලෙක භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි වූ මිගාර මාතෘ ප්‍රාසාදය නම් පූර්වාරාමයෙහි වැඩ වාසය කරන සේක. එකල්හි වාසෙට්ඨ, භාරද්වාජ නම් සාමණේර දෙනම භික්ෂු භාවය (උපසම්පදව) බලාපොරොත්තු වෙමින් භික්ෂූන් සමීපයෙහි වෙසෙත්. මේ සාමණේරයන් වහන්සේලා දෙනම සතළිස් කෝටිය බැවින් මහත් ධනය ඇති බ්‍රාහ්මණ මහා සාර කුලයෙහි ඉපිද වැඩි විය පැමිණ ත්‍රි වේදය පරතෙරට ඉගෙන ගත්හ. මේ බ්‍රාහ්මණ වංශිකයෝ සය මසකට වරක් දෙ තැනක රැස් වෙති. යම් කලෙක ජාතිය පිරිසිදු කරනු කැමැත්තේ වේ ද, එකල්හි "**උක්කට්ඨා නුවර පොක්කරසාති බ්‍රාහ්මණයා**" වෙත රැස් වෙති. යම් කලෙක මන්ත්‍ර පිරිසිදු කරනු කැමැත්තේ වේ ද එකල්හි "**ඉච්ඡානංගල ගමෙහි**" රැස් වෙති. මෙලෙස එක් කලෙක මන්ත්‍ර පිරිසිදු කරනු පිණිස **ඉච්ඡානංගල ගමෙහි** රැස් වූ විටෙක මේ වාසෙට්ඨ භාරද්වාජ යන තරුණ මිත්‍රයන් දෙදෙනා එක්ව පිළිසඳර කථාවක් ඇතිවිය. එහි දී වාසෙට්ඨ තරුණයා භාරද්වාර මිත්‍රයාගෙන් "**බ්‍රාහ්මණයෙකු වන්නේ කෙසේ ද**" යැයි ප්‍රශ්නයක් ඇසී ය. එවිට භාරද්වාජ තරුණයා පරම්පරා සතක් දක්වා කිලිටි නො වූ පිරිසිදු වූ කුල කිසිවෙකු විසින් ජාති වාදයෙන් බැහැර නොකරන ලද නින්ද නොකරන ලද උසස් කුල පරම්පරාවක උපන් හේතුවෙන් බ්‍රාහ්මණ වේය යැයි පිළිතුරු දුන්නේ ය.

එවිට වාසෙට්ඨ තරුණයා "**යමෙක් සිල්වත් වේ ද, ආචාර සම්පන්න වේ ද මෙතෙකින් බ්‍රාහ්මණ වෙයි**" යැයි කීවේ ය. මේ දෙදෙනාට ඔවුනොවුන් ගේ කථාවන් ගිවිස ගැනීමට නොහැකි විය. එවිට භාරද්වාජ මානවකයා වාසෙට්ඨ මානවකයා අමතා "**ශාක්‍ය කුලයෙන් නික්ම පැවිදි වූ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ කෙරෙහි ලොව මේ කරුණින් අර්හත්ය, සම්මා සම්බුද්ධය... භගවාය යනාදී ලෙස උසස් කීර්තියක් පැන නැඟී ඇත්තේ ය. ඒ ගෞතමයන් වහන්සේ ඉච්ඡානංගල ගම ඉච්ඡානංගල වනලැහැබෙහි වාසය කරයි. අපි ඒ භාග්‍යවතුන් වහන්සේ වෙතින් මේ ප්‍රශ්නය විමසමු**" යැයි කියා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ එම ප්‍රශ්නය විමසූහ. භාග්‍යවතුන් වහන්සේ යමෙක් ක්ලේශ ප්‍රහාණයෙන් අර්හත්වයට පැමිණේ ද හෙතෙම

ම බ්‍රාහ්මණ වේය යැයි පහද දෙමින් මජ්ඣිම නිකායේ එන වාසෙට්ඨ සූත්‍රය වදාළ සේක. එය අසා ඒ දෙදෙනා තෙරුවන් සරණ ගියහ.

නැවත වතාවක භාග්‍යවතුන් වහන්සේ කොසොල් රට මනසාකට බ්‍රාහ්මණ ගම චාරිකා කරන සේක් ඒ ගමට උතුරු දිසාවෙහි වූ අචිරවතී නදී තෙර වන ළැහැබක වසන සේක. එකල්හි මේ වාසෙට්ඨ භාරද්වාජ මානවකයන් දෙදෙනා අතර මග නොමග පිළිබඳව කථාවක් ඇතිව එහි නිගමනයකට පැමිණීමට නොහැකි ව භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ එම ප්‍රශ්නය විමසූහ. භාග්‍යවතුන් වහන්සේ එම ප්‍රශ්නය විසඳ දෙමින් දීඝ නිකායෙහි එන තේවිජ්ජ සූත්‍රය වදාළ සේක. එය අසා මේ මානවකයන් දෙදෙනා බුදු සසුනෙහි පැවිදි ව උපසම්පදව ලැබීමේ බලාපොරොත්තුව ඇතිව සිටියහ.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි ඵල සමාපත්තියෙන් නැගී සිට ප්‍රාසාදයෙන් බැස උතුරින් හා දකුණෙන් පලල් වූ ප්‍රාසාදයේ ඉදිරිපස වූ නැගෙනහිර දිග සෙවන ඇති එළිමහනෙහි සක්මන් කළ සේක.

වාසෙට්ඨ නම් සාමණේරයන් වහන්සේ ද සවස් වේලෙහි ඵල සමාපත්තියෙන් නැගී සිට ප්‍රාසාදයෙන් බැස ප්‍රාසාද සෙවණැල්ල පවත්නා අවකාශස්ථානයෙක්හි සක්මන් කරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ දුටුවේ ය. සත් රියන් උස රන් ඇගෑවක් (මලින් සැරසූ කණුවක්) මෙන් සවනක් රැස් මාලා ආකාශය පුරා විහිදෙමින් සක්මන් කරන භාග්‍යවතුන් වහන්සේ දැක භාරද්වාජ නම් සාමණේරයන් වහන්සේ අමතා "**ආයුෂ්මත් භාරද්වාජයෙනි, භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි ඵල සමාපත්තියෙන් නැගී සිට ප්‍රාසාදයෙන් බැස ප්‍රාසාදයේ ඉදිරිපස වූ නැගෙනහිර දිග සෙවන ඇති එළිමහනෙහි සක්මන් කරන්නාහුය. ආයුෂ්මත් භාරද්වාජය, (අපි) යමු, ඒ භාග්‍යවතුන් වහන්සේ යම් තැනක ද එතැනට පැමිණෙන්නෙමු. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙන් ධර්ම කථාවක් අසන්නට ලබන්නෙමු නම් ඉතා යහපති**" යැයි කීය.

"**ඇවැත්නි, එසේය**" යැයි භාරද්වාජ සාමණේරයන් වහන්සේ වාසෙට්ඨ සාමණේරයන් වහන්සේට පිළිවදන් දුන්නේ ය.

එවිට වාසෙට්ඨ භාරද්වාජ සාමණේරයන් වහන්සේලා දෙනම භාග්‍යවතුන් වහන්සේ යම් තැනක ද එතැනට පැමිණියහ. පැමිණ ඇඳිලි බැඳ මනාකොට භාග්‍යවතුන් වහන්සේ වැඳ නැමුණු ශරීර ඇතිව සක්මන් කරන්නා වූ භාග්‍යවතුන් වහන්සේ අනුව සක්මන් කළහ.

එවිට භාග්‍යවතුන් වහන්සේ "**වාසෙට්ඨ සාමණේරයෝ පණ්ඩිත ය, විසඳිය යුත්ත ද දනීය**" යැයි නුවණින් දැන වාසෙට්ඨ සාමණේරයන් වහන්සේට කථා කොට මෙසේ වදාළ සේක. "**වාසෙට්ඨය, තෙපි වනාහි බ්‍රාහ්මණ ජාතික වූ බ්‍රාහ්මණයන් අතුරෙහි කුල සම්පන්න වූ බ්‍රාහ්මණ කුලය හැර ගිහි ගෙයින් නික්ම ශාසනයෙහි මහණ වූවාහු ය. වාසෙට්ඨය, කිම? (අන්‍ය) බ්‍රාහ්මණයෝ තොපට දසවිධ අක්‍රෝෂ වස්තුන් ගෙන් අපහාස නොකෙරෙත් ද? හෙළා දැකීම නොකෙරෙත් ද?**" යනුවෙන් බ්‍රාහ්මණයන් විසින් අක්‍රෝෂ කරන ආකාරය මෙසේ අසා වදාළ සේක.

එවිට ඒ දෙදෙනා වහන්සේ "**ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, එකාන්තයෙන් ම බමුණෝ අපට අතරක් නැර නිරතුරුව තමන්ට හුරු වූ පරිභව වචනයෙන් දසවිධ අක්‍රෝෂ වස්තුන් ගෙන් අපහාස කෙරෙති. පරිභව කෙරෙති**" යැයි කීය.

"**වාසෙට්ඨය, බ්‍රාහ්මණයෝ අතරක් නැර නිරතුරුව තමන්ට හුරු වූ පරිභව වචනයෙන් දසවිධ අක්‍රෝෂ වස්තුන්ගෙන් කෙසේ අපහාස කෙරෙත් ද? පරිභව කෙරෙත් ද?**" යැයි අසා වදාළ සේක.

එවිට මේ සාමණේරයන් වහන්සේලා බ්‍රාහ්මණයෝ අක්‍රෝෂ පරභව කනී අයුරු මෙසේ දැන්වූහ.

"**ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ජාති ගෝත්‍ර ආදිය පනවන අවස්ථාවන්හි බ්‍රාහ්මණ වර්ණය ම (කුලය) ලොව ශ්‍රේෂ්ඨ ය. අනිත් වර්ණයෝ පහත් ය. බ්‍රාහ්මණ වර්ණය ම පිරිසිදු ය. ක්‍ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන අන්‍ය වර්ණයෝ අපිරිසිදු ය. නීච ය. ජාති ගෝත්‍ර ආදිය පනවන ස්ථානයන්හි බ්‍රාහ්මණයෝ ම ශුද්ධ වෙති. අන්‍යයෝ ශුද්ධ නොවෙති. බ්‍රාහ්මණයෝ ම බ්‍රහ්මයාගේ උරයෙහි වැස මුවින් බිහි වූ ලයෙහි තබා**

වැඩූ බැවින් බ්‍රහ්මයාගේ ඖරස පුත්‍රයෝ ය. බ්‍රහ්මයාගෙන් උපන් බ්‍රහ්මයා විසින් මවන ලද, බ්‍රහ්මයා විසින් නිර්මාණය කරන ලද වේද - වේදංග ආදී වූ බ්‍රහ්මයාගේ දෑවැද්දට උරුම කර වූ ඒ තෙපි ශ්‍රේෂ්ඨ වර්ණය හැර දමා ගෘහපති කුලයෙහි උපන් කළු වූ මාර පාක්ෂික වූ බ්‍රහ්මයාගේ පාදයන් ගෙන් උපන් මුඩු මහණුන් වූ හීන වර්ණයකට බැස ගත්තෝ වහු ය. ඒ මේ බ්‍රාහ්මණ කුමාරවරු දඹදිව බ්‍රාහ්මණයින් අතර ප්‍රකට ය. බුහුමනට පත් වූහ. ඔවුන් පැවිදි වූ බැවින් අන්‍ය බ්‍රාහ්මණ පුත්තු ද පැවිදි වූහ. ඒ හේතුවෙන් අපට පිහිටක් නැතිව ගියේය යැයි ගම් දෙර ආදී තැන්හි දී ද ඔවුන් දක ඔබලා විසින් බ්‍රාහ්මණ සමය බිඳින ලදි. නුඹලා මුඩු මහණාගේ පසු පස්සේ රසයට ලොල් ව හැසිරෙන්නෙහු ය" 'බ්‍රාහ්මණ තෙමේ ම උතුම් වංශ ඇත්තේ ය. අන්‍යයෝ හීන වංශ ඇත්තෝ ය. බ්‍රාහ්මණ තෙමේ ම පිරිසිදු වංශ ඇත්තේ ය. බ්‍රාහ්මණයෝ ම ශුද්ධ වෙති. බ්‍රාහ්මණ නො වූවෝ ශුද්ධ නොවෙති. බ්‍රාහ්මණයෝ ම මහා බ්‍රහ්මයාගේ පුත්‍රයෝ ය. (ඔහුගේ) කටින් පහළ වූවාහු ය. (ඔහු විසින්) හෘදයෙහි තබා වඩන ලද්දාහු ය. නොහොත් හෘදයෙහි වැස කටින් නික්මුණාහුය. බ්‍රහ්මයාගෙන් උපන්නාහු ය. බ්‍රහ්මයා විසින් මවන ලද්දාහු ය. බ්‍රහ්මයාගේ ම නෑයෝ වෙති. ඒ තෙපි ශ්‍රේෂ්ඨ වංශය හැර පියා හීන වූ මාර පක්ෂයෙහි වූ බඹහු ගේ පාදයෙන් උපන්නා වූ අපිරිසිදු වූ මුඩු මහණහු කෙරෙහි පැවිදි වීම නම් වූ යම් ඒ හීන වංශයකට පැමිණීමක් ඇත් ද, මහ බඹහු ගේ පාදයෙන් උපන්නා වූ මුඩු මහණහු කෙරෙහි පැවිදි වීම නම් වූ ඒ හීන වංශයට පැමිණීම තොපට නුසුදුසු ය. එය නො මැනවි" යනුවෙන් ස්වාමීනි, බමුණෝ මෙසේ අපට තම තමන්ට කැමති අක්ෂර පද යොදා අපහාස කෙරෙති. හෙළා දැකීම කෙරෙති යැයි කීහ.

මේ සාමණේරයන් වහන්සේලා දෙනම මෙලෙස බ්‍රාහ්මණයෝ අක්‍රෝෂ පරිභව කරන කල්හි ද කෝපයක් හෝ වෛරයක් නොකොට භාග්‍යවතුන් වහන්සේ විසින් විචාරන කල්හි මෙලෙස අක්‍රෝෂ පරිභව කරන අයුරු දැන්වූහ.

එවිට භාග්‍යවතුන් වහන්සේ වාසෙට්ඨය, ඒකාන්තයෙන් ම බ්‍රාහ්මණයෝ පුරාණ වූ අග්ගඤ්ඤ ලෝකෝත්පත්ති වංශයෙහි ආරම්භය මුල සිහි නො කරමින් මුල නො දැන "බ්‍රාහ්මණ වර්ණය ම (කුලය) ලොව ශ්‍රේෂ්ඨ ය. අනිත් වර්ණයෝ පහත් ය. බ්‍රාහ්මණ වර්ණය ම

**පිරිසිදු ය. ක්‍ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන අන්‍ය වර්‍ණයෝ අපිරිසිදු ය. නීච ය. ජාති ගෝත්‍ර ආදිය පනවන ස්ථානයන්හි බ්‍රාහ්මණයෝ ම ශුද්ධ වෙති. අන්‍යයෝ ශුද්ධ නොවෙති. බ්‍රාහ්මණයෝ ම බ්‍රහ්මයාගේ උරයෙහි වැස මුවින් බිහි වූ ලයෙහි තබා වැඩූ බැවින් බ්‍රහ්මයාගේ ඖරස පුත්‍රයෝ ය"** යැයි මෙසේ කියති.

වාසෙට්ඨය, බ්‍රාහ්මණයන්ගේ ඔසප් වූ ද, ගැබිනි වූ ද, දරුවන් වදන්නා වූ ද, දරුවන්ට කිරි පොවන්නා වූ ද මෙලෙස බ්‍රාහ්මණයින්ගේ පුත්‍ර ප්‍රතිලාභය පිණිස අවාහ විවාහ වශයෙන් කුලයට කැඳවාගෙන එන ලද බැමිණියෝ දක්නා ලැබෙති. ඔවුහු වනාහි පසු කාලයෙහි ඍතු වූවෝ වෙති. හටගත් දරු ගැබ් ඇත්තේ වේ දූ පුතුන් වදන්නියෝ, දරුවන්ට කිරි පොවන්නියෝ වෙති. ඒ බ්‍රාහ්මණයෝ මෙසේ ස්ත්‍රීන්ගේ යෝනි මාර්‍ගයෙන් ම උපන්නෝ ව මෙසේ කියති. **බ්‍රාහ්මණ වර්‍ණය ම (කුලය) ලොව ශ්‍රේෂ්ඨ ය. අනිත් වර්‍ණයෝ පහත් ය. බ්‍රාහ්මණ වර්‍ණය ම පිරිසිදු ය. ක්‍ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන අන්‍ය වර්‍ණයෝ අපිරිසිදු ය. නීච ය. ජාති ගෝත්‍ර ආදිය පනවන ස්ථානයන්හි බ්‍රාහ්මණයෝ ම ශුද්ධ වෙති. අන්‍යයෝ ශුද්ධ නොවෙති. බ්‍රාහ්මණයෝ ම බ්‍රහ්මයාගේ උරයෙහි වැස මුවින් බිහි වූ ලයෙහි තබා වැඩූ බැවින් බ්‍රහ්මයාගේ ඖරස පුත්‍රයෝ ය** කියායි. මෙසේ බ්‍රාහ්මණයෝ මහා බ්‍රහ්මයාගේ උරයෙහි වැස මුවින් උපන්නාහු ය යන මෙය සැබෑවක් වේ නම් බැමිණියන්ගේ කුස මහා බ්‍රහ්මයාගේ උරය වන්නේ ය. බැමිණියන්ගේ යෝනි මාර්‍ගය මහා බ්‍රහ්මයාගේ මුඛය වන්නේ ය. මෙය මෙසේ නො දත යුතු ය. මෙසේ කියන ඔවුහු බ්‍රහ්මයාට ම නින්ද කරති. මුසාවාදයෙන් චෝදනා කරති. බොහෝ අකුසල් ද රැස් කෙරෙති යැයි වදරා නැවත බ්‍රාහ්මණ, ක්‍ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන සිවු වර්‍ණය ම කුසල ධර්‍ම සමාදන්ව පැවැත්ම හේතුවෙන් ශුද්ධ වෙති යැයි දැක්වීම පිණිස මෙසේ වදාළ සේක.

# ❄ චතුවර්ණ ශුද්ධිය

වාසෙට්ඨය, **ක්‍ෂත්‍රියයෝ** ය, **බ්‍රාහ්මණයෝ** ය, **වෛශ්‍යයෝ** ය (වෙළඳුන්ය), **ශුද්‍රයෝ** ය (දාස, කම්කරුවෝ) යැයි වර්ණ (වංශ) සතරක් වෙති. වාසෙට්ඨය, මේ ලෝකයෙහි ඇතැම් ක්‍ෂත්‍රියෙක් ද ප්‍රාණඝාත කරන්නෙක් වෙයි. නුදුන් දෙය ගන්නෙක් වෙයි. කාමයෙහි වරදවා හැසිරෙන්නෙක් වෙයි. බොරු කියන්නෙක් වෙයි. කේලාම් කියන්නෙක් වෙයි. පරුෂ වචන කියන්නෙක් වෙයි. හිස් වචන කියන්නෙක් වෙයි. දැඩි ලොභය බහුල කොට ඇත්තෙක් වෙයි. ක්‍රෝධයෙන් යුත් සිත් ඇත්තෙක් වෙයි. මිථ්‍යාදෘෂ්ටි (වැරදි දැකීම්) ඇත්තෙක් වෙයි.

"වාසෙට්ඨය, මෙසේ යම් ධර්මයක් අකුසල් වෙයි ද, අකුසල් යැයි කියන ලද අකුසල් ම වූ, වරද සහිත යයි කියන ලද වරද සහිත ම වූ, සේවනය නොකට යුතු යැයි කියන ලද සේවනය නොකට යුතු ම වූ, ආර්‍ය්‍ය භාවයට අසමත් යැයි කියන ලද ආර්‍ය්‍ය භාවයට නුසුදුසු වූ කළු (අඳුරු) විපාක ඇති, අපිරිසිදු කර්ම ඇති, නුවණැත්තන් විසින් ගර්හා කරන ලද්ද වූ යම් අකුසල ධර්ම වේ ද, එබඳු ධර්මයෝ ඇතැම් ක්‍ෂත්‍රියා කෙරෙහි ද දක්නා ලැබෙත්. බ්‍රාහ්මණයා කෙරෙහි ද දක්නා ලැබෙති. වෛශ්‍යයා කෙරෙහි ද දක්නා ලැබෙත්. ශුද්‍රයා කෙරෙහි ද දක්නා ලැබෙති.

"වාසෙට්ඨය, මේ ලෝකයෙහි ඇතැම් ක්‍ෂත්‍රියෙක් ද ප්‍රාණඝාතයෙන් වැළකුණේ වෙයි. නුදුන් දෙය ගැනීමෙන් වැළකුණේ වෙයි. කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකුණේ වෙයි. බොරු කීමෙන් වැළකුණේ වෙයි. කේලාම් කීමෙන් වැළකුණේ වෙයි. පරුෂ වචන කීමෙන් වැළකුණේ වෙයි. හිස් වචන කීමෙන් වැළකුණේ වෙයි. දැඩි ලෝභය බහුල කොට ඇත්තේ නොවෙයි. ක්‍රෝධ සිත් ඇත්තේ නොවෙයි. සම්‍යක්දෘෂ්ටිය (නිවැරදි දැකීම) ඇත්තේ වෙයි.

වාසෙට්ඨය, මෙලෙස යම් ධර්මයක් කුසල් වෙයි ද, කුසල් යැයි කියන ල ද වරද රහිත ම වූ, සේවනය කට යුතුය යැයි කියන ලද සේවනය කළ යුතු ම වූ, ආර්‍ය්‍ය භාවය සිදු කිරීමෙහි සමර්ථ යැයි කියන ලද ආර්‍ය්‍ය භාවය සිදු කිරීමෙහි සමර්ථ ම වූ, කුසල විපාක ඇති කුසල ම

වූ, නුවණැත්තන් විසින් ප්‍රශංසා කරණ ලද යම් ධර්මයක් වෙයි ද, ඒ ඇතැම් ධර්මයන් ඇතැම් ක්‍ෂත්‍රිය කෙරෙහි ද දක්නා ලැබෙත්. බ්‍රාහ්මණයා කෙරෙහි ද දක්නා ලැබෙති. වෛශ්‍යයා කෙරෙහි ද දක්නා ලැබෙත්. ශුද්‍රයා කෙරෙහි ද දක්නා ලැබෙති.

වාසෙට්ඨය, මේ සතර වර්ණයන් (කුලයන්) කෙරෙහි ම නුවණැත්තන් විසින් ගර්හා කරණ දහම්හි ද, නුවණැත්තන් විසින් ප්‍රශංසා කරණ දහම්හි ද, පිරිසිදු දහම්හි ද, අපිරිසිදු දහම්හි ද, මෙලෙස කුසලාකුසල මිශ්‍ර ධර්මයන්හි ද පවත්නා කල්හි "**බ්‍රාහ්මණ වර්ණය ම (කුලය) ලොව ශ්‍රේෂ්ඨ ය. අනිත් වර්ණයෝ පහත් ය. බ්‍රාහ්මණ වර්ණය ම පිරිසිදු ය. ක්‍ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන අන්‍ය වර්ණයෝ අපිරිසිදු ය. නීච ය. ජාති ගෝත්‍ර ආදිය පනවන ස්ථානයන්හි බ්‍රාහ්මණයෝ ම ශුද්ධ වෙති. අන්‍යයෝ ශුද්ධ නොවෙති. බ්‍රාහ්මණයෝ ම බ්‍රහ්මයාගේ උරයෙහි වැස මුවින් බිහි වූ ලයෙහි තබා වැඩූ බැවින් බ්‍රහ්මයාගේ ඖරස පුත්‍රයෝ ය** යැයි මෙසේ කියත් ද, ඔවුන්ගේ ඒ කථාව නුවණැත්තෝ නො පිළි ගනිත්. ඊට හේතු කවරේද?

වාසෙට්ඨය, මේ ක්‍ෂත්‍රිය ආදි සතර වංශයන් අතුරෙන් කවර එකකින් හෝ යම් භික්‍ෂුවක් බුද්ධානුශාසනයෙහි පිහිටා කෙලෙස් දුරු කිරීමෙන් රහත් වූයේ වෙයි ද, ක්‍ෂය කරන ලද ආශ්‍රව ඇත්තේ වේ ද, අර්හත් මාර්ගය ලැබීමෙන් හැසිරීම නිම කරන ලද බ්‍රහ්මචර්‍ය්‍යාව ඇත්තේ වේ ද, සෝවාන් ආදී සිවු මගින් සතර ආර්‍ය්‍ය සත්‍යාවබෝධයෙන් නිර්වාණාවබෝධය පිණිස කළ යුතු කටයුතු නිම කරන ලද්දේ වේ ද, සෑම ලෙසින් ම නසන ලද භව බන්ධන ඇත්තේ වේ ද, කෙලෙසුන්ගෙන් මිදුණු බව ප්‍රත්‍යවේක්‍ෂා ඥාණයන්ගෙන් ප්‍රත්‍යක්‍ෂ වශයෙන් මනාව දන මිදුණේ වේ ද, එම භික්‍ෂුව ඒ සෑම දෙනා අතුරෙහි අග්‍ර යැයි කියනු ලැබේ. එය ද අධර්මයෙන් නොව ධර්මයෙන්ම ය. වාසෙට්ඨය, සියලු සත්ව සමූහයන්ට ම මෙලොවෙහි ද පරලොවෙහි ද යන දෙකෙහි ම ධර්මය ම ශ්‍රේෂ්ඨ වෙයි.

"වාසෙට්ඨය, මේ කරුණින් ද සත්වයන් පිළිබඳ වූ මෙලොවෙහි ද, පරලොවෙහි ද, ධර්මය ම ශ්‍රේෂ්ඨ වේද, එය දත යුතු ය.

"වාසෙට්ඨය, ශාක්‍ය කුලයෙන් නික්ම පැවිදි වූ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ හා සම කළ හැකි නිරුත්තර කෙනෙකු ලොව තවත් නැතැයි පසේනදි කොසොල් මහ රජතුමා දනියි. වාසෙට්ඨය, ශාක්‍යයෝ පසේනදි කොසොල් රජතුමාට සමාන වංශ ඇත්තාහුය. වාසෙට්ඨය, ශාක්‍යයෝ පසේනදි කොසොල් රජතුමාට ආදර දක්වීම ද, වැඳීම ද, දෑක නැගී සිටීම ද, දෑක මාගීයෙන් ඉවත් වීමාදී වත් දක්වීම ද කරති. වාසෙට්ඨය, ශාක්‍යයෝ පසේනදි කොසොල් රජතුමාට ආදර දක්වීම ද, වැඳීම ද, දෑක නැගී සිටීම ද, දෑක මාගීයෙන් ඉවත් වීමාදී වත් දක්වීම ආදී මේ යමක් කරත් ද, පසේනදි කොසොල් මහ රජතුමා තථාගතයන් වහන්සේට ද ආදර දක්වීම ද, වැඳීම ද, දෑක නැගී සිටීම ද, දෑක මාගීයෙන් ඉවත් වීමාදී වත් දක්වීම ආදී ඒ සියල්ල කරයි.

පසේනදි කොසොල් රජතුමා එලෙස තථාගතයන් වහන්සේට ආදර දක්වීම ද, වැඳීම ද, දෑක නැගී සිටීම ද, දෑක මාගීයෙන් ඉවත් වීමාදී වත් දක්වීමාදිය කරනුයේ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ උසස් කුලයක උපන්නෙකි, මම පහත් කුලයක උපන්නෙක්මි කියා හෝ, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ බලවත් කෙනෙකි මම දුබලයෙකි කියා හෝ, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ දකුම්කලු ය මම වනාහි විරූපයි කියා හෝ, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මහත් පරිවාර සම්පත් ඇති කෙනෙකි මම අල්ප පරිවාර සම්පත්තිය ඇත්තෙක්මි කියා හෝ නොකරයි. යලි ධර්‍මයට ම සත්කාර කරමින් ධර්‍මයට ම ගරු කරමින් ධර්‍මයට ම බුහුමන් කරමින් ධර්‍මයට ම පුදමින් මෙසේ පසේනදි කොසොල් රජ තෙමේ තථාගතයන් ආදර දක්වීම ද, වැඳීම ද, දෑක නැගී සිටීම ද, දෑක මාගීයෙන් ඉවත් වීමාදී වත් දක්වීමාදිය කරයි.

"වාසෙට්ඨය, මේ කාරණයෙන් ද සත්වයන් පිළිබඳ මෙලොවෙහි ද පරලොවෙහි ද යම් සේ ධර්‍මය ශ්‍රේෂ්ඨ වේය යැයි දත යුතුයි.

වාසෙට්ඨය, නුඹලා වනාහි නොයෙක් ජාති ඇතිව, නොයෙක් ගෝත්‍ර ඇතිව, නොයෙක් කුල ඇතිව සිට, පැමිණ ගිහි ගෙයින් නික්ම සසුනෙහි පැවිදි වූවාහු ය. එලෙස පැවිදි වූ නුඹලාගෙන් යමෙක් නුඹලා කවුරුන්ද යැයි ඇසූ කල්හි අපි **"ශාක්‍ය පුත්‍ර වූ ශ්‍රමණයෝ ය"** යැයි ප්‍රකාශ කරන්නෝ වවු. වාසෙට්ඨය, තථාගතයන් වහන්සේ කෙරෙහි යම්

පුද්ගලයෙකුගේ ශ්‍රද්ධාව නො සැලී පිහිටියේ වේ ද, මුල් බැසගෙන සිටියේ වේ ද, දැඩිව පිහිටියේ වේ ද එය ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ දෙවියෙකු හෝ මාරයෙකු හෝ බ්‍රහ්මයෙකු හෝ ලොව කිසිවෙකු විසින් හෝ සොලවාලිය නොහැක්කේ වේ නම් එබඳු ආර්‍ය්‍ය ශ්‍රාවකයා විසින් **"මම භාග්‍යවතුන් වහන්සේගේ මුවින් උපන් ධර්‍මයෙන් උපන් ධර්‍මයෙන් නිර්මිත ධර්‍ම දායාදය හිමි වූ ඖරස පුත්‍රයෙකු වෙමි"** යැයි මේ වචනය කීම සුදුසු ය. එබඳු අචලව පිහිටි ශ්‍රද්ධාවක් කා හට ඇත්තේ වේ ද? සෝවාන් වූ ආර්‍ය්‍ය ශ්‍රාවකයා හට ය. සෝවාන් ඵලයට පත් ආර්‍ය්‍ය ශ්‍රාවකයා වනාහි සැතකින් තම ගෙල සිඳින්නේ නමුත් භාග්‍යවතුන් වහන්සේ අබුද්ධ කියා හෝ ධර්‍මයට අධර්‍මය යැයි කියා හෝ මහා සංඝයා හට සංඝ නොවේ කියා හෝ නො කියයි. සූරම්බට්ඨ උපාසකයා මෙනි.

මේ සූරම්බට්ඨ උපාසක තුමා දිනක් ආරාමයට ගොස් තථාගතයන් වහන්සේගෙන් ධර්‍ම කථාවක් අසා සෝවාන් ඵලයට පැමිණ බලවත් ප්‍රීති සෝමනස්සයෙන් යුතුව තම නිවසට ආයේ ය. මෙතුමාගේ සිතෙහි ඇති ඒ ප්‍රීතිය දුටු වසවත් මාර දිව්‍ය පුත්‍රයා ඔහු සෝවාන් ව සිටින බව නො දැන මෙම ප්‍රීතියෙන් සෝවාන් වෙති යැයි සිතා එය වැළැක්වීමේ අදහසින් දෙතිස් ලකුණෙන් විසිතුරු බුදු රුවක් මවාගෙන එතුමාගේ නිවෙස ඉදිරියට පැමිණ දෙර කඩ සිට ශාස්තෲන් වහන්සේ වැඩියේ ය යැයි පණිවිඩ යැවී ය. එවිට සූරම්බට්ඨ උපාසක තුමා මෙසේ සිතී ය. මම දැන් ශාස්තෲන් වහන්සේ සමීපයට ගොස් බණ අසා පැමිණියෙමි. කුමක් වන්නේ ද? යැයි පැමිණ ශාස්තෲන් වහන්සේ යන සඤ්ඤාවෙන් වැඳ සිටියේ ය. එවිට මාරයා මෙසේ කීවේ ය. අම්බට්ඨය, මා විසින් නුඹට රූපය අනිත්‍යය වේදනාව අනිත්‍යය.... විඤ්ඤාණය අනිත්‍යය යැයි කියා ධර්‍ම දේශනා කළෙමි. එය මම වැරදීමකින් කීවෙමි. එසේ හෙයින් නුඹ රූපය නිත්‍යය... විඤ්ඤාණය නිත්‍යය යැයි මෙසේ සළකා ගනු ව යැයි බුද්ධ ලීලාවෙන් සිට කීවේ ය. එකල්හි සූරම්බට්ඨ උපාසක තුමා මෙසේ සිතුවේ ය. බුදුවරයන් වහන්සේලා වනාහි නො සලකා ප්‍රත්‍යක්‍ෂ නොකොට යම් කිසිවක් දේශනා කරන්නේය යන මෙය නොවිය හැකි ය. ඒකාන්තයෙන් මම භාග්‍යවතුන් වහන්සේගෙන් වෙන් කිරීමට පැමිණි වසවත් මාරයා වන්නේ ය යැයි සිතා නුඹ මාරයා නොවේ ද යැයි ඇසුවේ ය. මාරයාට

වනාහි බොරු කීමට නොහැකිව එසේය මම මාරයා වෙමි යැයි කීවේ ය. කුමක් පිණිස ආවෙහි ද යැයි සූරම්බට්ඨ උපාසක තුමා ඇසුවේ ය. නුඹගේ ශ්‍රද්ධාව වෙනස් කිරීමට යැයි මාරයා කීවේ ය. එවිට සූරම්බට්ඨ උපාසක තුමා මාරයා අමතා **"කිලිටි මාරය, නුඹ වැනි මාරයන් එකෙකු නොවේ සියයක් දහසක් ආවේ නමුත් මාගේ ශ්‍රද්ධාව සොළවාලිය නොහැකි ය. නුඹ එයට අසමර්ථ ය. සෝවාන් මාර්ගයෙන් පැමිණි ශ්‍රද්ධාව ගල් පොළවෙහි පිහිටි මහමෙර මෙන් ස්ථිර ය. නොසෙල්වෙන සුළු ය. නුඹ තවත් මෙහි කුමක් කෙරෙහි ද"** යැයි කියා අසුරක් ගැසුවේ ය. එකල්හි මාරයාට එහි රැඳී සිටීමට නොහැකිව අතුරුදහන් ව ගියේ ය.

මෙලෙස වූ ස්ථිර ශ්‍රද්ධාව ඇති ආර්‍ය ශ්‍රාවකයා විසින් **"මම භාග්‍යවතුන් වහන්සේගේ මුවින් උපන්, ධර්මයෙන් උපන්, ධර්මයෙන් නිර්මිත, ධර්ම දායාදය හිමි වූ ඖරස පුත්‍රයෙකු වෙමි"** යැයි මේ වචනය කීම සුදුසු ය. එබඳු ආර්‍ය ශ්‍රාවකයා වනාහි භාග්‍යවතුන් වහන්සේ නිසා ම ආර්‍ය භූමියෙහි උපන් බැවින් භාග්‍යවතුන් වහන්සේගේ පුත්‍ර යැයි ද, භාග්‍යවතුන් වහන්සේගේ හෘදයෙහි හට ගෙන මුවින් පිටවුන ධර්ම ඝෝෂාව හේතු කොට මාර්ග ඵලයන්හි පිහිටි බැවින් භාග්‍යවතුන් වහන්සේගේ මුවින් උපන්නෝ යැයි ද, ආර්‍යය ධර්මයෙහි උපන් බැවින් ආර්‍යය ධර්මයෙන් නිර්මිත බැවින් ධර්මජ කියා හෝ ධර්ම නිර්මිත යැයි ද, සතර මග සතර ඵල නිවන යන නව ලෝකෝත්තර ධර්ම දායාදයට සුදුසු වන හෙයින් ධර්ම දායාද යැයි ද කීමට සුදුසු ය.

ඒ කවර හෙයින් ද? යත්, වාසෙට්ඨය, තථාගතයන් වහන්සේ ත්‍රිපිටක බුද්ධ වචනය හෘදයෙන් සිතා වචනයෙන් දැක්වූහ. එබැවින් මේ කය ධර්මය ම බැවින් ධර්මය මෙන් වන බැවින් **"ධර්ම කාය"** නම් වේ. ධර්මය ශ්‍රේෂ්ඨ අර්ථයෙන් බ්‍රහ්ම නම් වේ. එබැවින් **"බ්‍රහ්ම කාය"** යනු ද, ධර්ම ස්වභාවය ම **"ධර්ම භූත"** යනු ද, එයම **"බ්‍රහ්ම භූත"** යනු ද මේ සියල්ල තථාගතයන් වහන්සේට ම කියන නම් වන හෙයිනි. මෙතෙකින් භාග්‍යවතුන් වහන්සේ බ්‍රාහ්මණයින් ම ශ්‍රේෂ්ඨය යන වාදය මිථ්‍යාව බිඳ දමා වෙනත් න්‍යායකින් ඒ බව දැක්වීම පිණිස පුරාණ ලෝකෝත්පත්තිය ගෙන හැර දක්වමින් මෙසේ වදාළ සේක.

වාසෙට්ඨය, දීර්ඝ කාලයක් ගත වීමෙන් පසු කිසියම් සමයක මේ ලෝක ධාතුව වැනසේ ද, එබඳු කාලයක් වේ. එලෙස ලොව වැනසෙන

කල්හි බොහෝ සෙයින් සත්වයෝ ආභස්සර බ්‍රහ්ම ලෝකයෙහි උපදනාහු වෙති. ඔවුහු එහි ධ්‍යාන චිත්ත බලයෙන් ඉපිද ප්‍රීතිය ම ආහාරය කොට ඇතිව ස්වකීය ශරීරාලොකයෙන් ම බබළන්නෝ ව අහසෙහි හැසිරෙමින් සිත් කළු වූ වස්ත්‍රාභරණ හැඳ පැළඳ සිටින්නාහු වෙති. මහා කල්ප අටක් එහි ආයුෂය බැවින් ඉතා දීර්ඝ කාලයක් ජීවත් වෙති. වාසෙට්ඨය, දීර්ඝ කාලයක් ගත වීමෙන් පසු මේ ලොකය හට ගනී ද, එබඳු කාලයක් වේ.

ලොව සැම කල්හි එක ලෙස පවතින්නක් නො වෙයි. හේතු ඵල ධර්ම ස්වභාවයන් අනුව කලක දී විනාශ වේ. කලක දී හට ගනී. එසේම වර්ෂ ගණන් වලින් ප්‍රමාණ කළ නොහැකි කාල පරිච්ඡේද වශයෙන් මෙම ධර්මතා සිදු වේ. එසේ වූ දීර්ඝ කාල පරිච්ඡේද "**කල්ප**" නම් වේ. මේ කල්පය "**ආයුෂ් කල්පය, අන්තර් කල්පය, අසංඛ්‍ය කල්පය, මහා කල්පය**" යනුවෙන් සිවු වැදෑරුම් වේ.

## ☸ ආයුෂ් කල්පය

ලොව පවත්නා කාලය තුළ සත්වයන්ගේ ආයුෂය වැඩෙමින් පිරිහෙමින් පවතින අතර ඒක් එක් කාලයන්හි සත්වයන් ජීවත් වන ආයුෂ කාලය ආයුෂ් කල්පය නම් වේ. (අපගේ භාග්‍යවතුන් වහන්සේ ලොව පහළ වූ කාලයෙහි මනුෂ්‍ය ආයුෂය අවුරුදු සියයකි. මේ වනාහි ඒ කාලයෙහි ආයුෂ් කල්පය වේ.)

## ☸ අන්තර් කල්පය

කල්ප ආරම්භයෙහි දී මනුෂ්‍ය ආයුෂය අවුරුදු අසංඛ්‍යයකි. පසුව සත්වයන්ගේ සිත්හි කෙලෙස් පහළ වීමත් සමග එය පිරිහී ගොස් කලක දී දස අවුරුදු ආයුෂයක් වේ. සියලු ආකාරයෙන් මානුෂීය ගුණයන්ගෙන් පිරිහුණා වූ එම කාලයෙහි දී සත්ව විනාශයක් ඇති වේ. එය අන්තර් කල්ප විනාශය නම් වේ. එය ද "**රෝග අන්තර් කල්පය,**

**සත්ථ** (ආයුධ) **අන්තර් කල්පය, දුර්භික්ෂ අන්තර් කල්පය**" යැයි ත්‍රිවිධ වේ.

## රෝග අන්තර් කල්පය

මෝහය උස්සන්න සත්වයන් වාසය කරන අන්තර කල්පය "**රෝග අන්තර කල්පය**" නම් වේ. රෝග අන්තර කල්පයෙහි මිය යන බොහෝ දෙනා රෝග පීඩා හේතුවෙන් මිය යන බැවින් අනේ මෙබඳු දුකක් අන් කිසිවෙකුටත් නොවේවා යැයි අන්‍යයන් කෙරෙහි මෛත්‍රී සිතින් යුක්තව මියගොස් ස්වර්ගයෙහි උපදිති.

## දුර්භික්ෂ අන්තර් කල්පය

ලෝභය උස්සන්න සත්වයන් වාසය කරන අන්තර කල්පය "**දුර්භික්ෂ අන්තර කල්පය**" නම් වේ. මේ දුර්භික්ෂ අන්තර කල්පයෙහි මිය යන බොහෝ දෙනා කුස ගිනි දුක් පීඩා හේතුවෙන් මිය යන බැවින් ආහාර ආශාවෙන් මියගොස් ප්‍රේත ලෝකයෙහි උපදිති.

## සත්ථ අන්තර් කල්පය

ද්වේශය උස්සන්න සත්වයන් වාසය කරන අන්තර කල්පය "**සත්ථ අන්තර කල්පය**" නම් වේ. මේ සත්ථ අන්තර කල්පයෙහි මිය යන බොහෝ සත්වයෝ ද්වේශය බහුල හේතුවෙන් බොහෝ අපරාධ කොට නිරයෙහි උපදිති.

මිනිස් ආයුෂය පිරිහී ගොස් දස අවුරුද්ද පරමායුෂ ඇති කල්හි පස් අවුරුදු කුමරිය ස්වාමියකුට දීමට සුදුසු කොට සලකන්නාහ. එකල්හි ගිතෙල්, වෙඬරු, තල තෙල්, මී, සකුරු, ලුණු යන මේ රස නැති වී යන්නේ ය. යම් සේ මේ කාලයෙහි ආහාර අතුරෙන් හැල් බත්, මස් අග්‍ර භෝජනය වන්නේ ද? එසේ මිනිසුන් අතර දස අවුරුද්ද පරමායුෂ කොට ඇති කල්හි යව නම් ධාන්‍යය අග්‍ර භෝජනය වන්නේ ය. දශ කුසල කර්ම පථ මුළුමනින් නැති වන්නාහ. දශ අකුශල කර්ම

පථයෝ අතිශයින් බහුල වන්නාහ. එකල්හි කුසල යන නමවත් ඇති නොවන්නේ ය. එසේ ඇති කල්හි කුසල් කරන්නෙක් ද නැත.

මව්පියන් කෙරෙහි වරදවා පිළිපදින්නා වූ, ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරෙහි වැරදි ලෙස හැසිරෙන්නා වූ සිය පවුලෙහි වැඩිහිටියන්ට ගරු නො කරන්නා වූ මනුෂ්‍යයෝ පිදිය යුත්තෝ ද ප්‍රශංසා කළ යුත්තෝ ද වන්නාහ. එකල්හි මව ය කියා හෝ සුලු මව ය කියා හෝ නැන්ද ය කියා හෝ ගුරු භාර්‍යාව ය කියා හෝ සුලු පියාගේ භාර්‍යාව ය කියා හෝ වෙනසක් නොවන්නේ ය. එළුවන්, බැටළුවන්, ඌරන්, කුකුළන්, බල්ලන්, හිවලුන් යම් සේ ද එසේ ලෝ වැසි මනුෂ්‍යයෝ වෙනසකට නො පැමිණෙන්නාහු ය. ඒ සත්වයන් තුළ ඔවුනොවුන් කෙරෙහි දැඩි කෝපය, දැඩි ව්‍යාපාදය දැඩි ද්වේෂය, දැඩි වධක චිත්තය (මැරීමේ ආශාව) ඇති වන්නේ ය. මුවන් මරන්නකුට මුවකු දැක දැඩි කෝපය, දැඩි ව්‍යාපාදය, දැඩි ද්වේෂය, දැඩි වධක චිත්තය ඇති වන්නේ යම් සේද එසේ පුත්‍රයා කෙරෙහි මවට ද, මව කෙරෙහි පුත්‍රයාට ද, පුත්‍රයා කෙරෙහි පියාට ද, පියා කෙරෙහි පුත්‍රයාට ද, සහෝදරිය කෙරෙහි සහෝදරයාට ද, සහෝදරයා කෙරෙහි සහෝදරියට ද ඔවුනොවුන් කෙරෙහි දැඩි කෝපය, දැඩි ව්‍යාපාදය, දැඩි ද්වේෂය, දැඩි වධක චිත්තය ඇති වන්නේ ය.

එලෙස ගුණධර්‍ම හීන වූ කල්හි සත් දවසක් මුළුල්ලෙහි ශස්ත්‍ර අන්තර් කල්පය (ආයුධවලින් ඇන කොටා ගෙන විනාශ වන කාලය) වන්නේ ය. එය සිදු වීමට දින සතකට පෙර ලොවට අවමංගල පණිවිඩ හඟවන චාතුර්‍මහාරාජික වැසි ලෝකබ්‍යූහ නම් දේවතාවෝ මිනිස් වෙසින් පැමිණ රතු වස්ත්‍ර හැඳ රතු මල් පැළඳගෙන අඬමින් කඳුළු පිසිමින් ගෙයක් පාසා ම ඇවිදිමින් මෙසේ කියන්නාහ. "**පින්වත්නි! මෙයින් දින සතක් ගත වූ විට ඔවුනොවුන් ඇන කොටාගෙන විනාශ වන මහත් ව්‍යසනයක් වන්නේ ය. එයින් මිය යන සියල්ලෝ ම නරකයෙහි උපදින්නාහු ය. එබැවින් එම ව්‍යසනයෙන් ගැලවීමට කැමති සියල්ලෝ ම පන්සිල් ආරක්ෂා කරන්න. මව්පිය උපස්ථාන කරන්න. මෛත්‍රිය වඩන්න යනාදී ලෙස කියන්නාහ.**" එහෙත් මෙය බොහෝ දෙනා නො පිළිගනිති. පෙර පින් ඇති ටික දෙනෙකු ම පිළිගනිති. ඔවුහු මේ කියූ දෙය සිදු විය හැකිය යැයි බිය වී වනාන්තර, ගුහා ලෙන්

ආදියට සත් දවසකට ප්‍රමාණවත් ලෙස ආහාරාදිය රැගෙන ගොස් තනි ව සැඟවී සිටින්නාහ. මෙය නො පිළිගන්නා කෙලෙස් බහුල බොහෝ ජනයා අතර ඔවුනොවුන් කෙරෙහි මෘග සංඥාව (මුවෙක් ය යන හැඟීම) ඇති ව ඔවුන් අතට අසු වූ අසු වූ දෑය ආයුධ වී ඒ තියුණු ආයුධවලින් **"මේ මුවෙක් ය, මේ මුවෙක් ය"** යැයි ඔවුනොවුන් කපා, කොටා ජීවිත විනාශ කර ගන්නාහ.

ඒ සත් දවස ගෙවී ගිය පසු සැඟවී සිටි මනුෂ්‍යයෝ ඒ ඒ තැන්වලින් එළියට පැමිණ තවත් සැඟවී සිටි කෙනෙක් ම ජීවත් ව සිටිනු දකින්නාහ. අන් සියල්ලෝ ම මරණයට පත්ව ඇති බව දැක මහත් සංවේගයට පැමිණ පින්වත්නි අපරාධ කර්ම හේතුවෙන් මේ සා විපතක් වූයේ ය යැයි කියා ඒ සියල්ලෝ ම ප්‍රාණඝාතයෙන් වළකින්නාහ. ඒ හේතුවෙන් ඔවුන්ට උපදින දරුවන්ට මව්පියන්ගේ අධිෂ්ඨාන පූර්වක කුසල බලයෙන් අවුරුදු විස්සක් දක්වා ආයුෂය වැඩෙන්නාහ. මෙසේ කුසල ධර්ම සමාදන් වූ හේතුවෙන් ආයුෂයෙන් වර්ණයෙන් වැඩි දියුණු වූ බව සළකා ප්‍රාණඝාත අදත්තාදාන දෙකින් වළකින්නාහ. එයින් ඔවුන්ට උපදින දරුවන්ට ආයුෂය සතළිසක් දක්වා වැඩෙන්නාහ. ඔවුන් කාමමිථ්‍යාචාරයෙන් වළකින්නාහ. ඔවුන්ට උපදින දරුවන්ට ආයුෂය අවුරුදු අසූවක් දක්වා ආයු වර්ණාදිය වැඩෙන්නාහ. ඔවුහු මුසාවාදයෙන් වළකින්නාහ. ඔවුන්ට උපදින දරුවන්ට අවුරුදු එකසිය හැටක් පරමායුෂ ඇති වන්නාහ. ඔවුහු කේලාම් කීමෙන් වළකින්නාහ. ඔවුන්ට උපදින දරුවන්ට අවුරුදු තුන්සිය හැටක් පරමායුෂ ඇති වන්නාහ. ඔවුහු ඵරුෂ වචනයෙන් ඔවුහු සම්ඵප්‍රලාපයෙන් වළකින්නාහ. ඔවුන්ට උපදින දරුවන්ට අවුරුදු හයසිය සතළිසක් පරමායුෂ ඇති වන්නාහ. ඔවුහු අභිජ්ජා, ව්‍යාපාදය යන දෙකෙන් වළකින්නාහ. ඔවුන්ට උපදින දරුවන්ට අවුරුදු දෙදහසක් පරමායුෂ ඇති වන්නාහ. ඔවුහු මිථ්‍යාදෘෂ්ටියෙන් වළකින්නාහ. ඔවුන්ට උපදින දරුවන්ට අවුරුදු සාර දහසක් පරමායුෂ ඇති වන්නාහ. ඔවුහු අධර්ම රාගය, විෂම ලෝභය, මිථ්‍යා ධර්ම යන තුනෙන් වළකින්නාහ. ඔවුන්ට උපදින දරුවන්ට අවුරුදු අට දහසක් පරමායුෂ ඇති වන්නාහ. මව කෙරෙහි, පියා කෙරෙහි, ශ්‍රමණයන් කෙරෙහි, බ්‍රාහ්මණයන් කෙරෙහි, මනාකොට පවතින්නෝ වමු. කුල දෙටුවන් පුදන්නෝ වමු නම් යහපත් ය යැයි සිතා, මහණෙනි, ඔවුහු මව කෙරෙහි, පියා කෙරෙහි, ශ්‍රමණයන් කෙරෙහි, බ්‍රාහ්මණයන් කෙරෙහි මනාකොට පවතින්නෝ වන්නාහු ය. කුල දෙටුවන් පුදන්නෝ

වන්නාහු ය. මෙසේ කුසලධර්‍ම සමාදන්ව පවතින ඔවුන්ට විසි දහසක් පරමායුෂ ඇති වන්නාහ. ඔවුහු කුසල ධර්‍ම සමාදන්ව පැවතීමෙන් ආයුෂයෙන් ද වර්‍ණයෙන් ද වැඩෙන්නාහ. ආයුෂයෙන් ද, වර්‍ණයෙන් ද වැඩෙනු ලබන්නා වූ ඔවුන්ට අවුරුදු සතළිස් දහසක් පරමායුෂ ඇති වන්නාහ. අවුරුදු සතළිස් දහසක් පරමායුෂ ඇති මිනිසුන්ට අවුරුදු අසූ දහසක් පරමායුෂ ඇති වන්නාහ.

මිනිසුන් අතර අවුරුදු අසූ දහසක් පරමායුෂ ඇති කල්හි අවුරුදු පන්සියයක් වයස ඇති කුමාරිකාවෝ ස්වාමි කුලයට යන්නාහ. මෙලෙස ක්‍රමයෙන් ආයුෂය වර්‍ධනය වී අවුරුදු අසංඛෙය්‍යක් දක්වා වැඩෙන්නාහ. මෙලෙස දස අවුරුදු වයසෙහි පටන් අසංඛෙය්‍යක් දක්වා වැඩී නැවත දස අවුරුද්ද දක්වා පිරිහෙන දස අවුරුදු දෙකක් අතර කාලය එක් අන්තර කල්පයකි.

## ☸ අසංඛෙය්‍ය

| | |
|---|---|
| එකේ දසයක් | = දසයකි. |
| දස දසයක් | = සියයකි. |
| සියක් දසයක් | = දහසකි. |
| දහස් සියයක් | = ලක්‍ෂයකි. |
| ලක්‍ෂ සියයක් | = කෝටියකි. |
| කෝටි කෝටියක් | = ප්‍රකෝටියකි. |
| ප්‍රකෝටි කෝටියක් | = කෝටි ප්‍රකෝටියකි. |
| කෝටි ප්‍රකෝටි කෝටියක් | = නහුතයකි. |
| නහුත කෝටියක් | = නින්නහුතයකි. |
| නින්නහුත කෝටියක් | = අක්‍ෂෝහිණියකි. |
| අක්‍ෂෝහිණී කෝටියක් | = බින්දුවකි. |
| බින්දු කෝටියක් | = අබ්බුදයකි. |
| අබ්බුද කෝටියක් | = නිරබ්බුදයකි. |
| නිරබ්බුද කෝටියක් | = අහහයකි. |
| අහහ කෝටියක් | = අබබයකි. |
| අබබ කෝටියක් | = අටටයකි. |

| | |
|---|---|
| අටට කෝටියක් | = සොගන්ධිකයකි. |
| සෝගන්ධික කෝටියක් | = උත්පලයකි. |
| උත්පල කෝටියක් | = කුමුදයකි. |
| කුමුද කෝටියක් | = පුණ්ඩරිකයකි. |
| පුණ්ඩරික කෝටියක් | = පදුමයකි. |
| පදුම කෝටියක් | = කථානයකි. |
| කථාන කෝටියක් | = මහාකථානයකි. |
| මහාකථාන කෝටියක් | = අසඞ්ඛෙය්‍යයකි. |

## ☸ අසංඛ්‍ය කල්පය

ඉහත කියන ලද අන්තර කල්ප විස්සක් එක් අසංඛ්‍ය කල්පයකි. "**සංවට්ට අසංඛ්‍ය කල්පය, සංවට්ටට්ඨායි අසංඛ්‍ය කල්පය, විවට්ට අසංඛ්‍ය කල්පය, විවට්ටට්ඨායි අසංඛ්‍ය කල්පය**" යැයි සතර වැදෑරුම් වේ.

❖ කල්පයක් විනාශ වීම පිණිස වසින්නා වූ කල්ප විනාශක මහා මේඝයෙහි පටන් විනාශ වී අවසන් වීම දක්වා වූ කාලය **සංවට්ට අසංඛ්‍ය කල්පය** නම් වේ.

❖ විනාශ වී දූවිලි ස්වල්පයක් තරම් වත් නැතිව හිස් අන්ධකාර අජටාකාශයක් ව සම්පත්ති කර මහා මේඝය ඇතිවීම දක්වා හිස් ව පවත්නා කාලය **සංවට්ටට්ඨායි අසංඛ්‍ය කල්පය** නම් වේ.

❖ ඒ සම්පත්ති කර මහා මේඝයෙහි පටන් චන්ද්‍ර සූර්‍ය්‍ය උදා ව තෙක් ලොව නැවත හටගන්නා කාලය **විවට්ට අසංඛ්‍ය කල්පය** නම් වේ.

❖ චන්ද්‍ර සූර්‍ය්‍යයන් පහළ වී සත්ව වාසයට සුදුසු භූමියක් ව නැවත කල්ප විනාශක මහා මේඝය දක්වා වර්‍තමානයෙහි මෙන් පවත්නා කාලය **විවට්ටට්ඨායි අසංඛ්‍ය කල්පය** නම් වේ.

## ☸ සංවට්ට තුන

කල්ප විනාශ වන ආකාර තුනකි. ආපෝ සංවට්ටය තේජෝ සංවට්ටය වායෝ සංවට්ටය යනුවෙන් ත්‍රිවිධ වේ.

සත්වයන්ගේ ද්වේශය බහුලව පවත්නා කල්පයන්හි ගින්නෙන් දැවී කල්ප විනාශය වේ එය .**තේජෝ සංවට්ටය** නම් වේ.

- ❖ සත්වයන්ගේ ලෝභය බහුලව පවත්නා කල්පයන්හි ජලයෙන් කල්ප විනාශය වේ. එය **ආපෝ සංවට්ටය** නම් වේ.

- ❖ සත්වයන්ගේ මෝහය බහුලව පවත්නා කල්පයන්හි වාතයෙන් කල්ප විනාශය වේ. එය **වායෝ සංවට්ටය** නම් වේ.

## ☸ සංවට්ට සීමා තුන

**ආභස්සර, සුභකිණ්හක, වේහප්ඵල** යනුවෙන් කල්ප විනාශ සීමා තුනකි.

- ❖ ගින්නෙන් දැවී කල්පය නස්නා විට සතර අපාය, මනුලොව, දිව්‍ය ලෝක සය, ප්‍රථම ධ්‍යාන බ්‍රහ්ම ලෝක තුන යන මේ ආභස්සර බඹ ලොවින් යට භූමි තුදුසක් (14) දැවී විනාශ වෙයි.

- ❖ ජලයෙන් කල්පය නස්නා විට සතර අපාය, මනුලොව, දිව්‍ය ලෝක සය, ප්‍රථම ධ්‍යාන බ්‍රහ්ම ලෝක තුන, දුතිය ධ්‍යාන බ්‍රහ්ම ලෝක තුන යන මේ සුභකිණ්හක බඹ ලොවින් යට භූමි සතළොසක් (17) දිය වී විනාශ වෙයි.

- ❖ වාතයෙන් කල්පය නස්නා විට සතර අපාය, මනුලොව, දිව්‍ය ලෝක සය, ප්‍රථම ධ්‍යාන බ්‍රහ්ම ලෝක තුන, දුතිය ධ්‍යාන බ්‍රහ්ම ලෝක තුන, තතිය ධ්‍යාන බ්‍රහ්ම ලෝක තුන යන මේ වේහප්ඵල බඹ

ලොවින් යට භූමි විස්සක් (20) වාතයෙන් සුනු විසුනු වී විනාශ වෙයි.

## ☸ ක්ෂේත්‍ර තුන

**ජාති ක්ෂේත්‍රය ආඥා ක්ෂේත්‍රය විෂය ක්ෂේත්‍රය** යැයි සීමා තුනකි.

❖ බුද්ධ බෝසතාණන් වහන්සේ පශ්චිම භවිකව මනුලොව මව්කුස පිළිසිඳ ගැනීම, මව්කුසෙන් බිහි වීම, බුද්ධත්වයට පත්වීම දම්සක් දෙසීම, ආයු සංස්කාරය අතහැරීම, අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවීම යන අවස්ථාවන්හි දී කම්පිත වන දස දහසක් සක්වළ **ජාති ක්ෂේත්‍රය** නම් වේ.

❖ **ආටානාටිය සූත්‍රය, මොර පිරිත, ඛන්ධ පිරිත, ධජග්ග පිරිත, මංගල සූත්‍රය, රතන සූත්‍රය, මෙත්ත සූත්‍රය** ආදියෙහි බුදුරජාණන් වහන්සේගේ ආනුභාවයෙන් ධර්ම බලය පිහිට හාත්පස පැතිර පවත්නා ප්‍රදේශය වන කෝටි ලක්‍ෂයක් සක්වළ **ආඥා ක්ෂේත්‍රය** නම් වේ.

❖ විශ්වය තුළ පවත්නා අනන්තාපරිමාණ ලෝක ධාතු සියල්ලම භාග්‍යවතුන් වහන්සේගේ බුදු නුවණට විෂය වේ. බුදු නුවණ ඉක්මවා විශ්වය තුළ අවබෝධ කළ යුතු ධර්ම නැත්තේ ය. අවබෝධ කළ යුතු ධර්ම ඉක්මවා බුදු නුවණ ද නැත්තේ ය. මෙලෙස බුදු නුවණ හා විශ්වය තුළ ඇති අවබෝධ කළ යුතු සියල්ල සමව පවත්නේ ය. එබැවින් විශ්වය තුළ පවත්නා අනන්ත සක්වළ සියල්ලම **විෂය ක්ෂේත්‍රය** නම් වේ.

කල්ප විනාශයෙහි දී ඉහත කී ආඥා ක්ෂේත්‍රය වූ කෝටි ලක්‍ෂයක් සක්වළ එකවර විනාශ වේ.

## ☸ කල්ප විනාශය වන ආකාරය

ගින්නෙන් කල්පය විනාශ වන කල්හි පළමු කොට ම කල්ප විනාශක මහා මේඝය ආඥා ක්ෂේත්‍රය වූ කෝටි ලක්ෂයක් සක්වළට එක පැහැර වසින්නේ ය. එවිට මනුෂ්‍යයෝ සතුටු ව බීජ වැපිරීමාදිය කරති. මෙලෙස වපුරන ලද බීජ පැල වී ගවයන්ට කා හැකි පමණට වැවුණු පසු එම වැස්ස නතර වී මේඝ ගර්ජනා පමණක් ම වන්නේ ය. එයින් පසු එම කල්පයට පිනි පොදක් වත් නො වැටෙන්නේ ය. එකල්හි වැසි දියෙන් ජීවත් වන සත්වයෝ ජීවත් විය නොහැකි ව මිය ගොස් දෙව්ලොව ඉපිද එහි දී ධ්‍යාන භාවනා වඩා බඹලොව උපදින්නාහ. මල් ඵලයන්හි ඕජාවෙන් ජීවත් වන සත්වයෝ ද එයින් ච්‍යුතව එලෙස ම බඹලොව උපදින්නාහ. මෙලෙස ආකාශයෙහි හා ගොඩ බිමෙහි වෙසෙන සියලු සත්වයෝ මියගොස් බඹලොව උපදින්නාහ. දියෙහි වෙසෙන මත්ස්‍යාදීහු ද ජලය නැතිව යෑමෙන් මියගොස් දෙව්ලොව ඉපිද ධර්ම නියාමය අනුව පූර්වයෙහි කරන ලද අපරාපරිය වේදනීය පුණ්‍ය කර්ම බලයෙන් ධ්‍යාන භාවනා වඩා බඹලොව උපදින්නාහ.

## ☸ ත්‍රිවිධ මහා කෝලාහල

**කල්ප කෝලාහලය, බුද්ධ කෝලාහලය, චක්‍රවර්ති කෝලාහලය,** යැයි ලොව මහා කෝලාහල තුනක් ඇත්තේ වේ.

### කල්ප කෝලාහලය

කල්ප විනාශයට අවුරුදු ලක්ෂයකට පෙර චාතුම්මහාරාජික දෙව්ලොව වැසි ලොවට අවමංගල පණිවිඩ දන්වන ලෝකබ්‍යූහ නම් දෙවියෝ මනුලොව පුරා මිනිස් වෙස් ගෙන කෙස් මුදා අඬමින් කඳුළු පිසිමින් රතු වස්ත්‍ර හැඳ විරූප වෙස් ගෙන මනුලොව සිසාරා හැසිරෙමින් මෙසේ කියන්නාහ. **"පින්වත්නි! මෙයින් අවුරුදු ලක්ෂයක් ගිය තැන මේ කල්පය විනාශ වන්නේ ය. මහ පොළව ද වැනසී යන්නේ ය. මහා සමුද්‍රය ද වියළෙන්නේ ය. මහාමේරු පර්වත ආදී විශාල වස්තූන් ද ගිනි ගෙන දැවී අළු වී විනාශ වන්නේ ය. බඹලොව තෙක් සියල්ල**

**විනාශ වන්නේ ය. ඒ කිසිවක අළුවත් ඉතිරි නොවන්නේ ය. එබැවින් මෛත්‍රිය වඩන්න. කරුණාව, මුදිතාව, උපේක්ෂාව වඩන්න. මව්පිය උපස්ථාන කරන්න. වැඩිහිටියන්ට සලකන්න."** යනාදී ලෙස කියමින් කල්ප විනාශය පිළිබඳව හඟවන්නාහ. මෙය කල්ප කෝලාහලය නම් වේ.

## බුද්ධ කෝලාහලය

සම්මා සම්බුදු රජාණන් වහන්සේ නමක් ලොව පහළ වීමට අවුරුදු දහසකට පෙර ලොවට මංගල පණිවිඩ දන්වන ලෝක පාලක දෙවියෝ මිනිස් වෙසින් පැමිණ සුදු වස්ත්‍ර හැඳ සුදු මල් පැළඳගෙන අලංකාර ශරීර සෝභාව ඇතිව සිනහ මුසු මුහුණින් යුක්තව මංගල විලාසයෙන් මිනිස් ලොව සිසාරා හැසිරෙමින් මෙසේ කියන්නාහ. **"පින්වත්නි! මෙයින් අවුරුදු දහසකින් මතු ලොව සම්මා සම්බුදු රජාණන් වහන්සේ නමක් පහළ වන්නාහ. ඒ බුදු රජාණන් වහන්සේ ධර්මානු ධර්ම ප්‍රතිපන්න වූ මහා සංඝරත්නය පිරිවරා ධර්ම දේශනා කරමින් ලොව හැසිරෙති. ඒ බුදු අසිරි දකිනු කැමති අය, බුදු බණ අසනු කැමති අය, දන් දෙනු කැමති අය, සිල් රක්‍ෂා කරනු කැමති අය, ඒ බුදු සසුනෙහි මග ඵල නිවන් සුව ලබනු කැමති අය දන් දෙන්න, පන්සිල් රක්‍ෂා කරන්න, පොහොය සිල් රක්‍ෂා කරන්න, ධ්‍යාන භාවනා වඩන්න"** යනාදී ලෙස ලොව පුරා කියා ඇවිදින්නාහ. මෙය බුද්ධ කෝලාහලය නම් වේ.

## චක්‍රවර්ති කෝලාහලය

සක්විති රජ කෙනෙක් ලොව පහළ වීමට අවුරුදු සියයකට පෙර ලෝක පාලක දෙවියෝ බුද්ධ කෝලාහලයෙහි මෙන් මංගල විලාසයෙන් මිනිස් ලොව සැරිසරමින් මෙසේ කියන්නාහ. **"පින්වත්නි! මෙයින් අවුරුදු සියයකින් මතු සතර මහද්වීපයට අධිපති චක්‍ර රත්නය, හස්ති රත්නය, අශ්ව රත්නය, මණි රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය, පරිනායක රත්නය යන සප්ත රත්නයන්ගෙන් ප්‍රතිමණ්ඩිත දහසක් පුත්‍රයන් පරිවාර කොට ඇතිව ආකාශයෙන් යන ගමන් ඇති චක්‍රවර්ති රජ කෙනෙක් පහළ වන්නේ ය. එකල්හි පන්සිල් ආදී ගුණ**

**පූජනීය නො කරන්නන්ට ජීවත් විය නොහැකි වන්නේ ය. යමෙක් පඤ්ච සීලයෙන් එකක් හෝ කඩ කරන්නේ ද ඔහු එතැන්හිදී ම මිය ගොස් අපාගත වන්නේ ය. ඒ සක්විති රාජ්‍ය තුළ සතර මහා දිවයින් වැසි සියලු මනුෂ්‍යයෝ ම සුචරිත ධර්ම සපුරා ස්වර්ග පරායන වන්නාහ"** යනාදී ලෙස ලොව පුරා කියා ඇවිදින්නාහ. මෙය චක්‍රවත්ති කෝලාහලය නම් වේ.

ඉහත කී ලෙස කල්ප කෝලාහලය ඇති වූ පසු එය අසා මනුෂ්‍යයෝ ද භූමාටු දෙවියෝ ද පින්කම් කොට එයින් ච්‍යුතව දෙව්ලොව ඉපිද එහි දී වායෝ කසින ආදී භාවනා වඩා බඹලොව උපදින්නාහ. අන් සත්වයෝ අපරාපරිය වේදනීය කර්ම බලයෙන් පෙර පින් මතු වී දෙව්ලොව ඉපිද ධ්‍යාන භාවනා වඩා බඹලොව උපදින්නාහ. මෙලෙස වැසි නැතිව බොහෝ කලක් ගිය කල්හි දෙවන සූර්ය මණ්ඩලයක් පහළ වන්නේ ය. ඒ දෙවන සූර්ය මණ්ඩලය පහළ වීමෙන් යම් ඒ කුඩා ඇල, දොළ, වළවල් ඇත්තේ වේ ද, ඒ සියල්ල සිඳී වියළී යති.

ඉන් පසු බොහෝ කලක් ඇවෑමෙන් තුන් වන සූර්ය මණ්ඩලයක් පහළ වේ. ඒ තුන් වන සූර්ය මණ්ඩලය පහළ වීමෙන් පසු **ගංගා, යමුනා, අචිරවතී, සරභූ, මහී** යන මේ මහා ගංගාවෝ වියළී සිඳී යති.

ඉන් පසු දීර්ඝ කාලයක් ඇවෑමෙන් සතර වන සූර්ය මණ්ඩලයක් පහළ වේ. සතර වන සූර්ය මණ්ඩලය පහළ වීමෙන් **අනවතප්ත විල, කණ්ණමුණ්ඩ විල, රථකාර විල, ඡද්දන්ත විල, කුණාල විල, මන්දකිණි විල, සිංහ ප්‍රපාත විල** යන සප්ත මහා විල් වියළී සිඳී යති.

ඉන් පසු දීර්ඝ කාලයක් ඇවෑමෙන් පස් වන සූර්ය මණ්ඩලයක් පහළ වේ. ඒ පස් වන සූර්ය මණ්ඩලය පහළ වීමෙන් යොදුන් අසූ සාර දහසක් උසට පිරී ඇති මහා සමුද්‍රය ඇඟිලි පුරුකක් තෙමෙන පමණ කුදු වියළී සිඳී යයි.

ඉන් පසු දීර්ඝ කාලයකින් පසු සය වන සූර්ය මණ්ඩලයක් පහළ වේ. ඒ සවන සූර්ය මණ්ඩලය පහළ වීමෙන් පසු කෝටි ලක්‍ෂයක් සක්වළ දුම් නැගී දුමින් පිරී යති.

ඉන් පසු දීර්ඝ කාලයක ඇවෑමෙන් සත් වන සූර්ය මණ්ඩලයක් පහළ වේ. ඒ සත් වෙනි සූර්යයා පහළ වීමෙන් මේ මහා පෘථිවිය ද, මේරු පර්වතාදිය ද මෙලෙස කෝටි ලක්‍ෂයක් සක්වළ එකම ගිනි ජාලාවක් වෙයි. ඒ ගින්න වාතයෙන් විසුරුවන ලද්දේ ආභස්සර බ්‍රහ්ම ලෝකයෙන් යට සියල්ල දැවී ගිතෙල් කපුරු ආදිය දැවූ තැන අළු ඉතිරි නොවන්නා සේ කෝටි ලක්‍ෂයක් සක්වළ අළු දූවිලි ස්වල්පයක් වත් ඉතිරි නොවී විනාශ වී යති.

ජලයෙන් කල්ප විනාශය වන කල්හි කල්ප විනාශක මහා මේඝය ඇති වීමෙන් පසු කෝටි ලක්‍ෂයක් සක්වළ ජලයෙන් පිරී ඉතිරී ගොස් ඉන් පසු ඒ ජලයෙන් ම දිය වී විනාශ වී යති.

වාතයෙන් කල්ප විනාශය වන කල්හි කල්ප විනාශක මහා මේඝය ඇති වීමෙන් පසු කෝටි ලක්‍ෂයක් සක්වළ පුරාවට මහත් චණ්ඩ මාරුත ඇති වී ඒ සක්වළ සතර දිශාවෙන් හමන සුළඟින් යොදුන් ගණන් විශාල පර්වත කඳු මහ පොළොව කොටස් ආකාශයට උගුළුවා සුළං බලයෙන් සුනු විසුනු කොට දූවිලි ස්වල්පයක් වත් ඉතිරි නොවන සේ විනාශ වී යති.

**''සත්ත සත්තග්ගිනා වාරා - අට්ඨමෙ දකා,**
**චතුසට්ඨි යද පුණ්ණා - එකො වායුවරො සියා.**

**අග්ගිනාභස්සරා හෙට්ඨා - ආපෙන සුභකිණ්හතො,**
**වෙහප්ඵලතො වාතෙන - එවං ලොකො විනස්සති''**

කල්පය විනාශ වන කල්හි ද පිළිවෙලින් සත් වාරයක් ගින්නෙන් විනාශ වේ. අටවන වාරය ජලයෙන් විනාශ වේ. නැවත සත් වාරයක් ගින්නෙන් විනාශ වේ. අටවන වාරය ජලයෙන් විනාශ වේ. මෙම චක්‍රයෙන් සත් වාරයක් සිදු වී අටවන වාරයෙහි දී සත් වාරයක්

ගින්නෙන් විනාශ වී අටවන හැට හතර වන වාරය වාතයෙන් විනාශ වේ.

ගින්නෙන් ආභස්සර බඹ තලයෙන් යට ද, ජලයෙන් සුභකිණ්හක බඹ තලයෙන් යට ද, වාතයෙන් වේහප්ඵල බඹ තලයෙන් යට ද විනාශ වේ.

## ☸ මහා කල්පය

ඉහත කියන ලද අසංඛ්‍ය කල්ප සතර, අන්තර කල්ප අසූව එක් මහා කල්පයකි. මේ මහා කල්පය ද **ශූන්‍ය කල්පය, සාර කල්පය, මණ්ඩ කල්පය, වර කල්පය, සාරමණ්ඩ කල්පය, මහා භද්‍ර කල්පය** යනුවෙන් සය වැදෑරුම් වේ.

- ❖ සම්මා සම්බුදු රජාණන් වහන්සේලා ලොව පහළ නොවන කල්පය බුද්ධ ශූන්‍ය බැවින් **ශූන්‍ය කල්පය** නම් වේ.
- ❖ එක සම්මා සම්බුදු රජාණන් වහන්සේ නමක් ලොව පහළ වන කල්පය **සාර කල්පය** නම් වේ.
- ❖ සම්මා සම්බුදු රජාණන් වහන්සේලා දෙ නමක් ලොව පහළ වන කල්පය **මණ්ඩ කල්පය** නම් වේ.
- ❖ සම්මා සම්බුදු රජාණන් වහන්සේලා තෙ නමක් ලොව පහළ වන කල්පය **වර කල්පය** නම් වේ.
- ❖ සම්මා සම්බුදු රජාණන් වහන්සේලා සතර නමක් ලොව පහළ වන කල්පය **සාරමණ්ඩ කල්පය** නම් වේ.
- ❖ සම්මා සම්බුදු රජාණන් වහන්සේලා පස් නමක් ලොව පහළ වන කල්පය **මහා භද්‍ර කල්පය** නම් වේ.

## ❄ රස පොළව පහළ වීම

කල්පය පිහිටන කල්හි කෝටි ලක්‍ෂයක් සක්වළ එක පැහැර යට අජටාකාශය දක්වා මහා පෘථිවිය මහාමේරු පර්‍වතාදිය ගින්නෙන් දැවී ගොස් එකම කුහරයක් ව නො සෑදූ බෙර යක් සේ නැසී සිටි කල්හි නැවත සියලු සත්වයන්ගේ පිනෙන් එක් අසංඛ්‍යයක් එක් අංගනයක් ලෙස පිහිටි කල්හි ලෝකයාට පිළියෙල වීම පිණිස වැස්ස වසින්නට පටන් ගනී. එය ආරම්භයෙහි දී හිම පතනයක් මෙන් වෙයි. පසුව තිවුඩු, සහල්, මුං, මෑ, බජිරි, නෙල්ලි, කැකිරි, කොමඩු, ලබු ආදී ප්‍රමාණ ලෙස වැසි බින්දු විශාල වී පසුව බඹය, දෙක, ආදී ලෙස ක්‍රමයෙන් විශාල වී අඩ යොදුන, යොදුන, දෙක, දසය, යොදුන් සියය, දහස ආදී ලෙස විශාල වැසි ධාරා පැමිණ ජලස්කන්ධය කෝටි ලක්‍ෂයක් සක්වළ ගැබ පුරවා පෙර දැවී ගිය තැන් පිරී යයි. එලෙස හටගන්නා කල්පයෙහි පහළ වන සත්වයන්ගේ කුසල කර්‍ම බලයෙන් ඒ ජලය උඩ යට සරස හාත්පසින් වාතය නැගී ධමකරකයෙහි (ඩබරාවෙහි) සිදුර වැසූ කල්හි ඇතුළත රැඳෙන ජලය මෙන් ඝන කොට පියුම් (නෙළුම්) පෙත්තක ජලය මෙන් එක ජල බිඳුවක් වත් බැහැරට යාමට නොදී නො විසිරෙන සේ පිඬු කොට ඒ ජලස්කන්ධය අතර වාතය ගමන් කළ හැකි සේ විවර සැකසෙමින් පන්දුවක් මෙන් වට කර ක්‍රමයෙන් ඝන වී යටට බැස පෙර ශක්‍ර භවනය පිහිටි තැනට ළං වේ. එසේ බසිත් ම පෙර ප්‍රථම ධ්‍යාන බ්‍රහ්ම ලෝක තුන පිහිටි තැන්හි ඒ බඹ ලොව පිහිට යි. එකල්හි ආභස්සරාදී ඉහළ බ්‍රහ්ම තලයන්හි වසන බ්‍රහ්මයන් අතුරෙන් ඇතමෙක් ආයුෂය ගෙවීමෙන් හෝ කර්‍මය ගෙවීමෙන් එයින් ච්‍යුතව මහා බ්‍රහ්ම, බ්‍රහ්ම පුරෝහිතය, බ්‍රහ්ම පාරිසජ්ජ තලයන්හි උපදිති. එසේ ම පරිනිර්මිත වසවර්ති, නිර්‍මාණ රති, තුසිත, යාමය යන දිව්‍ය ලෝකයන් ද පිහිටයි. එම දිව්‍ය ලෝකයන්හි ද එලෙස ම උපදිති. තාවතිංසය, චාතුර්මහාරාජිකය යන දෙ දෙව් ලෙව පොළව හා සම්බන්ධ බැවින් එකල්හි පහළ නොවේ. පෙර පොළොව (මිනිස් ලොව) පිහිටි තැනට ජලය බැස්ස කල්හි යට අජටාකාශය මත්තෙහි යොදුන් නවලක්‍ෂ සැට දහසක් ඝන ඇති වා පොළොව පිහිටියේ ය. ඒ වා පොළොව මත්තෙහි යොදුන් සාර ලක්‍ෂ අසූ දහසක් ඝන (ගැඹුර) ඇති ජල පොළොව පිහිටියේ ය. ඒ මත්තෙහි එක් ලක්‍ෂ විසි දහසක් යොදුන් ඝන ඇති ගල් පොළොව පිහිටියේ ය. ඒ ගල් පොළොව මත යොදුන් දෙලක්‍ෂ සතළිස්

දහසක් ඝන ඇති පස් පොළොව පිහිටියේ ය. එය මිහිරි ජලය පහත බැස පෙරහන්කඩයක මුව වැසුවාක් මෙන් වායු බලයෙන් ඒ ජලය ම ඝන වී ජලය මතුපිට පිහිටි නෙළුම් පතක් මෙන් පිහිටියේ ය. එකල්හි සමුද්‍ර පිහිටිය යුතු තැන් ගැඹුරු විය. සක්වළ, ත්‍රී කූට පර්වත, සප්ත කූට පර්වත, මහාමේරු පර්වත පිහිටිය යුතු තැන්හි ඒවා පිහිටියේ ය. එසේ ම සතර මහද්වීපයන් ද පිහිටියේ ය. එකල්හි ලෝකාන්තරික නරකය මෙන් එකම ඝන අඳුරක් ම වූයේ ය.

කල්පයක් විනාශ වන කල්හි පොළොවෙහි අන් සියලු තැන් විනාශ වී ගොස් අවසානයෙහි දී මහා බෝධි මණ්ඩලය විනාශ වේ. කල්පයක් නැවත හට ගැනීමෙහි දී ප්‍රථමයෙන් මහා බෝධි මණ්ඩලය හට ගනී. එහි පෙර නිමිත්තක් වී නෙළුම් ගසක් හට ගනී. ඉදින් ඒ කල්පයෙහි සම්මා සම්බුදු රජාණන් වහන්සේලා පහළ වන්නේ නම් මල් හට ගනී. නො වන්නේ නම් මල් හට නො ගනී. ඒ අනුව බුදු රජාණන් වහන්සේලා ලොව පහළ නොවන්නේ නම් ඒ කල්පය **ශූන්‍ය කල්පය** නම් වේ. එක බුදු රජාණන් වහන්සේ නමක් පහළ වන්නේ නම් එහි එක මලක් පිපෙයි. එය **සාර කල්පය** නම් වේ. දෙ නමක් පහළ වන්නේ නම් එහි මල් දෙකක් පිපෙයි. එය **මණ්ඩ කල්පය** නම් වේ. තෙනමක් පහළ වන්නේ නම් එහි මල් තුනක් පිපෙයි. එය **වර කල්පය** නම් වේ. සතර නමක් පහළ වන්නේ නම් එහි මල් සතරක් පිපෙයි. එය **සාර මණ්ඩ කල්පය** නම් වේ. පස් නමක් පහළ වන්නේ නම් එහි මල් පසක් පිපෙයි. එය **මහා භද්‍ර කල්පය** නම් වේ. ඒ මල් ද එක ම නටුවක එකට බැඳී හට ගනී.

එකල්හි සුද්ධාවාස බඹලොව වැසි අභීත් බ්‍රහ්මයෝ අලුත හටගන්නා කල්පයෙහි පෙර නිමිති බලන්නට මහා බෝධි මණ්ඩලය පිහිටන තැනට පැමිණෙති. ඒ නෙළුම් ගසෙහි මල් හට ගෙන නැත්තේ නම් **"මේ කල්පය වනාහි අඳුරු වන්නේ ය. මැරෙන සත්වයෝ අපායෙහි උපදිති. දිව්‍ය ලෝක සය ද, බ්‍රහ්ම ලෝක නවය**[1] **ද හිස් වන්නේ ය"** යැයි අසතුටු වී යති. මල් පිපී ඇති කල්හි එය දැක **"සර්වඥ වූ මහ බෝසතාණන් වහන්සේ මවු කුස පිළිසිඳ ගන්නා කල්හි ද, මවු**

[1] මෙය භූමි භේදයෙන් කියන ලදි.

**කුසෙන් බිහි වෙන කල්හි ද, සම්මා සම්බුද්ධත්වයට පැමිණෙන විට ද, ධර්මචක්‍රය පවත්වන කල්හි ද, යමක ප්‍රාතිහාර්යය පවත්වන කල්හි ද, දේවාරෝහණය කරන කල්හි ද, ආයු සංස්කාරය අතහරින කල්හි ද, අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනෙවන කල්හි ද දස දහසක් සක්වළ කම්පා වීම ආදී ප්‍රාතිහාර්යය දකින්නෙමු. එසේම සතර අපාය හිස් වන්නේ ය. දිව්‍ය ලෝක සය ද, බ්‍රහ්ම ලෝක නවය ද පිරී යන්නේ ය"** යැයි සතුටු සිත් ඇතිව උදන් අනමින් තම තමන්ගේ බ්‍රහ්ම ලෝකයන්ට යති.

පොළොව හට ගැනීමෙහි දී ජලස්කන්ධය මතුපිට රස පොළොව හට ගනී. එය වර්ණයෙන් කිණිහිරි මල් මෙන් ඉතා සුදු පැහැයෙන් යුක්ත ය. දිව්‍ය සුගන්ධයක් මෙන් ඉතා සුවඳවත් ය. දිව්‍ය ඕජස් හෙලන ලද්දක් මෙන් පිලවුන් නැති දඬු වැල් බෑ මී වදයක් මෙන් පැණි මෙන් ද, දිය නුමුසු කිරෙහි මතුපිට හටගත් තෙල් පටලය මෙන් ද වේ. එකල්හි ආභස්සර බඹ ලොවින් ච්‍යුත වන බ්‍රහ්මයෝ ඒ රස පොළොව මත පහළ වෙති. ඔවුහු ධ්‍යාන උපචාර සිතින් ඕපපාතික ව ඉපිද ප්‍රීතිය ම ආහාර කොට ඇතිව ස්වකීය ශරීරාලොකයෙන් ම බබළමින් අහසෙහි හැසිරෙමින් මනොඥ ස්වභාව ඇත්තාහු ඉතා දීර්ඝ කාලයක් ජීවත් වෙති. එකල්හි මහ ඝන අන්ධකාරයක් ම වෙයි. සඳ හිරු හා ග්‍රහ තාරකාවෝ නො පෙණෙති. රෑ දහවල් මාස අර්ධ මාසයෝ නො පෙණෙති. ඍතු භේද හා අවුරුදු භේද සහ ස්ත්‍රී පුරුෂ යන භේදයක් නො පෙණෙයි. සත්වයෝ ය, සත්වයෝ ය යැයි ව්‍යවහාරයට පැමිණෙති.

වාසෙට්ඨය, එකල්හි එක්තරා ලොල් සත්වයෙක් පින්වත්නි, මේ කුමක් නම් විය යුතු වන්නේ ද? යැයි රස පොළොව මඳක් ඇඟිල්ලෙන් ගෙන දිව අග ගෑවේ ය. ඒ ක්ෂණයෙහි රස නහර දහසක ඒ රසය පැතිර යෑමෙන් එය ඔහුට ඉතා ප්‍රිය විය. ඔහු එහි බලවත් තෘෂ්ණාවෙන් බැඳී ගියේ ය. අන්‍ය සත්වයෝ ද ඔහු කළ ඒ ක්‍රියාව දැක එලෙස ම රස පොළොව ඇඟිල්ලෙන් ගෙන රස බැලුවාහු ය. එලෙස රස බලන්නා වූ ඔවුන්ගේ ද දහසක් රස නහර පිණා ගියහ. ඔවුන්ට එහි බලවත් තෘෂ්ණාවෙන් බැඳී ගියහ. එකල්හි ඔවුහු රස පොළොව පිඬු කොට වළඳන්නට පටන් ගත්හ.

# ❄ චන්ද්‍ර, සූර්‍ය, නැකත් තරු පහළ වීම

වාසෙට්ඨය, එලෙස ඒ සත්වයෝ රස පොළොව අතින් පිඬු කොට අනුභව කරන්ට පටන්ගත් කල්හි ඒ සත්වයන්ගේ ශරීරාලොකය නැති වී ගියේ ය. බලවත් අන්ධකාරයක් විය. එයින් සත්වයෝ ආලෝකය නැති වූයේ ය යැයි බියට තැති ගැනීමට පත්ව අපට ආලෝකය ලැබෙන්නේ නම් හොඳ ය යැයි සිතූහ. හිරුමඬල පහළ වූයේ ය. සත්වයන්ගේ සූර භාවය උපදවමින් පහළ වූ බැවින් එයට **"සූර්‍යයා"** යැයි නම් කළහ. මෙම සූර්‍ය මණ්ඩලය ඇතුළත රන් විමනකි. පිටත ආවරණය පළිඟුවෙන් සෑදී ඇත. මේ රන් හා පළිඟු යන දෙක ම උණුසුම් බැවින් සූර්‍ය මණ්ඩලය තේජසින් යුක්ත ය. ප්‍රමාණ වශයෙන් සූර්‍ය මණ්ඩලයෙහි විශ්කම්භය පනස් යොදුනකි. වට ප්‍රමාණයෙන් එකසිය පනස් යොදුනකි. සූර්‍ය මණ්ඩලය උදෑසන පායා සවසට බැස යයි. එවිට ඉතිරි කාලය අන්ධකාර විය. එයින් බියපත් වූ සත්වයෝ රාත්‍රියට ද ආලෝකයක් ලැබෙන්නේ නම් හොඳ ය යැයි සිතූහ. එවිට රාත්‍රිය ආලෝකවත් කරමින් සඳමඬල පහළ වූයේ ය. එයින් සතුටු වූ ඔවුහු එයට **"චන්ද්‍රයා"** යැයි නම් කළහ. මේ චන්ද්‍ර මණ්ඩලයෙහි ඇතුළත නිල් මැණික් විමනකි. පිටත රිදී ආවරණයකි. මේ නිල් මැණික් හා රිදී යන දෙක ම සිසිලසින් යුක්ත බැවින් චන්ද්‍ර මණ්ඩලය සිසිලසින් යුක්ත ය. මේ චන්ද්‍ර මණ්ඩලයෙහි විශ්කම්භය යොදුන් සතළිස් සතකි. වට ප්‍රමාණයෙන් යොදුන් එකසිය සතළිස් සතකි.

චන්ද්‍ර සූර්‍ය මණ්ඩල දෙක මහ පොළව මතුපිට සිට යොදුන් දෙසාළිස් දහසකට (42000) උඩින් චාතුර් මහාරාජික දෙව්ලො පිහිටා ඇති යුගන්ධර පර්වතයෙහි මුදුන මට්ටමෙන් ආකාශයෙහි පිහිටියේ ය. එයින් ද සූර්‍ය මණ්ඩලය උඩින් පිහිටියේ ය. චන්ද්‍ර මණ්ඩලය යටින් පිහිටියේ ය. චන්ද්‍ර සූර්‍ය දෙදෙනා අතර පරතරය යොදුනකි. චන්ද්‍ර මණ්ඩලයේ යට කෙළවරෙහි සිට සූර්‍ය මණ්ඩලයෙහි උඩ කෙළවර දක්වා දුර යොදුන් සියයකි. සඳ ඍජු ව[1] ගමන් යන කල්හි සෙමෙන්

[1] උදා වූ තැන් පටන් අස්තයට යන ගමන

යයි. සරස් ව[1] ඉක්මනින් යයි. සූර්‍ය මණ්ඩලයෙහි ඍජු ව යන ගමන ඉක්මනින් යයි. සරස් ව[2] සෙමින් යයි. චන්ද්‍ර මණ්ඩලයට ඉදිරියෙන් ද, පසුපසින් ද, දෙ පසින් ද නැකත් තාරකාවෝ වෙති. එළ දෙන තම පැටවුන් ළඟට පැමිණෙන්නාක් මෙන් සඳමඬල නැකත් තරු වෙත පැමිණෙයි. නැකත් තරු තම පිහිටි ස්ථානය අතහැර නො යයි.

මෙලෙස චන්ද්‍ර සූර්‍ය මණ්ඩල දෙක ම එක විටම පහළ වූහ. එයින් ප්‍රථමයෙන් සූර්‍ය මණ්ඩලය පෙනුණේ ය. සූර්‍ය මණ්ඩලය බැස ගිය විට චන්ද්‍ර මණ්ඩලය පෙනුණේ ය. චන්ද්‍ර සූර්‍ය මණ්ඩල දෙක පහළ වූ කල්හි ග්‍රහ තාරකා ද සෙසු තාරකාවෝ ද පහළ වූහ. ග්‍රහ තාරකා හා සෙසු තාරකා පහළ වූ කල රෑ දහවල් පෙනුනාහු ය. රෑ දහවල් ප්‍රකට වූ කල්හි මාස අර්ධ මාසයෝ ප්‍රකට වූහ. මාස අර්ධ මාසයන් පෙනෙන්නට වන් කල්හි ඍතු සංවත්සර (අවුරුදු) ප්‍රකට වූහ.

## ❈ රෑ, දහවල, දින, පක්ෂ, මාස පහළ වීම

චන්ද්‍ර සූර්‍ය මණ්ඩල දෙක අමාවක දවසෙහි දී එක්ව ම යයි. සූර්‍ය මණ්ඩලය එක දිනකට මහාමේරු පර්වතය වටා සතර මහද්වීපයට ආලෝකය ලබා දෙමින් යොදුන් විසිහත් ලක්ෂයක් දුර ගමන් කරයි. එලෙස චන්ද්‍ර මණ්ඩලය එක් දිනකට යොදුන් විසිහය ලක්ෂයක් දුර ගමන් කරයි. අමාවක දිනයෙන් පසු දින වන විට සූර්‍ය මණ්ඩලය චන්ද්‍ර මණ්ඩලය පසු කොට යොදුන් ලක්ෂයක් ඉක්මවා ඈත් ව යයි. එදින චන්ද්‍ර මණ්ඩලයෙහි රේඛාවක් පමණක් පෙනෙයි. එබැවින් එදින පැලවිය නම් වේ. දෙවන දිනය වන විට සූර්‍ය මණ්ඩලය චන්ද්‍ර මණ්ඩලයෙන් ඈත් ව යොදුන් දෙලක්ෂයක් දුර යයි. එදින චන්ද්‍ර මණ්ඩලයෙහි රේඛා දෙකක් වැවී පෙනෙයි. එබැවින් එදින දියවක නම් වේ. මෙලෙස දවසින් දවස යොදුන් ලක්ෂය බැගින් සූර්‍ය මණ්ඩලය චන්ද්‍ර මණ්ඩලයෙන් ඈත් ව ගොස් පසළොස්වක දින පිරී සම්පූර්ණ

[1] එක මාසයක් තුළ දකුණු දෙස සිට උතුරු දිසාවට ද, උතුරු දෙස සිට දකුණු දිසාවට ද යමින් බොහෝ වර මාරුවෙමින් යයි

[2] සූර්‍ය මණ්ඩලය සය මසකට වරක් බැගින් එක් වර්ෂයකට දෙවතාවක් උතුරු දකුණු දෙදිසාවට මාරු වෙමින් යයි.

වෙයි. එය හේතුවෙන් **"(පුර) පෑලවිය, දියවක, තියවක, ජලවක, විසේනිය, සැටවක, සතවක, අටවක, නවවක, දසවක, එකොළොස්වක, දෙළොස්වක, තෙළෙස්වක, තුදුස්වක, පසළොස්වක"** යනුවෙන් දින සකස් වෙයි. මෙසේ චන්ද්‍ර මණ්ඩලය අමාවක දින සිට පුර පසලොස්වක පෝය දින දක්වා වැඩෙන කාලය සුක්ඛ (පුර) පක්ෂය නම් වේ. මෙලෙස පසලොස්වක දක්වා චන්ද්‍ර මණ්ඩලය වැඩී එතැන් පටන් නැවත දවසින් දවස රේඛාව රේඛාව පිරිහීමට පත්ව අමාවක දින චන්ද්‍ර මණ්ඩලය නො පෙනී යයි. එය හේතුවෙන් **"(අව) පෑලවිය, දියවක, තියවක, ජලවක, විසේනිය, සැටවක, සතවක, අටවක, නවවක, දසවක, එකොළොස්වක, දෙළොස්වක, තෙළෙස්වක, තුදුස්වක, අමාවක"** යනුවෙන් දින සකස් වෙයි. මෙලෙස චන්ද්‍ර මණ්ඩලය පිරිහෙන කාලය කාල (අව, කළුවර) පක්ෂය නම් වේ. මෙසේ දින සැකසීමත් සමග පක්ෂ මාස සකස් වෙයි.

චන්ද්‍ර සූර්‍ය්‍ය මණ්ඩල දෙක සතර මහද්වීපයන්ට ඉහළින් සැරිසරන අතර සය මසක් සක්වළ මධ්‍යයෙහි පිහිටි මහාමේරු පර්‍වතයට ආසන්නයෙහි මහද්වීපයන්ට උතුරෙන් සැරිසරති. සය මසක් සක්වළ වට කොට පිහිටි චක්‍රාවාට පර්‍වතයට ආසන්නයෙහි සතර මහද්වීපයන්ට දකුණෙන් සැරිසරති. මෙසේ සැරිසරන අතර ඇසළ මස මහාමේරු පර්‍වතයට ආසන්නයෙහි හැසිරෙති. ඉන් පසු නිකිණි බිනර යන දෙමස ක්‍රමයෙන් පර්‍වතාසන්නයෙන් දවසින් දවස ඈත් වෙමින් සැරිසරති. ඉන් පසු වප් මස මහද්වීපයන්ට මුදුන් ව සැරිසරමින් ගොස් දකුණු දෙසට ක්‍රමයෙන් සංක්‍රමණය වී ඉල් උඳුවප් දෙමස සැරිසරා දුරුතු මස චක්‍රාවාට පර්‍වතයට ආසන්න ව භ්‍රමණය වී නැවත නවම්, මැදින් දෙමස උතුරු දෙසට සංක්‍රමණය වෙමින් සැරිසරා බක් මස මහද්වීපයන්ට ආසන්නයෙහි හැසිරෙති. නැවත ද එයින් උතුරු දෙසට වෙසක්, පොසොන් දෙමස සංක්‍රමණය වෙමින් ගොස් ඇසළ මස මහාමේරු පර්‍වතය ආසන්නව සැරිසරති.

මෙලෙස චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනා පහළ වීමත් සමග ම නක්ෂත්‍ර මෙන්ම අනෙකුත් ග්‍රහ තාරකා රූප සියල්ලක් ම පහළ වූයේ ය. රාත්‍රිය දහවල හට ගත්තේ ය. එයින් හිරු බැස යාමෙහි පටන් අරුණ නැගීම

දක්වා කාලය "**රාත්‍රිය**" නම් විය. අරුණ නැගීමෙහි පටන් සූර්‍ය්‍යයා බැස යාම දක්වා කාලය "**දහවල**" නම් විය.

මේ චන්ද්‍ර සූර්‍ය්‍ය මණ්ඩල දෙකෙන් එකවිට ම මහද්වීප තුනක් ආලෝකවත් වේ. අප වාසය කරන ජම්බුද්වීපයට හිරු උදා වන කාලයෙහි පූර්‍වී විදේහයට මධ්‍යාහ්න කාලය වේ. උතුරු කුරු දිවයිනට හිරු බැස යන කාලය වේ. අපරගෝයානයට මධ්‍යම රාත්‍රිය වේ.

පූර්‍වී විදේහයට හිරු උදා වන කාලයෙහි උතුරු කුරු දිවයිනට මධ්‍යාහ්න කාලය වේ. අපරගෝයානයට හිරු බැස යන කාලය වේ. ජම්බුද්වීපයට මධ්‍යම රාත්‍රිය වේ.

උතුරු කුරු දිවයිනට හිරු උදා වන කාලයෙහි අපරගෝයානයට මධ්‍යාහ්න කාලය වේ. ජම්බුද්වීපයට හිරු බැස යන කාලය වේ. පූර්‍වී විදේහයට මධ්‍යම රාත්‍රිය වේ.

අපරගෝයානයට හිරු උදා වන කාලයෙහි ජම්බුද්වීපයට මධ්‍යාහ්න කාලය වේ. පූර්‍වී විදේහයට හිරු බැස යන කාලය වේ. උතුරු කුරු දිවයිනට මධ්‍යම රාත්‍රිය වේ.

## ❄ ඍතු සකස් වීම

මේ චන්ද්‍ර සූර්‍ය්‍ය මණ්ඩල දෙදෙනා **අජ වීථිය, නාග වීථිය, ගෝ වීථිය** යැයි වීථි තුනක ගමන් කරයි.

යම් වීථියකින් සූර්‍ය්‍යයා ගමන් කරන කල්හි වැස්ස වලාහක දිව්‍ය පුත්‍රයා සූර්‍ය්‍ය රශ්මියෙන් දැඩි සේ පෙළී තම විමානයෙන් නො නික්මෙත් ද, ක්‍රීඩාවෙහි යෙදී නො හැසිරෙත් ද එකල්හි සූර්‍ය්‍යයාගේ විමානය ප්‍රකෘති මාර්‍ගයෙන් පහතට බැස හැසිරෙයි. එවිට චන්ද්‍ර මණ්ඩලය ද පහතට බැස හැසිරෙයි. එහෙයින් මෙම වීථිය ජලය නොමැති හෙයින් ද, එළුවන්ට අනුරූප පැවතුම් ඇති බැවින් ද ඒ චන්ද්‍ර සූර්‍ය්‍ය මණ්ඩලයන්හි ගමන් මාර්‍ගය "**අජ වීථිය**" නමින් හැඳින්වීමට ගියේ ය.

චන්ද්‍ර සූර්‍ය දෙදෙනා අජ වීථියට පැමිණි කල්හි එක වැසි බින්දුවකුදු නොවසී.

යම් වීථියකින් සූර්‍යයා ගමන් කරන කල්හි වැස්ස වළාහක දිව්‍ය පුත්‍රයෝ සූර්‍ය තාපයෙන් නො තැවෙත් ද, තමාගේ විමානයෙන් නික්ම ක්‍රීඩාවෙහි යෙදෙමින් ඔබිනොබ සැරිසරති. එකල්හි සූර්‍ය විමානය ප්‍රකෘති මාර්‍ගයෙන් උඩට නැගී ගමන් කරයි. එවිට චන්ද්‍ර මණ්ඩලය ද සූර්‍යයා අනුගමනය කරමින් එයට අනුරූපව ගමන් කරයි. එවිට වායු මණ්ඩලය ද එයට අනුරූපව ගමන් කරයි. එබැවින් එම වීථියෙහි ජලය බහුල බැවින් නාගයින් - ඇතුන් හා සමාන බැවින් "**නාග වීථිය**" යැයි හැඳින්වීමට ගියේ ය. චන්ද්‍ර සූර්‍ය දෙදෙනා නාග වීථියට නැගුණු කල්හි අහස බිඳුණාක් මෙන් වැව් වසී.

යම් කලෙක සූර්‍ය මණ්ඩලය උඩට ද නො ගොස් යටට ද නො බැස ප්‍රකෘති මාර්‍ගයෙන් ම ගමන් කරයි ද, එකල්හි වැස්ස වළාහක දෙවියෝ කැමති පරිදි විමානයෙන් නික්ම සුව සේ හැසිරෙති. එකල්හි කලින් කලට වැස්ස වසිමින් ලොවෙහි ඍතු සම බවට පැමිණේ. එලෙස ඍතු සමතාවයට පැමිණීමෙන් චන්ද්‍ර සූර්‍ය දෙදෙනාගේ ගමන් මග ගවයෙකුට සමාන ගති ඇති බැවින් "**ගෝ වීථිය**" යැයි හැඳින්වීමට ගියේ ය. චන්ද්‍ර සූර්‍ය දෙදෙනා ගෝ වීථියට පැමිණි කල්හි ඍතු සමාන බවට පැමිණේ. ඒ අනුව "**හේමන්ත, ගිම්හාන, වස්සාන**" යන ඍතු තුන සකස් වේ.

එළුවන්ට ජලය පිළිකුල් වේ. එමෙන්ම චන්ද්‍ර සූර්‍ය දෙදෙනා අජ වීථියට පැමිණි කල්හි වැසි බින්දුවකුදු නො වැසීමෙන් වියළීමට පත්ව පවත්නා බක්, වෙසක්, පොසොන්, ඇසළ යන සිව් මස "**ගිම්හාන ඍතුව**" නම් වේ.

ඇතුන්ට නාගයින්ට ජලය ඉතා ප්‍රිය ය. මනාප ය. එමෙන්ම චන්ද්‍ර සූර්‍ය දෙදෙනා නාග වීථියට පැමිණි කල්හි අහස සිදුරු වූවක් මෙන් වර්‍ෂාපතනය සිදු වී ජල ගැලුම් සිදු වී හාත්පස තෙමී පවත්නා නිකිණි, බිනර, වප්, ඉල් යන සිව් මස "**වස්සාන ඍතුව**" නම් වේ.

එළ ගවයාට සීත උෂ්ණ දෙක සමාන ය. එමෙන්ම චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනා ගෝ වීථියට පැමිණි කල්හි වර්‍ෂාව ද නැවතීමට පත්ව, අධික උෂ්ණය ද නැතිව ඍතුව සමානව පවත්නා උඳුවප්, දුරුතු, නවම්, මැදින් යන සිව් මස **"හේමන්ත ඍතුව"** නම් වේ.

## ❄ සංවත්සර සකස් වීම

මෙලෙස කල්පය සකස් වීමෙහි දී චන්ද්‍ර සූර්‍ය්‍යය මණ්ඩල දෙකේ සැරිසැරීම හේතුවෙන් රෑ දහවල සකස් විය. මෙලෙස එක රැයක් හා දහවලක් එක දවසකි. එබඳු දින සතක් එක සතියකි. එසේ වූ සති හතරක් එක් මාසයකි. එසේ වූ මාස හතරක් එක ඍතුවකි. එබඳු මාස දෙළොසක් නොහොත් ඍතු තුනක් එක් වර්‍ෂයකි. එබඳු වර්‍ෂ හෙවත් සංවත්සර දෙළොසක් ඇත්තේ ය. එනම්:

**මූසිකො වසභො ව්‍යග්‍ඝ - සස නාගානි'මෙව ච,**
**සප්පස්සජ කපී'චෙව - කුක්කුටො සොණ සූකරො'ති.**

මූෂික සංවත්සරය, වෘෂභ සංවත්සරය, ව්‍යාඝ්‍ර සංවත්සරය, සස සංවත්සරය, නාග සංවත්සරය, සර්‍ප සංවත්සරය, අස්ස සංවත්සරය, අජ සංවත්සරය, කපි සංවත්සරය, කුක්කුට සංවත්සරය, සෝණ සංවත්සරය, සූකර සංවත්සරය යනුවෙන් දෙළොසකි. ඒ අනුව අපි දැන් ගත කරනු ලබන්නේ **සූකර** සංවත්සරය යි.

මෙලෙස චන්ද්‍ර සූර්‍ය්‍ය මණ්ඩල, නක්‍ෂත්‍ර, තාරකා රූප පහළ වීමත් සමගම **චක්‍රවාට පර්‍වතය, මහාමේරු පර්‍වතය, සප්ත කූට පර්‍වත, මහද්වීප සතර, හිමාල පර්‍වතය** ආදී සියල්ල පහළ වූහ.

## ☸ චක්‍රාවාට පර්වතය

ලෝකයක් යනු එක් සක්වළකි. සක්වළක ඉම **"චක්‍රාවාට පර්වතය"** හෙවත් **"සක්වළ ගල"** නම් වේ. ඒ චක්‍රාවාට පර්වතය යොදුන් දෙළොස් ලක්‍ෂ තුන්දහස් සාරසිය පණසක (12,03450) විෂ්කම්භයකින් යුක්ත ය. වට ප්‍රමාණය යොදුන් සතිස්ලක්‍ෂ දසදහස් තුන්සිය පණසකින් (36010350) යුක්ත ය. උස යොදුන් එක් ලක්‍ෂ සැටසය දහසකින් (166,000) යුක්ත ය. එහි ඇතුළත යොදුන් සුවාසූ දහසක් (84,000) උසට සමුද්‍ර ජලය පිරී පවත්නේ ය. ජලයෙන් ඉහළ කොටස යොදුන් දෙයාසූ දහසක් (82,000) උස්ව පිහිටියේ ය.

## ☸ මහාමේරු පර්වතය

**චතුරාසීති සහස්සානි - අජ්ඣොගාළ්හො මහණ්ණවෙ,**
**අච්චුග්ගතො තාවදෙව - සිනෙරු පබ්බතුත්තමො.**

ඒ චක්‍රාවාට පර්වත මධ්‍යයෙහි සල පොළොව (ගල් පොළොව) මත ත්‍රිකූට නම් වූ පර්වත තුනක් මුදුනෙහි භේරි සණ්ඨාන ඇතිව අෂ්ට වර්ණයකින් යුක්තව පිහිටි මහාමේරු පර්වතය යොදුන් එක් ලක්‍ෂ අට සැට දහසකින් (1,68,000) යුක්ත ය. එයින් යොදුන් සුවාසූ දහසක් (84,000) සමුද්‍ර ජලයෙහි ගිලී ඇත්තේ ය. ජලයෙන් උඩට යොදුන් සුවාසූ දහසක් (84,000) උස්ව පිහිටියේ ය. එහි පළල ද යොදුන් සුවාසූදහසකින් (84,000) යුක්ත ය.

**පාචීනපස්සං රජතං - දක්ඛිණං ඉන්දනීලකං,**
**පච්ඡිමං ඵළිකං පස්සං - උත්තරං කඤ්චනාමයං.**

ඒ මහාමේරු පර්වතයෙහි පෙර දිග මුහුණත පළිඟු වන් සුදු පැහැයෙන් යුක්ත ය. දකුණු පස මුහුණත ඉඳුනිල් මිණි වන් නිල් පැහැයෙන් යුක්ත ය. පශ්චිම දිසා මුහුණත පබළු වන් රතු පැහැයෙන් යුක්ත ය. උතුරු දිග මුහුණත ඝන රන් පැහැයෙන් යුක්ත ය.

තව ද එහි ඊසාන දිග සුදු හා රන් මිශ්‍ර පැහැයෙන් යුක්ත ය. ගිනිකොන දිග සුදු හා නිල් මිශ්‍ර පැහැයෙන් යුක්ත ය. නිරිත දිග රතු හා නිල් මිශ්‍ර පැහැයෙන් යුක්ත ය. වයඹ දිග රතු හා රන් මිශ්‍ර පැහැයෙන් යුක්ත ය.

මෙසේ කැඩපත් වැනි මුහුණත් අටකින් යුත් මහාමේරු පර්වතයෙහි අට දිශාවෙන් විහිදෙන වර්ණයන්ගෙන් ඒ දිශාවන් හි පිහිටි මහා සමුද්‍ර පර්වතාදී සියල්ල චක්‍රාවාට පර්වතය දක්වා ඒ ඒ වර්ණයන්ගෙන් බැබළෙමින් පවත්නේ වේ. එබැවින් පූර්ව දිසාවෙහි සමුද්‍රය ක්ෂීර සාගරය නම් වේ. දකුණු දිසාවෙහි සමුද්‍රය නීල සාගරය නම් වේ. පශ්චිම දිසාවෙහි සමුද්‍රය රක්ත සාගරය නම් වේ. උතුරු දිසාවෙහි සමුද්‍රය ස්වර්ණ සාගරය නම් වේ. මෙලෙස සතර දිසාවෙහි පිහිටි සමුද්‍ර සතර මහා සාගරය නම් වේ.

මහාමේරු පර්වතයෙහි පූර්ව දිසාවෙහි යොදුන් පන්දහස බැගින් පළලින් ද, උසින් ද යුක්තව **නාගාලින්දය** පිහිටියේ ය. දකුණු දිග **ගරුඬාලින්දය** පිහිටියේ ය. බටහිර දිග **කුම්භණ්ඩාලින්දය** පිහිටියේ ය. උතුරු දිග **යක්ඛාලින්දය** පිහිටියේ ය. තාවතිංස දෙව්ලොවට අරක් ගත් ඒ දෙවියන්ගේ නම් වශයෙන් ප්‍රකට ව මේ ආලින්ද සතර පිහිටියේය.

මේ මහාමේරු පර්වතය පාමුල ඇතුළත ත්‍රි කූට පර්වත අතර යොදුන් දසදහසක් දිග පළල උස ඇතිව තව්තිසා දෙව්ලොව හා සමාන සැප සම්පතින් යුක්ත වූ අසුර භවන පිහිටියේ ය. මහාමේරු පර්වතය පා මුල එය වට කර නාග භවන පිහිටියේ ය.

## ☸ සප්ත කූට පර්වත

**යුගන්ධරො ඊසධරො - කරවීකො සුදස්සනො,**
**නෙමිධරො විනතකො - අස්සකණ්ණො ගිරි බ්‍රහා.**

**එතෙ සත්ත මහාසෙලා - සිනෙරුස්ස සමන්තතො,**
**මහාරාජානමාවාසා - දෙවයක්ඛනිසෙවිතා.**

**"යුගන්ධර, ඊසධර, කරවීක, සුදර්ශන, නේමිධර, විනතක, අශ්වකර්ණ"** යන මේ මහා සප්ත කූට පර්වත මහාමේරු පර්වතය වට කොට පිහිටියහ. ඒ මහාමේරු පර්වතය වට කොට යොදුන් සුවාසූ දහසකින් (84,000) ඇත් ව නා නා විධ රත්නයන්ගෙන් විසිතුරු වූ යොදුන් සුවාසූ දහසක් (84,000) උස ඇති පර්වතය පිහිටියේ ය. එයින් යොදුන් දෙසාළිස් දහසක් (42,000) සමුද්‍රයෙහි ගිලී ඇත්තේ ය. එපමණ ම උස්ව පිහිටියේ ය. සතර වරම් දෙව් රජවරුන් ප්‍රධාන ව චාතුර්මහාරාජික දෙව්ලොව දේව යක්ෂයන්ගේ වාස භූමිය මෙහි පිහිටියේය.

ඒ යුගන්ධර පර්වතය වට කොට යොදුන් දෙසාළිස් දහසකින් (42,000) ඇත් ව යොදුන් දෙසාළිස් දහසක් (42,000) උස ඇති **ඊසධර පර්වතය** පිහිටියේ ය. එයින් යොදුන් එක් විසි දහසක් (21,000) සමුද්‍රයෙහි ගිලී ඇත්තේ ය. එපමණ ම උස්ව පිහිටියේ ය.

ඒ ඊසධර පර්වතය වට කොට යොදුන් එක් විසි දහසකින් (21,000) ඇත් ව යොදුන් එක් විසි දහසක් (21,000) උස ඇති **කරවීක පර්වතය** පිහිටියේ ය. එයින් යොදුන් දසදහස් පන්සියයක් (10,500) සමුද්‍රයෙහි ගිලී ඇත්තේ ය. එපමණ ම උස්ව පිහිටියේ ය.

ඒ කරවික පර්වතය වට කොට යොදුන් දසදහස් පන්සියයකින් (10,500) ඇත් ව යොදුන් දසදහස් පන්සියයක් (10,500) උස ඇති **සුදර්ශන පර්වතය** පිහිටියේ ය. එයින් යොදුන් පන්දහස් දෙසිය පණසක් (5,250) සමුද්‍රයෙහි ගිලී ඇත්තේ ය. එපමණ ම උස්ව පිහිටියේය.

ඒ සුදර්ශන පර්වතය වට කොට යොදුන් දසදහස් පන්සියයකින් (5,250) ඇත් ව යොදුන් පන්දහස් දෙසිය පනසක් (5,250) උස ඇති **නේමිධර පර්වතය** පිහිටියේ ය. එයින් යොදුන් දෙදහස් හයසිය පස් විස්සක් (2,625) සමුද්‍රයෙහි ගිලී ඇත්තේ ය. එපමණ ම උස්ව පිහිටියේය.

ඒ නේමිධර පර්වතය වට කොට යොදුන් දෙදහස් හයසිය පස් විස්සකින් (2,625) ඇත් ව යොදුන් දෙදහස් හයසිය පස් විස්සක් (2,625) උස ඇති **විනතක පර්වතය** පිහිටියේ ය. එයින් යොදුන් එක්දහස් තුන්සිය

දෙළොස් යොදුනකුත් දෙ ගව්වක් (1,312 - ගව් 2) සමුද්‍රයෙහි ගිලී ඇත්තේ ය. එපමණ ම උස්ව පිහිටියේය.

ඒ විනතක පර්වතය වට කොට යොදුන් එක්දහස් තුන්සිය දෙළොස් යොදුනකුත් දෙ ගව්වකින් (1,312 - ගව් 2) ඈත් ව එක්දහස් තුන්සිය දෙළොස් යොදුනකුත් දෙ ගව්වක් (1,312 - ගව් 2) උස ඇති **අශ්වකර්ණ පර්වතය** පිහිටියේ ය. එයින් යොදුන් හයසිය පණසකුත් එක් ගව්වක් (650 - ගව් 1) සමුද්‍රයෙහි ගිලී ඇත්තේ ය. එපමණ ම උස්ව පිහිටියේ ය. මේ සප්ත කූට පර්වත මහාමේරු පර්වතයෙහි පටන් අනු පිළිවෙලින් මිටි ව වේදිකා ආකාරයෙන් පිහිටියේ ය.

මහාමේරු පර්වතය හා යුගන්ධර පර්වතය අතර සුවාසූ දහසක් (84,000) යොදුන් පළල ඇතිව සීදන්ත සාගරය පිහිටියේ ය. ඒ සාගරයෙහි ජලය ඉතා සියුම් ය. මොනර පිළක් දැමුවත් එහි ගිලෙන්නේ ය. ඉතා සියුම් දූවිලි ස්වල්පයක් වත් දිය මතුපිට නො රැඳී ගිලීමට පත්ව සැම කල්හි පිරිසිදුව පවත්නා බැවින් එම සාගරය **සීදන්ත සාගරය** නම් වේ.

එසේ ම යුගන්ධර පර්වතය හා ඊසධර පර්වත දෙක අතර ද දෙසාළිස් දහසක් (42,000) යොදුන් පළල ඇතිව සීදන්ත සාගරය පිහිටියේ ය.

ඊසධර පර්වතය හා කරවික පර්වත දෙක අතර එක්විසි දහසක් (21,000) යොදුන් පළල ඇතිව සීදන්ත සාගරය පිහිටියේ ය.

කරවික පර්වතය හා සුදර්ශන පර්වත දෙක අතර දසදහස් පන්සියයක් (10,500) යොදුන් පළල ඇතිව සීදන්ත සාගරය පිහිටියේ ය.

සුදර්ශන පර්වතය හා නෙමිධර පර්වත දෙක අතර පන්දහස් දෙසිය පනසක් (5,250) යොදුන් පළල ඇතිව සීදන්ත සාගරය පිහිටියේ ය.

නෙමිධර පර්වතය හා විනතක පර්වත දෙක අතර දෙදහස් හයසිය පස් විස්සක් (2,625) යොදුන් පළල ඇතිව සීදන්ත සාගරය පිහිටියේ ය.

විනතක පර්වතය හා අස්සකණ්ණ පර්වත දෙක අතර එක්දහස් තුන්සිය දෙළොස් යොදුනකුත් දෙ ගව්වක් (1,312 - ගව් 2) පළල ඇතිව සීදන්ත සාගරය පිහිටියේ ය.

## ☸ සතර මහ දිවයින

**ජම්බුද්වීපය, අපරගෝයානය, පූර්වවිදේහය, උතුරකුරු දිවයින,** යැයි එක් ලෝක ධාතුවක (සක්වළක) මනුෂ්‍ය වාසභූමි වූ මහද්වීප සතරක් ඇත්තේ වේ. ජම්බුද්වීපය මහාමේරු පර්වතයට දකුණු දිසාවෙහි පිහිටියේ ය. අපරගෝයානය මහාමේරු පර්වතයට පශ්චිම (බටහිර) දිසාවෙහි පිහිටියේ ය. උතුරු කුරු දිවයින මහාමේරු පර්වතයට උතුරු දිසාවෙහි පිහිටියේ ය. මහාමේරු පර්වතය හා යුගන්ධරාදී සප්තකූට පර්වත මේ මහද්වීප සතරට ම උතුරු දිසාවෙහි පිහිටියේ ය. චක්‍රාවාට පර්වතය මේ සතර මහද්වීපයන්ට දකුණු දිසාවෙහි පිහිටියේ ය.

### පූර්ව විදේහය

පූර්ව විදේහය මහාමේරු පර්වතයට පූර්ව දිසාවෙහි (නැගෙනහිර) පිහිටියේ ය. දිගින් පළලින් යොදුන් සත් දහසක ප්‍රමාණයෙන් යුක්ත ය. එහි උපන් මනුෂ්‍යයන්ට නිත්‍ය වශයෙන් අවුරුදු පන්සියයක් ආයුෂ ඇත්තේ වේ. ජම්බුද්වීපයෙහි පිහිටි දඹ වෘක්ෂය මෙන් වටින් පසළොස් යොදුන් කඳ ඇති, උසින් පනස් යොදුන් කඳ ඇති, හාත්පස පනස් පනස් යොදුන් විහිදී ගිය දිග අතු ඇති, පළලින් සියක් යොදුනක් ඇති කල්පස්ථායී මහාරී වෘක්ෂය මෙහි පිහිටියේ ය. මෙම දිවයින ආදස (කැඩපතක) සටහන් (හැඩය) ඇත්තේ ය. මෙහි උපදින මනුෂ්‍යයින්ගේ මුහුණ ද එම හැඩයෙන් ම යුක්ත වේ.

## ජම්බුද්වීපය

**පඤ්චසතයොජනක්ඛන්ධ - සාඛායාමා සමන්තතො,**
**සතයොජනවිත්ථිණ්ණා - තාවදෙව ච උග්ගතා,**
**ජම්බූ යස්සානුභාවෙන - ජම්බුදීපො පකාසිතො.**

යම් දඹ වෘක්ෂයක් නිසා ජම්බුද්වීපය යැයි කියන ලද්දේ ද, එය හිමවතට දකුණු දිසාවෙහි පිහිටියේ ය. නග නම් වූ ඒ දඹ වෘක්ෂය වටින් පසළොස් යොදුන් කඳ ඇත්තේ ය. උසින් පනස් යොදුන් කඳ ඇත්තේ ය. හාත්පස පනස් පනස් යොදුන් විහිදී ගිය දිග අතු ඇත්තේ ය. පළලින් සියක් යොදුනක් ඇත්තේ ය. මේ දඹ වෘක්ෂයෙහි ආනුභාවයෙන් මේ දිවයින (පෘථිවිය) ජම්බුද්වීපය නම් විය. මේ ජම්බුද්වීපය දෙයාසූ දහසක් (82,000) යොදුන් මහා සමුද්‍රයෙහි ගිලී ඇත්තේ ය. එපමණ ම උස්ව පිහිටියේ ය.

මේ ජම්බුද්වීපය සකට සණ්ඨාන (කරත්තයක් මෙන් තුණැස් හැඩය) ඇත්තේ ය. මෙහි උපදින මනුෂ්‍යයන්ගේ මුහුණ ද එම හැඩය ම ඇත්තේ ය. දිගින් පළලින් දසදහසක්, දසදහසක් යොදුන් ඇතිව පිහිටියේ ය. පසුව එයින් යොදුන් සාර දහසක ප්‍රමාණය ජනයාගේ කුසල හීනත්වය හේතුවෙන් මහා සමුද්‍රයට බිලි වූයේ ය. ඉතිරි යොදුන් සය දහස අතරින් යොදුන් තුන්දහසක ප්‍රමාණය හිමවත් කඳු ප්‍රදේශය විය. එයින් ඉතිරි යොදුන් තුන්දහස සයානූ ලක්ෂයක් පටුන් ගමින් හා සපණසක් (56) රුවන් ආකරයන්ගෙන් ද, නවානූ ලක්ෂයක් (99,000,00) ද්‍රෝණ මුඛයන්ගෙන් ද යුක්ත ය. මේ ජම්බුද්වීපය මනුෂ්‍යයන්ගේ පුණ්‍ය සෘද්ධියෙන් සශ්‍රීකමත් වූ උත්තම කාලයන්හි සුවාසූ දහසක් (84,000) රාජධානින්ගෙන් ද, මධ්‍යම ප්‍රමාණයෙන් යුක්ත කාලයන්හි තෙසැට දහසක් (63,000) රාජධානින්ගෙන් ද, මනුෂ්‍යයන් පිනෙන් අඩු වී අධර්මයෙන් වෙසෙන කාලයන්හි දෙපනස් දහසක් (52,000) රාජධානින්ගෙන් යුක්ත ව මනුෂ්‍යයන්ට වාසස්ථාන විය.

## හිමාල පර්වතය

**යොජනානං සතානුච්චො - හිමවා පඤ්ච පබ්බතො,**
**යොජනානං සහස්සානි - තීණි ආයතවිත්ථතො.**

**චතුරාසීතිසහස්සෙහි - කූටෙහි පතිමණ්ඩිතො,**
**තිපඤ්චයොජනක්ඛන්ධ - පරික්ඛෙපා නගව්හයා.**

හිමාල පර්වතය දිගින් පළලින් යොදුන් තුන්සියයක් ඇත්තේ ය. උසින් යොදුන් පන්සියයකි. සුවාසූ දහසක් රන්, රිදී, මැණික් පර්වතයන්ගෙන් ප්‍රතිමණ්ඩිත ය.

ඒ හිමාල පර්වතය හිමයට වාසස්ථානයක් ව රිදී පර්වතයක් මෙන් දුරට පෙනෙන බැවින් හිමාල පර්වතය නම් විය. මේ හිමාල පර්වතයෙන් ගංගා පන්සියයක් ගලා බසින්නාහ. ඒ හිමාලයෙහි **අනෝතත්ත විල, කණ්ණමුණ්ඩ විල, රථකාර විල, ඡද්දන්ත විල, කුණාල විල, මන්දකිණි විල, සිංහ ප්‍රපාත විල** යන සප්ත මහා විල් පිහිටියේ ය. එයින් අනෝතත්ත විල මධ්‍යයෙහි පිහිටියේ ය. අනෙක් විල් සය මලක පෙති මෙන් එය වට කොට පිහිටියේ ය.

## අනෝතත්ත විල

අනෝතත්ත විල දිගින් හා පළලින් යොදුන් පණසකි. වටින් එකසිය පනස් යොදුන් ඇත්තේ වේ. ඒ විල වට කොට **සුදර්ශනකූටය, චිත්‍රකූටය, කාලකූටය, ගන්ධමාදනකූටය, කෛලාසකූටය** යැයි පර්වත පසකින් වටව ඇත්තේ ය.

**සුදර්ශන කූටය** රන් පැහැ ඇත්තේ ය. **චිත්‍ර කූට පර්වතය** සර්ව රත්නයන්ගෙන් නිර්මිත ය.

**කාල කූටය** අඳුන් වන් කළු පැහැයෙන් යුක්ත ය.

**ගන්ධමාදන කූටය** ශ්‍යාම වර්‍ණ ඇත්තේ ය. ඇතුළත මුං පැහැ ඇත්තේ ය. කාලානුසාරියාදී මූල සුගන්ධයන්ගෙන් ද, සඳුන් ආදී අරටු සුගන්ධයන්ගෙන් ද, සලල ආදී කොවුල් සුගන්ධයන්ගෙන් ද, ලමඟ ආදී පොතු සුගන්ධයන්ගෙන් ද, කප්පිත්ත ආදී පපටික සුගන්ධයන්ගෙන් ද, සජ්ජ ආදී රස සුගන්ධයන්ගෙන් ද, තමාල ආදී පත්‍ර සුගන්ධයන්ගෙන් ද, නාගකුංකුම ආදීපුෂ්ප සුගන්ධයන්ගෙන් ද, ජාති ඵල ආදී ඵල සුගන්ධයන්ගෙන් ද, මේ සියල්ල එක් වූ විට ඇත්තා වූ සර්‍ව සුගන්ධයන්ගෙන් ද යන දසවිධ සුගන්ධයන්ගෙනි ද, අනේක විධ වූ ඖෂධයන්ගෙන් ද ගැවසී ඇත්තේ ය. අව පසළොස්වක ද රාත්‍රියෙහි සහස්ස කිරණාලෝකයක් මෙන් බබළන්නේ ය.

මෙම ගන්ධමාදන පර්‍වතයෙහි නන්දමූලක නම් පභාරයක් ඇත්තේ ය. එහි පසේ බුදු රජාණන් වහන්සේලාට වාසය පිණිස රන් ගුහාවක් ද, රිදී ගුහාවක් ද, මැණික් ගුහාවක් ද ඇත්තේ ය. එයින් විසිතුරු වූ මැණික් ලෙන දෙර කඩ රුවන් මලුව අසල යොදුනක් උස ඇති **මංජුසක** නම් වෘක්‍ෂයක් ඇත්තේ ය. ඒ වෘක්‍ෂයෙහි දිය ගොඩ පිපෙන සියලු මල් පිපෙන්නේ ය. පසේ බුදුරජාණන් වහන්සේලා එතැනට වඩින විට ඒ රුවන් මලුව පවනක් ඇති වී හමදනේ ය. තවත් පවනකින් එහි ඇති රුවන් වැලි වල ගොඩ තැන් සම කොට බෙර ඇසක් මෙන් සම කරන්නේ ය. තවත් පවනක් ඇති වී අනෝතත්ත විලෙන් දිය ගෙනවිත් ඉසින්නේ ය. තවත් පවනක් ඇති වී ඒ හිමාල වනයෙහි ඇති සියලු සුවඳ ගෙනවිත් රුවන් මළුවෙහි බහා මලුව එකම සුවඳ පිඩක් සේ කරන්නේ ය. තවත් පවනක් ඇති වී ඒ මංජුසක නම් වෘක්‍ෂයෙහි පිපී ඇති මල් නටුවෙන් බිඳ බිම වගුරුවන්නේ ය. තවත් පවනක් ඇති වී ඒ මල්වලින් මනාකොට ආසනයක් පනවා තබන්නේ ය. පසේ බුදු රජාණන් වහන්සේ එහි වැඩ හිඳ කමටහන් විචාරා පොහොය කොට වඩනා සේක.

**කෛලාසකූට** පර්‍වතය රිදී පැහැ ඇත්තේ ය.

මේ සියලු පර්‍වත යොදුන් දෙසීයක් උස ඇත්තේ වේ. මුලින් විශාල ව අගට කුඩා වී කවුඩු හොට පසක් මෙන් විලට නැමී එකතු වී විල වැසී ඇත්තේ ය. සූර්‍ය මණ්ඩලය හා චන්ද්‍ර මණ්ඩලය මුදුනෙන් යන විට මේ විලට ආලෝකය නො වැටෙන්නේ ය. උතුරු දෙසින් හෝ

දකුණු දෙසින් අවරෙන් යන විට පර්වත අතරින් මඳක් ආලෝකය වැටෙන්නේ ය. එබැවින් මේ විල **අනෝතත්ත** නම් වේ.

මේ අනෝතත්ත විලට දෙවියන්ගේ හා නාගයින් ගේ ආනුභාවයෙන් මසකට සතර වැස්සක් වසින්නේ ය. එයින් පර්වත මුදුනෙහි සිට ගලන ජලය ගංගාවන් සේ වහනය වී ඒ සියලු ජලය ඒ විලට ම යන්නේ ය. මේ විල වටා රිදී පවුරක් ඇත්තේ ය. ඒ පවුරෙහි තැනින් තැන සෝපාන මාලාවෙන් යුක්තව නහන තොටවලින් සෝභමාන ය. ප්‍රාණීන් නැති නිර්මල ජලය බුදු පසේබුදු මහ රහතන් වහන්සේලාට හා සිද්ධ විද්‍යාධරාදීන්ට ප්‍රයෝජනවත් වේ. ඒ විල සතර දිසාවෙහි සිංහ මුඛ, හස්ති මුඛ, අශ්ව මුඛ, වෘෂභ මුඛ යැයි ජලය පිටතට ගලා බස්නා දොරටු සතරක් ඇත්තේ ය. ඒ දොරටුවලින් වෙන වෙනම මහා ගංගා සතරක් ගලා බස්නේ ය. එයින් සිංහ මුඛයෙන් ජලය ගලා බස්නා ගංගා තීරයෙහි සිංහයෝ බහුලව ඇත්තාහ. හස්ති මුඛයෙන් ජලය ගලා බස්නා ගංගා තීරයෙහි ඇත්තු බහුලව ඇත්තාහ. අශ්ව මුඛයෙන් ජලය ගලා බස්නා ගංගා තීරයෙහි අශ්වයෝ බහුලව ඇත්තාහ. වෘෂභ මුඛයෙන් ජලය ගලා බස්නා ගංගා තීරයෙහි වෘෂභයෝ බහුලව ඇත්තාහ. මෙසේ සතර දිසාවෙන් නික්මෙන ගංගාවෝ එකකට එකක් එකතු නොවී ඒ විල වටා තුන් වාරයක් ගමන් කොට ඒ ඒ දිසාවන්ගෙන්ම අමනුෂ්‍ය පතයට වැද මහා වන මැදින් මහා සමුද්‍රය වෙත ගලා බසින්නාහ.

දකුණු දිසාවෙන් නික්මෙන ගංගාව එලෙස විල වටා තුන් වටයක් පැදකුණු කොට ගලා යන්නේ ය. ඉන් පසු කළුගල් තලාවක් මත සැට යොදුනක් ගලා යන්නේ ය. එයින් හරස් ව පිහිටි පර්වතයක වැදී ගව් තුනක් පමණ මහා ජල කඳක් ව අහසට නැගී සැට යොදුනක් ගොස් බිම පතිත වන්නේ ය. එලෙස පතිත වන තැන **තියග්ගල** නම් ඝන පාෂාණයක් ඇති තැනක පතිත වී පනස් යොදුන් මහා විලක් සෑදී ඇත්තේ ය. එලෙස වැටෙන ජල කඳ පොකුණු ඉවුර බිඳී සැට යොදුනක් යන්නේ ය. එසේ ගොස් පොළොවට පතිත වන තැන පොළොව බිඳී සැට යොදුනක් දුර උමඟකින් යන්නේ ය. එලෙස යන ඒ මහා ජල කඳ හරස් ව පිහිටි **වින්ධ්‍යා** නම් ඝන පාෂාණයක හැපී එය සිදුරු වී ජල

ධාරා පසක් ව පොළොව මතුපිටට පැමිණ මහා ගංගා පසක් ව මහා සමුද්‍රය වෙත ගලා බසින්නේ ය.

එලෙස එම ජල ධාරාව අනෝතත්ත විල වටා තුන් වටයක් පැදකුණු කරන ප්‍රදේශය **ආවර්ත ගංගාව** නම් වේ. එයින් කළුගල් තලාව මත සැට යොදුනක් ගලා යන ප්‍රදේශය **කාල ගංගාව** නම් වේ. ආකාශයට නැගී යන සැට යොදුනක් තැන **ආකාශ ගංගාව** නම් වේ. ඒ ජල ධාරාව පතිත වන තැන තියග්ගල පාෂාණය බිඳී සෑදුණු වල **තියග්ගල පොකුණ** නම් වේ. පොකුණු ඉවුර බිඳී සැට යොදුනක් දුර යන ප්‍රදේශය **බහල ගංගාව** නම් වේ. එයින් පොළොවට වැටී පොළොව බිඳී උමඟක් වශයෙන් යන සැට යොදුනක් තැන **උමං ගංගාව** නම් වේ. වින්ධ්‍යා පර්වතයෙහි හැපී එය සිදුරු ව පොළොව මතුවට පැමිණ ගලා බසිනා ජල ධාරා පස **ගංගා, යමුනා, අචිරවතී, සරභූ, මහී** යන පඤ්ච මහා ගංගා නම් වෙති.

## ❁ කණ්ණමුණ්ඩ විල

කණ්ණමුණ්ඩ විල දිගින් හා පළලින් පනස් යොදුන් ඇත්තේ ය. වටින් එකසිය පනස් යොදුන් ඇත්තේ ය. කණ්ණමුණ්ඩ පර්වතය සමීපයෙහි පිහිටි බැවින් මේ විල **කණ්ණමුණ්ඩ විල** නම් වේ.

## ❁ ඡද්දන්ත විල

ඡද්දන්ත විල දිගින් හා පළලින් පනස් යොදුන් ඇත්තේ ය. වටින් එකසිය පනස් යොදුන් ඇත්තේ ය. එහි මධ්‍යයෙහි දොළොස් යොදුනක් පමණ ප්‍රදේශය දිය සෙවල පරඬලා මඩ ආදී කිසිවක් නැත්තා වූ ඉඳුනිල් මිණි කඳක් සේ ප්‍රසන්න වූ ජලය පිරී පවත්නේ ය. ඒ පිරිසිදු ජලය වට කොට පිරිසිදු හෙල් මැලි වනය පිහිටියේ ය. ඒ හෙල් මැලි වනය වට කොට නිලුපුල් වනය පිහිටියේ ය. ඒ හෙලි මැලි වනය වට කොට නිල් මානෙල් වනය පිහිටියේ ය. එය වට කොට රත් මානෙල් වනය ද, එය වට කොට සුදු මානෙල් වනය ද, එය වට කොට රත් පියුම් වනය ද, එය වට කොට සුදු පියුම් වනය ද පිහිටියේ ය. මේ

සත් වනයන් ගෙන් අනතුරුව හෙල් මැලි ආදී සියල්ල මිශ්‍ර වනය පිහිටියේ ය. ඉන් අනතුරුව ඇතුන්ගේ ඉගටිය පමණ වූ ජලයෙහි යොදුනක් පළල ඇති රත් හැල් වනය පිහිටියේ ය. එය වට කොට දියෙහි කෙළවර නිල් කහ රතු සුදු පැහැයන්ගෙන් අලංකාරමත් වූ මල්වලින් ගැවසී ගත් කුඩා ගස්වලින් පිරුණු වනය පිහිටියේ ය. මේ දස වනයම යොදුන බැගින් පළල ඇත්තේ වේ. ඉන් පසු මහ මෑ වනය ද, එය වට කොට මුං වනය ද පිහිටියේ ය. ඒ මුං වනය වට කොට පුහුල් වනය ද, එය වට කොට කැකිරි වනය ද, එය වට කොට ලබු වනය ද, එය වට කොට කොමඩු වනය ද යන මේ වැල් ඇති වනයෝ පිහිටියහ. ඉන් අනතුරුව පුවක් ගස් මෙන් උස්ව වැවුණු උක් වනය වේ. අනතුරුව ඇත් දළ පමණ ගෙඩි ඇති කෙසෙල් වනය ද, එය වට කොට සල් වනය ද, එය වට කොට සැළි පමණ ගෙඩි ඇති කොස් වනය ද, අනතුරුව මිහිරි ඵල ඇති සියඹලා වනය ද, අනතුරුව දිවුල් වනය ද, ඉන් අනතුරුව සියල්ල මිශ්‍ර වනය ද, ඒ සියල්ල වට කොට උණ වනය ද යොදුන බැගින් විශාල ව පිහිටියේ ය. මේ සියල්ල වට කොට පර්වත වළලු සතක් පිහිටියේ ය. ඒ පර්වතයන් අතර සත් යොදුනක් උස ඇති රන්වන් පැහැ ඇත්තා වූ **ස්වර්ණපාර්ශ්ව පර්වතය** පාත්‍ර මුව විටක් මෙන් ඇතුළට නැමී උණ වනයට පිටතින් ඡද්දන්ත විල වට කොට පිහිටියේ ය. එහි ඇති රන්වන් පැහැය විල දියට වැටී නිරතුරුව ම තරුණ රිවි මඬලක් (හිරු මඬලක්) දියෙහි ගැලුණාක් මෙන් බබළන්නේ ය. ඒ ස්වර්ණපාර්ශ්වන පර්වතය වට කොට සය යොදුන් උස ඇති **මණි පාර්ශ්ව පර්වතය** පිහිටියේ ය. එය වට කොට පස් යොදුන් උස ඇති **සූර්ය පාර්ශ්ව පර්වතය** පිහිටියේ ය. එය වට කොට තුන් යොදුන් උස ඇති **චන්ද්‍ර පාර්ශ්ව පර්වතය** පිහිටියේ ය. එය වට කොට පස් යොදුන් උස ඇති **උදක පාර්ශ්ව පර්වතය** පිහිටියේ ය. එය වට කොට දෙ යොදුන් උස ඇති **මහා කාල පර්වතය** පිහිටියේ ය. එය වට කොට යොදුනක් උස ඇති **චූල කාල පර්වතය** පිහිටියේ ය.

මෙලෙස සප්ත පර්වතයන්ගෙන් වට වූ ඡද්දන්ත විලට ගිනිකොන දිසාවෙන් නුදුරු ව පවනින් දිය බිඳු ඉසෙන තරම් දුර තෙළෙස් යොදුන් උස ඇති නුග රුකක් පිහිටියේ ය. එහි කඳ වට යොදුන් පසකි. කඳ මුල පටන් අතු දක්වා සත් යොදුනකි. සතර දිසාවට විහිදුණු ශාඛා සතර යොදුන් සය යොදුන් පමණ වේ. මුදුන් ශාඛාව සය

යොදුනකි. මුල පටන් අග දක්වා තෙළෙස් යොදුනකි. එයින් අටදහසක් අරළු (මුල්) පහතට බැස ඇත්තේ ය. ඒ නුග වෘක්ෂයෙහි අටදහසක් මුල් යට ඡද්දන්ත හස්තීහු ග්‍රීෂ්ම කාලයෙහි වසන්නාහු ය. වර්ෂා කාලයෙහි ස්වර්ණ පාර්ශ්වාදී පර්වතයන්හි වාසය කරති. එම හස්තීන්ගේ සතර පාදයෝ ද, සොඬ ද, වාලදිය (වලිගය) ද හිඟුල් මෙන් රතු පැහැ ඇත්තේ ය. කඳ සුදු පැහැ ඇත්තේ ය. ඒ ඇතුන්ගේ දළවලින් සවනක් රැස් විහිදෙන බැවින් ඡද්දන්ත ඇත්තු නම් වේ. ඒ ඡද්දන්ත හස්තීන් බහුලව මෙම විල සමීපයෙහි වෙසෙන බැවින් එම විල **ඡද්දන්ත විල** නම් වේ.

## ❁ කුණාල විල,

කුණාල විල ද පනස් යොදුන් විෂ්කම්භය ඇත්තේ ය. එකසිය පනස් යොදුන් වට ඇත්තේ ය. කුණාල පක්ෂීන් බහුලව වෙසෙන බැවින් මේ විල **කුණාල විල** නම් වේ. එය වට කොට මුල් මල් ගෙඩි පත්‍ර ආදී වූ සියලු ඖෂධයන්ගෙන් පිරී ගිය ඖෂධ වනයක් ඇත්තේ ය. නොයෙක් පුෂ්පයන්ගෙන් අලංකාරමත් ය. කාලාවක, ගංගෙය්‍ය, පණ්ඩර, ථම්භ, පිංගල, ගන්ධ, මංගල, හේම, උපෝසථ, ඡද්දන්ත යන දස ඇත් කුලයන්ගේ ඇතුන් හා ඇත් පැටවුන් ද, ඇතින්නන් ද නිතර ගැවසෙන්නාහ. ගවයෝ ද වෘෂභයෝ ද, මහිෂයෝ ද නිරතුරුව හැසිරෙන්නාහ. එසේ ම රන්වන් මුවෝ ද, සෙමර මුවෝ ද, චිත්‍ර මුවෝ ද, උද්දුරක නම් මුවෝ ද, කෙසෙල් මුවෝ ද, සරභ මුවෝ ද, ශාඛා මුවෝ ද, ඒනි මුවෝ ද, මහා වාත මුවෝ ද යන මුව මණ්ඩලයන්ගෙන් පිරී ඇත්තාහ. එසේ ම කඟවෙහෙණුන් ද, කළු සිංහයෝ ද, තෘණ සිංහයෝ ද, පණ්ඩු සිංහයෝ ද, කේසර සිංහයෝ ද, ව්‍යාඝ්‍රයෝ ද, දිවියෝ ද, වලස්සු ද, වෘකයෝ ද, කළු හිස් වලස්සු ද නිතර හැසිරෙන්නාහ.

එසේ ම වඩවා මුඛී නම් යක්ෂණියෝ ද, දේව කිඳුරු, සඳ කිඳුරු, දුම කිඳුරු, දණ්ඩ මානවක කිඳුරු ආදී කිඳුරන්ගෙන් ද, යක්ෂ රාක්ෂාදීන්ගෙන් නිති හැසිරීමෙන් යුක්ත ය. කැකුළු මලින් ද, පිපුණු මලින් ද, පොකුරු මලින් ද අතු අග පමණක් පිපුණු මලින් ද යුත් නන් වැදෑරුම් ගස් සමූහයෙන් පැතිරී පවත්නේ ය. උකුසු, ඇට් කුකුළු,

ඇත්කඳ ලිහිණි, මොණර, කොවුල්, ජීවඤ්ජීවක, චේලාවක, භිංකාර, කරවීක යනාදී සිය ගණන් මත් විහඟුන්ගේ නාදයෙන් මනහර ය. එසේ ම අඳුන්, මනෝසිලා, හිරියල්, හිඟුල්, හේම, රිදී, කනක ආදී සිය ගණන් වණීවත් රත්නයන්ගෙන් අලංකාරමත් භූමීන්ගෙන් පිරී ඇත්තේ ය.

## ❁ මන්දකිණි විල

මන්දකිණි විල ද පනස් යොදුන් විෂ්කම්භය ඇත්තේ ය. එකසිය පනස් යොදුන් වට ඇත්තේ ය. මේ විලෙහි මධ්‍යයෙහි යොදුන් පස් විස්සක් පමණ ප්‍රදේශය සෙවෙල් හෝ ප්‍රාණීන් නොමැත්තේ ය. සිසිල් මිහිරි ප්‍රසන්න වූ පිළි මිණි වන් (පළිඟු) ජලය පිරී පවත්නේ ය. ඒ පිරිසිදු ජල තලාව වට කොට දෙ ගව්වක් පළල ඇති හෙල පියුම් (සුදු නෙළුම්) වනය පිහිටියේ ය. ඒ හෙල පියුම් වනයෙහි නෙළුම්බූ දලි (නෙළුම් දඬු) නඟුලිස් පමණ ඇත්තේ ය. එහි බෙර පමණ අල පොකුරු ඇත්තේ ය. එහි එක් එක් පුරුකක් වසා සිටි සිවියක් ඇතුළෙහි නැළියක් පමණ කිරි පිරී ඇත්තේ ය. එහි මල් පිපුණු කල්හි රේණු විසිරී ගොස් පියුම් පත පිට වැගිර පවනින් දිය බිඳු ඉසී හිරු රැසින් පැසී මඳ රත් පැහැති යවටක් (යකඩ ගුළියක්) මෙන් ඝනව රසයෙන් යුක්ත වූ පොකුරු මී ධ්‍යාන ලාභී තාපස ආදීන්ට ප්‍රයෝජනය පිණිස වන්නේ ය. ඒ හෙල පියුම් වනය වට කොට රත් පියුම් (රතු නෙළුම්) වනය පිහිටියේ ය. එය වට කොට රත් කුමුදු (රත් මානෙල්) වනය පිහිටියේ ය. එය වට කොට හෙල කුමුදු (සුදු මානෙල්) වනය පිහිටියේ ය. එය වට කොට කැකිරි, තියඹරා, ලබු, පුහුල්, ආදී වැල් වන පිහිටියේ ය. මේ එකොළොස් වනයට අනතුරුව උණ දඬු පමණ දඬු ඇති දෙ යොදුනක් ප්‍රමාණයේ වටට උක් වනය පිහිටියේ ය. ඒ උක් වනයෙහි වෙසෙන හස්තීන් ඒ උක් දඬු බිඳ ගෙන ගොස් ගල් අතල වල තබා පයින් මිරිකූ කල්හි උක් පැණි වැගිර ගල් කෙම්වල පිරී සූර්‍ය්‍ය තාපයෙන් තැවී ඝනව උක් සකුරු කැටි වී තිබෙන්නේ ය. ඒ වනයට බුදු පසේබුදු මහ රහතන් වහන්සේලා වැඩි කල්හි ඒ ඇත්තු ඒ හකුරු පිළිගන්වන්නාහ. ඒ උක් වනයට අනතුරුව මහත් ගෙඩි ඇති කෙසෙල් වනය පිහිටියේ ය. එය වටා කොස් වනය ද, එය වටා අඹ වනය ද, එය වටා ගිවුළු (දිවුල්) වනය ද, එය වටා මිශ්‍ර වනය ද ඒ විල වටා පිහිටියේ ය.

## ❁ සිංහ ප්‍රපාත විල

සිංහ ප්‍රපාත විල ද පනස් යොදුන් විෂ්කම්භය ඇත්තේ ය. එකසිය පනස් යොදුන් වට ඇත්තේ ය. සිංහයන් මේ විල සමීපයෙහි බහුලව ගැවසෙන බැවින් **සිංහ ප්‍රපාත විල** නම් වේ.

හිමාල පර්වතයෙහි සිංහ ව්‍යාඝ්‍ර හස්ති අශ්ව ගව මහිෂ සෙමර සූකර දිවි මුව හංස මයුර පරපටු කිඳුරු ගිජු ලිහිණි ආදී වූ නොයෙක් අපාද, ද්වි පාද, චතුෂ් පාද ආදී සත්වයෝ වාසය කරන්නාහු වෙති. ඒ සත්වයන් අතර සිංහයන්ගේ ද කුරවි කෙවිල්ලන්ගේ ද විශේෂත්වයක් ඇත්තේ වේ.

මෙහි වසන සිංහයන් අතර තෘණ සිංහ, කාල සිංහ, පංඩු සිංහ, කේසර සිංහ යැයි සිංහයෝ සතර කුලයක් වෙති. ඔවුන් අතර තෘණ සිංහයෝ පරෙවි පැහැ ඇත්තාහ. තෘණ අනුභව කරන්නාහ. කාල සිංහයෝ කළු ගවයන් බඳු ය. තෘණ අනුභව කරති. පණ්ඩු සිංහයෝ පඬුවන් පැහැ ඇති වෘෂභයන් වැනි වෙති. ඔවුන් මාංශ අනුභව කරති. කේසර සිංහයෝ ද මාංශ අනුභව කරති. ඒ කේසර සිංහයන්ගේ මුඛය ද, වාලධිය (වලිගය) ද, පාදයන් ද අලතා (දිය කරන ලද ලාකඩ) ගැල්ලූවාක් මෙන් රතු පැහැයෙන් යුක්ත ය. ඔවුන්ගේ හිසෙහි පටන් ලතු දියෙන් අඳින ලද්දක් මෙන් රේඛා තුනක් පිට මැදින් ගොස් එයින් දෙපස රේඛා දෙක කලව දක්වා ගොස් කලව අතර දකුණට කරකැවී සිටියේ වේ. මැදින් ගිය රේඛාව වලිගය මුල සරසා පිහිටියේ ය. ඔවුන්ගේ කඳෙහි ලක්ෂයක් වටිනා පලසකින් වැසුවාක් මෙන් වී කේසර බරින් ශොභමාන ය. සෙසු තැන් හාල් පිටි සක් සුනු පිඩක් මෙන් සුදු පැහැයෙන් බබළන්නේ ය. මෙබඳු වූ කේසර සිංහයෝ තමන් වාසය කරන රන් ගුහා, රිදී ගුහා, මැණික් ගුහා පළිඟු ගුහා, සත් රුවන් ගුහා, රත් සිරියල් ගුහා ආදී ගිරි ගුහාවල වාසය කොට පිටතට කරුණු සතරක් පිණිස නික්මෙති. එනම් ගුහා ඇතුළත අඳුරෙන් පීඩිත ව සිට ආලෝකය පිණිස ද, මළ මුත්‍රයෙන් පීඩිත ව ඒවා බැහැර කරණු පිණිස ද, කුස ගින්නෙන් පෙළුණු විට ආහාර සොයනු පිණිස ද, කාම රතියෙන් පෙළුණු විට මෛථුනයෙහි යෙදෙනු පිණිස ද නික්මෙති.

ඒ කේසර සිංහයෝ එම රන් රිදී ආදී ගුහාවන්හි වාසය කොට ආහාර පිණිස එම ගුහාවලින් එළියට නික්මෙන කල්හි පසුපස පාද ද්වය සමව පිහිටුවා ඉදිරි පාද ද්වය ඉදිරියට දිගු කොට සිරුරෙහි පසු කොටස ඇද ඉදිරි කොටසට ගෙන පිට නමා ගෙල ඔසවා හෙන හඬක් ඇති වන්නාක් මෙන් නාස පුඩු පෙලා සිරුරෙහි ලැගුණු දූවිලි ගසා දමමින් කෙසුරු සලයි. එලෙස කෙසුරු සලන බිමෙහි ද තරුණ වස්සෙකු මෙන් ඔබිනොබ දුව යමින් සිංහ විජම්බන කරති. එලෙස දුවන්නා වූ ඒ සිංහයන්ගේ සිරුර අඳුරෙහි කැරකෙන ගිනි පෙනෙල්ලක් මෙන් දිස් වේ. මෙසේ සිංහ විජම්බන කොට තුන් යලක් සිංහ නාද කරන්නේ ය. ඒ සිංහ නාදය හාත්පසින් තුන් යොදුනක් ඒක නින්නාද ව පවත්නේ ය. ඒ සිංහ නාදය ඇසූ ඒ තුන් යොදුනක් ප්‍රදේශයෙහි ජීවත් වන අපාද ද්වි පාද චතුෂ්පාද දී සත්ව ජාතීහු තමන් දූන් දූන් අල්වති යැයි වටපිට බලමින් තැති ගෙන ඒ ඒ සිටි තැන්හි සිටිය නොහැකි ව පලා යති. සිදුරුවල වසන සර්ප නකුල ගෝධ ආදීහු තම තමන් වසන සිදුරුවලට ම වදිති. දියෙහි වසන මත්ස්‍ය කැස්බෑ ආදීහු ගැඹුරු අඳුරු ගන නිල් දිය සළා අතරට වැද ගනිති. වනයෙහි වසන ඇත් අස් ගෝණ මුව ආදීහු ගන වන මධ්‍යයට වැද ගනිති. පක්ෂීහු ආකාශයට නැගී භ්‍රමණය වෙමින් සිටිති. මෙසේ නාද කරන්නා වූ කේසර සිංහ රාජයා තමා සිටි තැන සිට වමින් ඉස්බක් තැන ද, දකුණෙන් ඉස්බක් තැන ද පනින්නේ ය. එසේම ඉහලට ද සතර ඉස්බක් හෝ අට ඉස්බක් තැන පනින්නේ ය. සම භූමියෙහි සිට පසුපසට සොළොස් ඉස්බක් හෝ විසි ඉස්බක් පනින්නේ ය. ගොඩක හෝ පර්වතයක් මුදුනෙහි සිට පිටුපසට සැට ඉස්බක් හෝ අසූ ඉස්බක් පනින්නේ ය. එසේ පනින කල්හි ද මාර්ගයෙහි අතර වෘක්ෂයක් හෝ පර්වතයක් හෝ දුටු කල්හි එය මග හරිමින් දකුණෙන් හෝ වමෙන් හෝ එයට උඩින් හෝ ඉස්බක් නො ලංව පනින්නේ ය.

මෙබඳු වූ කේසර සිංහරාජයා ගල් මුදුනෙහි සිට තුන් යලක් සිංහනාද පවත්වා ඒ ශබ්දය හා සමග ම තුන් යොදුනක් දුර පැන ගොස් නැවත තමන් සිටි තැනට ම අවුත් ඒ තමාගේ ම සිංහ නාදයෙහි අනුනාදය අසන්නේ ය. ඊට හේතු කවරේද? යත්, මේ කේසර සිංහයා බලවත් තේජස් ඇත්තේ ය. සියලු සිව්පා සතුන්ට රජ ය. සිංහයාට කිසි

තැනක බියක් නැත. ඒ සිංහයන්ගේ නාදය අසා ම තුන් යොදුනක ප්‍රමාණයෙහි වෙසෙන සියලු සත්වයන් මර බියෙන් පලා යති.

මේ කේසර සිංහයා තමන් වෙසෙන ගුහාවෙන් පිටතට නික්ම සතර දිග බලා ම සිංහනාද පවත්වන්නේ ය. කුමක් පිණිස එසේ සතර දිග බලන්නේ ද? යත් මේ සිංහයාට අන් කුඩා සතුන් කෙරෙහි ඇති දයාව නිසා ය. ඔහු සිංහනාද නගන විට පර්වත තටාකාදී විෂම ස්ථානයන්හි සිටින ඇත් ගෝණ මුව මී ගවාදීහු ප්‍රපාතයන්හි ද, ආවාටයන්හි ද වැටෙති. එබැවින් ඔවුන් කෙරෙහි දයාවෙන් බලයි. කිමෙක් ද? අනුන්ගේ මස් බුදින මේ රුදුරු සිංහයාට සතුන් කෙරෙහි දයාවක් නම් ඇති වෙයි ද? එසේ ය ඇත්තේ ම ය. මරණ ලද බොහෝ සත්වයන්ගෙන් මට කවර වැඩක් ද, ඒ සතුන් නිකරුණේ මගේ නාදය අසාම මැරෙන්නේ ය යැයි දන්නා බැවින් **"මම විෂම ස්ථානවල සිටින කුඩා සතුන් විනාශයට නො පමුණුවමි"** යැයි සිතා ඒ කුඩා සත්වයන්ට පලා යනු පිණිස නාද පවත්වන්නේ ය. මෙසේ වූ වික්‍රමයක් තෘණ සිංහ, කාල සිංහ, පණ්ඩු සිංහ යන සිංහයන්ට නොමැත්තේ ය.

**තිණසීහො කාලසීහො - පණ්ඩුසීහො ච කෙසරී,**
**තෙසං චතුන්නං සීහානං- කෙසරී අග්ගතං ගතො.**

තෘණ සිංහ, කාල සිංහ, පණ්ඩු සිංහ, කේසර සිංහ යන සිංහ සතර කුලයන් අතර කේසර සිංහයා ම අග්‍ර වෙති.

හිමාල වනයෙහි වෙසෙන කරවික පක්ෂීන් මධුර රස ඇති විලිකුම් අඹ එල තුඩින් විද අඹ පැණි බී එහි රසයෙන් මත් ව පියාපත් තාල ගසා යට අත්තක සිට මිහිරි හඬින් නාද කොට ඉහල අත්තකට ගොස් තමාගේ ම නාදයෙහි අනු රාවය කන් පුරා රස විඳී. එකල්හි ඒ මිහිරි නාදය අසා සිව්පා සත්වාදීහු ඒ නාදයෙන් මත් ව තමන් පිළිබඳව ද නො දනිති. තණ කනු පිණිස මුඛයෙන් ගත් මුව ආදී සත්වයෝ ඒ තමන් කන ගොදුර අතහැර, සැපීම නවතා එම ශබ්දය ම අසති. ව්‍යාල මෘගයෝ ගොදුරු පිණිස කුඩා සතුන් පසුපස ලුහුබැඳ දුවන්නාහු එස වූ පය පහත නොහෙලා එම හඬට කන් දෙති. තම ගොදුර අමතක වේ. අන් ව්‍යාල සත්වයන්ට බියෙන් දුවන ගෝණ මුව ආදී කුඩා සත්වයෝ ද ඒ මර බිය ද අමතක ව ඒ හඬට ම කන් යොමු කරති. ආකාශයෙහි

පියාසර කරන පක්ෂීහු ද, පියාපත් නො ගසා විහිද ගෙන ඒ ශබ්ද රසය විඳිති. දියෙහි හැසිරෙන මත්ස්‍යයෝ ද වරල් නො සොලවා ඒ ශබ්දය අසති. මෙසේ මධුර ස්වරයෙන් කන්කලු වූ කුරවි කෙවිල්ලෝ හිමවතෙහි බබළන්නාහ.

## අපරගෝයානය

අපරගෝයානය මහාමේරු පර්වතයට බස්නාහිර දිසාවෙහි පිහිටියේ ය. භූමිය ප්‍රමාණයෙන් යොදුන් සත් දහසකි. මෙම දිවයින කැඩපතක සටහන් ඇත්තේ ය. උපදින මනුෂ්‍යයන්ගේ මුහුණු ද එසේම ය. එහි උපදින මනුෂ්‍යයන්ට නිත්‍ය වශයෙන් අවුරුදු පන්සියයක් ආයුෂය ඇත්තේ ය. ජම්බුද්වීපයෙහි පිහිටි දඹ වෘක්ෂය මෙන් වටින් පසළොස් යොදුන් කඳ ඇති, උසින් පනස් යොදුන් කඳ ඇති, හාත්පස පනස් පනස් යොදුන් විහිදී ගිය දිග අතු ඇති, පළලින් සියක් යොදුනක් ඇති කොළොම් වෘක්ෂය පිහිටියේ ය.

## උතුරු කුරු දිවයින

උතුරු කුරු දිවයින මහාමේරු පර්වතයට උතුරු දිසාවෙහි පිහිටියේ ය. භූමිය ප්‍රමාණයෙන් යොදුන් අට දහසකි. මෙම දිවයින පීඨ සණ්ඨාන (පුටුවක හැඩය) ඇත්තේ ය. එහි මනුෂ්‍යයන්ගේ මුහුණු ද ඒ හැඩයම ය. ජම්බුද්වීපයෙහි පිහිටි දඹ වෘක්ෂය මෙන් වටින් පසළොස් යොදුන් කඳ ඇති, උසින් පනස් යොදුන් කඳ ඇති, හාත්පස පනස් පනස් යොදුන් විහිදී ගිය දිග අතු ඇති, පළලින් සියක් යොදුනක් ඇති කල්ප වෘක්ෂය මෙහි පිහිටියේ ය. මෙහි උපදින මනුෂ්‍යයන්ට නිත්‍ය වශයෙන් අවුරුදු දහසක් ආයුෂය ඇත්තේ ය. රෝගාන්තරා, විකලාංග, විකලේන්ද්‍රිය ආදී කිසිවක් කිසි කලෙක නැත්තේ ම ය.

මේ දිවයිනෙහි ඒ ඒ ප්‍රදේශයන්හි ඉතා ඝනව වැඩුණු කොළවලින් යුක්ත වූ අතුපතර ඇත්තා වූ කුළු ගෙවල් පමණ ඇති මනරම් වූ මහත් වෘක්ෂයෝ මනුෂ්‍යයන්ට වාසස්ථාන වශයෙන් අවශ්‍යතා ඉටු කරති. යම් තැනක සුව සේ වසත් ද එබඳු නිවෙස් ඇත්තේ වේ.

එහි ඇති අන්‍ය වෘක්ෂ මනාව හට ගෙන සැම කල්හි මලින් පිරී ඇත්තේ ය. ජලාශයෝ ද පිපුණු සුදු නෙළුම්, රත් නෙළුම්, නිල් මානෙල්, රත් මානෙල්, ඕලු ආදී ජලජ පුෂ්පයන්ගෙන් සැරසී සැම කල්හි හාත්පස දස දිසාවෙහි සුවඳ විහිදී පවත්නේ ය.

උතුරු කුරු දිවයින් වැසි මනුෂ්‍යයන්ගේ ශරීර ඉතා උස ද නොවූ ඉතා මිටි ද නොවූ ආරෝහ පරිණාහ සම්පන්න ය. සම රැළි වැටීම් කෙස් රැවුල් ඉදීම් ආදී ජරාවට පත්වීමක් නැත්තේ ය. නො පිරිහෙන කාය බලයෙන් යුක්තව ආයුෂය කෙළවර කොට ඇති ජව බලයෙන් හා පරාක්‍රමයෙන් යුක්ත ය. කෘෂි වාණිජ ආදී රැකී රක්ෂා කිරීමේ වෙහෙසක් එහි නැත්තේ ය. ආහාර සෙවීමේ දුකක් නැත්තේ ය. එබැවින් දැසි දස් කම්කරුවෝ මේ භූමියෙහි විද්‍යමාන නොවෙති. සීතලෙන් උෂ්ණයෙන් අවු වැසි සුළං ආදියෙන් වන පීඩාවක් කිසි කලෙක නැත්තේ ය. මේ ජම්බුද්වීපයේ ගිම්හාන ඍතුවේ අවසන් මාසයෙහි දිනයන්හි අලුයම් වෙලෙහි සම වූ සීත උෂ්ණ කාලගුණයක් ඇත්තාක් මෙන් උතුරු කුරු දිවයිනෙහි සැම කල්හි සම වූ සීත උෂ්ණ කිසි කලෙක කයික වෙහෙසීමක් නැත්තේ ය.

මෙහි නො වපුරන ලද බිමෙහි ස්වභාවයෙන් හටගත් දහයියා නැති, නිවුඩු නැති සුවඳවත් හැල් සහල්වලින් දුම් නැති, දැළි නැති ගින්නෙනි අඟුරෙන් පිසින ලද බත් ම අනුභව කරති. එම දිවයිනෙහි ජෝතික පාෂාණ නම් ගිනි නිපදවන ගල් විශේෂයක් ඇත්තේ වේ. එහි ජනයා ඒ ගල් තුනක් තබා එහි හැල් සහල් දමන ලද භාජනය ඒ ගල් මත තැබූ විට ඉබේම ගිනි ඇවිළී බත ඉදී ගින්න නිවී යයි. ඉන් පසු ඒ හැලියෙන් ම බත අනුභව කරයි. ඒ සඳහා අන් සූප ව්‍යඤ්ජන ආදී කිසිවක් නැත. ඒ මනුෂ්‍යයන් සිත අනුව කැමත්ත අනුව රසය ඒ බතෙහි ඇති වේ. ඒ හැල් බත් අනුභව කරන මනුෂ්‍යයන්ට කුෂ්ට රෝග, ගඩු, ඇදුම, ක්‍ෂය රෝග, කාශ (කැස්ස), ස්වාස (ඇදුම), අපස්මාර, ජ්වර ආදී කිසිඳු රෝග පීඩාවක් නැත්තේ ය. එහි පැමිණෙන්නන්ට ද ඔවුහු දන් දෙති. මසුරු සිතක් ඔවුන්ගේ නැත. මහත් ඍද්ධි ඇති බුදු පසේබුදු මහ රහතන් වහන්සේලා එහි ගොස් පිණ්ඩපාතය ලබා ගනිති. එහි උපදින මනුෂ්‍යයෝ කුදු, වාමන, අන්ධ, ගොළු, බිහිරි, කොර වූවෝ විකලාංග ඇත්තෝ විකල ඉන්ද්‍රිය ඇත්තෝ නොවෙති.

එහි උපදින ස්ත්‍රීහු ඉතා උස ද නොවූ ඉතා මිටි ද නොවූ ඉතා කෙට්ටු ද නොවූ ඉතා ස්ථූල ද නොවූ ඉතා කළු ද නොවූ ඉතා සුදු ද නොවූ දැකුම් කළු ප්‍රසාද ජනක රූප සම්පත්තියෙන් යුක්ත වෙති. එම ස්ත්‍රීන්ගේ දිග ඇඟිලි ඇත්තේ ය. තඹ වන් නිය ඇත්තේ ය. එල්බෙන පියයුරු ඇත්තේ ය. මධ්‍යම ප්‍රමාණ සිරුර ඇත්තේ ය. පූර්ණ චන්ද්‍රයා වැනි මුහුණ ඇත්තේ ය. ලොකු ඇස් ඇත්තේ ය. මෘදු වූ ශරීරාවයව ඇත්තේ ය. මනාව ගැළපුණු කලවය ඇත්තේ ය. සුදු පැහැති දත් ඇත්තේ ය. ගැඹුරු වූ නාභිය ඇත්තේ ය. සිහින් කෙණ්ඩා ඇත්තේ ය. දිගු වූ නිල් වන් වූ අගින් නැවුණු කේශ කලාප ඇත්තේ ය. පළල් වූ උකුලක් ඇත්තේ ය. ඉතා දැඩි ලෝම නැත්තේ ය. පුණ්‍යවන්ත වූ ප්‍රිය වූ සැප දයක වූ සිසිල් ගුණයෙන් යුත් සිරුරු ඇත්තේ ය. මෘදු වූ සියුම් වූ වචන කථා කරන්නේ ය. නා නා විධ ආභරණයන්ගෙන් සැරසුණු ඔවුහු සැම කල්හි සොළොස් හැවිරිදි කාන්තාවන් මෙන් හැසිරෙති. එහි වෙසෙන පුරුෂයන් ද විසිපස් හැවිරිදි තරුණයන් මෙන් හැම කල්හි හැසිරෙති. ඔවුහු අඹු දරුවන් කෙරෙහි නො ඇලෙති.

මේ දිවයිනෙහි ස්ත්‍රී පුරුෂයෝ කාම රතියෙන් යුක්තව සත් දිනක් ම හැසිරෙති. ඉන් පසු කාමාශා රහිතව තම තමන් වසන තැන්වලට ම යති. එම දිවයින් වැසියන්ට මේ ජම්බුද්වීප වැසියන්ට මෙන් දරු ගැබ පිළිසිඳීම, ගැබ පරිහරණය, දරුවන් වැදීම ආදී දුකක් නැත්තේ ය. රතු සැට්ටයකින් නික්මෙන රන් පිළිමයක් මෙන් ලේ සෙම ආදියෙන් නො තැවරී සුවසේ ම මවු කුසෙන් බිහි වෙති.

මේ දිවයිනෙහි මව්වරු පුතෙකු හෝ දුවක වද ඔවුන් හැසිරෙන ඒ ප්‍රදේශයෙහි ම තබා අපේක්ෂාවක් නැතිව ම කැමති තැනකට යති. එසේ සයනය කරන ඒ දරුවන් දකින අන් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් එම දරුවන් වෙත තමාගේ ඇඟිලි දිගු කරයි. එවිට කර්ම බලයෙන් ඇඟිලිවලින් කිරි වැගිරෙයි. දරුවෝ එම කිරිවලින් යැපෙති. මෙසේ වැඩෙන ඔවුහු කිහිප දිනකින් කාය බලය ලබා එතැනින් නැගිට ළදැරියන් ස්ත්‍රීන් වෙත ද, ළදරුවන් පුරුෂයන් වෙත ද යති. ඔවුන්ට අවශ්‍ය වස්ත්‍ර ආභරණ ආදිය කල්ප වෘක්ෂයන්ගෙන් ම නිපදවී ලැබෙති. නා නා විධ වර්ණයන්ගෙන් යුත් විසිතුරු වූ සියුම් වූ මෘදු වූ සුව පහසු ඇති වස්ත්‍ර ආභරණාදිය ඒ ඒ තැන්හි පිහිටි කල්ප වෘක්ෂවල එල්ලෙමින්

තිබෙති. නාන ප්‍රකාර රශ්මි ජාලාවන්ගෙන් බබලන නා නා විධ වර්ණයන්ගෙන් යුත් මැණික් ඔබ්බවන ලද නා නා ප්‍රකාර මල් කම් ලිය කම් ආදියෙන් අලංකාරමත් වූ ශීර්ෂාභරණ, ග්‍රීවාභරණ, හස්තාභරණ, පාදභරණ ආදී අනේක ප්‍රකාර ආභරණයෝ ඒ කල්ප වෘක්ෂයන්හි එල්ලී ඇත්තාහ. එසේ ම වීණා, මිහිඟු බෙර, තාලම්පට, සක්, වස්දඬු, වේතාල, පරිවාර වීණා ආදී නා නා විධ තූර්ය භාණ්ඩයෝ ද ඒ කල්ප වෘක්ෂයන්හි ඒ ඒ තැන්හි එල්ලී ඇත්තාහ. එහි ද බොහෝ පලතුරු ගස්හි කළ ගෙඩි පමණ මහත් වූ රසවත් පලතුරු හට ගනිති. එම පලතුරු අනුභව කරන ඒ දීප වාසීන්ට සත් දිනක් සා පිපාසා දුකක් ඇති නොවෙති. එහි පිහිටි ගංගාවෝ ද ඉතා පිරිසිදු ජලය ඇතිව, මනා තොටුපලවල් ඇතිව, රමණීය ව මඩ සෙවල ආදියක් නැතිව වැලි තලාවන්ගෙන් යුක්තව අති සීත ද නොවී අති උෂ්ණ ද නොවී දිව්‍යමය සුවඳ හමන ජලජ පුෂ්පයන්ගෙන් ගැවසී ගෙන සැම කල්හි සුවඳ හමමින් ගලා යති.

මේ උතුරු කුරු දිවයිනෙහි කටු සහිත කර්කශ පැළෑටි, වල් ආදී කිසිවක් නැත්තේ ය. කටු රහිත නිතර මල් ගෙඩි ආදියෙන් බබලන තෘණ පත් ගස් වැල් ආදිය ම ඇත්තේ ය. සඳුන් නාග වෘක්ෂයෝ තමන් ම රසය වගුරුවති. ඒ දිවයිනෙහි නහනු කැමත්තෝ නදී තොටෙහි එක් පසෙක වස්ත්‍රාභරණ තබා නදියට බැස නා ගොඩට පැමිණ උඩින් උඩින් ඇති වස්තාභරණ ම හැඳ පැළඳ ගනිති. මෙය මගේ ය, මෙය අහවලාගේ ය යැයි සිතක් ඔවුන්ට නැත. එබැවින් ඔවුන් අතර කිසි කලෙක විවාදයක් කලහයක් ඇති නොවේ. සත් දිනක් ම ඔවුන් තුළ කාම රති ක්‍රීඩා පවතී. ඉන් පසු රාගය දුරු කළවුන් මෙන් හැසිරෙති. යම් ගසක නිදනු කැමති වේ ද එහි ම සයනය පහළ වෙයි. මළ සත්වයන් දක කිසිවෙකු හැඬීම් වැලපීම් නොකරති. එම මළ සිරුර සරසා බැහැර කරති. එකෙනෙහිම ඒ දිවයින් වැසියන් බඳු ම වූ පක්ෂීන් පැමිණ ඒ මෘත දේහ අන්‍ය දිවයිනකට ගෙන යති. එහෙයින් උතුරු කුරු දිවයිනෙහි සොහොනක් හෝ අසූචි දමන ස්ථානයක් හෝ නැත. එහි මිය යන කිසිවෙක් සතර අපායෙහි නූපදිති. ධර්මතා වශයෙන් පිහිටි පඤ්ච සීලයෙහි ආනුභාවයෙන් ඔවුහු දෙව්ලොව උපදිති. උතුරු කුරු දිවයිනෙහි පවත්නා මෙම සිදුවීම් සියල්ල ධර්ම නියාමයෙන් නො වෙනස් ව සැම කල්පයක ම මෙලෙස පවතී. මේ භූමියෙහි උපදින මනුෂ්‍යයන්ට ජරා ව්‍යාධි සෝක පරිදේව අනිත්‍ය දුක්ඛ ආදී ධර්මයන්

නො වැටහෙති. එබැවින් ඒ ජීවිතයෙහි දී හේතු සම්පත් ඇත්තේ නමුත් මඟ ඵල නිවන් සුව ලැබීමට නොහැකි වෙති.

මෙලෙස සඳ හිරු පහළ වූ දම මහාමේරු පර්වතය, චක්‍රාවාට පර්වතය, හිමාල පර්වතය ආදී සියල්ල හට ගත්හ. මේ සියල්ල මැදින් පුර පසලොස්වක පෝය දින හට ගත්හ.

වාසෙට්ඨය, මෙපමණකින් මේ ලෝකය නැවත හට ගත්තේ වෙයි. වාසෙට්ඨය, ඉක්බිති ඒ සත්වයෝ රස පොළොව අනුභව කරමින් එයම ආහාර කොට ඇතිව අවුරුදු සැට දහසක් (60,000) ඉක්මවූහ.

වාසෙට්ඨය, යම් යම් පරිද්දෙකින් ඒ සත්වයෝ රස පොළොව අනුභව කරමින් එයම ආහාර කොට ඇතිව බොහෝ දීර්ඝ කාලයක් සිටියාහු ද එසේම ඒ සත්වයන්ගේ ශරීරයෙහි රළු ගතිය ද ඇති විය. වර්ණයාගේ වෙනස් වීම ද පෙනුණේ ය. ඇතැම් කෙනෙක් වර්ණවත් වෙති. ඇතැම් කෙනෙක් දුර්වර්ණ වෙති. ඔවුන් අතුරෙහි යම් කෙනෙක් වර්ණවත් වෙයි ද ඔහු "**අපි ඔහුට වඩා අතිශයින් වර්ණවත් වෙමු. අපට වඩා මොහු අතිශයින් දුර්වර්ණ වූවේ ය**" යැයි දුර්වර්ණ සත්වයන්ට අවමන් කෙරෙත්. වර්ණය නිසා උපන් අධික මාන හේතුවෙන් ඔවුන්ගේ රස පොළොව අතුරුදහන් ව ගියේ ය. රස පොළොව නැතිව ගිය කල ඔහු එක්රැස් වූහ. එසේ එක්රැස් වී අපගේ මිහිරි රසය අතුරුදහන් වූයේ ය. "**අහෝ රසය, අහෝ රසය**" යැයි කියන්නට වූහ. එය එසේම ය. මෙකල්හි ද මිනිස්සු කිසියම් මිහිරි රසයක් ලැබ '**අහෝ රසය, අහෝ රසය**' යැයි කියති. එලෙස කියනු ලබන්නේ පුරාණ ලොකොත්පත්ති වංශයෙන් හට ගෙන පරපුරෙන් පැවත ආවා වූ වංශ කථාව අනුව යමිනි. එහෙත් ඒ පිළිබඳ අර්ථය නොදනිත්ම ය.

## ❄ භූමි පප්පටක (හතු) පහළ වීම

වාසෙට්ඨය, ඉක්බිති ඒ සත්වයන්ගේ රස පොළොව නැති වී ගිය කල්හි ඕජා සහිත අමාවක් බඳු හතු පහළ වූයේ ය. යම් සේ නයි හතු පහළ වන්නේ ද එමෙනි. එය වර්ණ සම්පන්න විය. සුවඳින් යුක්ත විය. රසයෙන් යුක්ත විය. මනාව සකසන ලද ගිතෙල් යම් සේ වෙයි ද, මනාව සකසන ලද වෙඬරු යම් සේ වේ ද, එබඳු පැහැ ඇත්තේ විය. පිලව් නැති දඬුවල් බෑ මීයක් යම් සේ වේ ද, එබඳු රස ඇත්තේ විය. වාසෙට්ඨය, එවිට ඒ සත්වයෝ බිම් හතු අනුභව කරන්නට පටන් ගත්හ. ඔවුහු ඒ බිම් හතු අනුභව කරමින් එයම ආහාර කොට ගෙන අවුරුදු පසළොස් දහසක් (15,000) තරම් දීර්ඝ කාලයක් සිටියාහු ය.

වාසෙට්ඨය, යම් පරිද්දෙකින් ඒ සත්වයෝ බිම් හතු අනුභව කරමින් එයම ආහාර කොට ඇතිව දීර්ඝ කාලයක් සිටියාහු ද, ඒ පරිද්දෙන් ඒ සත්වයන්ගේ ශරීරයන්හි රළු බව ද වැඩි විය. ශරීර වර්ණයෙහි අඩු බව ද පෙණුනේ ය. ඇතැම් සත්ව කෙනෙක් වර්ණවත් වෙති. ඇතැම් සත්ව කෙනෙක් දුර්වර්ණ වෙති. ඔවුන් අතුරෙහි යම් ඒ සත්ව කෙනෙක් වර්ණවත් වෙත් ද ඔහු "**අපි මොවුන්ට වඩා අතිශයින් වර්ණවත් වෙමු. අපට වඩා මොහු අතිශයින් දුර්වර්ණ වූවෙහි ය**" යැයි දුර්වර්ණ සත්වයන් හෙළා දකිත්. වර්ණය නිසා උපන් මහත් මාන හේතුවෙන් නැවත නැවත උපදනා අති මානය හේතුවෙන් ඔවුන්ගේ බිම් හතු අතුරුදහන් ව ගියේය.

## ❄ බදාලතා වැල් පහළ වීම

ඒ බිම් හතු අතුරුදහන් වී ගිය කල්හි බදාලතා නම් වූ වැල් ජාතියක් පහළ විය. නාලවල්ලි, විල්පලා යම් සේ ද එපරිද්දෙන් පහළ විය. ඒ බදාලතා නම් වැල් වර්ගය මනා වර්ණයෙන් ද, සුවඳින් ද යුක්ත විය. රසවත් විය, මනාව සකසන ලද ගිතෙල් යම් සේ වෙයි ද, මනාව සකසන ලද වෙඬරු යම් සේ වේ ද, එබඳු පැහැ ඇත්තේ විය. පිලව් නැති දඬු වැල් බෑ මීයක් යම් සේ වේ ද, එබඳු රස ඇත්තේ විය.

වාසෙට්ඨය, එවිට ඒ සත්වයෝ ඒ වැල් ජාතිය අනුභව කරන්නට පටන් ගත්හ. ඔවුහු ඒ වැල් ජාතිය අනුභව කරමින් එයම ආහාර කොට ගෙන අවුරුදු පන්තිස් දහසක් (35,000) තරම් දීඝී කාලයක් සිටියාහු ය.

වාසෙට්ඨය, යම් යම් පරිද්දෙකින් ඒ සත්වයෝ බදලතා නම් වැල් ජාතිය අනුභව කරමින් එයම ආහාර කොට ඇතිව බොහෝ දීඝී කාලයක් සිටියාහු ද, එපරිද්දෙන් ම ඒ සත්වයන්ගේ ශරීරයෙහි රළු බව ද බොහෝ සෙයින් වැඩි විය. ශරීර වණීය අඩු විය. ඇතැම් සත්ව කෙනෙක් වණීවත් වෙති. ඇතැම් සත්ව කෙනෙක් වණීය නැත්තෝ වෙති. ඔවුන් අතුරෙහි යම් ඒ සත්ව කෙනෙක් වණීවත් වෙත් ද ඔහු **"අපි මොවුන්ට වඩා බොහෝ වණීවත් වෙමු. අපට වඩා මොහු බොහෝ වණීයෙන් අඩු ය"** යැයි දුර්වණී සත්වයන් හෙලා දකිත්. වණීය නිසා උපන් මානය හේතුවෙන් නැවත නැවත උපදනා අති මානය ඇති ඔවුන්ගේ බදලතා වැලි නැති වී ගියේ ය. ඒ බදලතා වැල් නැති වී ගිය කල්හි ඔහු එක් රැස් වූහ. එක් රැස්ව **"මිහිරි රස ඇති බදලතා නම් වැල් අපට ඇති විය. එය දැන් අපට නැති විය"** යැයි ඔවුනොවුන් පුන පුනා කථා කළහ. මෙකල්හි ද මිනිස්සු කිසියම් දුකකින් පීඩාවට පත් වූ කල්හි **"අපට කලින් යමක් වී නම් එය නැති විය"** යයි කියති. එලෙස කියනු ලබන්නේ පුරාණ ලොකොත්පත්ති වංශයෙන් හට ගෙන පරපුරෙන් පැවත ආවා වූ වංශ කථාව අනුව යමිනි. එහෙත් ඒ පිළිබඳ අථීය නොදනිත්ම ය.

## ❄ දහයියා නිවුඩු නැති හැල් පහළ වීම

"වාසෙට්ඨය, ඉක්බිති ඒ සත්වයන්ට බදලතා වැල් නැති වී ගිය කල්හි නො සාන ලද භූමියෙහි උපන්නා වූ කුඩු රහිත වූ දහයියා (පොතු) රහිත වූ සුවඳවත් වූ සහල් ම ඵලය කොට ඇති හැල් පහළ වූයේ ය. යම් ඒ සුවඳ හැල් කොටසක් සවස් වෙලෙහි සවස බත පිණිස ගෙනෙත් ද, පසු දා උදය වන විට ඒ ගත් කොටස පැසී වැඩී සකස් වේ. නැවත වැඩුණේ වේ. ගත් තැන නො පෙනෙන්නේ වේ. වාසිට්ඨය, එකල්හි ඒ සත්වයෝ නො සාන ලද භූමියෙහි උපන්නා වූ කුඩු රහිත

වූ දහයියා (පොතු) රහිත වූ සුවඳමත් වූ සහල් ම ඵලය කොට ඇති හැල් අනුභව කරමින් අවුරුදු පන්තිස් දහසක් (35,000) තරම් දීර්ඝ කාලයක් සිටියාහු ය. ධාන්‍යයන්ගේ නො අඩු බව ම පෙණෙයි.

වාසෙට්ඨය, යම් සේ නො සාන ලද භූමියෙහි හටගත් හැල් අනුභව කරමින් එයම ආහාර කොට ඇතිව බොහෝ දීර්ඝ කාලයක් සිටියාහු ද, එම සත්වයන්ගේ සිරුරු බොහෝ සෙයින් රළු බවට පත් වූහ. ශරීර වර්ණය අඩු විය.

## ❄ ස්ත්‍රී-පුරුෂ ලිංග පහළ වීම

වාසෙට්ඨය, යම් සේ නො සාන ලද භූමියෙහි හටගත් හැල් අනුභව කරමින් එයම ආහාර කොට ඇතිව බොහෝ දීර්ඝ කාලයක් සිටියාහු ද, එම සත්වයන්ගේ සිරුරු බොහෝ සෙයින් රළු බවට පත් වූහ. ශරීර වර්ණය අඩු වූහ. මෙලෙස ශරීරය රළු වීමෙන් පෙර මනුෂ්‍ය කාලයෙහි ස්ත්‍රියක් වූවා ද ඇයට ස්ත්‍රී ලකුණු පහළ විය. පෙර මනුෂ්‍ය කාලයෙහි යමෙක් පුරුෂ වූයේ ද ඔහුට පුරුෂ ලකුණු පහළ විය. (යම් පුරුෂයෙකු ස්ත්‍රී බවට පත් වන්නේ නම් පරදර සේවන, කාම මිථ්‍යාචාර අකුසල් බලවත් වීමෙන් එය සිදු වේ. යම් ස්ත්‍රියක් පුරුෂ බවට පත් වන්නේ නම් පරදර සේවන, කාම මිථ්‍යාචාර අකුසලයන්ගෙන් වෙන් වී බ්‍රහ්මචර්‍ය්‍යාව පුරුදු කිරීමෙන් එය සිදු වේ.)

ඉන් පසු ස්ත්‍රිය බොහෝ වේලාවක් පුරුෂයා දෙස බලා සිටියි. පුරුෂයා ද ස්ත්‍රිය දෙස බොහෝ වේලාවක් බලා සිටියි. මෙසේ බොහෝ වේලාවක් ඔවුනොවුන් දෙස බලා සිටින්නා වූ ඒ සත්වයන්ට කාම රාගය ඇති විය. ශරීරයෙහි රාග පරිදහ උපන්නේය. ඒ සත්වයෝ රාග පරිදහ හේතු කොට මෛථුන සේවනය කළහ.

වාසෙට්ඨය, ඒ කාලයෙහි යම් ඒ සත්වයෝ මෛථුන සේවනය කරන්නා වූ සත්වයන් දකිත් ද, වසලිය නැසෙව. වසලිය නැසෙව, කෙසේ නම් එක් සත්වයෙක් තවත් සත්වයෙකුට මෙබන්දක් කරන්නේ ද යැයි කියා ඇතැම් කෙනෙක් පස්වලින් ගසත්. ඇතැම් කෙනෙක්

අළුවලින් ගසත්. ඇතැම් කෙනෙක් ගොමවලින් ගසත්. මෙකල්හි ද ඇතැම් ජනපදයන්හි මිනිස්සු ද එසේ කරති. ස්ත්‍රියක ගෙන යනු ලබන කල්හි ඇතැම් කෙනෙක් පස්වලින් ගසත්. ඇතැම් කෙනෙක් අළුවලින් ගසත්. ඇතැම් කෙනෙක් ගොමවලින් ගසත්. මෙසේ එම පුරාණ ලොකොත්පත්ති වංශ කථාවට අනුව යති. එහෙත් ඒ පිළිබඳ අර්ථය නොදනිත්ම ය.

## ❄ මෛථුන සේවනය

වාසෙට්ඨය, පූර්වයෙහි පස්වලින් ගැසීම් ආදී වශයෙන් පිළිකුල් කළා වූ යම් අධර්මයක් වී ද, එය දැන් ධර්මය යැයි සම්මත වෙයි. වාසෙට්ඨය, ඒ කාලයෙහි යම් සත්වයෝ මෛථුන සේවනය කෙරෙත් ද, ඔවුහු මසක් ද, දෙ මසක් ද ගමකට හෝ නියම් ගමකට පිවිසෙන්නට අවසර නොලබති. වාසෙට්ඨය, යම් හේතුවකින් ඒ සත්වයෝ ඒ කාලයෙහි බොහෝ වේලාවක් මෛථුන සේවනය කටයුතු බවට පැමිණියාහු ද, එකල්හි ඒ මෛථුන නම් වූ අසද්ධර්මය සැඟවී කරනු පිණිස ගෙවල් කරන්නට පටන් ගත්හ.

වාසෙට්ඨය, එකල්හි එක්තරා අලස ස්වභාව ඇති සත්වයෙකුට **"පින්වත, සවස බත පිණිස සවස ද, උදය බත පිණිස උදෑසන ද හැල් ගෙනෙමින් මම කුමට වෙහෙසෙම් ද, සවස හා උදෑසන බත් පිණිස එකවරම හැල් ගෙන එන්නෙම් නම් යෙහෙක"** යැයි මෙබඳු අදහසක් විය. "වාසෙට්ඨය, එවිට ඒ සත්වයා සවස හා උදය බත් පිණිස එකවර ම හාල් ගෙන ආයේ ය. වාසෙට්ඨය, ඉක්බිති එක්තරා සත්වයෙක් ඒ සත්වයා යම් තැනක ද එතැනට පැමිණියේ ය. පැමිණ, ඒ සත්වයාට මේ කාරණය කීයේ ය. **"පින්වත් සත්වය, එව, හැල් ගෙන ඒම පිණිස යන්නෙමු"** යැයි මෙය කීවේ ය. එවිට එම සත්වයා **"පින්වත් සත්වය, කම් නැත. මා විසින් සවස හා උදය බත පිණිස එකවරම හැල් ගෙන එන ලද්දේ ය"** යැයි කීයේ ය.

වාසෙට්ඨය, එවිට ඒ සත්වයා එකවර දෙ දිනකට සෑහෙන පමණ හැල් ගෙන ආ සත්වයා අනුව යමින් "**පින්වත, මෙසේ කිරීම යහපත**" යැයි කියා එකවරම දෙ දවසකට සෑහෙන පමණ හැල් ගෙන ආයේ ය. වාසෙට්ඨය, ඉක්බිති එක්තරා සත්වයෙක් ඒ සත්වයා යම් තැනක ද එතැනට පැමිණියේ ය. පැමිණ, ඒ සත්වයාට "**පින්වත් සත්වය, එව. හැල් ගෙන එනු පිණිස යන්නෙමු**" යැයි මෙම කරුණ කීයේය. "**පින්වත් සත්වය, කම් නැත. මා විසින් සතර දවසක ප්‍රයෝජනය පිණිස හැල් එකරවම ගෙන එන ලද්දේ ය**" යැයි පිළිතුරු දුන්නේ ය. වාසෙට්ඨය, එවිට ඒ සත්වයා ඒ දෙ දවසක් පිණිස හැල් ගෙන ආ සත්වයාගේ දෘෂ්ටානුගතියට (අනුකරණය) පැමිණෙන්නේ "**පින්වත, මෙසේ කිරීම යහපත**" යැයි කියා සතර දවසක් පිණිස හැල් එකවරම ගෙන ආයේ ය. වාසෙට්ඨය, එවිට එක්තරා සත්වයෙක් ඒ සතර දවසක් පිණිස හැල් ගෙන ආ සත්වයා යම් තැනක ද එතනට පැමිණියේ ය. පැමිණ ඒ සත්වයාට "**පින්වත් සත්වය, එව හැල් ගෙන එනු පිණිස යන්නෙමු**" යැයි මෙ කරුණ කීයේ ය.

එවිට එම සත්වයා "**පින්වත් සත්වය, කම් නැත. මා විසින් සතර දවසක ප්‍රයෝජනය පිණිස එකවරම හැල් ගෙන එන ලද්දේ ය**" යැයි කීයේය. වාසෙට්ඨ ය, ඉක්බිති ඒ සත්වයා සතර දවසක් පිණිස ඒ හැල් ගෙන ආ සත්වයාගේ දෘෂ්ටානුගතියට පැමිණෙන්නේ "**පින්වත, මෙසේ කිරීම යහපත**" යැයි කියා සතර අට දවසක් පිණිස ඇල් වී එක වරම ගෙන ආයේ ය. වාසෙට්ඨය, යම් කාලයක පටන් ඒ සත්වයෝ හැල් ගෙනවිත් රැස් කොට තබාගෙන පරිභෝග කරන්නට පටන් ගත්තාහු ද, එකල්හි කුඩු ද සහල් වසා සිටියේ ය, දහයියා පොතු ද සහල් වසා සිටියේ ය. කපන ලද ධාන්‍යය ද නැවත නො වැඩුණේ ය. කපන ලද තැන්හි අඩුව ම පෙනුණේ ය. හැල් වී එක් එක් තැන්වල කොටස් කළාක් මෙන් පඳුරු පඳුරු ව සිටියාහු ය.

# ❄ හැල් සහල් බෙදීම

වාසෙට්ඨය, එවිට ඒ සත්වයෝ එක් තැනකට රැස් වූහ. එසේ රැස්ව ඔවුනොවුන් මෙසේ කථා කළහ. "පින්වත්නි, ඛේදයක! ලාමක ස්වභාවයෝ (අකුසල ධර්මයෝ) සත්වයන් කෙරෙහි පහළ වූහ. අපි පෙර මනෝමය වූ ප්‍රීතිය ආහාරය කොට ඇතිව ස්වකීය ශරීරාලොකයෙන් බබළමින් අහසෙහි හැසිරෙමින් ශෝභන වස්ත්‍රාභරණ ඇතිව ඉතා දීර්ඝ කාලයක් සිටියෙමු. එසේ සිටි ඒ අපට දීර්ඝ කාලයක් ගත වීමෙන් පසු කිසි කලෙක්හි රස පෘථිවිය ජලයෙහි පැතිර පිහිටියේ ය. ඒ රස පොළොව වර්ණවත් ද, සුවඳවත් ද, රසවත් ද විය. ඒ අපි රස පොළොව අතින් පිඬු කොට වළඳන්නට පටන් ගත්තෙමු. එලෙස රස පොළොව අතින් පිඬු කොට වළඳන්නට පටන්ගත් කල්හි ඒ අපගේ ස්වකීය ශරීරාලොකය නැති වී ගියේ ය. ඒ ස්වකීය ශරීරාලොකය නැති වී ගිය කල්හි චන්ද්‍ර සූර්ය දෙදෙනා පහළ වූහ. සඳ හිරු දෙදෙනා පහළ වූ කල්හි නැකත් තාරකා ද, අනෙකුත් තාරකා රූපයෝ ද පහළ වූහ. නැකත් තරු හා අනෙක් තාරකාරූයෝ පහළ වූ කල්හි රෑ දහවල් ප්‍රකට වූහ. රෑ දහවල් ඇති වූ කල්හි මාස අර්ධ මාස ප්‍රකට වූහ. මාස අර්ධ මාස ඇති වූ කල්හි ඍතු සංවත්සර ප්‍රකට වූහ. ඒ අපි රස පොළොව අනුභව කරමින් එයම ආහාර කොට ඇතිව ඉතා දීර්ඝ කාලයක් සිටියෙමු. ලාමක වූ අකුශල ධර්මයන්ගේ පහළ වීමෙන් ඒ අපගේ රස පොළොව නැති වී ගියේ ය. රස පොළොව නැති වී ගිය කල බිම් හතු පහළ විය. ඒ බිම් හතු වර්ණවත් විය. සුවඳින් යුක්ත විය. රසවත් විය. ඒ අපි බිම් හතු අනුභව කරන්නට පටන් ගත්හ. ඒ අපි බිම් හතු අනුභව කරමින් එයම ආහාර කොට ඇතිව ඉතා දීර්ඝ කාලයක් සිටියෙමු. ලාමක වූ අකුශල ධර්මයන්ගේ පහළ වීමෙන් ඒ අපගේ බිම් හතු නැති වී ගියේය. බිම් හතු නැති වී ගිය කල්හි බදාලතා නම් මිහිරි රස ඇති වැල් ජාතිය පහළ විය. ඒ බදාලතා තොමෝ වර්ණවත් විය. සුවඳින් යුක්ත විය. රසවත් විය. ඒ අපි බදාලතා වැල් අනුභව කරන්නට පටන් ගත්හ. ඒ අපි ඒ බදාලතා වැල් අනුභව කරමින් එයම ආහාර කොට ඇතිව ඉතා දීර්ඝ කාලයක් සිටියෙමු. ලාමක වූ අකුශල ධර්මයන්ගේ පහළ වීමෙන් ඒ අපගේ බදාලතා වැල් නැති වී ගියේ ය. බදාලතා වැල් නැති වී ගිය කල නො සාන ලද භූමි භාගයෙහි උපන්නා වූ කුඩු රහිත වූ දහයියා රහිත වූ පිරිසිදු වූ සුවඳ හමන්නා වූ පිරිසිදු සහල් ම ඵලය කොට ඇත්තා වූ හැල් පහළ

වූයේ ය. සවස් වේලෙහි සවස බත පිණිස යම් ඒ සුවඳ හැල් කොටසක් හැර ගෙනෙත් ද, උදෑසන ඒ කොටස පැසී සිටියේ වේ. නැවත වැඩුණේ වේ. ස්වභාවයෙන් ම ගත් තැන අඩුව නො පෙනී සිටියේ වේ. උදෑසන උදය බත පිණිස යම් ඒ සුවඳ හැල් කොටසක් හැර ගණිමු ද සවස ඒ කොටස පැසී සිටියේ වෙයි. නැවත වැඩුණේ වෙයි. ස්වභාවයෙන් ම ගත් තැන අඩුව නො පෙනී සිටියේ වෙයි. ඒ අපි නො සාන ලද බිමෙහි හට ගත්තා වූ හැල් අනුභව කරමින් එයම ආහාර කොට ඇතිව ඉතා දීර්‍ඝ කාලයක් සිටියෙමු. ලාමක වූ අකුශල ධර්‍මයන්ගේ පහළ වීමෙන් කුඩු ද ඒ අපගේ සහල් වසා සිටියේ ය. දහයියා ද සහල් වසා සිටියේ ය. කපන ලද ධාන්‍ය ද නැවත නො වැඩුණේ ය. කපන ලද කපන ලද තැන් එසේ අඩුව ම පෙනුණේ ය. හැල් වී පඳුරු පඳුරු ව සිටියහ. අපි හැල් වී බෙදා ගන්නෙමු නම් මායිම් තබා ගන්නෙමු නම් ඉතා යෙහෙක" යැයි මෙසේ කථාවත් ඇති කර ගත්හ. වාසෙට්ඨය, ඉක්බිති ඒ සත්වයෝ හැල් කෙත් වශයෙන් මේ කොටස මගේ ය, මේ කොටස අසවලාගේ ය යනුවෙන් බෙදා ගත්හ, (ඉඩම් වශයෙන්) මායිම් තබා ගත්හ.

වාසෙට්ඨය, එවිට ලොල් ස්වභාව ඇති එක්තරා සත්වයෙක් තම හැල් කොටස ආරක්‍ෂා කරමින් තමහට නුදුන්නා වූ එක්තරා කොටසක් සොර සිතින් ගෙන පරිභෝග කළේ ය. එය දැක අන්‍යයෝ ඒ සත්වයා අල්ලා ගත්තාහු ය. අල්ලා ගෙන මෙසේ කීහ. "පින්වත් සත්වය, යම් හේතුවකින් නුඹ තමාගේ කොටස ආරක්‍ෂා කරමින් තමහට නුදුන්නා වූ අනුන් අයත් එක්තරා කොටසක් සොර සිතින් ගෙන පරිභෝග කිරීමෙන් ඒකාන්තයෙන් පාප කර්‍මයක් කෙරෙහි ය. පින්වත් සත්වය, නැවත එසේ නො කරව" යැයි කීහ. "පින්වත්නි, එසේය" යැයි ඒ සත්වයා උත්තර දුන්නේ ය.

වාසෙට්ඨය, දෙවන වාරයෙහි ද ඒ සත්වයා තම හැල් කොටස ආරක්‍ෂා කරමින් තමහට නුදුන්නා වූ එක්තරා කොටසක් සොර සිතින් ගෙන පරිභෝග කළේ ය. එය දැක අන්‍යයෝ ඒ සත්වයා අල්ලා ගත්හ. අල්ලා ගෙන මෙසේ කීහ. "පින්වත් සත්වය, යම් හේතුවකින් නුඹ තමාගේ කොටස ආරක්‍ෂා කරමින් තමහට නුදුන්නා වූ අනුන් අයත් එක්තරා කොටසක් සොර සිතින් ගෙන පරිභෝග කිරීමෙන් ඒකාන්තයෙන් පාප කර්‍මයක් කෙරෙහි ය. පින්වත් සත්වය, නැවත එසේ

**නො කරව"** යැයි කීහ. "**පින්වත්නි, එසේය"** යැයි ඒ සත්වයා උත්තර දුන්නේ ය.

වාසෙට්ඨය, තුන් වන වාරයෙහි ද ඒ තම හැල් කොටස ආරක්ෂා කරමින් තමහට නුදුන්නා වූ එක්තරා කොටසක් සොර සිතින් ගෙන පරිභෝග කළේ ය. එය දැක අන්‍යයෝ ඒ සත්වයා අල්ලා ගත්හ. අල්ලා ගෙන මෙසේ කීහ. "**පින්වත් සත්වය, යම් හේතුවකින් නුඹ තමාගේ කොටස ආරක්ෂා කරමින් තමහට නුදුන්නා වූ අනුන් අයත් එක්තරා කොටසක් සොර සිතින් ගෙන පරිභෝග කිරීමෙන් ඒකාන්තයෙන් පාප කර්මයක් කෙරෙහි ය. පින්වත් සත්වය, නැවත එසේ නො කරව"** යැයි කියා තුන් වන වාරයෙහි ද කළ අවවාද නො පිළිගෙන නැවත වරදෙහි යෙදීම හේතුවෙන් ඇතැම් කෙනෙක් අතින් පහර දුන්හ, ඇතැම් කෙනෙක් ගල් කැටවලින් පහර දුන්හ, ඇතැම් කෙනෙක් දණ්ඩෙන් පහර දුන්හ. වාසෙට්ඨය, එතැන් පටන් ලෝකයෙහි අන්සතු නුදුන් දෙය පැහැර ගැණීම ප්‍රකට විය. අන්‍යයන්ට අපහාස කිරීම ඇති විය. බොරු කීම ඇති විය. සත්ව හිංසනය පිණිස දඬු ගැණීම ඇති විය.

## ❄ මහා සම්මත රජ

වාසෙට්ඨය, ඉක්බිති ඒ සත්වයෝ රැස් වූහ. රැස්ව ඔවුනොවුන් මෙසේ කථා කළහ. "**පින්වත්නි, ඛේදයකි! යම් කෙනෙකු කෙරෙහි සොරකම් කිරීම ඇති වූයේ ද, ගර්හා කිරීම ඇති වූයේ ද, බොරු කීම ඇති වූයේ ද, දඬු ගැනීම ඇති වූයේ ද ඒ සත්වයන් කෙරෙහි ලාමක අකුසල ධර්මයෝ පහළ වූහ. යම් කෙනෙක් අප අතර දෙස් නැගිය යුත්තාට මනාව දෙස් නගන්නේ ද, ගර්හා කළ යුත්තාට මනාව ගර්හා කරන්නේ ද, නෙරපිය යුත්තා මනාව නෙරපන්නේ ද අපි මේ ජන සමූහය අතරින් එසේ කළ හැකි කෙනෙකු සම්මත කර ගන්නෙමු නම් ඉතා යෙහෙක. අපි ඔහුට හැල් කෙතෙන් වී අමුණක් (පැල් සතරක්) දෙන්නෙමු"** යැයි කතිකා කර ගත්හ.

වාසෙට්ඨය, එවිට ඒ සත්වයෝ ඔවුන් අතුරෙන් යමෙක් ඉතා වඩාත් රූප සම්පත්තියෙන් යුක්ත ද, වඩාත් දැකුම් කළු ද, වඩාත් සිත් පහදවන සුලු ද, වඩාත් තේජසින් යුක්ත ද, එසේ වූ එක් සත්වයෙකු වෙත එළඹ **"පින්වත් සත්වය, මෙහි එන්න. දෙස් නැගිය යුත්තාට මනාව දෙස් නගන්න, ගහී කළ යුත්තාට මනාව ගහී කරන්න, නෙරපිය යුත්තා මනාව නෙරපන්න. අපි වනාහි ඒ නුඹට එක එක කුඹුරකින් අමුණක් බැගින් සහල් දෙන්නෙමු. නුඹ විසින් කිසි වැඩක් නොකළ යුතු ය. නුඹ අපගේ ප්‍රධානියා වශයෙන් සිටින්න"** යැයි මෙසේ කීහ. **"පින්වත්නි, එසේය"** යැයි ඒ සත්වයා ඒ සත්වයන්ට පිළිවදන් දී දෙස් නැගිය යුත්තාට මනාව දෙස් නැගුවේ ය. ගහී කළ යුත්තාට මනාව ගහී කළේ ය, නෙරපිය යුත්තා මනාව නෙරපුවේ ය. ඒ අන්‍ය සත්වයෝ ඒ සත්වයාට හැල් වී අමුණක් කොටසක් දුන්හ.

වාසෙට්ඨය, **"මහාජනසම්මතො'ති මහාසම්මතො"** එසේ මහජනයා විසින් සම්මත කරණ ලද්දේ ය යන අර්ථයෙන් ඔහුට **මහා සම්මත ය, මහා සම්මතය** යැයි පළමු වන නාම ව්‍යවහාරය ඇති විය.

වාසෙට්ඨය, **"ඛෙත්තානං අධිපතී'ති ඛත්තියො"** ක්ෂේත්‍රයන්ට (ඉඩම්වලට) අධිපතිය යන අර්ථයෙන් **ක්ෂත්‍රිය, ක්ෂත්‍රිය** යැයි කියා දෙවන නාම ව්‍යවහාරයක් විය.

වාසෙට්ඨය, **"ධම්මෙන පරෙ රඤ්ජෙතී'ති රාජා"** ධර්මයෙන් අන්‍ය සත්වයන් පිනවයි යන අර්ථයෙන් රජය, රජය යන තුන් වන නාමය ඇතිවිය.

වාසෙට්ඨය, මෙසේ පෞරාණික වූ අග්‍රය යැයි දන්නා ලද නාම ව්‍යවහාරයෙන් මේ ක්ෂත්‍රිය මණ්ඩලයෙහි ආරම්භය (පහළ වීම) වූයේ ය. එය ද ඒ සත්වයන් සම්බන්ධව ම ය. අන්‍ය සත්වයන් සම්බන්ධව නොවේ. සමාන වූ සත්වයන් සම්බන්ධව ම ය. අසමාන සත්වයන් සම්බන්ධව නොවේ. ධර්මයෙන්ම ය. අධර්මයෙන් නොවේ. වාසෙට්ඨය, එසේ හෙයින් මේ සත්වයන් කෙරෙහි ද, මේ ලොවෙහි ද පරලොවෙහි ද ධර්මය ම ශ්‍රේෂ්ඨ ය.

# ❄ බ්‍රාහ්මණ මණ්ඩලය පහළ වීම

වාසෙට්ඨය, ඉන් පසු ඒ ඇතැම් සත්වයෙකුට මෙබඳු අදහසක් විය. "**පින්වත්නි, ඛේදයෙකි! යම් කෙනෙකු කෙරෙහි සොරකම හට ගත්තේ ද, අන්‍යයන්ට ගර්‍හා කිරීම හට ගත්තේ ද, බොරු කීම හට ගත්තේ ද, දඬු ගැනීම හට ගත්තේ ද, රටින් නෙරපීම හට ගත්තේ ද, එසේ වූ සත්වයන් කෙරෙහි ලාමක අකුසල ධර්‍මයෝ පහළ වූවාහු ය. අපි ඒ ලාමක අකුසල ධර්‍ම බැහැර කරන්නෙමු නම් යෙහෙක**" යැයි මෙසේ සිත් විය. ඔවුහු ලාමක අකුශල ධර්‍මයෝ දුරු කළහ.

වාසෙට්ඨය, "**පාපකෙ අකුසලෙ ධම්මෙ වාහෙන්තී'ති බ්‍රාහ්මණා**" ලාමක අකුශල ධර්‍මයන් දුරු කෙරෙති, යන අර්‍ථයෙන් **බ්‍රාහ්මණ බ්‍රාහ්මණ** යැයි පළමු වන නාම ව්‍යවහාරය වූයේ ය.

ඔවුහු වන ප්‍රදේශයෙහි අතු කොළ ආදියෙන් පන්සල් කොට ගෙන එකී පන්සල්වල ධ්‍යාන කෙරෙති. එහි විසීමෙහි දී පිස අනුභව කළ යුතු දෙයක් නැති බැවින් ගිනි අඟුරු හා දුම් නැති බැවින් ද, කොටා පිසිය යුතු දෙයක් නැති බැවින් වංගෙඩි මොහොල් නැති බැවින් ද සවස් බත පිණිස සවස් කාලයෙහි ද, උදය බත පිණිස උදෑසන කාලයෙහි ද පිඬු සිඟීම් වශයෙන් කැඳ බත් සොයමින් ගම් නියම් ගම් රාජධානිවලට බසිති. ඔවුහු ආහාර ලබා ගෙන නැවත ද වන ප්‍රදේශයෙහි පන්සල්වලට වැද ධ්‍යාන කෙරෙති. එබැවින් ඔවුන්ට "**ඣායන්තී'ති ඣායකා**" ධ්‍යාන කෙරෙති යන අර්‍ථයෙන් **ඣායක** යැයි දෙවන නාම ව්‍යවහාරය විය.

වාසෙට්ඨය, එම සත්වයන් අතුරෙන් ඇතැම් කෙනෙක් වන ප්‍රදේශයෙහි පන්සල්වල සිටිය ද ධ්‍යානය කළ නොහැකි ව ගම් නියම්ගම් සීමාවන්ට පැමිණ ත්‍රී වේද ග්‍රන්ථ සකස් කෙරෙමින් ද, උගන්වමින් ද වෙසෙති. මිනිස්සු ඒ මේ සමූහයා දැක මෙසේ කීය.

පින්වත්නි, මේ සත්වයෝ වන ප්‍රදේශයෙහි පන්සල්වල හිඳ ද ධ්‍යාන කළ නොහැකි වී ගම් නියම් ගම් සීමාවන්ට පැමිණ ත්‍රී වේදය සකස් කෙරෙමින් ද, උගන්වමින් ද වෙසෙති. "**න'දානිමෙ ඣායන්තී'ති**

**අජ්ඣායකා"** දැන් මොවුහු ධ්‍යාන නො කෙරෙති, දැන් මොහු ධ්‍යාන නො කෙරෙති යන අර්ථයෙන් **"අජ්ඣායකයා"** යන තුන් වන නාම ව්‍යවහාරය විය.

වාසෙට්ඨය, වේද මන්ත්‍ර දැරීම, වේද මන්ත්‍ර හැදෑරීම යන මෙය එකල්හි පහත් යැයි සම්මත විය. එහෙත් මෙපමණ මන්ත්‍ර කර තිබේ ය, පාඩම් කර තිබේ ය යැයි ඒ මන්ත්‍ර දැරීම හා හැදෑරීම දැන් ශ්‍රේෂ්ඨ යයි සම්මත වෙයි.

වාසෙට්ඨය, මෙසේ මේ පෞරාණික වූ අග්‍ර යැයි පිළිගන්නා ලද ව්‍යවහාරයෙන් ඒ බ්‍රාහ්මණ මණ්ඩලයෙහි ආරම්භය සිදු විය. එය ද ඒ සත්වයන් සම්බන්ධව ම ය. අන්‍ය සත්වයන් සම්බන්ධව නොවේ. සමාන වූ සත්වයන් සම්බන්ධව ම ය. අසමාන සත්වයන් සම්බන්ධව නොවේ. ධර්මයෙන්ම ය. අධර්මයෙන් නොවේ. වාසෙට්ඨය, එසේ හෙයින් මේ සත්වයන් කෙරෙහි ද, මෙලොවෙහි ද පරලොවෙහි ද ධර්මය ම ශ්‍රේෂ්ඨ ය.

## ❄ වෛශ්‍ය මණ්ඩලය පහළ වීම

වාසෙට්ඨය, එම සත්වයන් අතුරෙන් ඇතැම් සත්ව කෙනෙක් මෛථුන ධර්ම සේවනය කරමින් අඹු සැමියන් වශයෙන් දෙදෙනා බැගින් වෙන් වී නිවාස තනා පදිංචි වී කෘෂි කර්මාන්ත වෙළඳාම ගව පාලනය ආදී ඒ ඒ අවස්ථාවන්හි ගැලපෙන ප්‍රසිද්ධ කර්මාන්තයන්හි යෙදුණාහු ය. වාසෙට්ඨය, මෙලෙස **"මෙථුනං ධම්මං සමාදය විසුකම්මන්තෙ පයොජෙන්තී'ති, වෙස්සා"** මෛථුන ධර්මය සඳහා ප්‍රසිද්ධ කර්මාන්තයන්හි යෙදෙත් ය යන අර්ථයෙන් **වෛශ්‍ය, වෛශ්‍ය** යැයි නාම ව්‍යවහාරය විය.

වාසෙට්ඨය, මෙසේ මේ පෞරාණික වූ අග්‍ර යැයි පිළිගන්නා ලද ව්‍යවහාරයෙන් ඒ වෛශ්‍ය මණ්ඩලයෙහි ආරම්භය සිදු විය. එය ද ඒ සත්වයන් සම්බන්ධව ම ය. අන්‍ය සත්වයන් සම්බන්ධව නොවේ. සමාන වූ සත්වයන් සම්බන්ධව ම ය. අසමාන සත්වයන් සම්බන්ධව

නොවේ. ධර්මයෙන්ම ය. අධර්මයෙන් නොවේ. වාසෙට්ඨය, එසේ හෙයින් මේ සත්වයන් කෙරෙහි ද, මෙලොවෙහි ද පරලොවෙහි වාසෙට්ඨය, මෙසේ සත්වයන් සම්බන්ධව මෙලොවෙහි ද පරලොවෙහි ද ධර්මය ම ශ්‍රේෂ්ඨ ය.

## ❄ ශුද්‍ර මණ්ඩලය පහළ වීම

වාසෙට්ඨය, එම සත්වයන් අතුරෙන් යම් සත්වයෙක් වැදි ජනයන් මෙන් අන් සත්වයන් විපතට පමුණුවන, බට කර්මාන්ත දැව කර්මාන්ත ආදී වූ පහත් පැවතුම් ඇත්තෝ වූවාහු ද, ඔවුහු නපුරු වූවාහු රෞද්‍ර පැවතුම් ඇත්තෝ වූවාහු ය. වාසෙට්ඨය, එලෙස **"ලුද්දාචාරා ඛුද්දාචාරා'ති සුද්දා"** නපුරු ක්‍රියා ඇත්තෝ, නින්දිත ක්‍රියා ඇත්තෝ වහ වහා නින්දිත බවට යන්නේ යන අර්ථයෙන් **ශුද්‍ර, ශුද්‍ර** යන නාම ව්‍යවහාරය විය.

වාසෙට්ඨය, මෙසේ මේ පෞරාණික වූ අග්‍ර යැයි පිළිගන්නා ලද ව්‍යවහාරයෙන් ඒ ශුද්‍ර මණ්ඩලයෙහි ආරම්භය සිදු විය. එය ද ඒ සත්වයන් සම්බන්ධව ම ය. අන්‍ය සත්වයන් සම්බන්ධව නොවේ. සමාන වූ සත්වයන් සම්බන්ධව ම ය. අසමාන සත්වයන් සම්බන්ධව නොවේ. ධර්මයෙන්ම ය. අධර්මයෙන් නොවේ. වාසෙට්ඨය, එසේ හෙයින් මේ සත්වයන් කෙරෙහි ද, මෙලොවෙහි ද පරලොවෙහි වාසෙට්ඨය, මෙසේ සත්වයන් සම්බන්ධව මෙලොවෙහි ද, පරලොවෙහි ද ධර්මය ම ශ්‍රේෂ්ඨ ය.

වාසෙට්ඨය, යම් හේතුවකින් ක්‍ෂත්‍රියා ද තමාගේ ක්‍ෂත්‍රිය ධර්මයට ගර්හා කොට පැවිදි වන්නෙමි යැයි ගිහි ගෙයින් නික්ම පැවිදි වෙයි ද, බ්‍රාහ්මණයා ද ස්වකීය බ්‍රාහ්මණ ධර්මයට ගර්හා කොට පැවිදි වන්නෙමි යැයි ගිහි ගෙයින් නික්ම පැවිදි වෙයි ද, වෛශ්‍යයා ද ස්වකීය වෛශ්‍ය ධර්මයට ගර්හා කොට පැවිදි වන්නෙමි යැයි ගිහි ගෙයින් නික්ම පැවිදි වෙයි ද, ශුද්‍රයා ද තම ශුද්‍ර ධර්මයට ගර්හා කොට පැවිදි වන්නෙමි යැයි ගිහි ගෙයින් නික්ම පැවිදි වෙයි ද, එබඳු වූ කාලයක් වූයේ ය.

වාසෙට්ඨය, මෙසේ ඒ සතර වංශයන්ගෙන් ම ස්වකීය වංශයට ස්වකීය ධර්මයට ගර්හා කොට ගිහි ගෙයින් නික්ම පැවිදි වූවාහු ද එයින් මේ ශ්‍රමණ මණ්ඩලයෙහි ආරම්භය විය. එය ද ඒ සත්වයන් සම්බන්ධව ම ය. අන්‍ය සත්වයන් සම්බන්ධව නොවේ. සමාන වූ සත්වයන් සම්බන්ධව ම ය. අසමාන සත්වයන් සම්බන්ධව නොවේ. ධර්මයෙන්ම ය. අධර්මයෙන් නොවේ. වාසෙට්ඨය, එසේ හෙයින් මේ සත්වයන් කෙරෙහි ද, මෙලොවෙහි ද පරලොවෙහි වාසෙට්ඨය, මෙසේ සත්වයන් සම්බන්ධව මෙලොවෙහි ද, පරලොවෙහි ධර්මය ම ශ්‍රේෂ්ඨ ය.

මෙහි ශ්‍රමණ මණ්ඩලය යැයි වෙනම මණ්ඩලයක් (වංශයක්) නැත්තේ ය. ජාතියෙන් (උපන් කුලය අනුව) මනාව පිරිසිදු විය නොහැක. තම තමා විසින් ම යෙදෙන හොඳ ප්‍රතිපත්තියෙන් ම පිරිසිදු වීම සිදු වේ. එබැවින් මනා ප්‍රතිපත්තියෙහි යෙදීම පිණිස තම තමාගේ උපන් ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණාදී සතර වංශයෙන් ම පැමිණ ශ්‍රමණ භාවයට ලැබීමෙන් ශ්‍රමණ මණ්ඩලයෙහි ඉපදීම සිදු වේ. එබැවින් අන් සතර මණ්ඩලය ම ශ්‍රමණ මණ්ඩලය අනුව පවතී. එසේ පවතින්නේ ද ධර්මයෙන් ම මිස අධර්මයෙන් නොවේ. ශ්‍රමණ මණ්ඩලයට පැමිණ මනා ප්‍රතිපත්ති පුරා ශුද්ධියට (පිරිසිදු බවට) පැමිණීම වේ.

## ❄ දුශ්චරිත ආදි කථා

වාසෙට්ඨය, ක්‍ෂත්‍රිය වංශිකයා ද කයින් දුශ්චරිතයන්හි හැසිර, වචනයෙන් දුශ්චරිතයන්හි හැසිර, සිතින් දුශ්චරිතයන්හි හැසිර මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන්ව අකුසල ධර්මයන්හි යෙදී කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහ වූ බැවින් අපාය නම් වූ, දුකට ම ස්ථාන වූ බැවින් දුගතිය නම් වූ, අතරක් නැතිව ගිනි දැලින් වෙළෙමින් ද යමපල්ලන් විසින් පමුණුවන අපමණ දුක්වලින් ද අතුරු සිදුරු නැති ව සත්වයන්ගෙන් පිරී ඇති බැවින් විනිපාත නම් වූ නිරයෙහි උපදියි.

වාසෙට්ඨය, බ්‍රාහ්මණ වංශිකයා ද කයින් දුශ්චරිතයන්හි හැසිර, වචනයෙන් දුශ්චරිතයන්හි හැසිර, සිතින් දුශ්චරිතයන්හි හැසිර මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන්ව අකුසල ධර්මයන්හි යෙදී කය බිඳීමෙන්

මරණින් මතු සැපයෙන් පහ වූ බැවින් අපාය නම් වූ, දුකට ම ස්ථාන වූ බැවින් දුගතිය නම් වූ, අතරක් නැතිව ගිනි දැලින් වෙළෙමින් ද යමපල්ලන් විසින් පමුණුවන අපමණ දුක්වලින් ද අතුරු සිදුරු නැති ව සත්වයන්ගෙන් පිරී ඇති බැවින් විනිපාත නම් වූ නිරයෙහි උපදියි.

වාසෙට්ඨය, වෛශ්‍ය වංශිකයා ද කයින් දුශ්චරිතයන්හි හැසිර, වචනයෙන් දුශ්චරිතයන්හි හැසිර, සිතින් දුශ්චරිතයන්හි හැසිර මිථ්‍යාදෘෂ්ටි කර්‍ම සමාදන්ව අකුසල ධර්‍මයන්හි යෙදී කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහ වූ බැවින් අපාය නම් වූ, දුකට ම ස්ථාන වූ බැවින් දුගතිය නම් වූ, අතරක් නැතිව ගිනි දැලින් වෙළෙමින් ද යමපල්ලන් විසින් පමුණුවන අපමණ දුක්වලින් ද අතුරු සිදුරු නැති ව සත්වයන්ගෙන් පිරී ඇති බැවින් විනිපාත නම් වූ නිරයෙහි උපදියි.

වාසෙට්ඨය, ශුද්‍රයා ද කයින් දුශ්චරිතයන්හි හැසිර, වචනයෙන් දුශ්චරිතයන්හි හැසිර, සිතින් දුශ්චරිතයන්හි හැසිර මිථ්‍යාදෘෂ්ටි කර්‍ම සමාදන්ව අකුසල ධර්‍මයන්හි යෙදී කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහ වූ බැවින් අපාය නම් වූ, දුකට ම ස්ථාන වූ බැවින් දුගතිය නම් වූ, අතරක් නැතිව ගිනි දැලින් වෙළෙමින් ද යමපල්ලන් විසින් පමුණුවන අපමණ දුක්වලින් ද අතුරු සිදුරු නැති ව සත්වයන්ගෙන් පිරී ඇති බැවින් විනිපාත නම් වූ නිරයෙහි උපදියි.

වාසෙට්ඨය, ශ්‍රමණයා ද කයින් දුශ්චරිතයන්හි හැසිර, වචනයෙන් දුශ්චරිතයන්හි හැසිර, සිතින් දුශ්චරිතයන්හි හැසිර යාග හෝමාදිය පිණිස සත්ව ඝාතන කිරීමාදී මිථ්‍යාදෘෂ්ටි කර්‍ම සමාදන්ව අකුසල ධර්‍මයන්හි යෙදී කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහ වූ බැවින් අපාය නම් වූ, දුකට ම ස්ථාන වූ බැවින් දුගතිය නම් වූ, අතරක් නැතිව ගිනි දැලින් වෙළෙමින් ද යමපල්ලන් විසින් පමුණුවන අපමණ දුක්වලින් ද අතුරු සිදුරු නැති ව සත්වයන්ගෙන් පිරී ඇති බැවින් විනිපාත නම් වූ නිරයෙහි උපදියි.

වාසෙට්ඨය, ක්‍ෂත්‍රියා ද කයින් සුචරිතයෙහි හැසිර, වචනයෙන් සුචරිතයෙහි හැසිර, සිතින් සුචරිතයෙහි හැසිර, සම්‍යක්දෘෂ්ටිය ඇතිව

සම්‍යක්දෘෂ්ටි කර්‍ම සමාදන්ව ඒ හේතුවෙන් කය බිඳීමෙන් මරණින් මත්තෙහි සුගති නම් වූ ස්වර්‍ග ලොකයට පැමිණෙයි.

වාසෙට්ඨය, බ්‍රාහ්මණයා ද කයින් සුචරිතයෙහි හැසිර, වචනයෙන් සුචරිතයෙහි හැසිර, සිතින් සුචරිතයෙහි හැසිර, සම්‍යක්දෘෂ්ටිය ඇතිව සම්‍යක්දෘෂ්ටි කර්‍ම සමාදන්ව ඒ හේතුවෙන් කය බිඳීමෙන් මරණින් මත්තෙහි සුගති නම් වූ ස්වර්‍ග ලොකයට පැමිණෙයි.

වාසෙට්ඨය, වෛශ්‍යයා ද කයින් සුචරිතයෙහි හැසිර, වචනයෙන් සුචරිතයෙහි හැසිර, සිතින් සුචරිතයෙහි හැසිර, සම්‍යක්දෘෂ්ටිය ඇතිව සම්‍යක්දෘෂ්ටි කර්‍ම සමාදන්ව ඒ හේතුවෙන් කය බිඳීමෙන් මරණින් මත්තෙහි සුගති නම් වූ ස්වර්‍ග ලොකයට පැමිණෙයි.

වාසෙට්ඨය, ශුද්‍රයා ද කයින් සුචරිතයෙහි හැසිර, වචනයෙන් සුචරිතයෙහි හැසිර, සිතින් සුචරිතයෙහි හැසිර, සම්‍යක්දෘෂ්ටිය ඇතිව සම්‍යක්දෘෂ්ටි කර්‍ම සමාදන්ව ඒ හේතුවෙන් කය බිඳීමෙන් මරණින් මත්තෙහි සුගති නම් වූ ස්වර්‍ග ලොකයට පැමිණෙයි.

වාසෙට්ඨය, ශ්‍රමණයා ද කයින් සුචරිතයෙහි හැසිර, වචනයෙන් සුචරිතයෙහි හැසිර, සිතින් සුචරිතයෙහි හැසිර, සම්‍යක්දෘෂ්ටිය ඇතිව සම්‍යක්දෘෂ්ටි කර්‍ම සමාදන්ව ඒ හේතුවෙන් කය බිඳීමෙන් මරණින් මත්තෙහි සුගති නම් වූ ස්වර්‍ග ලොකයට පැමිණෙයි.

වාසෙට්ඨය, ක්‍ෂත්‍රියා ද විටෙක කයින් කුසලාකුසල දෙක ම කරන්නේ ද, වචනයෙන් කුසල් අකුසල් දෙක ම කරන්නේ ද, සිතින් කුසලාකුසල දෙක ම කරන්නේ ද, විටෙක සම්‍යක් දෘෂ්ටිය ද විටෙක මිථ්‍යා දෘෂ්ටිය ද යන මිශ්‍ර වූ දෘෂ්ටි ඇතිව, මිශ්‍ර දෘෂ්ටි කර්‍ම සමාදන්ව ඒ හේතුවෙන් කාය භේදයෙන් මරණින් මත්තෙහි සුව දුක් දෙක ම විඳින්නේ වෙයි.

වාසෙට්ඨය, බ්‍රාහ්මණයා ද විටෙක කයින් කුසලාකුසල දෙක ම කරන්නේ ද, වචනයෙන් කුසල් අකුසල් දෙක ම කරන්නේ ද, සිතින් කුසලාකුසල දෙක ම කරන්නේ ද, විටෙක සම්‍යක් දෘෂ්ටිය ද විටෙක මිථ්‍යා දෘෂ්ටිය ද යන මිශ්‍ර වූ දෘෂ්ටි ඇතිව, මිශ්‍ර දෘෂ්ටි කර්‍ම සමාදන්ව ඒ

හේතුවෙන් කාය භේදයෙන් මරණින් මත්තෙහි සුව දුක් දෙක ම විඳින්නේ වෙයි.

වාසෙට්ඨය, වෛශ්‍යයා ද විටෙක කයින් කුසලාකුසල දෙක ම කරන්නේ ද, වචනයෙන් කුසල් අකුසල් දෙක ම කරන්නේ ද, සිතින් කුසලාකුසල දෙක ම කරන්නේ ද, විටෙක සම්‍යක් දෘෂ්ටිය ද විටෙක මිථ්‍යා දෘෂ්ටිය ද යන මිශ්‍ර වූ දෘෂ්ටි ඇතිව, මිශ්‍ර දෘෂ්ටි කර්‍ම සමාදන්ව ඒ හේතුවෙන් කාය භේදයෙන් මරණින් මත්තෙහි සුව දුක් දෙක ම විඳින්නේ වෙයි.

වාසෙට්ඨය, ශුද්‍රයා ද විටෙක කයින් කුසලාකුසල දෙක ම කරන්නේ ද, වචනයෙන් කුසල් අකුසල් දෙක ම කරන්නේ ද, සිතින් කුසලාකුසල දෙක ම කරන්නේ ද, විටෙක සම්‍යක් දෘෂ්ටිය ද විටෙක මිථ්‍යා දෘෂ්ටිය ද යන මිශ්‍ර වූ දෘෂ්ටි ඇතිව, මිශ්‍ර දෘෂ්ටි කර්‍ම සමාදන්ව ඒ හේතුවෙන් කාය භේදයෙන් මරණින් මත්තෙහි සුව දුක් දෙක ම විඳින්නේ වෙයි.

වාසෙට්ඨය, ශ්‍රමණයා ද විටෙක කයින් කුසලාකුසල දෙක ම කරන්නේ ද, වචනයෙන් කුසල් අකුසල් දෙක ම කරන්නේ ද, සිතින් කුසලාකුසල දෙක ම කරන්නේ ද, විටෙක සම්‍යක් දෘෂ්ටිය ද විටෙක මිථ්‍යා දෘෂ්ටිය ද යන මිශ්‍ර වූ දෘෂ්ටි ඇතිව, මිශ්‍ර දෘෂ්ටි කර්‍ම සමාදන්ව ඒ හේතුවෙන් කාය භේදයෙන් මරණින් මත්තෙහි සුව දුක් දෙක ම විඳින්නේ වෙයි.

මෙහි කුසලාකුසල දෙක ම කරන කල්හි එකම චිත්තක්‍ෂණයෙහි සිත් දෙකක් ඉදිරිපත් ව විපාක ලබා දීමේ ශක්තියක් සත්ව සන්තානයෙහි නැත. යමෙකු විසින් බොහෝ අකුසල් කරන ලද්දේ වේද, සිදුකළ කුසල් අල්ප වේද, යම් හෙයකින් සිදු කරන ලද කුසල ධර්‍ම ප්‍රතිසන්ධි විපාක වශයෙන් ඉදිරිපත් ව ක්‍ෂත්‍රිය කුලයෙහි හෝ බ්‍රාහ්මණ කුලයෙහි උපදවයි., ඔහු සිදුකළ මහත් අකුසල කර්‍ම ප්‍රවෘත්ති විපාක වශයෙන් ඉදිරිපත් ව ඔහු කණ කරයි. කුදු කරයි. අත් පා කොර කරයි. ඒ හේතුවෙන් හෙතෙම රජකමට නුසුදුස්සෙකු වේ. අභිෂේක

නොකළ කාලයෙහි කණ වීම ආදිය සිදු වීමෙන් භෝග පරිභෝජනයට නොහැකි වේ.

යම් හෙයකින් මරණාසන්න කාලයෙහි දී මල්ලව පොර කරුවන් මෙන් කුසලාකුසල දෙක පිළිබඳව සමාන භාවයෙන් වැටහීම වේ ද, එහි දී කාම සම්පත් පිළිබඳව බලවත් ආශාව ආදිය ඇති විට අකුසල කර්මයට ම සහාය වී කුසලය යට කොට අකුසලය බලවත් වී ඉදිරිපත් ව තිරිසන් යෝනියෙහි උපදවයි. කුසල කර්ම ප්‍රවෘත්ති විපාක වශයෙන් ඉදිරිපත් ව රජතුමාට මඟුල් ඇතා, මඟුල් අශ්වයා, මඟුල් වෘෂභයා බවට පමුණුවයි. එයින් හෙතෙම කුසලය ප්‍රවෘත්ති විපාක වශයෙන් ලැබී සම්පත් අනුභව කරයි. මෙලෙස කුසලාකුසල කර්ම අනුව සැප දුක් විඳීම වේ.

## ❄ බෝධිපාක්ෂික ධර්ම භාවනාව

වාසෙට්ඨය, ක්ෂත්‍රිය වංශිකයා ද ප්‍රාණඝාත, අදත්තාදන, කාමමිථ්‍යාචාර, සුරාපාන ආදී දුසිරිත්වලින් වැළකී කායික සංවරයෙන් යුක්තව, මුසාවාද, පිසුණා වාච, ඵරුසා වාච, සම්ඵප්‍රලාප ආදී දුසිරිත්වලින් වැළකී වාචසික සංවරයෙන් යුක්තව, අභිජ්ජා, ව්‍යාපාද, මිථ්‍යාදෘෂ්ටි ආදී දුසිරිත්වලින් වැළකී මානසික සංවරයෙන් යුක්තව, සතර සතිපට්ඨාන, සතර සෘද්ධිපාද, සතර සම්‍යප්‍රධාන, පඤ්චේන්ද්‍රිය, පඤ්චබල, සප්ත බොජ්ඣංග, ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ග යනුවෙන් කාණ්ඩ සතකින් යුත් අංග වශයෙන් සත් තිසක් ඇත්තා වූ බෝධිපාක්ෂික ධර්මයන් භාවනා වශයෙන් වැඩීම කොට මේ ආත්මභාවයෙහි ම කෙලෙස් පිරිනිවීමෙන් පිරිනිවෙන්නේ ය.

වාසෙට්ඨය, බ්‍රාහ්මණ වංශිකයා ද වෛශ්‍යයා ද, ශුද්‍රයා ද කයින් සංවර ව, වචනයෙන් සංවර ව, සිතින් සංවර ව සතර සතිපට්ඨාන, සතර සෘද්ධිපාද, සතර සම්‍යප්‍රධාන, පඤ්චේන්ද්‍රිය, පඤ්චබල, සප්ත බොජ්ඣංග, ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ග යනුවෙන් සත් කොටසකට අයත් වූ අංග වශයෙන් සත් තිසක් වූ බෝධිපාක්ෂික ධර්මයන් භාවනා වශයෙන්

වැඩීම කොට මේ ආත්මභාවයෙහි ම කෙලෙස් පිරිනිවීමෙන් පිරිනිවෙන්නේ ය.

වාසෙට්ඨය, ශ්‍රමණ තෙමේ ද කයින් සංවර ව, වචනයෙන් සංවර ව, සිතින් සංවර ව, සතර සතිපට්ඨාන, සතර ඍද්ධිපාද, සතර සම්‍යප්‍රධාන, පඤ්චේන්ද්‍රිය, පඤ්චබල, සප්ත බොජ්ඣංග, ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ග යනුවෙන් සත් කොටසකට අයත් වූ අංග වශයෙන් සත් තිසක් වූ බෝධිපාක්ෂික ධර්මයන් භාවනා වශයෙන් වැඩීම කොට මේ ආත්මභාවයෙහි ම කෙලෙස් පිරිනිවීමෙන් පිරිනිවෙන්නේ ය.

මෙහි පුද්ගල සන්තානයෙහි නිර්වාණාවබෝධය පිණිස සහාය වන මූලධර්ම බෝධිපාක්ෂික ධර්ම නම් වේ. එහි "**බෝධි**" යන මෙයින් "**බොධිපි රුක්ඛොපි, මග්ගොපි, සබ්බඤ්ඤුතඤ්ඤාණම්පි, නිබ්බානම්පි වුච්චති**" 'වෘක්ෂය ද, ලෝකෝත්තර මාර්ගය ද, සර්වඥතා ඥානය ද, නිර්වාණය' ද බෝධි යැයි කියන ලදි. එහි "**යස්ස රුක්ඛස්ස මූලෙ චතුමග්ගඤ්ඤාණසඞ්ඛාතබොධිං බුද්ධා පටිවිජ්ඣන්ති, සො බොධී'ති වුච්චති**" 'යම් වෘක්ෂ මූලයක වැඩ හිඳ සතර මාර්ග ඥාණ සංඛ්‍යාත බෝධිය අවබෝධ කරන ලද්දේ ද, ප්‍රතිවේධ කරන ලද්දේ ද එම වෘක්ෂ රාජයන් වහන්සේ **බෝධිය** යැයි කියන ලදි'. මෙයින් වෘක්ෂය බෝධි යැයි කියන ලදි. "**බොධි'ති වුච්චති චතූසු මග්ගෙසු ඤාණං**" 'සතර මාර්ග ඥාණය **බෝධි** යැයි කියන ලදි' යන මෙයින් මාර්ගය බෝධිය යැයි කියන ලදි. "**පප්පොති බොධිං වරභූරිමෙධසො**" 'උතුම් නුවණ ඇත්තේ සම්‍යක් සම්බුද්ධත්වයට පමුණුවයි' යන මෙයින් සර්වඥතා ඥානය **බෝධිය** යැයි කියන ලදි. "**පත්වාන බොධිං අමතං අසඞ්ඛතං**" 'අසංඛත ධාතු සංඛ්‍යාත අමෘත බෝධියට පැමිණ' යන මෙයින් නිවන බෝධිය යැයි කියන ලදි.

මෙහි දී **බෝධි** නම් වූ නිවන පිණිස පවත්නා ධර්ම සමූහයාගේ හෝ **බෝධි** නම් වූ ආර්‍ය්‍යය ශ්‍රාවකයාගේ අංග වෙත්නුයි බොජ්ඣංග නම් වේ. ලෞකික ලෝකෝත්තර මාර්ගයට බාධා කිරීම් වශයෙන් උපදින්නා වූ ථීනමිද්ධ නම් වූ කුසල සිතෙහි හැකිළෙන ස්වභාවය, උද්දච්ච නම් වූ සිතෙහි නො සන්සුන් බව, පතිට්ඨාන නම් වූ ලෝභාදී කෙලෙස් මත පිහිටුවා සසරෙහි රඳවන ස්වභාවය, ආයූහන නම් වූ සසරෙහි නැවතී සිටීමට කුසලාකුසල රැස් කරවන ස්වභාවය, කාම සුඛ,

අත්තකිලමතානුයෝගය, ශාශ්වත දෘෂ්ටිය උච්ඡේද දෘෂ්ටිය ආදී වූ නොයෙක් උපද්‍රවයන්ට ප්‍රතිපක්ෂ (විරුද්ධ) භාවයෙන් යුත් යම් ධර්ම සමූහයක් වේ ද, සති ධම්මවිචය විරිය ප්‍රීති පස්සද්ධි සමාධි උපෙක්ඛා යන මේ ධර්ම සමූහයෙහි එකතුවෙන් කෙලෙස් නින්දෙන් නැගී සිටුවා ආර්‍ය්‍ය සත්‍යයන් ධර්මයන් අවබෝධය කරවා ආර්‍ය්‍ය ශ්‍රාවක භාවයට පමුණුවා නිවනට පමුණුවන බැවින් බෝධි නම් වේ.

එලෙස නිවනට පමුණුවන **සති, ධම්මවිචය, විරිය, ප්‍රීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා** යන සත ප්‍රශස්ත සුන්දර අංග වන බැවින් සම්බොජ්ඣංග නම් වේ.

## ☸ සති සම්බොජ්ඣංගය

"**සරණාට්ඨේන සති**" සිහි කිරීම් අර්ථයෙන් **සති** නම් වේ. සක්විති රජතුමාගේ භාණ්ඩාගාරික ඇමතියා විසින් "**මහ රජ, අමු රන් මෙපමණ ය, රන් මෙපමණ ය, සෙසු ධනය මෙපමණ ය**" යනුවෙන් සිහි කරවන්නාක් මෙන් මෙම සතිය කුසල අකුසල, සාවද්‍ය අනවද්‍ය, හීන ප්‍රණීත, කණ්හ (පව්වු, අයහපත්) සුක්ක (යහපත්) ආදී ලෙස කුසලාකුසල ධර්ම සිහි කරවන්නේ ය. නිර්වාණගාමිනී ප්‍රතිපදාවෙහි යෙදෙන යෝගාවචරයාගේ සිත සමථ විදර්ශනා භාවනාරම්මණයන්හි අතරක් නැර නංවන සිහිය **සතිසම්බොජ්ඣංගය** නම් වේ.

සතිසම්බොජ්ඣංගය එළඹ සිටීම (අවධියෙන් සිටීම) ලක්ෂණ කොට ඇත්තේ ය. මුලා නොවීම කෘත්‍ය රසය කොට ඇත්තේ ය. සිතෙහි කුසල ධර්ම ආරක්ෂා කිරීම වැටහෙන ආකාරය කොට ඇත්තේ ය. ස්ථිර කුසල සඤ්ඤාව ආසන්න කාරණය කොට ඇත්තේ ය.

සතිසම්බොජ්ඣංගය වැඩීමට සිහිය නුවණ ඇති බව , සිහි ඇති පුද්ගලයන් ,සිහියෙන් තොර පුද්ගලයන් ඇසුරෙන් දුරු කිරීම සති සම්බෝජ්ඣංගයට නැමුණු සිත් ඇති බව යන ධ ,ඇසුරු කිරීමර්‍ම .සතර වැඩිදියුණු කළ යුතු ය

## ☸ ධම්මවිචය සම්බොජ්ඣංගය

**"චතුසච්චධම්මෙ විචිනාතී'ති ධම්මවිචයො"** චතුරාර්‍ය්‍යසත්‍ය ධර්‍මයන් පරීක්‍ෂා කෙරෙත් නුයි **ධම්මවිචය** නම් වේ. තව ද සන්තති ඝනය, සමූහ ඝනය, කෘත්‍ය ඝනය, ආරම්මණ ඝනය යන ඝන සතරෙන් වැසී සත්ව පුද්ගල ආත්ම ආදී වශයෙන් පෙනී සිටින ආධ්‍යාත්මික, බාහිර, පරමාර්ථ රූපාරූප ධර්‍මයන්හි ප්‍රඥප්තිය බිඳ හැර පඨවි ධාතුව ස්පර්‍ශ ආදී වශයෙන් ද, ස්කන්ධ ධාතු ආයතන ඉන්ද්‍රිය සත්‍ය පටිච්ච සමුප්පාද ආදී වශයෙන් ද, අනිත්‍ය දුක්ඛ අනාත්ම ආදී වශයෙන් ද නන් අයුරින් පිරි සිඳ දැනීමෙහි දැකීමෙහි සමත් වූ තියුණු නුවණ **ධම්මවිචය** නම් වේ. තව ද ප්‍රඥා චෛතසිකය ධම්මවිචය නම් වේ.

ධර්‍ම ස්වභාවය ප්‍රතිවේධ කිරීම (සෙවීම) ධම්මවිචය සම්බොජ්ඣංගයෙහි ලක්‍ෂණය යි. ධර්‍ම ස්වභාවය වසන මෝහය දුරු කිරීම කෘත්‍යය යි. නුමුලා බව වැටහෙන ආකාරය යි. සමාධිය ආසන්න කාරණය යි.

ධම්මවිචය සම්බොජ්ඣංගය වැඩීමට පඤ්චස්කන්ධ, ධාතු, ආයතන ආදී ධර්‍මයන් පිළිබඳව ප්‍රශ්න විචාරන බව, ආධ්‍යාත්මික බාහිර පිරිසුදු බව, ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් සම කර ගැනීම, නුවණ නැති පුද්ගලයන් ඇසුරු නොකිරීම, නුවණ ඇති පුද්ගලයන් ඇසුරු කිරීම, පඤ්චස්කන්ධාදී ධර්‍මයන්හි පැවති ප්‍රඥා ප්‍රභේදයන් සිහි කිරීම, ධම්මවිචය සම්බෝජ්ඣංගයට නැමුණු සිත් ඇති බව යන ධර්‍ම සත වැඩිදියුණු කළ යුතු ය.

## ☸ විරිය සම්බොජ්ඣංගය

නූපන් ලාමක අකුශල ධර්‍මයන් නො ඉපදවීම පිණිස ද, උපන් ලාමක අකුශල ධර්‍මයන් ප්‍රහාණ වීම පිණිස ද, නූපන් කුසල ධර්‍මයන් ඉපදවීම පිණිස ද, උපන් කුසල ධර්‍මයන්ගේ පැවැත්ම පිණිස, අමතක නොවීම පිණිස, වැඩීම පිණිස, විපුලත්වයට පැමිණ වීම පිණිස,

භාවනාවෙන් සම්පූර්ණ කිරීම පිණිස කැමැත්ත ඉපදවීම වෑයම් කිරීම පටන් ගැනීම වීර්‍ය්‍යය නම් වේ. මෙලෙස නිර්වාණාවබෝධය පිණිස අතරක් නැර සහාය වන බැවින් වීර්‍ය්‍යය **විරියසම්බොජ්ඣංගය** නම් වේ.

උත්සාහය වීර්‍ය්‍යයෙහි ලක්‍ෂණය වේ. එක්ව යෙදෙන චිත්ත චෛතසික ධර්‍මයන් දිරි ගැන්වීම කෘත්‍යය යි. නො නවතින බව වැටහෙන ආකාරය යි. සංවේගය ආසන්න කාරණය යි.

විරිය සම්බොජ්ඣංගය වැඩීම සඳහා අපාය භය සිහි කිරීම, වීර්‍ය්‍යයෙහි ආනිශංස දැකීම, බුදු පසේබුදු මහ රහතන් වහන්සේලාගේ ගමන් මග සිහි කිරීම, සැදැහැතියන් විසින් පුදන ප්‍රත්‍යයන්ට ගරු කිරීම, ධර්‍ම දායාදය සිහි කිරීම, ශාස්තෘ මහන්තතාවය සිහි කිරීම, "මම භාග්‍යවතුන් වහන්සේගේ ඖරස පුත්‍ර වූ රාහුල තෙරුන් ගේ සොහොයුරෙකි" යනාදී ලෙස ජාති මහන්තතාවය සිහි කිරීම, සැරියුත් මුගලන් මහ රහතන් වහන්සේලා වැනි සබ්‍රහ්මචාරී (එක්ව ගුණ පුරන්නන්ගේ) ගුණ මහන්තතාවය සිහි කිරීම, අලස පුද්ගලයන් දුරු කිරීම, වීර්‍ය්‍යවන්ත පුද්ගලයන් ඇසුරු කිරීම, වීර්‍ය්‍යය සම්බොජ්ඣංගයට නැමුණු සිත් ඇති බව යන කරුණු එකොළොස දියුණු කළ යුතු ය.

## ☸ ප්‍රීති සම්බොජ්ඣංගය

සිත පිනවීම ප්‍රීතිය නම් වේ. නිර්වාණගාමිනී ප්‍රතිපදාවෙහි දී ඒ සඳහා යෙදීම පිණිස ඇතිවන අසතුට, උදාසීන බව දුරු කොට භාවනා කෘත්‍යයෙහි සතුට ඇති කරවමින් සහය වෙමින් නිවන් මගට සහය වන බැවින් වේ ප්‍රීතිය ප්‍රීති සම්බොජ්ඣංගය නම් වේ.

සිත භාවනාරම්මණයෙහි පිනවීම ප්‍රීතියෙහි ලක්‍ෂණය වේ. තෘප්තියට පැමිණ වීම, අරමුණෙහි සිත පැතිරවීම කෘත්‍ය රසය වේ. උද්‍යෝගය ඇති කරලීම වැටහෙන ආකාරය යි. භාවනාරම්මණයෙහි පිනවන බව ආසන්න කාරණය යි.

ප්‍රීති සම්බොජ්ඣංගය වැඩීමට බුදුගුණ මෙනෙහි කිරීම, දහම් ගුණ මෙනෙහි කිරීම, සඟ ගුණ මෙනෙහි කිරීම, තමාගේ සීල ගුණය

මෙනෙහි කිරීම, තමාගේ ත්‍යාග ගුණය මෙනෙහි කිරීම, දේවත්වයට හේතුවන තමාගේ ශ්‍රද්ධාදී ගුණ මෙනෙහි කිරීම, තමාගේ සන්සුන් කෙලෙසුන් මෙනෙහි කිරීම, රළු පුද්ගලයන් ඇසුරු නොකිරීම, මෘදු මොලොක් පුද්ගලයන් ඇසුරු කිරීම, ප්‍රීති සම්බොජ්ඣංගයට නැමුණු සිත් ඇති බව යන කරුණු එකොළොස දියුණු කළ යුතු ය.

## ☸ පස්සද්ධි සම්බොජ්ඣංගය

චිත්ත චෛතසික ධර්මයන්ගේ සන්සිඳීම පස්සද්ධිය නම් වේ. භාවනා යෝගයෙහි දී යෝගාවචරයන්ට ඇතිවන වෙහෙස පීඩනය කාය පස්සද්ධි චිත්ත පස්සද්ධි චෛතසික දෙකෙන් සන් සිඳී යන්නේ ය. මෙලෙස නිර්වාණගාමිනී ප්‍රතිපදාවෙහි යෙදීමෙහි දී වෙහෙසක් පීඩාවක් නැතිව සුව සේ භාවනාවෙහි යෙදිය හැකි බව පස්සද්ධි සම්බොජ්ඣංගය නම් වේ.

චිත්ත චෛතසික ධර්මයන්ගේ සන්සිඳවීම පස්සද්ධි සම්බොජ්ඣංගයෙහි ලක්ෂණය වේ. චිත්ත චෛතසික ධර්මයන්ගේ දහය නැති කිරීම මෙහි කෘත්‍ය රසය වේ. චිත්ත චෛතසික ධර්මයන්ගේ සිසිල් බව වැටහෙන ආකාරය වේ. චිත්ත චෛතසික ධර්ම ආසන්න කාරණය වේ.

පස්සද්ධි සම්බොජ්ඣංගය වැඩීමට ප්‍රණීත භෝජන වැළඳීම, කායික සුවය ලැබෙන සෘතු ගුණ සේවනය කිරීම, සැප වූ ඉරියව් සේවනය කිරීම, සැප දුක් ආදියෙහි මධ්‍යස්ථ බව පුරුදු කිරීම, නො සන්සුන් ඉරියව් ඇති පුද්ගලයන් දුරු කිරීම, සන්සුන් ඉරියව් ඇති පුද්ගලයන් ඇසුරු කිරීම, පස්සද්ධි සම්බොජ්ඣංගයට නැමුණු සිත් ඇති බව යන කරුණු සත දියුණු කළ යුතු ය.

## ☸ සමාධි සම්බොජ්ඣංගය

චිත්ත චෛතසික ධර්ම නා නා අරමුණෙහි විසිර නො ගොස් එක ම අරමුණෙහි එකඟ ව පැවැත්ම සමාධිය නම් වේ. මෙලෙස

නිර්වාණගාමිනී ප්‍රතිපදාවෙහි යෙදීමෙහි දී නා නා අරමුණෙහි විසිර නො ගොස් එක ම අරමුණෙහි එකඟ ව පැවැත්විය හැකි බව, භාවනාවෙහි යෙදිය හැකි බව සමාධි සම්බොජ්ඣංගය නම් වේ.

චිත්ත චෛතසික ධර්මයන්ගේ විසිර නො යාම සමාධි සම්බොජ්ඣංගයෙහි ලක්‍ෂණය වේ. චිත්ත චෛතසික ධර්ම සම්පිණ්ඩනය කිරීම එහි කෘත්‍ය රසය වේ. කෙලෙස් සන්සිඳවීම වැටහෙන ආකාරය වේ. සුඛ වේදනාව ආසන්න කාරණය වේ.

සමාධි සම්බොජ්ඣංගය වැඩීමට අභ්‍යන්තර බාහිර වස්තූන් පිරිසිදු කර ගැනීම, ශ්‍රද්ධා දී ඉඳුරන් සමව පවත්වා ගැනීම, කසින ආදී භාවනාරම්මණයන්හි නිමිති සිතට ගැනීමෙහි සමත් බව, සිතට අනුබල දීමට සුදුසු අවස්ථාවෙහි අනුබල දීම, චිත්ත වේගය අඩු කළ යුතු අවස්ථාවෙහි චිත්ත වේගය අඩු කිරීම, සිත සතුටු කළ යුතු අවස්ථාවෙහි සිත සතුටු කිරීම, සිත භාවනාරම්මණයෙහි මධ්‍යස්ථ ව පවත්නා විට සිත ගැන මධ්‍යස්ථ වීම, අසමාහිත පුද්ගලයන් දුරු කිරීම, සමාහිත පුද්ගලයන් ඇසුරු කිරීම, ධ්‍යාන මාර්ග ඵල ධර්මයන් මෙනෙහි කිරීම, සමාධි සම්බොජ්ඣංගයට නැමුණු සිත් ඇති බව යන කරුණු එකොළොස දියුණු කළ යුතු ය.

## ☸ උපෙක්ඛා සම්බොජ්ඣං

චිත්තය හැකිළීමට ද නොදී, නො සන්සුන් වීමට ද නොදී කුසලාරම්මණයෙහි සමව පිහිටුවන තත්‍රමජ්ඣත්තතා චෛතසිකය උපේක්‍ෂාව නම් වේ. හීන වීර්යයෙන් සිත හැකිළීමට පත් වේ. අධික වීර්යයෙන් සිත නො සන්සුන් බවට පත් වේ. වීර්යය හා සමාධිය සමව තබා ගෙන නිරුත්සාහයෙන් නිර්වාණගාමිනී ප්‍රතිපදාවෙහි සමව පැවැත්විය හැකි බව, භාවනාවෙහි යෙදිය හැකි බව උපේක්‍ෂා සම්බොජ්ඣංගය නම් වේ.

නුවණින් සළකා බැලීම, චිත්ත චෛතසික ධර්මයන් සමව පැවැත්වීම උපේක්‍ෂා සම්බොජ්ඣංගයෙහි ලක්‍ෂණය වේ. වීර්යයෙහි අඩු

වැඩි බව වැළැක්වීම එහි කෘත්‍ය රසය වේ. මැදහත් බව වැටහෙන ආකාරය වේ. මධ්‍යස්ථ ව දැකීම ආසන්න කාරණය වේ.

උපේක්ෂා සම්බොජ්ඣංගය වැඩීමට සත්වයන් කෙරෙහි මැදහත් වීම, සංස්කාරයන් කෙරෙහි මැදහත් වීම, සත්ව සංස්කාරයන් සුරතල් කරන අති ලෝභීන්ගෙන් වෙන්වීම, සත්වයන් හා සංස්කාරයන් කෙරෙහි මධ්‍යස්ථ පුද්ගලයන් ඇසුරු කිරීම, උපේක්ෂා සම්බොජ්ඣංගයට නැමුණු සිත් ඇති බව යන කරුණු පස දියුණු කළ යුතු ය.

වාසෙට්ඨය, මේ ක්ෂත්‍රිය ආදී සතර වර්ණයන්ගෙන් කවර කෙනෙකුන් හෝ රහත් බවට පැමිණියා වූ, නසන ලද ආශ්‍රව ඇතිව, බ්‍රහ්මචර්‍ය්‍යාව පුරා අවසන් කරන ලද, සෝවාන් සකෘදගාමී අනාගාමී අර්හත් යන සිවු මගින් කළ යුතු කෘත්‍යයන් කොට නිමවන ලද, උපාදනස්කන්ධ පස කෙරෙහි තණ්හා දෘෂ්ටි මාන වශයෙන් පැවති කෙලෙස් බර බහා තබන ලද, මාර්ග ඵල පිළිවෙලින් පැමිණි රහත් බව ඇතති, සියලු ආකාරයෙන් භව බන්ධන නසන ලද, ප්‍රත්‍යවේක්ෂා ඥාණයන් තුළින් සියලු කෙලෙසුන්ගෙන් මිදුණු බව දන්නා වූ යම් ශ්‍රමණයකු වේ ද, ඒ ශ්‍රමණයන් වහන්සේ ඒ සෑම දෙනාට ම අග්‍රය යැයි කියනු ලැබේ. එය ද ධර්මයෙන්ම ය. අධර්මයෙන් නොවෙයි. වාසෙට්ඨය, එබැවින් ධර්මය ම මෙලොවෙහි ද, පරලොවෙහි ද මේ ජනයා කෙරෙහි ශ්‍රේෂ්ඨ වේ.

වාසෙට්ඨය, සමන්කුමාර නම් බ්‍රහ්මයා විසින් ද කියන ලද මේ ගාථාවක් වේ.

**"ඛත්තියො සෙට්ඨො ජනෙතස්මිං**
**යෙ ගොත්තපටිසාරිනො,**
**විජ්ජාචරණසම්පන්නො**
**සො සෙට්ඨො දෙවමානුසෙ'ති."**

යම් කෙනෙක් සිය ගෝත්‍රය සිහි කරන්නෝ ඇත්තේ වේ ද, ඒ ජනයා අතරෙහි ක්ෂත්‍රියා ශ්‍රේෂ්ඨ ය. යම් කෙනෙක් අෂ්ට විද්‍යාවෙන් හා

පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්ත වේ ද, ඒ සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ දෙවි මිනිසුන් අතර ශ්‍රේෂ්ඨ ය.

වාසෙට්ඨය, ඒ මේ ගාථාව සනත්කුමාර බ්‍රහ්මයා විසින් මනාව ගයන ලදි. නො මනාව ගයන ලද්දක් නොවේ ය. මනාකොට කියන ලද්දේ ය. නො මනා කොට කියන ලද්දක් නොවේ ය. මනා අර්ථයෙන් යුක්ත ය. අනර්ථයෙන් යුක්ත නොවේ ය. මා විසින් ද එය අනුමත කරන ලද්දේ වෙමි. වාසෙට්ඨය, මම ද මෙසේ කියමි.

**"ඛත්තියො සෙට්ඨො ජනෙතස්මිං**
**යෙ ගොත්තපටිසාරිනො,**
**විජ්ජාචරණසම්පන්නො**
**සො සෙට්ඨො දෙවමානුසෙති"**

යම් කෙනෙක් සිය ගෝත්‍රය සිහි කරන්නෝ ඇත්තේ වේ ද, ඒ ජනයා අතරෙහි ක්‍ෂත්‍රියා ශ්‍රේෂ්ඨ ය. යම් කෙනෙක් අෂ්ට විද්‍යාවෙන් හා පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්ත වේ ද, ඒ සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ දෙවි මිනිසුන් අතර ශ්‍රේෂ්ඨ ය.

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළ සේක. වාසෙට්ඨ භාරද්වාජ යන සාමණේරයන් වහන්සේලා දෙනම සතුටු සිත් ඇත්තාහු භාග්‍යවතුන් වහන්සේගේ අවවාදය ආදර ගෞරවයෙන් පිළිගත්හ.

**නිමි.**

## ආශ්‍රිත ග්‍රන්ථ


| | |
|---|---|
| දීඝ නිකාය I | බෞ: සං: මධ්‍යස්ථානය |
| දීඝ නිකාය III | ” |
| මජ්ඣිම නිකාය II | ” |
| අංගුත්තර නිකාය IV | ” |
| දීඝනිකායට්ඨකථා I | ” |
| දීඝනිකායට්ඨකථා II | ” |
| මජ්ඣිමනිකායට්ඨකථා I | ” |
| මජ්ඣිමනිකායට්ඨකථා II | ” |
| සංයුත්තනිකායට්ඨකථා I | ” |
| අඞ්ගුත්තරනිකායට්ඨකථා II | ” |
| ජාතකට්ඨකථා VI | ” |
| දීඝනිකාය ටීකා III | ” |
| සිංහල විශ මාර්ගය | ” |
| සද්ධර්ම රත්නාකරය | ධර්මදින්නාචාර්ය විමලකිත්ති හිමි |
| සූවිසි මහ ගුණය | රේරු: චන්ද්‍රවිමල නා හිමි |
| බෝධිපාක්ෂික ධර්ම විස්තරය | ” |
| කෙලෙස් එක්දහස් පන්සියය | ” |
| සද්ධර්ම සාගර ධර්මපද වර්ණනාව | අම්බ: ධම්මකුසල නා හිමි |
| පාලි සිංහල ශබ්දකෝෂය | මඩිතියවෙල සුමංගල නා හිමි |
| අභිධර්මාර්ථ ප්‍රදීපිකාව | අමරදස රත්නපාල මහතා |
| මහා සිංහල ශබ්දකෝෂය | හරිස්චන්ද්‍ර විජේතුංග මහතා |
| රාජාවලිය | වතුවත්තේ පේමානන්ද නා හිමි |
| යෝගාශ්‍රම බුද්ධ වන්දනාව | නා උයනේ අරියධම්ම මාහිමි |